# වර්ධන මාවතට පිවිසෙමින්



## වාර්ෂික වාර්තාව 2016

ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

## දැක්ම

"ආසියානු කලාපය තුළ කාර්යක්ෂම බවින් හා සුහදත්වයෙන් ප්‍රමුඛතම ගුවන් සේවා කේන්ද්‍රස්ථානය වීම"

## මෙහෙයුම

"උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තෘප්තිමත්භාවය තහවුරු කරන අතරම තරඟකාරී ගුවන් සේවා පහසුකම් සහ හොඳම පරිචයකින් යුත් සේවා සැපයීමට අපි මහත් පරිශ්‍රමයක් දරන්නෙමු"

අපි වර්ධනය සම්බන්ධයෙන් ස්ථිර ලෙසම වේගවත් මාවතකට පිවිස සිටිමු. එසේම ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම (ගු.ගු.සේ) නිවැරදි දිශාවට හිස ඔසවමින් සිටියි. සඵලවත් පිරිවැය පාලන යාන්ත්‍රනය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සමග අපගේ සංවර්ධන උපායමාර්ග ස්ථිර ලෙස ක්‍රියාවේ යෙදවීම, අපගේ මෙහෙයුම් ලාභය ඉහළ දැමීමට මෙන්ම තම අනාගත වර්ධන උපායමාර්ග ප්‍රාග්ධනීකරණය කරනු පිණිස සමාගම ශක්තිමත්ව තැබීමට උදව් විය. අපගේ වාර්තා බිඳ හෙලූ ආදායම, ලාභය සහ වර්ෂය තුල ජයග්‍රහණය කළ අනෙකුත් බොහෝ විශිෂ්ඨ අවස්ථා හරහා ශක්තිය, ප්‍රාණවත් බව සහ නව අදහස් සහිත අධ්‍යාත්මය ප්‍රදර්ශනය වෙයි. වේගවත් වෙනස්වීම් පවතින ගතික පරිසරයක් මධ්‍යයේ අත් කරගත් මෙම වර්ධනය, අප සමාගමේ අපේක්ෂිත ප්‍රතිඵලය අත් කරගැනීම සඳහා උපායමාර්ගික වශයෙන් තුලනාත්මක වී ඇති ආකාරය පෙන්වයි.

"වර්ධන මාවතට පිවිසෙමින්"

# පටුන


මූල්‍ය සුවිශේෂිතා ........ 01
කාර්ය සාධන සුවිශේෂිතා ........ 02
ශ්‍රී ලංකා ගුවන් සේවා ඉතිහාසය ........ 03
සභාපති තුමාගේ සමාලෝචනය ........ 05
අධ්‍යක්ෂ මණ්ඩලය ........ 09
ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ........ 11
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව ........ 13
කළමනාකාරිත්ව සාකච්ඡාව සහ විශ්ලේෂණය ........ 21
මූල්‍ය සමාලෝචනය ........ 45
මානව සම්පත් කළමනාකරණය ........ 55
සාමූහික පාලනය ........ 61
අවදානම් කළමනාකරණය ........ 67
විගණකාධිපති වාර්තාව ........ 87
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ........ 95
මූල්‍ය තත්ව ප්‍රකාශනය ........ 96
ස්කන්ධය වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය ........ 97
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ........ 98
මූල්‍ය ප්‍රකාශන වලට සටහන් ........ 99
විගණකාධිපති වාර්තාවට පැහැදිලි කිරීමේ සටහන් ........ 128
සංස්ථාමය තොරතුරු ........ 134

# මූල්‍ය සුවිශේෂත්වය

| | 2016 Rs. Mn. | 2015* Rs. Mn. | 2016 /2015 +/- % | 2014* Rs. Mn. | 2015 /2014 +/- % |
|---|---|---|---|---|---|
| පිරිවැටුම | 18,343 | 15,698 | 17% | 13,887 | 13% |
| ක්ෂය කිරීමට පෙර මෙහෙයුම් වියදම් | 7,991 | 7,466 | -7% | 6,757 | -10% |
| **පොලී, බදු, ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂයට පෙර ඉපයුම්** | **10,264** | **8,127** | 26% | **6,979** | 16% |
| ස්ථාවර වත්කම් ක්ෂය කිරීම | 2,665 | 2,658 | -0.2% | 2,664 | 0.2% |
| ශුද්ධ මූල්‍ය පිරිවැය/(ආදායම) | 779 | 3,196 | 76% | (1,030) | -410% |
| **බදු පෙර ලාභය** | **6,909** | **2,378** | 191% | **5,496** | -57% |
| ආදායම් බදු | (11) | 1,561 | 101% | 2,084 | 25% |
| **බදු පසු ලාභය** | **6,920** | **817** | 747% | **3,412** | -76% |
| ස්කන්ධ කොටස්හිමියන් අතර බෙදා හැරිය හැකි ලාභය | 6,920 | 817 | 747% | 3,412 | -76% |
| ලාභාංශ | 1,500 | 497 | 202% | 500 | -1% |
| දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ | 22,708 | 15,550 | 46% | 10,238 | 52% |
| දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ අරමුදල | 16,436 | 11,012 | 49% | 10,568 | 4% |
| දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් මුළු ධාරන අගය | 43,471 | 44,079 | -1% | 45,578 | -3% |
| දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් මුළු වටිනාකම | 27,605 | 21,206 | 30% | 14,952 | 42% |
| දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වගකීම් | 10,430 | 10,132 | 3% | 8,908 | 14% |
| වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදම | 2,400 | 617 | 289% | 1,234 | -50% |

* ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ සංඛ්‍යා යලි සකස් කර ඇත. සියළුම සංඛ්‍යා වටැයීමව ඉදිරිපත් කර ඇත.

+ = හිතකර % විචලනය

- = අහිතකර % විචලනය

# කාර්යසාධන සුවිශේෂිතා

| | | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් සුවිශේෂිතා** | | | | | | |
| ජාත්‍යන්තර ගුවන් ගමන් සංචලන | ගණන | 61,637 | 56,156 | 54,960 | 51,972 | 48,416 |
| මගී සංචලන ** | ගණන | 9,466,248 | 8,505,740 | 7,780,724 | 7,330,421 | 7,079,920 |
| භාණ්ඩ සංචලන *** | මෙ.ටො. | 248,347 | 218,402 | 209,607 | 194,020 | 186,618 |
| පියාසර සංචලන | ගණන | 35,118 | 32,694 | 31,600 | 27,529 | 23,835 |
| දෙසැම්බර් 31 දිනට මුළු සේවක සංඛ්‍යාව | ගණන | 3,810 | 3,871 | 3,932 | 3,674 | 3,445 |
| **අනුපාත සුවිශේෂත්වය** | | | | | | |
| ස්කන්ධ මත ප්‍රතිලාභ | % | 42 | 7 | 32 | 48 | 65 |
| බ/පෙ ශුද්ධ ලාභය මුළු ආදායමට | % | 38 | 15 | 40 | 39 | 35 |
| බ/පෙ/ශුලා.කොටස්හිමිඅරමුදලට | % | 42 | 22 | 52 | 64 | 92 |
| මුළු ආදායම මුළු වත්කම්වලට | වාර | 0.26 | 0.24 | 0.23 | 0.22 | 0.22 |
| එක් සේවකයෙකුට මුළු වත්කම් | රු'000 | 18,655 | 16,865 | 15,394 | 15,316 | *14,415 |
| එක් සේවකයෙකුට මුළු කාර්යමණ්ඩල පිරිවැය - වර්ෂයකට | රු'000 | 1,578 | 1,462 | 1,203 | 1,182 | 1,020 |
| හැසිරූ එක් යානයකට මුළු පිරිවැය | රු'000 | 216 | 256 | 184 | 188 | 164 |
| එක් මගියෙකුට ආදායම | රු | 1,938 | 1,846 | 1,785 | 1,652 | 1,570 |
| එක් මගියෙකුට බදු පසු ලාභය | රු | 731 | 96 | 438 | 485 | 387 |
| එක් සේවකයෙකුට ගුවන් සංචලන | ගණන | 16 | 15 | 14 | 14 | 14 |
| ගුවන් යානාවකට මගීන් | ගණන | 154 | 151 | 142 | 141 | 146 |
| එක් සේවකයෙකුට මගීන් | ගණන | 2,485 | 2,197 | 1,979 | 1,995 | 2,055 |
| තෝලන අනුපාතය | % | 48 | 67 | 71 | 82 | 89 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ | % | 10 | 1 | 6 | 6 | 6 |
| ලාභදායිතා අනුපාතය | % | 38 | 5 | 25 | 29 | 25 |
| ප්‍රාග්ධන ඵලදායිතා දර්ශකය | වාර | 0.26 | 0.23 | 0.24 | 0.20 | 0.19 |
| කොටසක ඉපයුම | රු | 34,598 | 4,084 | 17,058 | 17,768 | 13,688 |
| ජංගම අනුපාතය | වාර | 2.65 | 2.09 | 1.68 | 1.29 | *1.78 |
| මුළු වියදමට මුළු ආදායම | වාර | 1.52 | *1.17 | *1.54 | *1.48 | 1.53 |

* ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ සංඛ්‍යා යලි සකස් කර ඇත.

** මගී සංචලනවල ජාත්‍යන්තර පැමිණීම, පිටත්වීම, මාරුවීම සහ සංක්‍රමන මගීන් ඇතුලත් වේ. අභ්‍යන්තර ගුවන් මගීන් ඇතුලත් නොවේ.

*** ගුවන් භාණ්ඩ සංචලනවලට අපනයන, ආනයන සහ ප්‍රතිඅපනයන ගුවන් භාණ්ඩ ඇතුලත් වේ. ගෘහස්ථ භාණ්ඩ සහ ගුවන් ලිපි ඇතුලත් නොවේ.

# ශ්‍රී ලංකා ගුවන් සේවා ඉතිහාසය

ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා ) සමාගම (AASL - ගුගුසේ ) 1983 දී සංස්ථාගත කළ අතර ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම පිණිස රජයේ නියෝජිතයා වශයෙන් පත් කරන ලදී. 1982 ගගන නාවික විශේෂ විධිවිධාන පණත අවලංගු කරමින් ඉදිරිපත් වූ 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පණත මගින් ශ්‍රී ලංකාව තුල සිවිල් ගුවන් තොටුපල සියල්ලේම ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස කටයුතු කිරීමට ගු.ගු.සේ. වෙත බලය පවරන ලදී. ගු.ගු.සේ. අද ව්‍යවස්ථාපිත වගකීම් ක්‍රියාත්මක කිරීමේ තම විෂය සීමාවට වැටෙන ගුවන් තොටුපලවල් හතරක් එනම් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (බ.ජා.ගු) කොළඹ ගුවන් තොටුපල - රත්මලාන මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (ම.රා.ජා.ගු) සහ මඩකලපුව ගුවන් තොටුපල සංවර්ධනය කරමින් පාලනය කිරීමේ අභියෝගය තම උරමතට ගෙන ඇත.

**1932** ශ්‍රී ලංකා ආණ්ඩුකාරවරයා එක්සත් රාජධානිය සහ ඉන්දියාව අතර ගුවන් ලිපි සේවාව ලංකාව හරහා ව්‍යාප්ත කිරීමට සාකච්ඡා කරයි.

**1934** ලංකා රාජ්‍ය සභාව රත්මලාන ගගනයාත්‍රාංගණයක් ඉදි කිරීමට තීරණය කරයි.

**1936** රත්මලාන ගගනයාත්‍රාංගණයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කළ අතර ලංකා ගුවන් සමාජය මහජනතාව වෙත ගුවන් ගමන් අවස්ථා පිරිනමයි.

**1937** ප්‍රථම ගුවන් නාවික නීති රීති පද්ධතිය ප්‍රකාශයට පත්කරයි. ලංකා ලාංඡනය ඇතුලත් කළ ප්‍රථම ගුවන් යානා තුන ගුවන් යානා ලේඛනයට ඇතුලත් කරයි.

**1938** පෙබරවාරි 28 දින රත්මලාන ගුවන් තොටුපල ආරම්භ කරයි. පොදු වැඩ අධ්‍යක්ෂ ගුවන් සේවා අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලබයි.

**1939** පුත්තලමේ හදිසි ගොඩබෑමක් මෙහෙයවයි.

**1942** දෙවන ලෝක යුද්ධය ඇති වීමත් සමග රාජකීය ගුවන් හමුදාව රත්මලාන ගුවන් තොටුපලේ කාර්යයන් පාලනය තම යටතට ගනියි.

**1945** එක්සත් රාජධානිය - ඕස්ට්‍රේලියා - ලැන්කැස්ට්‍රියන් සේවය ලංකාව හරහා මෙහෙයුම් ආරම්භ කරයි.

**1946** ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරයි. සිවිල් ගුවන් කටයුතු සඳහා රත්මලාන ගුවන් තොටුපල රාජකීය ගුවන් හමුදාවෙන් ලබාගනී.

**1947** ලංකා ගුවන් සේවය - ජාතික ප්‍රවාහකයා සන්නිවේදන සහ වැඩ අමාත්‍යාංශය යටතේ පිහිටවූ අතර කොළඹ සිට යාපනය හරහා මදුරාසිය දක්වා ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කරයි.

**1948** ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව පත්කරයි.

**1950** 1950 අංක 15 දරණ නාවික කටයුතු පණත ප්‍රකාශයට පත්කරයි. ගුවන් නියමුවන් පුහුණු කිරීම සඳහා පුහුණු පීඨයක් ස්ථාපිත කරයි.

**1955** ලංකා ගුවන් සේවය KLM Royal Dutch ගුවන් සේවය සමග ගිවිසුමකට එළඹෙයි.

**1959**
ජාත්‍යන්තර ගුවන් මෙහෙයුම් කටුනායකට මාරු කරන ලදී.

**1963**
කටුනායක ගුවන් තොටුපලේ සංවර්ධන වැඩසටහන් ආරම්භ කරයි. කැනඩා රජයේ ආධාරය මත ඝන ධාවන පථය මීටර් 1,840 සිට 3,350 දක්වා පුළුල් කරයි. වර්ෂයකට ගුවන් මගීන් 150,000 ක් දැරීමට හැකි වන සේ පර්යන්ත ගොඩනැගිල්ල ඉදි කරයි.

**1968**
විශාල පර්යන්ත ගොඩනැගිල්ලක්, යානා හැසිරවීමේ අංගනයක් සහ ගුවන් ධාවන පථයට පිවිසුම් මාර්ග ඉදිකිරීම සිදුවෙයි.

**1979**
ජාතික ප්‍රවාහකයා - එයාර් ලංකා ආරම්භය. 1979 ගුවන් තොටුපල අධිකාරිය පණත ප්‍රකාශයට පත්කළ අතර ගුවන් තොටුපල අධිකාරිය පිහිටුවනු ලබයි.

**1980**
ගුවන් තොටුපල අධිකාරිය සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවෙන් සිවිල් ගුවන් තොටුපල මෙහෙයුම් කටයුතු භාරගනී.

**1981**
ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා කටයුතු මෙහෙයවීම සඳහා රජය සතු සමාගමක් පිහිටුවීමට රජය තීරණය කරයි.

**1982**
ගුවන් නාවික පණතට සංශෝධන ගෙන එනු ලබයි.

**1983**
සිවිල් ගුවන් තොටුපලවල සමස්ථ සංවර්ධනය, නඩත්තුව, පරිපාලනය සහ සේවා බෙදා හැරීම අධීක්ෂණය කිරීම සඳහා ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම (ගු.ගු.සේ.) ස්ථාපිත කරයි.

**1984**
නව ධාවන පථය, මගී පර්යන්ත ගොඩනැගිල්ල, ගුවන් භාණ්ඩ සංකීර්ණය, පාලක කුළුණ සහ නාවික සේවා සහ නඩත්තු සංකීර්ණයක් ඉදිකිරීමේ වැඩසටහන් ආරම්භ කොට ක්‍රියාත්මක කරයි.

**1987/88**
සංවර්ධන වැඩසටහන සම්පූර්ණ කළ අතර නව ධාවන පථය සහ වාර්ෂික හැසිරවීමේ ධාරිතාව ගුවන් මගීන් මිලියන 3.5 ක් සමග නව පර්යන්ත ගොඩනැගිල්ල ක්‍රියාත්මක කරයි.

**1992**
ගුවන් භාණ්ඩ ගම්මානය ආරම්භ කරයි.

**2005**
ගුවන් පාලම් 8 ක් සමග ඇඟිලි වන් කුළුණු, ව්‍යාප්ත කල පර්යන්ත, විවේකාගාර සහ අනෙකුත් පහසුකම් ඉදිකිරීමත් සමග නොවැම්බරයේදී ගුවන් තොටුපල සඳහා සම්පූර්ණ නව පෙනුමක් ලැබීය.

**2008**
ගු.ගු.සේ. 25 වසරක රජත ජයන්තිය සමරයි.

**2010**
2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පණත පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදී. ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස ශ්‍රී ලංකාව තුල සිවිල් ගුවන් තොටුපලවල් මෙහෙයවීමට ගු.ගු.සේ. වෙත ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය සහතිකය සහ බලපත්‍රය නිකුත් කරයි.

**2012**
1912 දෙසැම්බර් 07 දින කොළඹ රේස් කෝර්ස් පිටියට පළමුවන ගුවන් යානය සාර්ථකව ගොඩබෑමෙන් ඇරඹි සිවිල් ගුවන් සේවා අංශය වසර 100 ක ගුවන් සේවාවක් සම්පූර්ණ කරයි.

**2013**
හම්බන්තොට ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල (ම.රා.ජා.ගු) මාර්තු 18 දින විවෘත කරන ලදී.

සභාපතිවරයාගේ

# සමාලෝචනය

අපගේ දැක්ම මත කටයුතු කිරීමට, අපගේ
උනන්දු පාර්ශවයන් හට මෙන්ම සමස්ථයක්
ලෙස රටට සුවිශේෂී ආර්ථික ප්‍රතිලාභ
උත්පාදනය කිරීමට අපි වඩා ශක්තිමත්ව
සහ හොඳින් ස්ථාපිතව සිටිමු.



## කාර්යසාධනය සමස්ථ විග්‍රහය 2016

ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම තම උනන්දු පාර්ශවයන් හට අපේක්ෂිත ප්‍රතිලාභ සපයමින්, එහි ඉතිහාසයෙහි වාර්තා බිඳිමින් සාර්ථකත්වයට පත් වූ තවත් වසරක් ලෙස 2016 වර්ෂය සලකුණු කර ඇත. ගුවන් ප්‍රවාහන සංඛ්‍යා සහ මූල්‍ය ප්‍රතිඵල අනුව සමාගමේ කාර්යක්ෂමතාවය සහ ලාභදායිතාවය වැඩිකර ගනිමින් වර්ෂය ආරම්භයේ දී පිහිටුවා ගත් උපායමාර්ගික අරමුණු ගණනාවක් අපි ජයග්‍රහණය කර ඇත්තෙමු. නව වාර්තාවක් පිහිටුවමින් සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයේ මිලියන 8.5 සිට මිලියන 9.5 දක්වා 11% කින් සමස්ථ මගීන් ගණන වැඩිවී ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (බ.ජා.ගු), අවහිරතා බිඳ දමමින් සහ සියලු කල්හි පහසුකම් සපයන අතරතුර පාරිභෝගික සහ මගී ආරක්ෂාව තහවුරු කරමින් 1.6 වරක් වූ අතිරික්ත මගී ධාරිතාවකින් කටයුතු කර ඇත.

අපට පසුගිය වර්ෂයේ ආදායම් වාර්තාව වූ රු. බිලියන 15.7 සමග සසඳන විට 17% ක වර්ධනයක් සමග 2016 වර්ෂයේදී රු. බිලියන 18.3 ක විශිෂ්ඨ ආදායමක් උපයා ගැනීමට හැකි විය. 2015 වර්ෂයේදී එක් මගියෙකුට ආදායම වූ රු. 1,846 සිට 1,938 දක්වා වැඩිවීම මෙහි ප්‍රතිඵලය විය. වාණිජ ආදායම විශාල වශයෙන් වර්ධනය වූයේ සමස්ථ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ යහපාලන ප්‍රතිපත්ති ආරක්ෂාවන අයුරින් අවුරුදු 3 සිට 5 දක්වා දිගු කොන්ත්‍රාත් කාලයකට ගුවන් තොටුපල ඉඩපහසුකම් තීරු බදු රහිත සාප්පු සහ අනෙකුත් මෙහෙයුම් කරුවන් වෙත ලබා දීමෙනි. උපායමාර්ගික වර්ධනය කිරීම් සහ මගී පර්යන්ත ගොඩනැගිල්ල තුල සාප්පු පිහිටීම් යලි සකස් කිරීම මගී අත්දැකීම් දියුණු කිරීමට සහ වාණිජ ඵලදාව වැඩි කිරීමට හේතු සාධක විය.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ (ම.රා.ජා.ගු) මෙහෙයුම් පාඩුව වූ රු. බිලියන 2.3 අවශෝෂණය කරමින් සහ කලින් වර්ෂයට සමගාමීව මෙහෙයුම් වියදම් වැඩිවීම 5% ක වැනි අඩු මට්ටමකින් පවත්වා ගනිමින් සමාගමේ මෙහෙයුම් ලාභය රු. බිලියන 5.6 සිට රු. බිලියන 7.7 දක්වා 38% කින් සුවිශේෂී ලෙස වැඩිවීම සඳහන් කිරීම උචිතය. තවදුරටත් පෙර වර්ෂයට වැඩි 191% ක වර්ධනයක් සහිතව ඉහළම බදු පෙර ලාභය වූ රු. බිලියන 6.9 ක් වාර්තා කිරීමට සමාගමට හැකිවිය. මේ සඳහා ප්‍රධාන දායකත්ව සාධකයන් වූයේ කෙටිකාලීන සහ දිගුකාලීන ආයෝජන මත රු. බිලියන 1.0 සිට රු. බිලියන 1.8 දක්වා 79% කින් වර්ධනය වූ ආයෝජන ආදායම් සහ පෙර වර්ෂය සමග සසඳන විට එ.ජ. ඩොලරයට එරෙහිව වාර්තා කරන මුදලේ සුළු අඩුවීම හේතුවෙන් රු. බිලියන 3.5 සිට රු. බිලියන 2.0 දක්වා විනිමය පාඩුව අඩුවීමයි.

සමලෝචිත වර්ෂය තුලදී ගුවන් යානා අනතුරු සහ මගීන් අනතුරට පත්වීම් වාර්තා නොවූ බව ප්‍රකාශ කිරීමට මම සතුටුවෙමි. 60,000 කට වැඩි ජාත්‍යන්තර ගුවන් යානා සංචලන බ.ජා.ගු සමග සම්බන්ධ වූ අතර එය 2015 වර්ෂය හා සැසඳීමේදී 10% ක වර්ධනයකි. එසේම ගුවන් භාණ්ඩ පරිමාව මෙ.ටො. 2,48,000 දක්වා ගෙන එමින් වර්ධනය 14% ක් ලෙස වාර්තා විය. පියාසර සංචලන 35,118 ක් ලෙස වාර්තා වූ අතර එය 2015 වර්ෂයේ 32,694 සමග සසඳන විට 7% ක වර්ධනයක් විය. පසුගිය වර්ෂයේ වාර්තා දෙගුණ කරමින් අභ්‍යන්තර ගුවන් ගමන් මගින් 30,000 කට වැඩියෙන් ආකර්ෂණය කර ගෙන ඇත.

රජය සතු වගකිව යුතු ආයතනයක් ලෙස අපි රු. බිලියන 1.5 ක් ලාභාංශ ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවා ඇති අතර සියළු ව්‍යවස්ථාපිත ගෙවීම් නිසිකලට පියවා ඇත්තෙමු. සමස්ථයක් ලෙස 2016 වර්ෂයේදී ධනාත්මක මෙහෙයුම් ප්‍රතිඵල සමග අපි ඉතා හොඳින් කටයුතු කර ඇත්තෙමු.එසේම අනාගතයේදී අපගේ උනන්දු පාර්ශවන් වෙත වඩා හොඳ ප්‍රතිඵල ලබා දීම සඳහා අපගේ ආයෝජන සැපයුම් මාර්ග නොකඩවා ක්‍රියාත්මක කරමින් සිටිමු.

## අභියෝග තුලින් සංවර්ධනය

වර්ෂය තුල ගනු ලැබූ සංවර්ධන මුල පිරීම් සඳහා ඉහත සඳහන් විශිෂ්ඨ ප්‍රතිඵල ශක්තිමත් වේදිකාවක් සපයයි. අභ්‍යන්තර ගුවන් සේවා සංවර්ධනය කරනු පිණිස 2016 වර්ෂයේදී සිවිල් සහ හමුදා ඒකාබද්ධ මෙහෙයුම් මඩකලපුව ගුවන් තොටුපලේදී දියත් කළ අතර සේවා සපයන්නා ලෙස ගු.ගු.සේ පත්කරන ලදී. අභ්‍යන්තර සිවිල් ගුවන් මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාවන් සහ පහසුකම් දැනටමත් ක්‍රියාත්මක වෙමින් තිබේ. 2016 දී බ.ජා.ගු හි ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වන ධාවන පථයේ මතුපිට ඇතිරීමේ ව්‍යාපෘතිය සහ බ.ජා.ගු ව්‍යාප්ත කිරීම සඳහා වූ දෙවන අදියරේ දෙවන පියවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදී.

බ.ජා.ගු ධාවන පථයේ මතුපිට ඇතිරීම දිගු කලක් ගත වූවක් වූ අතර එ. ජ. ඩොලර් මිලියන 48 ක් සඳහා වූ ව්‍යාපෘතියට අදාල ගිවිසුම 2016 සැප්තැම්බර් 02 වන දින අත්සන් කරන ලදී. අරමුදල් සැකසීම සිදුවූයේ කොන්ත්‍රාත් වටිනාකමෙන් 85% ක් HSBC හොංකොං බැංකුවෙන් සහ දේශීය කොටස වූ 15% ගු.ගු.සේ මගින් වශයෙනි. 2017 ජනවාරි 6 වන දින පිළිසකර කිරීමේ වැඩ ආරම්භ කළ අතර නිශ්චිත කාල සටහනට අනුව 2017 අප්‍රේල් 6 දින ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. වසර 30 කට පෙර මෙහෙයුම් පටන් ගත් කාලයේ සිට එකම ධාවන පථය වූ මෙහි පළමු පිළිසකර කිරීම මෙය විය. ජාතික වශයෙන් වැදගත් වූ මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වූයේ තාර දැමූ කොටසේ හානි වූ තැන් සහ ගුවන් ධාවන පථයට පිවිසුම් මාර්ග පිළිසකර කිරීමත්, එයාර් බස් 380 වැනි විශාල යානාවලට පහසු වන පරිදි ධාවන පථය මීටර් 60 සිට 75 දක්වා දෙපසින් පුළුල් කිරීමත්ය. වියලි කාලගුණය මෙන්ම මගින් හට වන අපහසුතා අවම කිරීම සැලකිල්ලට ගනිමින් මාස තුනක කාලයක් පුරා දිනකට පැය 8ක් මතුපිට ඇතිරීමේ කටයුතු සඳහා ධාවන පථය මෙහෙයුම් සඳහා වසා තබන ලදී. වැඩි දුරටත් මෙහෙයුම් සඳහා වන අවහිරය අඩුකිරීම සඳහා ම.රා.ජා.ගු සහ රත්මලාන ගුවන් තොටුපලවල් ගුවන් සේවා සඳහා පහසුකම් සපයමින් පූර්ණ සූදානමකින් තබන ලදී. මෙහෙයුම් සඳහා අනෙකුත් ගුවන් තොටුපලවල් දවස මුළුල්ලේම ක්‍රියාත්මක වීම මගින් ගුවන් යානා සඳහා තම හැරවුම් සම්බන්ධතා පහසුවෙන් ලබාගැනීම සහ තාක්ෂණික නැවතුම් පහසුවෙන් ලබා ගැනීම සහතික කරන ලදී. වසා තැබූ කාලය තුල රත්මලාන ගුවන් තොටුපලින් ව්‍යාපාරික ජෙට් ගුවන් යානා සංචලනය හසුරුවන ලදී. ධාවන පථයේ සහ ගුවන් අංගනයේ ආලෝක පද්ධතිය හැලජන් ලාම්පු ඉවත් කොට LED බල්බ් මගින් ප්‍රතිසම්පාදනය කළ අතර විදුලි පරිභෝජනයේ ඉතිරියක් වන අතරම ගුවන් නියමුවන් හට ඕනෑම කාලගුණික තත්වයක් යටතේ ගුවන් ධාවන පථය දැක ගැනීමට එමගින් පහසු කරවයි. බ.ජා.ගු හි මෙහෙයුම් සීමා වීම නිසා සිදුවූ අපහසුතාවය වෙනුවෙන් අපි අවංකවම අපගේ මගීන්ගෙන් සහ උනන්දු පාර්ශවයන්ගෙන් සමාව ඉල්ලන අතර මෙම අවහිරතා ජයගැනීම පිණිස සෑම කෙනෙකු විසින්ම දෙනු ලැබූ සහයෝගය වෙනුවෙන් ස්තූති කරන්නෙමු.

බ.ජා.ගු දෙවන අදියරේ පියවර 2 ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු පිරිවැය එ. ජ. ඩොලර් මිලියන 700 ක් වන අතර එයට ව. මී. 180,000 ක් සහිත දෙමහල් පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම, අවහිරයකින් තොර ප්‍රවේශයක් සැපයීමට සැලසුම් කළ ගුවන් මගී මණ්ඩප දෙකක් සහ කුළුණු මතින් ඉදිවෙන මාර්ගයක් ඇතුලත් වේ. මෙය ශ්‍රී ලංකාව ජාත්‍යන්තරයට විවෘත වන දොරටුවක් බවට පත්වනු ඇත. පවතින පර්යන්ත ගොඩනැගිල්ලේ හැසිරවීමේ ධාරිතාව මිලියන 6 ක් වුවත් බ.ජා.ගු දැනට වර්ෂයකට මගීන් මිලියන 9 කට වඩා හසුරුවයි. විශේෂයෙන් වැඩි සේවා ඉල්ලුම් පවතින අවස්ථාවල පරීක්ෂණ කවුන්ටර්වල දිගු පෝලිම් සහිතවීම, පැමිණීමේ ගමන් බඩු ඉවත්කර ගැනීමේ ප්‍රදේශයෙහි ප්‍රමාණවත් නොවන ධාරිතා පහසුකම් ආදිය නිසා ඇතිවන මගී සේවා ප්‍රමාදයන් හේතුවෙන් ගුවන් තොටුපල පීඩාවිඳියි. 2020 දී ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු දැනට මගීන්ට සහ ගුවන් යානාවලට සිදුවන දුෂ්කරතා නිසා ඇතිවන තදබදය අඩුකරමින් ගුවන් තොටුපලට වර්ෂයකට මගීන් මිලියන 15 ක් හැසිරවීමට හැකියාව ඇති වන අතර පහසුව සහ ආරක්ෂාව වර්ධනය කරන අතරතුර වැඩි වන ඉල්ලුමට සැපයීමටද හැකියාව ඇති වෙයි. බ.ජා.ගු දෙවන අදියරේ පියවර 2 සඳහා අරමුදල් JICA විසින් සපයනු ලබන අතර එයට අවුරුදු 40 ක පසු ගෙවුම් කාලයක් සහ වසර 10 ක සහන කාලයක් ඇතුලත් වන අතර පොලී අනුපාතය වසරකට 0.2% ක් වේ. 2012 මාර්තු මාසයේදී සහ 2016 මාර්තු මාසයේදී පිළිවෙලින් ජපන් යෙන් බිලියන 29 කට සහ ජපන් යෙන් බිලියන 45 කට ගු.ගු.සේ සහ JICA අතර ණය ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදී. 2017 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ඇත. ව්‍යාපෘති සැලසුම නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුගත වෙමින් සූර්ය බල ශක්තිය, LED ආලෝකය, ප්‍රතිචක්‍රීය කළ ජලය සහ වැසි ජලය රැස් කිරීම වැනි බොහෝ පාරිසරික හිතකාමී මූලිකයන් භාවිතා කරන හරිත ගුවන් තොටුපල සංකල්පය මත පදනම් වේ.

ශ්‍රී ලංකාවේ එකම වාණිජ ගුවන් තොටුපල මෙහෙයුම්කරුවා ලෙස අපගේ අභියෝගය වන්නේ, අපගේ ගුවන් තොටුපලවල් හරහා ගමන් කරන බැව් දැනෙන ආකාරයේ වඩා හොඳ අත්දැකීමක් තහවුරු කරන අතරම නිසි ගුවන් තොටුපල යටිතල පහසුකම් සපයමින් අපගේ ගනුදෙනුකරුවන් හට සහයෝගය දීමයි. විදේශීය ණය සමග වූ ඉහත සඳහන් ආයෝජන මගින් වඩා හොඳ පර්යන්ත සහ ගුවන් අංශයේ පහසුකම් සහ අපගේ දිගුකාලීන අරමුණු අත්පත් කරගැනීම සඳහා වැඩි දියුණු කළ සේවා සමග නව සහ උසස් යටිතල පහසුකම් සැපයීමට අපට හැකියාව ලබා දෙනු ඇත.

ගු.ගු.සේ හි වර්ධනයේ කථාන්තරය පිළිබඳ ඉහත පරිච්ඡේදය මහත් විශ්වාසයකින් සහ උද්‍යෝගයකින් කේන්ද්‍රගත කරන අතරම ඉහළ වර්ධනයක් උදෙසා මෙහෙයවීමට සහ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට අපගේ ඉහත සඳහන් සියළු උපායමාර්ග ඉදිරි වර්ෂ සඳහාද අඛණ්ඩව පවතී.

## වාණිජමය රාජ්‍ය ව්‍යවසායයක් ලෙස අනාගතය

මූල්‍ය සංයමය වැඩිදියුණු කිරීමේ අරමුණින් සහ රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන් (SOBE) ශක්තිමත් කිරීමේ අරමුණින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නිර්දේශය මත 2017 මාර්තු 15 වන දින ගු.ගු.සේ, මුදල් අමාත්‍යාංශය සහ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සංස්ථාමය අභිප්‍රායයන් පිළිබඳ ප්‍රකාශනය (SCI) සඳහා

වසර තුනක ත්‍රෛයිපාර්ශවීය ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම පෙළඹවීම රටෙහි දළ ජාතික නිෂ්පාදිතයට (GDP) කරනු ලබන දායකත්වය වැඩි කරන ආර්ථික ඉලක්ක සමග සමානව යන අතර වාණිජ රාජ්‍ය ව්‍යවසායක් ලෙස කටයුතු කිරීමට ප්‍රමාණවත් සහ සාධාරණ කළමනාකාරිත්ව සහ මෙහෙයුම් ස්වාධීනත්වයක් ලබා දෙමින් මෙහෙයුම් සහ මූල්‍ය කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා ගු.ගු.සේ ධෛර්යමත් කිරීමත් පහසු කිරීමත් එමගින් බලාපොරොත්තු වේ. ක්‍රියාත්මක කරන දින සිට මාස 6 කට පසු ගිවිසුම සමාලෝචනය කිරීමට යටත් වන අතර මහජන වගකිව යුතු බව වැඩි දියුණු කරන අතරම වර්ධිත සංස්ථාමය පරිචයන්, නවීකරණ මූල්‍යකරණය, ශක්තිමත් සහ විචක්ෂණ මූල්‍ය කළමනාකරණය, තරඟකාරීත්වයට නැඹුරු වීම, ජාත්‍යන්තර යහපත් පරිචයන් සහ ඵලදායී මානව සම්පත් කළමනාකරණය හරහා ක්‍රියාත්මක වීම ගු.ගු.සේ. වෙතින් අපේක්ෂා කරයි.

### මත්තල ගුවන් තොටුපලෙහි අවකාශයන්

ගුවන් තොටුපල ඵලදායී ලෙස පරිහරණය කරනු පිණිස රජයේ මැදිහත් වීම සමග පෞද්ගලික අංශයේ සහභාගිත්වය යටතේ ම.රා.ජා.ගු හි ව්‍යාපාරික අවස්ථා සඳහා ගු.ගු.සේ තවමත් බලාපොරොත්තුවෙන් සිටී. 2016 වර්ෂයේදී විභවයන් ඇති ජාත්‍යන්තර මෙන්ම දේශීය ආයෝජකයින් ගෙන් කැමැත්ත ප්‍රකාශ කිරීම් (EOI) කැඳවූ අතර ස්ථාවර පදනම් සහිත මෙහෙයුම් (FBO), පියාසර පාසැල්, ගුවන් යානා නඩත්තු අලුත්වැඩියා සහ සුපරීක්ෂණ (MRO) සහ ම.රා.ජා.ගු හි අනෙකුත් ගුවන් සේවා ආශ්‍රිත කර්මාන්ත සඳහා විවිධ යෝජනා කිහිපයක් ලැබුනි. උනන්දු පාර්ශව කිහිපයක් සමග සාකච්ඡා පැවැත්වූ අතර තවමත් ඒවා මූලික අදියරේ පවතී. මේ අතරතුර ශ්‍රී ලංකන් ගුවන් සේවය නැවතත් ම.රා.ජා.ගු හි මෙහෙයුම් ආරම්භ කරන ලදී. එසේම Fly Dubai සහ රොටානා ජෙට් ගුවන් සේවය ම.රා.ජා.ගු හි මෙහෙයුම් අඛණ්ඩව කර ගෙන ගිය අතර ශ්‍රී විජය ගුවන් සේවය ඉන්දුනීසියාවට ගුවන් ගමන් සඳහා පොළඹවන ලදී. ම.රා.ජා.ගු මෙහෙයුම් පිළිබඳ මෙම වර්ධනය වීම් මගින් ආයෝජනය මත ප්‍රතිලාභ අර්ථයෙන් ගත් කළ යම් ධනාත්මක බලාපොරොත්තු සලසා දෙයි.

### සමාප්තිය

2016 වර්ෂය ගු.ගු.සේ හට තවත් විශිෂ්ඨ වර්ෂයක් විය. මම අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමට සහ අපගේ සියළුම සේවකයින් හට ඔවුන්ගේ නොසැලෙන බැඳීම සහ කැපවීම වෙනුවෙන් මෙන්ම අනෙකුත් සියළුම උනන්දු පාර්ශවයන් වෙත ඔවුන් විසින් වර්ෂය තුල ලබා දුන් අගනා දායකත්වය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි. පොදු ඉලක්ක කරා කටයුතු කරන නිපුණ පුද්ගලයින්ගෙන් සමන්විත ඉහළ ක්‍රියාකාරීත්වයකින් යුත් කණ්ඩායමක් මෙහෙයවීමට ලැබීම මාගේ භාග්‍යයක් කොට සලකමි. අපගේ සේවකයින් ඉදිරියේ එන අභියෝග ජය ගැනීමට හැකියාවක් ඇති අය බවත් අපගේ උනන්දු පාර්ශවයන්හට නිරතුරුව ඉහළ මට්ටමේ සේවයක් ලබා දෙන බවත් මගේ විශ්වාසයයි. වර්ෂය පුරා තම දූරදර්ශී නායකත්වය සමග මෙහෙයවීම සහ මගපෙන්වීම ලබා දීම වෙනුවෙන් වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ අවංක ප්‍රශංසාව පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම සියළු අවශ්‍ය මෙහෙයවීම්, සමීප සුපරීක්ෂාකාරීත්වය, සමාගමේ කටයුතු පිළිබඳ අධීක්ෂණය සහ අප පිළිබඳ විශ්වාසය තැබීම උදෙසා ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා ගරු අමාත්‍යතුමාට සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට, ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් සහ කාර්ය මණ්ඩලයට, මුදල් අමාත්‍යාංශයට සහ සිවිල් ගුවන් සේවා අධිකාරියට මම ස්තුතිය පළකරමි. අවසාන වශයෙන් ශ්‍රී ලංකා රජයට සහ අනෙකුත් සංවිධානවලට, අපගේ ගුවන් තොටුපලවල සහ මෙහෙයුම්වල වර්ධනය හැකි කිරීම සහ පහසු කිරීම වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි. 2017 වර්ෂය තුලදීත් අපගේ ගමන නොනවත්වා ඉදිරියට ගෙන යාමට බලාපොරොත්තු වෙමි.



ඉන්ජිනේරු එස්. එස්. එදිරිවීර
සභාපති
2017 ජූනි 14



# අධ්‍යක්ෂ මණ්ඩලය

## වමේ සිට දකුණට

| | |
|---|---|
| එන් පී එල් පී ප්‍රනාන්දු | - අධ්‍යක්ෂ |
| එන් ආර් හේවාතන්ත්‍රි | - අධ්‍යක්ෂ |
| එල් ඩබ් ඒ ද සොයිසා | - අධ්‍යක්ෂ |
| කේ වී පී රන්ජිත් ද සිල්වා | - උප සභාපති |
| එස් එස් එදිරිවීර | - සභාපති |



| | |
|---|---|
| ජොහාන් ජයරත්න | - විධායක අධ්‍යක්ෂ |
| එම් සී පී මහීපාල | - සමාගම් ලේකම් |
| ඩබ් එම් අනුරාධ විජේකෝන් | - අධ්‍යක්ෂ |
| ආර් කැටවලගේ | - අධ්‍යක්ෂ |
| ජේ එම් ගුණවර්ධන | - අධ්‍යක්ෂ |

පින්තූරයේ නොමැත:

| | |
|---|---|
| එස් ආර් ආටිගල | - අධ්‍යක්ෂ |
| එස් ඊ ඩබ් ගුණසේකර | - අධ්‍යක්ෂ |




| | | |
|---|---|---|
| වමේ සිට දකුණට : | එස් ඩී ඒ එස් නිශාන්ත | - සමාගමේ වෛද්‍ය නිලධාරී |
| | එල් දහනායක | - ප්‍රධානී මූදල් |
| | ඩබ් එම් පී කරුණාරත්න | - ප්‍රධානී වාණිජ සහ දේපල |
| | එච් එස් හෙට්ටිආරච්චි | - ප්‍රධානී ගුවන් තොටුපල කළමනාකරණ |
| | එම් සී පී මහීපාල | - ප්‍රධානී මානව සම්පත් සහ සමාගම් ලේකම් |

# ජ්‍යෙෂ්ඨ



| | | |
|---|---|---|
| වමේ සිට දකුණට : | ජේ එම් ඒ යූ ජයමාන්න | - ප්‍රධානී විදුලි ඉන්ජිනේරු |
| | යූ ජේ ලොකු ආරච්චි | - ප්‍රධානී තොරතුරු තාක්ෂණ |
| | එම් රත්නසිංහ | - ප්‍රධානී නීති |
| | ඒ අයි බී කරුණාරත්න | - ප්‍රධානී ව්‍යාපෘති |
| | පී විතානගේ | - ප්‍රධානී සිවිල් ඉන්ජිනේරු (සැලසුම් සහ නිර්මාණ) |
| | ජේ එම් ද කෲස් රූබින් | - ප්‍රධානී ගෘහ නිර්මාණ, භූමි අලංකරණ සහ අභ්‍යන්තර නිර්මාණ |




වමේ සිට දකුණට:

| | |
|---|---|
| එච් ඒ ඒ කේ එම් සෙනෙවිරත්න | - ප්‍රධානී සිවිල් ගුවන් සේවා පුහුණු කිරීම් |
| ඩබ් සී තිසේරා | - ප්‍රධානී ගගන නාවික සේවා |
| ඩබ් විමල්ශාන්ති | - ප්‍රධානී ඉලෙක්ට්‍රොනික සහ ගගන නාවික ඉංජිනේරු |
| ඒ ඩී එන් ආර් ද  අල්විස් ගුණසේකර | - ප්‍රධානී ගිනි නිවීම් සහ මුදවා ගැනීමේ සේවා |
| කේ එච් සී කුමාරසිංහ | - ප්‍රධාන සම්බන්ධීකාරක අභ්‍යන්තර ගුවන් තොටුපල ව්‍යාපෘති |

# කළමනාකාරීත්වය



වමේ සිට දකුණට :

| | |
|---|---|
| ආර් ඩබ් විජේසිංහ | - ප්‍රධානී යාන්ත්‍රික ඉංජිනේරු |
| යූ එස් ජාගොඩ | - ප්‍රධානී සිවිල් ඉංජිනේරු (නඩත්තු) |
| ඩබ් පී සිරිල් | - ප්‍රධානී අභ්‍යන්තර විගණන සහ තත්ව සහතික |
| එච් පී එල් සිරිමාන්න | - වැඩ බලන ප්‍රධානී සැපයුම් දාම කළමනාකරණ |
| එස් එම් ඩී විජේසූරිය | - වැඩ බලන ප්‍රධානී ආරක්ෂක සේවා |

සමාගමේ කටයුතු පිළිබඳ

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

“2016 වර්ෂයේදී පවා අපි ගු.ගු.සේ ඉතිහාසයේ තවත් සුවිශේෂී වසරක් තුලින් කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් අඛණ්ඩව පැමිණියෙමු. මෙම ජයග්‍රහණය විශිෂ්ඨත්වය උදෙසා කැපවීමට සහ ශ්‍රේෂ්ඨ නායකත්වයක් යටතේ කේන්ද්‍රගත වූ ප්‍රයත්නයන්ට සාක්ෂියක් වේ. සැකයක් නොමැත, මෙය ආසියානු කලාපය තුළ කාර්යක්ෂම බවින් හා සුහදත්වයෙන් ප්‍රමුඛතම ගුවන් සේවා කේන්ද්‍රස්ථානය වීම දෙසට වූ මාවත පැහැදිලි කිරීම සහ ඒ දෙසට අපගේ ගමන වේගවත් කිරීම කරනු ඇත.”

## සමාගම පිළිබඳව

ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම (ගු.ගු.සේ) ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් තොටුපල කළමනාකරනය සහ සංවර්ධනය කිරීමට ව්‍යවස්ථාපිත බලය ලත් පූර්ණ වශයෙන් රජය සතු සමාගමකි. මෙහි ඉදිරිපත් කර ඇති තොරතුරු 2007 අංක 7 දරන සමාගම් පණතේ අවශ්‍යතා වලට අනුව සහ ප්‍රශස්ථ ගිණුම්කරණ පරිචයන්ට අනුව ඉදිරිපත් කර ඇත.

## ප්‍රධාන කාර්යයන්

වසර තුලදී ගු.ගු.සේ සමාගමේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් නොවෙනස්ව පැවතුනි. 2010 නොවැම්බර් 4 දින ගැසට් කළ 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පණතින් ලබාදුන් බලපත්‍රය යටතේ පහත සඳහන් ගගන නාවික සේවා පිළිබඳ එකම ව්‍යවස්ථාපිත සේවා සම්පාදකයා ලෙස ගු.ගු.සේ සමාගම අඛණ්ඩව තම භූමිකාව සම්පූර්ණ කර ඇත.

- බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (බ.ජා.ගු), මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල (MRIA) සහ රත්මලාන ගුවන් තොටුපල සංවර්ධනය කිරීම, මෙහෙයවීම සහ පවත්වා ගෙන යාම. අභ්‍යන්තර ගුවන් සේවා සංවර්ධනය කිරීමේ රජයේ උපායමාර්ගයට සමපාතික වෙමින් මඩකලපුව ගුවන් තොටුපලෙහි මෙහෙයුම් කටයුතු 2016 වර්ෂය තුල ගු.ගු.සේ වෙත පවරන ලදී.
- ඉහතින් දක්වන ලද ගගන යාත්‍රාංගනයන්හි සුපරීක්ෂාව, මුදවා ගැනීම් සහ ගිනි නිවීම් සේවා මෙන්ම ගුවන් ගමන් ආරක්ෂණ සේවා සැපයීම සහ නඩත්තු කිරීම.
- ගුවන් මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා, ගගන නාවික තොරතුරු සේවා, ගගන නාවික සංනිවේදන සේවා සැපයීම සහ කොළඹ ගුවන් තොරතුරු කලාපය තුල (FIR) සියලු ගුවන් යානා සහ මගීන්ගේ ආරක්ෂාවත් සුරක්ෂිතතාවයත් තහවුරු කරමින් සන්නිවේදනය, ගුවන් සංතරණය සහ සුපරීක්ෂාකාරීත්වය සඳහා ගගන නාවික පහසුකම් සැපයීම.

## මෙහෙයුම් සමාලෝචනය

මෙහෙයුම් සහ මූල්‍ය කාර්යසාධනයේ සමාලෝචනයක් සභාපති තුමාගේ සමාලෝචනයෙහි සහ කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණයෙහි (MDA) සවිස්තරාත්මකව පැහැදිලි කර ඇත. සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ මෙම වාර්තා තුලින් සමාගමේ අදාල කටයුතු පිළිබඳව විදහා දැක්වෙයි.

## මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 7 දරන සමාගම් ආඥා පණතට අනුව අප සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ඔවුන් හොඳින් තේරුම් ගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) සහ 2007 අංක 7 දරන සමාගම් ආඥා පණතේ විධිවිධාන වලට අනුකූලව නිරවද්‍ය මූල්‍ය වාර්තා පවත්වා ගෙන යන බව සහතික කිරීම ඔවුන්ගේ වගකීම බව ඔවුන් අවබෝධ කර ගෙන සිටියි.

වාර්තාවේ අංක 95 සිට 127 දක්වා පිටු වල ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වලින් සමාගමේ කටයුතු පිළිබඳව සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉදිරිපත් කරන බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත්වෙයි.

## විගණකවරුන්ගේ වාර්තාව

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණක වරුන්ගේ වාර්තාව අංක 87 සිට 93 දක්වා පිටුවල දක්වා ඇත.

## සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

2016 වර්ෂය තුල ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සුවිශේෂී වෙනස්කම් සිදුවී නොමැත. සමාගම වර්ෂය තුල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) යොදා ගෙන කටයුතු කළ අතර එය කලින් වර්ෂය සමගද අනුකූල විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් අධීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි ආදායම හඳුනාගැනීමේදී සහ ඇගයීමේදී LKAS 18 මගින් ඉල්ලා ඇති පරිදි අමතර ප්‍රකාශන ඉදිරිපත් කොට තිබේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අංක 99 සිට 127 තෙක් වූ පිටුවල දක්වා ඇත.

## ආයතනික සමාජීය වගකීම (CSR)

ගු.ගු.සේ සමාගම විසින් වර්ෂය තුල ආයතනික සමාජීය වගකීම් (CSR) සහ පරිත්‍යාග වෙනුවෙන් වූ මුළු දායකත්වය රු මිලියන 3.2 ක් විය.

## අභ්‍යන්තර පාලන පද්ධතිය

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. සමාගමේ උපාය මාර්ගික ඉලක්ක සහ සංයුක්ත පාලන ආකෘති රාමුව යටතේ වූ ප්‍රතිපාදනවලට අනුකූල වූ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් පද්ධතීන් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය ඇතුලුව සියලු මූල්‍ය සහ මූල්‍ය නොවන කටයුතු මෙම විෂය පථය තුලින් ආවරණයවේ.

## අනාගත සංවර්ධනයන්

ධාවන පථය ඇතිරීම සහ ඒ ආශ්‍රිත වැඩ පිළිබඳ ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ආරම්භ කළ අතර දිගු කාලයක් ප්‍රමාදව පැවති මෙම කාර්‍යය සම්පූර්ණ කරගැනීමට හැකි කරමින් 2016 සැප්තැම්බර් 02 වන දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන ලදී. කොන්ත්‍රාත් වටිනාකමෙන් 85% ක් මුල්‍යනය කරන ලද්දේ එ.ජ. ඩොලර් මිලියන 44 ක විදේශීය ණයක් HSBC Hong Kong බැංකුවෙන් ලබා ගැනීමෙනි. ඉතිරි 15% අභ්‍යන්තර අරමුදල් මගින් මුල්‍යනය කරන ලදී. මෙම ජාතික වැදගත් කමකින් යුත් ව්‍යාපෘතිය 2017 පළමුවන කාර්තුවේදී සාර්ථක ලෙස නිම කරන ලදී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි දෙවන මගී පර්යන්ත ගොඩනැගිල්ල (T2) ඉදිකරමින් වර්ෂයකට මගීන් හැසිරවීමේ වර්තමාන ධාරිතාවය වූ මිලියන 6 තවත් මිලියන 9 කින් වැඩි කිරීම තුලින් වර්ෂයකට මගීන් හැසිරවීමේ ධාරිතාවය මිලියන 15 දක්වා වැඩි කරනු පිණිස, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි යෝජිත ධාරිතා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2017 වර්ෂය තුල මේ වන විටත් ආරම්භ කොට ඇත. ජපාන යෙන් බිලියන 29 ක් සඳහා වූ මුල් ණය ගිවිසුම 2012 දී අත්සන් කළ අතර යෙන් බිලියන 45 ක් සඳහා වූ අමතර ණය ගිවිසුමක් JICA සමග 2016 මාර්තුවලදී අත්සන් කරන ලදී. මෙයට අමතරව බ.ජා.ගු, රත්මලාන සහ මරාජාගු ගුවන් තොටුපලවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ අනුබද්ධිත දේපල සංවර්ධනය කිරීම ඉදිරි පස් වසර සඳහා සැලසුම් කළ ව්‍යාපෘති වන අතර එමගින් රටෙහි ගුවන් සේවා කර්මාන්තයේ ඒකාන්ත වර්ධනයක් සිදු වනු ඇත.

## සමාගමෙහි ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්වය

### ආදායම

සමාගම මෙතෙක් ලැබූ ඉහළම දළ ආදායම ලෙස රු බිලියන 18.3 ක අගයක් වාර්තා කොට ඇත. ආදායම සහ ලාභය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය සමාලෝචනය යටතේ ඉදිරිපත් කර තිබේ.

### මෙහෙයුම් ප්‍රතිඵල

සමාගම 2016 වර්ෂය අවසානයේ රු. බිලියන 6.9 ක බදු පෙර ලාභයක් (PBT) වාර්තා කර තිබේ. මෙය පසුගිය වසර සමග සසඳන විට 191% ක (රු. බිලියන 4.5) සුවිශේෂී වර්ධනයකි. මෙම ප්‍රතිඵලයට හේතුවූයේ ආදායම රු. බිලියන 2.6 කින් වැඩිවීම සහ එ. ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය සෙමින් සිදුවීම මගින් මූල්‍ය ආදායමට දායකත්වය වැඩිවීම සහ ආදායම් වර්ධනය සමග සසඳන විට වියදම පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වීමත්ය. කලින් වර්ෂය හා සසඳන විට බදු පසු ලාභය (PAT) 747% ක වැඩි වීමක් වාර්තා කරයි. ඉහත සඳහන් කරුණු වලට අමතරව බදු පසු ලාභයේ වැඩිවීමට, 2015 වර්ෂයේ වාර්තා කළ බදු ප්‍රතිපාදනය වූ රු. බිලියන 1.6 හා සැසඳූ කළ රු. මිලියන 11 ක බදු ප්‍රතිපාදනය ප්‍රතිවර්තනය වීමද හේතු වී ඇත.

වසර දෙක සඳහා සංඛ්‍යා සටහන් සංසන්දනය කිරීම පහත වගුවෙන් දක්වයි.

| විස්තරය | **2016**<br>රු.මිලියන | **2015**<br>රු.මිලියන |
|---|---:|---:|
| සියලුම මෙහෙයුම් වියදම් ගෙවීමෙන් සහ ක්ෂය වෙන් කිරීමෙන් පසු දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර ලාභය | 6,909 | 2,378 |
| අඩුකළා: බදු වෙන්කිරීම | 11 | (1,561) |
| වර්ෂයේ බදු පසු ලාභය | 6,920 | 817 |
| ආයුගණක උපකල්පන වෙනස් වීම් මත පැනනගින වාසි හෝ පාඩු | 4 | 124 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - |
| මුළු විස්තීර්ණ ආදායම | 6,924 | 941 |

### සංචිත

රඳවාගත් ඉපයුම්වල වැඩිවීම සමග සමාගමේ සංචිත 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 16,416 ක් දක්වා වැඩි වී ඇති අතර 2015 වර්ෂය සඳහා එය රු. මිලියන 10,992 ක් විය. සමාගමේ සංචිතවල චලනය පිළිබඳව අංක 97 පිටුවේ දැක්වෙන ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ දක්වා ඇත.

### ලාභාංශ

වර්ෂය තුල අධ්‍යක්ෂවරුන් 2015 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 350 ක අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත් කොට ගෙවා ඇත. 2016 සහ 2017 වර්ෂ සඳහා රු. මිලියන 1,150 ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත. 2016 සඳහා වූ අවසන් ලාභාංශ වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කිරීමට නියමිතය.

### ප්‍රාග්ධන වියදම

2015 වසරේ වූ රු. මිලියන 617 සමග සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ ප්‍රාග්ධන වියදම රු. මිලියන 2,400 ක් විය. වර්ෂය තුල දේපල. පිරියත සහ උපකරණ වල වෙනස් වීම් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 11 යටතේ ඉදිරිපත් කර ඇත.

## ශ්‍රී.ශ්‍රී.සේ විසින් රජයේ ආදායමට දායකත්වය




## ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කිරීමට අවශ්‍ය ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනට පසුව සිදුවී නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

සාමාන්‍ය පුරෝකථන ක්‍රම අනුගමනය කිරීමෙන්, අනාගත කටයුතු හා අවදානම් තත්වයන් සැලකිල්ලට ලක් කිරීමෙන් සහ යෝග්‍ය විමර්ශන කටයුතු කිරීමෙන් අනතුරුව ඉදිරි කාලය තුල තම මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් තරම් සම්පත් සහ ණය ලබා ගැනීමේ හැකියාව සමාගම සතු බව අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. ඒ අනුව සියලුම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කර ඇත.

## අසම්භාව්‍යයන් සහ බැඳීම්

2016 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය බැරකම් සහ ප්‍රාග්ධන බැඳීම් පිළිබඳ තොරතුරු අංක 126 සහ 127 පිටුවල ඇති අංක 27 සහ 28 මූල්‍ය ප්‍රකාශන සටහන්වල ඉදිරිපත් කර ඇත.

## ආයෝජන

වාර්තා කරන දිනට පවතින දිගුකාලීන සහ කෙටිකාලීන ආයෝජන පිළිබඳ පැහැදිලි විස්තරයක් මූල්‍ය ප්‍රකාශන සටහන් 14 සහ 18 (පිටු අංක 120 සහ 122) යටතේ දක්වා ඇති අමතර ආයෝජනයක් වූ රු. බිලියන 6.2 ක් වර්ෂය තුල ඉහළ එලදාවක් සමග ණයකර සහ භාණ්ඩාගාර බිල්පත් වල යොදවා තිබේ.

## කොටස් ප්‍රාග්ධනය

සමාගමෙහි කොටස් ප්‍රාග්ධනය සමාගමේ ගිණුම් වල දක්වා ඇති අතර එය එකක් රු 100 බැගින් වූ සාමාන්‍ය කොටස් වලින් යුක්තවේ. 2016 දෙසැම්බර් 31 දිනට කොටස් හිමිකාරීත්වය පහත සඳහන් පරිදි වේ.

| කොටස් ගණන | වටිනාකම (රු) | දරන්නේ |
|---|---|---|
| 200,000 | 20,000,000 | මහා භාණ්ඩාගාර ලේකම් |
| 1 | 100 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් |
| 1 | 100 | සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| **200,002** | **20,000,200** | |

## අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල තොරතුරු

### අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂමණ්ඩලය පත් කරන ලද්දේ 2015 වර්ෂය තුලය. 2016 මාර්තු 17 දින නව අධ්‍යක්ෂක වරයෙක් 2016 වර්ෂය සඳහා පත් කරන ලදී. මූල්‍ය වර්ෂය අවසානයේ නිලතල දැරූ අධ්‍යක්ෂවරුන්ගේ ලැයිස්තුවක්, දරන හෝ දැරූ නිලය, පත්වීම් කළ දිනය, ඉල්ලා අස්වීම් සහ නැවත පත් කිරීම් ආදී විස්තර සමගින් පහතින් දක්වා ඇත. සභාපති වරයා පත්කිරීම (79 වගන්තිය) සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත්කිරීම (82 වගන්තිය) ශ්‍රී.ශ්‍රී.සේ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඉහතින් සඳහන් කළ වගන්ති ප්‍රකාරව සිදු කරන ලදී.

2016 මූල්‍ය වර්ෂය අවසානයේදී ධූර ඉසිලූ අධ්‍යක්ෂක වරුන් පිළිබඳ විස්තර

| නම | තනතුර | පත්වීමේ දිනය |
|---|---|---|
| එස්. එස්. විදිරිවීර | සභාපති | 12/10/2015 |
| කේ. වී. පී. ආර්. ද සිල්වා | උප සභාපති | 12/10/2015 |
| ජොහාන් ජයරත්න | විධායක අධ්‍යක්ෂ | 12/10/2015 |
| එන්. ආර්. හේවතන්ත්‍රි | අධ්‍යක්ෂ | 12/10/2015 |
| එන්. පී. එල්. පී. ප්‍රනාන්දු | අධ්‍යක්ෂ | 12/10/2015 |
| ඩබ්. එම්. ඒ. විජේකෝන් | අධ්‍යක්ෂ | 12/10/2015 |
| එස්. ඊ. ඩබ්. ගුණසේකර | අධ්‍යක්ෂ | 12/10/2015 |
| එල්. ඩබ්. ඒ. ද සොයිසා | අධ්‍යක්ෂ | 16/11/2015 |
| එස්. ආර්. ආටිගල | අධ්‍යක්ෂ | 16/11/2015 |
| ආර්. කැටවලගේ | අධ්‍යක්ෂ | 16/11/2015 |
| ජේ. එම්. ගුණවර්ධන | අධ්‍යක්ෂ | 17/03/2016 |

## අධ්‍යක්‍ෂ මණ්ඩල උප කමිටු

මෙහෙයුම් සහ අභ්‍යන්තර පාලනය සඳහා වඩා හොඳ මග පෙන්වීමක් සහ අධීක්‍ෂණයක් ඇති කරනු වස් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විගණන සහ කළමනාකරන කමිටුව (AMC) පිහිටුවා තිබේ. මෙය අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබූ විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වෙයි. එල්. ඩබ්. ඒ. ද සොයිසා, එස්. ආර්. ආටිගල සහ එන්. පී. එල්. පී. ප්‍රනාන්දු යන මහත් වරුන් සමාලෝචිත වර්ෂය තුල මෙම කමිටුවේ සේවය කරන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී ඒ.ඩී. දිල්රුක්ෂි මහත්මිය සහ අභ්‍යන්තර විගණන සහ තත්ව සහතික අංශ ප්‍රධානි සී. වන්නිගම මහතාද සමාලෝචිත වර්ෂය තුල කමිටුවේ සාමාජිකත්වය දැරීය. අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා සහ ගු.ගු.සේ ගනුදෙනු ආශ්‍රිත අවදානම අවම කිරීම සඳහා AMC විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කරන ලදී. මෙයට අමතරව ISO 9001:2008 ප්‍රතිපාදනවලට සමපාතීව ගු.ගු.සේ හි තත්ව කළමනාකරණ පද්ධතිය (QMS) ස්ථාපිත කරන ලදී. ප්‍රමිතිය ගු.ගු.සේ හි ප්‍රධාන ක්‍රියාවලීන් ආවරණය කරන ලදී. වර්ෂය තුලදී සැලසුම් කළ සියළුම QMS අභ්‍යන්තර විගණන කටයුතු සියළුම අංශ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලදී.

## කොටස් සහ ණයකර සම්බන්ධව අධ්‍යක්‍ෂවරුන්ගේ ගනුදෙනු හෙළිදරව් කිරීම

කිසිදු අධ්‍යක්‍ෂවරයෙකු කොටස් හෝ ණයකර හිමිකම් දරන්නේ නැත.

## කොන්ත්‍රාත්තු සහ යෝජිත කොන්ත්‍රාත්තු සම්බන්ධව අධ්‍යක්‍ෂවරුන්ගේ සබඳතා

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ ව්‍යාපාරික කටයුතු වලට අදාල කොන්ත්‍රාත්තු හෝ යෝජිත කොන්ත්‍රාත්තුවලට කිසිදු අධ්‍යක්‍ෂවරයෙක් සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වී නොමැත.

## අධ්‍යක්‍ෂවරුන්ගේ දීමනා හා අනෙකුත් ප්‍රතිලාභ

විධායක අධ්‍යක්‍ෂවරුන් තිදෙනෙකු හට (සමාගම් ව්‍යවස්ථාවලියේ 77 වගන්තිය අනුව පත් කළ) රු. මිලියන 7.7 ක් දීමනා ලෙස වර්ෂය තුලදී ගෙවා ඇත. මෙයට අධ්‍යක්ෂ දීමනා, සේවක අර්ථ සාධක, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, සංග්‍රහ දීමනා ප්‍රති පූරණය කිරීම, දුරකථන, නිවාඩු සඳහා ගෙවීම සහ අනෙකුත් දීමනා ආදී වශයෙන් වූ සියලු මූල්‍ය ප්‍රතිලාභ ඇතුලත් වේ. විධායක අධ්‍යක්‍ෂවරුන් නොවන අයහට අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වලට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් සහ අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු ලෙස රු. මිලියන 1.24 ක් වර්ෂය තුලදී ගෙවා ඇත.

## සාමුහික පාලනය

සියලු උනන්දු පාර්ශවයන් සමග දීර්ඝ කාලීන සම්බන්ධතාවයක් පවත්වා එය වැඩි දියුණු කිරීම සඳහා සමාගමෙහි සමස්ථ පාලන ක්‍රියාවලියේ ඵලදායිතාවය සහතික කිරීමේ වගකීම අධ්‍යක්‍ෂවරුන් දරයි.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට, වෙනත් නියාමන ආයතනවලට හා සේවකයින්ට කළ යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලය තුල ගෙවූ බවට හෝ ප්‍රතිපාදන සැලසූ බවට තමන්ගේ උපරිම දැනුමට හා විශ්වාසයට අනුව අධ්‍යක්‍ෂ මණ්ඩලය සහතික කර ඇත.

## විගණකවරු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය සඳහා 2015 මැයි 15 දින සිදු කළ 19 වන සංශෝධනයට අනුව විගණකාධිපතිවරයා හට, 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ හෝ වෙනත් ඕනෑම නීතියක් යටතේ ස්ථාපිත සියළුම රාජ්‍ය ආයතන විගණනය කිරීමේ බලය පවරා ඇත. ඒ අනුව 2016 වර්ෂය වෙනුවෙන් ගු.ගු.සේ. සමාගම විගණනය කිරීම විගණකාධිපති වරයා විසින් සිදු කරන ලදී.

කාලච්ඡේදය සඳහා විගණන ගාස්තුව රු. 750,000 ක් (2015 දී රු 940,753 කි) වූ අතර විගණන ආශ්‍රිත සේවා සඳහා හෝ විගණන නොවන සේවා සඳහා විගණක වරුන් හට වෙනත් කිසිදු ගෙවීමක් කර නොමැත.

## වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2017 ජූනි 30 දින ප.ව. 3.00 ට ගු.ගු.සේ සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට නියමිතය.

## කෘතඥතාවය පලකිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය, සමාගම විසින් අත්පත් කරගත් සාර්ථකත්වයන් හිදී පෙන්නුම් කළ දැඩි ප්‍රයත්නය, ධෛර්යය සහ වෘත්තීයමය භාවය පිළිබඳව කළමනාකරණ කණ්ඩායමට සිය ස්තුතිය පළකරයි. උනන්දු පාර්ශවකරුවෙකු වෙමින් සහ සමාගම නියාමනය කරමින් අප වෙත දෙනු ලැබූ නිරන්තර සහයෝගය වෙනුවෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට සහ අනෙකුත් ආයතනවලට අපගේ විශේෂ කෘතඥතාවය හිමිවේ. තවදුරටත් අපවෙත අඛණ්ඩව විශ්වාසය තැබූ අපගේ ගනුදෙනුකරුවන් ඇතුළුව සමාගමේ ජයග්‍රහණ සඳහා දායක වූ සියල්ලන්ටම අපගේ ප්‍රශංසාව පළකිරීමට

කැමැත්තෙමු. අවසාන වශයෙන්, නමුත් අඩුවක් නොමැතිව ගු.ගු.සේ. සමාගමේ සියළුම කාර්යමණ්ඩලයට ඔවුන්ගේ පූර්ණ කැපවීම, අවංකභාවය සහ දැඩි ලෙස වෙහෙසී වැඩ කිරීම වෙනුවෙන් අපගේ කෘතඥතාවය පලකරමු.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි



ඉංජිනේරු එස්.එස්. එදිරිවීර

සභාපති

2017 ජූනි 07 දින



# බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල
# සංවර්ධන ව්‍යාපෘතිය



"ඉදිරි වසර කිහිපය තුලදී මගීන් මිලියන 15 කට වැඩි ප්‍රමානයක් හැසිරවීම යථාර්තයක් වනු ඇත..."

## කළමනාකරණ

# සාකච්ඡාව සහ විශ්ලේෂණය

පොදු දැක්මක් ලෙසට ගු.ගු.සේ ගමන
2016 දී **“E16”** සමග
**වර්ධන මාවතට පිවිසෙමින්**






11% ක වර්ධනයක් සමග මගීන්

**9,466,248**




10% ක වර්ධනයක් සමග ගුවන් සංචලන

**61,637**



14% ක වර්ධනයක් සමග ගුවන් භාණ්ඩ

මෙ.ටො **248,347**

# ලෝක ගුවන්තොටුපල ගමනාගමන වාර්තාව - 2015



ලෝක ගුවන් මගී සංඛ්‍යාව
**බිලියන 7.2** දක්වා වැඩි විය.
**එය 6.4% ක වර්ධනයකි.**








**ගුවන් තොටුපල 37 ක**
**මිලියන 40** ඉක්මවූ ගුවන් මගීන්










ලෝක ගුවන් ගමන් සංචලන
**මිලියන 88.5.** එය 2.0% ක වර්ධනයකි.

*මූලාශ්‍රය : ACI ලෝක ගුවන් තොටුපොල ගමනාගමන වාර්ෂික වාර්තාව (WATR) - 2015*

# 2016 වසර සඳහා ලෝක ගුවන්තොටුපල ගමනාගමන පුරෝකථනය

## 2015-2040 මගී ගමනාගමන වර්ධනය

(සංයුක්ත කළ වාර්ෂික වර්ධන අනුපාතිකය)




ලෝක ව්‍යාප්ත සංයුක්ත වර්ධනය (CAGR) 4.9%

2028 න් පසුව ජාත්‍යන්තර මගී ගමනාගමනය,
ගෘහස්ථ ගමනාගමනය පසු කරනු ලබයි




2029 දී ලෝක මගී ගමනාගමනය
**දෙගුණයක් වී බිලියන 14 ක් ඉක්මවීම**




**ගුවන් මගී ගමනාගමනයේ ඉදිරි වර්ධනය**
නැගී එන වෙළඳපොලවල් තුලින් උපත ලබයි

## වෙළඳපොළ කොටස් (%)




## දිගු කාලීන භාණ්ඩ හා සංචලන වර්ධනය

(CAGR 2015-2040)

මුළු ගුවන් භාණ්ඩ
**2.3%**

මුළු ගුවන් භාණ්ඩ සංචලන
**2.5%**

*මූලාශ්‍රය : ACI සංයුක්ත කළ ලෝක ගුවන් තොටුපල ගමනාගමනය (WATF) - 2016-2040*

## ගෝලීය ආර්ථිකය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික දැක්ම අනුව, ලිහිල් ආර්ථික කටයුතු නිරතුරුව වෙළඳපල සහ සංවර්ධන ආර්ථිකයන් මතුකිරීමට යොමු වීමෙන් දියුණු ආර්ථිකයන් අපේක්ෂා කළ යහපතට වැඩි ශක්තිමත් බවක් තහවුරු කර ගැනීමත් සමග, 2016 දෙවන භාගයේදී ගෝලීය ආර්ථිකයේ පිබිදීමක් ඇති විය. ඉල්ලුම මත පදනම් වූ වෙළඳපල සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් උත්තේජනය කරනු පිණිස අඛණ්ඩ උත්සාහයක යෙදුන දියුණු ආර්ථිකයන්, සාමාන්‍යයෙන් ගෝලීය මූල්‍ය වෙළඳපලෙහි දැඩි කොන්දේසි මගින් වන බලපෑම නොසලකා එක් එක් රටෙහි ගෙවුම් ශේෂ තත්වයන්, මූල්‍ය අවස්ථා සහ ආයෝජන ක්‍රියාකාරකම් මත රඳා පවතිමින් විවිධ වර්ධනයන් සහ විනිමය අනුපාත ප්‍රතිඵල පෙන්වන ලදී. ලෝක නිමැවුම් වර්ධන වේගය 2015 වසරේ 3.4% ට සාපේක්ෂව 2016 වසරේ දී 3.1% ක වර්ධනයක් පෙන්නුම් කරයි. සංවර්ධන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ආර්ථික කටයුතු වල පහත වැටීම, ප්‍රධාන ලෙසින්ම ඛනිජ, බලශක්ති, කෘෂි කර්මාන්ත සහ ආර්ථික මෙහෙයුම් යලි තුලනය කිරීම ඇතුළුව පැහැදිලිව දැකිය හැකි අංශ ගණනාවක අවධමනයට බඳුන් වූ භාණ්ඩ මිලෙහි ප්‍රතිඵලයක් විය. විවිධ අභියෝගයන් අපේක්ෂා කළත් ගෝලීය ආර්ථිකය 2017 දී සහ 2018 දී පිළිවෙලින් 3.5% ක සහ 3.6% ක වර්ධනයක් ලබනු ඇතැයි අපේක්ෂා කරයි.

## ශ්‍රී ලංකා ආර්ථිකය

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව 2015 වසර තුල වූ 4.8% ක වර්ධනය සමග සසඳන විට විවිධ ගෝලීය සහ දේශීය අභියෝගයන් මධ්‍යයේ ශ්‍රී ලංකා ආර්ථිකය 2016 දී මූර්ත යෙදුමෙන් 4.4% ක වර්ධනයක් ලබා ඇත. 2015 දී මෙන්ම 2016 දීත් බොහෝ දුරට සමාන වූ කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන ප්‍රධාන අංශ තුනෙන් මේ සඳහා දායකත්වය සපයා ඇත. සේවා අංශය 2015 ලද 56.6% ට සාපේක්ෂව 2016 දී 56.5% ක දායකත්වයක් ලබා දී ඇත.

2016 දී ලැබූ ආර්ථික වර්ධනය මූලික වශයෙන් මෙහෙයවන ලද්දේ වර්ෂය තුල ප්‍රසාරණය වූ ආයෝජන වියදම් මගිනි. ආර්ථිකයේ නිෂ්පාදන හැකියා ඉහළ ධාරිතාවයක් කරා යොමු කිරීමට නම්, 2016 දී ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්යසාධනයේ ගැඹුරු ව්‍යුහාත්මක ගැටළු නිරාකරණය කිරීමේ අවශ්‍යතාවය යලි තහවුරු කර ඇත.

## ගෝලීය ගුවන් සේවා අංශය

ගුවන් සේවා කර්මාන්තය විවෘත කිරීම මගින් තරඟකාරී මිලට ගුවන් සේවාවන් සහ ගමනාන්ත පුළුල් පරාසයක් තුල තෝරා ගැනීමට ඉඩකඩ ලැබීම සමග මගී ජනතාවට සුවිශේෂී ප්‍රතිලාභ ජනිත වී ඇත. ලිහිල්කරණය තුලින් ගුවන් තොටුපලවලටද ප්‍රතිලාභ ලබා දී ඇත. වාණිජ මධ්‍යස්ථාන, සංචාරක ගමනාන්ත සහ දේශීය ප්‍රජාව වැනි අංශවලට පිවිසුම් දොරටු ලෙස සේවය කිරීම නිසා ගුවන් තොටුපලවල් තම ගුවන් සේවා හවුල් කරුවන් සමග ඉහළ ප්‍රවාහන මට්ටමකට පිළිගන්නා ලදී. ගුවන් ප්‍රවාහන වටිනාකම් දාමය සහ ගෝලීය ආර්ථිකය විවෘත කිරීම මත ප්‍රතිඵලය වූ ගුණක ප්‍රතිවිපාකයට සාක්ෂි ලෙස සංචාරක කටයුතුවල වැඩිවීම සහ දේශසීමා ඉක්මවූ ආයෝජන සහ වෙළඳාම දැක්විය හැකිය. ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අත්පත් කරගත් පුළුල් වාසි නොසලකා භෞමික දේශපාලන තර්ජන සහ ආර්ථික අවදානම කර්මාන්තයට හිසරදයක් විය. 2016 වර්ෂයේදී, එය බ්‍රෙක්සිට් (BREXIT), ඇමරිකාවේ ජනාධිපතිවරණය හෝ සිරියන් සිවිල් යුද්ධය වුවත් ගෝලීය ආර්ථිකයේ සහ විශේෂයෙන් ගුවන් සේවා අංශයේ ආර්ථික අවිනිශ්චිතතාවය පිළිබඳ හැඟීම පැතිර ගොස් තිබුනි.ආරක්ෂාව පැත්තෙන් බැලූවිට, කර්මාන්තය ඉස්තාන්බුල්හි Ataturk සහ බ්‍රසල්ස් ගුවන් තොටුපලවල් ඇතුළුව සෘජු ත්‍රස්තවාදී පහර දීම්වලට මුහුණ පාන ලදී. තවමත් කර්මාන්තය අහිතකර තත්වයන්ගෙන් හෝ සිදුවීම් වලින් යථා තත්වයට පත්වීමේ හැකියාව නිරූපණය කරමින් තිබේ. 2016 තුල ගුවන් ප්‍රවාහනය සඳහා ඉල්ලුම මගින් මෙය හොඳින් පැහැදිලි කරයි.

## ක්ෂිතිජයෙන් එපිට බැලීම

ගුවන් තොටුපලවල් පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලය (ACI) වාර්ෂික වර්ධන අනුපාතය 4.9% ක් ලෙස විග්‍රහ කරමින් කළ පුරෝකථනයට පදනම්ව 2029 වර්ෂයේදී ගුවන් ප්‍රවාහනය බිලියන 14 ට වඩා දෙගුණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පරීක්ෂාකාරී සර්වශුභවාදී වීමෙහි වැරැද්ද මත දිගුකාලීන සහ මධ්‍යකාලීන වශයෙන් ගුවන් ප්‍රවාහන ඉල්ලුමෙහි වර්ධන අරමුණු අවහිර කළ හැකි බාධාවන් කිහිපයක් ඇත. විශේෂයෙන් මේවා දේශපාලනික නොසන්සුන් බව සහ ආරක්ෂාවට පවත්නා තර්ජනය සහ තවදුරටත් ආර්ථික ඒකීයකරණයෙන් සහ ගුවන් ප්‍රවාහනය විවෘත කිරීමෙන් පසුබස්වන ආරක්ෂණ වාදී ප්‍රතිපත්ති හා සම්බන්ධ වෙයි. අවසාන වශයෙන්, ගුවන් තොටුපලවල් පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලයේ ගෝලීය, මධ්‍යකාලීන මගී පුරෝකථනය 2016 සිට 2020 දක්වා පෙන්වූ 33% ක වර්ධනය සමග බොහෝ ජාතික ආණ්ඩු පවත්නා ගුවන් තොටුපල යටිතල පහසුකම් අභිබවා යන ගුවන් ප්‍රවාහන ඉල්ලුමේ වේගවත් ඉහළ යාමකට මුහුණු දුන්හ. මෙම අභියෝගයට දිගුකාලීනව මුහුණ දීම සඳහා ආයෝජන අවශ්‍යය. ඒ අනුව බොහෝ රජයන් අවශ්‍ය සම්පත් සඳහා පෞද්ගලික අංශයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. ගුවන් තොටුපල සේවා මිල මට්ටම් මත වූ නියාමන ආකෘතියේ සංගත භාවය අනුව හොඳින් පෙළඹවූ ආර්ථික දිරිගැන්වීම් දෙසට යොමු වීමෙන් පෞද්ගලික ප්‍රාග්ධනයට ගුවන් තොටුපල කර්මාන්තයට ගලා ඒමට හැකිවිය. මෙම ප්‍රවේශය මගින් ආයෝජනය ආකර්ෂණය කළ අතර එවැනි දිගුකාලීන ප්‍රාග්ධන සුක්ෂ්ම අරමුදල්හි සමස්ථ අවදානම් මට්ටම පාලනය කිරීමටද එය උදව් විය. එමෙන්ම, ACI ආමන්ත්‍රණය කළ ප්‍රධාන ක්ෂේත්‍රය වන්නේ ගුවන් තොටුපල හිග ධාරිතාවයේ ප්‍රශස්ථ කළමනාකරණයයි. විශේෂයෙන්ම, මෙදෙසට යොමු වීම කර්මාන්තය සඳහා ප්‍රමුඛතාවයක් නියෝජනය කරන වැඩපිළිවෙලකට වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කරයි. ගුවන් තොටුපල මෙහෙයුම් කරුවන් වඩ වඩා ලෝක ව්‍යාප්ත වැඩපිළිවෙලක මග පෙන්වීම් අනුව නවීකරණය කිරීමේ ක්‍රියාවලියකට සම්බන්ධ වියයුතු බවට ACI නිරතුරුව උපදෙස් දෙයි.

**හවුල් දැක්ම දෙසට ගු.ගු.සේ. ගමන 2016 දී**

**“16Es”**

**සමග වර්ධන මාවතට පිවිසෙමින්**

## 1. කාර්යක්ෂමබව *(Efficient) - "කාර්යක්ෂම"* වෙමින් වර්ධන මාවතට පිවිසීම

නවීන සංයුක්ත ලෝකයේ සැම දෙනම කාලය මදිකම පිළිබඳව මැසිවිලි නගති. "කාල කළමනාකරණය" පිළිබඳව සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු කිරීම් සහ දේශන පවත්වති. නමුත් කාලය නිසිලෙස පාලනය කරන කෙනෙක් නැත. මෙය නිශ්චිත මෙන්ම ස්ථාවර දෙයකි. මෙම විරුද්ධාභාසය තුල රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස අපට කළ හැක්කේ අප ක්‍රියාත්මක වන දේශපාලනික, ආර්ථික, සාමාජීය, තාක්ෂණික, පාරිසරික, සදාචාරමය සහ නෛතික (PESTEEL) පරිසරය තුල ලබා දී ඇති සීමිත කාලයෙන් අපට ගත හැකි හොඳම දේ ගනිමින් "අපව පාලනය" කර ගැනීමයි. එය කිරීමට ඇති එකම මාර්ගය නම් අපගේ මෙහෙයුම් කාර්යයන් කාර්යක්ෂම කිරීමයි. නාස්තිය, ක්‍රියාවලීන්ගේ සහ අනුමත කිරීම් වලදී සිදුවන ප්‍රමාද, ඌනතා, අපගමනයන් ආදීය අවම කිරීම මෙයට ඇතුලත් වේ. 2016 වර්ෂය පුරාම ගු.ගු.සේ. කාර්යක්ෂම වූ අතර පැවති සීමිත සම්පත් තුල එහි මෙහෙයුම් පාලනය කර ගැනීමට හැකි විය.

## 2. ඵලදායිබව *(Effective) - "ඵලදායි"* වෙමින් වර්ධන මාවතට පිවිසීම

මෙම වෙනස්වන සුළු, අවිනිශ්චිත, සංකීර්ණ සහ ව්‍යාකූල (VUCA) ලෝකයේ කාර්යක්ෂම වීම පමණක් ප්‍රමාණවත් නොවේ. කෙනෙකුට කාර්යක්ෂම ලෙස ව්‍යාජ අරමුණු අත්පත් කර ගත හැකිය. ඵලදායිතාවය පරිශ්‍රමයේ ප්‍රතිඵලයයි. රජය සතු සේවා සපයන්නකු ලෙස ගු.ගු.සේ අපේක්ෂිත ප්‍රතිඵල සමග ගනුදෙනු කරයි. කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය එකිනෙකට සමපාත වන බොහෝ අවස්ථා ඇත. සෑමවිටම කාර්යක්ෂමතාවය ඵලදායිතාවය සමගම යායුතු නිසා 2016 වර්ෂය තුල මෙම අරමුණු දෙක මගින් ගු.ගු.සේ තම ඵලදායීතාවය වැඩි කර ගත්තේ කෙසේද යන්න අපි සාකච්ඡා කර බලමු.

### බ.ජා.ගු හි සූර්ය බලශක්තිය ජනනය කිරීම

සියළුම ප්‍රමාණයේ ගුවන් තොටුපලවල පරිසරය පිළිබඳ දැනුම මෙන්ම පරිසර හිතකාමිබව වැඩිවන තත්වයට පත්වෙමින් තිබේ. ගෝලීය උෂ්ණත්වය අඩුකිරීමට උදව් වන පරිසරයට ප්‍රශස්ථ ආවරණයක් වන බැවින් සූර්ය බලශක්තිය භාවිතය පිළිබඳ පූර්වක්‍රියා ජනප්‍රිය වෙමින් පවතී. තවදුරටත් එය මුදල් ඉතිරි කරන අතර බලශක්ති සැපයුම්කරුවන් මත රැඳීමක් නොමැතිව බලශක්ති විශ්වසනීයත්වයක් සහ බලශක්ති ආරක්ෂාවක් සපයයි. නව පරිච්ඡේදයක් ලියා දක්වමින් බ.ජා.ගු සූර්ය බලශක්තිය භාවිතය ආරම්භ කර ඇත. මෙය රු. මිලියන 14 ක මුළු වියදමකින් යුත් කි. වොට් 75 (KWP) ක ධාරිතාවක් සහ සහතික කළ ජීව කාලය අවුරුදු 25 ක් සහිත ජාල ගත සූර්ය බලශක්ති උත්පාදන පිරියත මත බ.ජා.ගු හි ඇති නියමු ව්‍යාපෘතියක් වේ. පසු ගෙවුම් කාලය වසර 6 ක් වූ ආයෝජනයක් සමග සාමාන්‍ය මාසික ඉතිරිය රු. 200,000 ක් වේ.

වර්තමානයේ සාමාන්‍ය මාසික බලශක්ති උත්පාදනය කි. වොට් 10,000 (KWP) කි. නියමු ව්‍යාපෘතිය සාර්ථක ලෙස අවසන් කිරීමත් සමග ගු.ගු.සේ. අදියර පදනමකින් ප්‍රධාන මගී පර්යන්ත ගොඩනැගිල්ල සඳහා මෙගාවොට් පරාසය තුල සූර්ය බලශක්තිය ව්‍යාප්ත කිරීමට දැන් සැලසුම් කර ඇත. ගු.ගු.සේ සමාගම, දැනටත් වර්ෂයකට රු.



1

බිලියන 1 ක් වන වාර්ෂික බලශක්ති පිරිවැය අඩු කිරීමට සහ පරිසරයට කාබන් විමෝචනය අඩුකරන අතරම පර්යන්තයට ව්‍යාප්ත කෙරෙන ව්‍යාපෘතිය හේතුවෙන් අනාගත බලශක්ති ඉල්ලුම අඩු කිරීමට බලාපොරොත්තු වේ.

බලශක්ති පරිභෝජනය (2001-2016)




ප්‍රශස්ථ ආකාරයට ගු.ගු.සේ ඉතිහාසයේ මගියෙකුට අවම විදුලි පරිභෝජනය 2016 දී වාර්තා වී ඇත. එය කි.වොට් පැය (KWH) 4.09 කි.

මගියෙකුට විදුලි පරිභෝජනය (2001-2016)




සූර්ය බලශක්ති උත්පාදන පිරියත සංඛ්‍යා ලේඛන 2016

| මාසය | උත්පාදනය කි.වො. පැය | ඵලදාව රු. (කි.වො. පැය x 20.70) |
|---|---|---|
| අගෝස්තු | 10,190 | 210,933 |
| සැප්තැම්බර් | 9,540 | 197,478 |
| ඔක්තෝබර් | 10,940 | 226,458 |
| නොවැම්බර් | 8,680 | 179,676 |
| දෙසැම්බර් | 10,260 | 212,382 |




2



3

1 බ.ජා.ගු. - සූර්ය බලශක්ති උත්පාදන පිරියත ක්‍රියාත්මක කිරීම

2 බ.ජා.ගු. හි කාර්යසාධනය පදනම් වූ යාත්‍රාකිරීමේ පද්ධතිය (*PBNS*)

3 බ.ජා.ගු. හි සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම (පර්යන්ත සංක්‍රමණික ප්‍රදේශ)

කාර්යසාධනය පදනම් වූ යාත්‍රාකිරීමේ පද්ධතිය (PBNS)

යාත්‍රාකිරීමේ පද්ධති නියාමනය සඳහා තාක්ෂණික විසඳුමක් වූ ගුවන් ගමන් පාලන මැදිරිය, 2016 අගෝස්තු මාසයේදී කාර්යසාධනය පදනම් වූ යාත්‍රාකිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. PBNS ගුවන් යාත්‍රාකිරීම් ආධාර සීමාවූ ස්ථාන ආවරණය තුල හෝ ස්වයං ආධාර උපකාරක හැකියාවන් සීමා තුල හෝ මේ දෙකෙහිම සංයෝජනයක් සහිතව කැමති ඕනෑම ගුවන් පථයක ගුවන් මෙහෙයුම් වලට ඉඩදෙන ක්‍රමවේදය මත පදනම් වේ. PBN අත්පොත (ICAO ලියවිලි 9613) මෙම යාත්‍රාකිරීමේ හැකියාවන් නිර්වචනය කොට ප්‍රමිතකරණය කර තිබේ. යාත්‍රා කිරීම් පිරිවිතර, ගුවන් යානා මෙහෙයුම්කරුවන් සහ යාත්‍රාකිරීම් සේවා සපයන්නන් සඳහා මග පෙන්වීමේ මෙනුවක් එහි අඩංගු වේ. ක්‍රියාත්මක කිරීම එකලස් කිරීමේ යෝජනාවලිය A 37-11 යටතේ වූ එකඟත්වයන්ට වඩා මන්දගාමීවීම හේතුවෙන් RNAV සහ RNP ගුවන් ගමන් මාර්ග සහ ප්‍රවේශ ක්‍රියාපටිපාටීන් පිළිබඳ PBN ක්‍රියාත්මක කිරීම වර්තමානයේ ICAO හි ප්‍රමුඛත්වය බවට පත්වී ඇත.

2016 වර්ෂයේදී මුළු ඉන්ධන ඉතිරිය කි.ග්‍රෑ. 1,821,555 ක් වන අතර කාබන් විමෝචනය අඩු කිරීම කි.ග්‍රෑ. 5,737,900 ක් විය.

ඉන්ධන ඉතිරිය සහ කාබන් විමෝචනය අඩුවීම




කාලෝචිත භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය

සමාලෝචිත වර්ෂය තුලදී මුළු ප්‍රසම්පාදන වටිනාකම 2015 වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 5.2 දක්වා 90% කින් වැඩිවී ඇත. මෙයට අමතරව 2016 වර්ෂයේදී පිටත්ව යාමේ සංක්‍රමණ ප්‍රදේශය තුල ටෙන්ඩර් 18 ක් සම්පූර්ණ කරන ලදී. සංක්‍රමණ ප්‍රදේශය තුල කුලී ආදායම 2015 වර්ෂයේ රු. බිලියන 295 ට සාපේක්ෂව රු. බිලියන 541 දක්වා වැඩිවීම මෙහි ප්‍රතිඵලය වූ අතර එය 83% ක වැඩිවීමකි. සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සමාග මට ප්‍රතිලාභ අත්කර ගනිමින් රජයේ ප්‍රසම්පාදන මග පෙන්වීම්වලට අනුකූලව සිදුකරන ලදී.

## 3. අනුවේදනාත්මකබව *(Empathic)* - "අනුවේදනාත්මකබව" තුලින් වර්ධන මාවතට පිවිසීම

අනුවේදනය යනු "අන්‍යයන්ගේ පාවහන් තුලට පිවිස ඔවුන් මෙන් ඇවිදීමට තැත් කිරීමයි". මෙයින් අදහස් කරනුයේ අන් අයගේ දෘෂ්ටියෙන් ප්‍රශ්නයක් හෝ ගැටළුවක් දෙස බැලීමේ හැකියාව ඇති බවයි. ගු.ගු.සේ. සමාගම දැඩි ලෙසම මගීන්ගේ සුව පහසුව සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව උනන්දු වෙයි. සේවක සුභසාධනය, පුහුණුකිරීම, උසස්වීම් සහ වෘත්තීය සමිති සම්බන්ධ කටයුතුවලදී ගු.ගු.සේ. හි කළමනාකාරීත්වය අනුවේදනීය ලෙස කටයුතු කරයි. උද්වේගාත්මක බුද්ධිඑලයක් ලැබෙන අනුවේදනය, වර්තමාන සන්දර්භය තුල, නිර්මාණාත්මක ව්‍යාපාර නායකත්ව ලක්ෂණ අතුරින් වඩාත් අභිලාෂාත්මක එකක් ලෙස සලකයි.

### අන්තර්ජාතික ප්‍රමිතීන්වලට මගී පහසුව

සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස බ.ජා.ගු. සංක්‍රමණික ප්‍රදේශය තුල සනීපාරක්ෂක පහසුකම් පිළිසකර කිරීම සිදුකළ අතර 2016 ඔක්තෝබර් 19 දින එය මගීන් සඳහා විවෘත කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු







පිරිවැය රු. මිලියන 13 ක් විය. ව්‍යාපෘතියේ සියළුම වැඩ ගු.ගු.සේ. හි පුහුණු මානව සම්පත් මගින් සම්පූර්ණ කළ නිසා රු. මිලියන 4.3 ක ඉතිරියක් සමග ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කළ පිරිවැය වූයේ රු. මිලියන 8.7 කි.

ව්‍යාපෘතියේ ඉදිකිරීම් සහ අනෙකුත් කටයුතු කරගෙන යාමේදී ගු.ගු.සේ. හි අංශ කිහිපයක් එනම් ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පී සහ භූමි අලංකරණ, මූල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ අංශය සම්බන්ධ විය. මෙය ගු.ගු.සේ. කාර්යමණ්ඩලයේ කණ්ඩායම් කාර්යයක් ලෙස ක්‍රියාත්මක විය. ඉහළ කළමනාකාරීත්වයේ මෙහෙයවීම සහ මග පෙන්වීම සමග ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව සහ ඉලක්කගත දිනට පෙර සම්පූර්ණ කරගනිමින් සමස්ථ ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට හැකිවිය.

සේවක සුභසාධනය සහ රාජකාරී කටයුතු ජීවිතය තුලනය කිරීම

ගු.ගු.සේ සමාගමට සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම, පුද්ගල අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම, කාර්යමණ්ඩල ප්‍රවාහන සේවා, නිවාඩු නිකේතන පහසුකම්, කාර්යමණ්ඩල නිලනිවාස, කාර්යමණ්ඩල ණය යෝජනා ක්‍රමය වැනි විවිධ සුභ සාධන ප්‍රතිලාභ පවත්වා ගෙන යාමට හැකි වී ඇත. අපට වර්ෂය තුල සේවක ණය සැකසීමේ කාලය අවම කර ගත හැකි වූ අතර සේවක පහසුව සඳහා කාර්යමණ්ඩල ණය සෘජුවම බැංකු ගිණුම්වලට ප්‍රේෂණය කිරීමට හැකි විය.

සමාගමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය මගින්, ගු.ගු.සේ. හි සියළුම සුදුසුකම් ඇති සේවකයින් සඳහා වෙනස් යෝජනා ක්‍රම තුනක් යටතේ නේවාසික වෛද්‍ය පහසුකම් සපයයි. 2016 වර්ෂයේදී වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ සේවකයින් 3,592 ක් ආවරණය වී ඇත.

අනුවේදනීය ගු.ගු.සේ. කාර්යමණ්ඩලයෙන් ගංවතුර සහනාධාර

දැඩි සුළං සහ මහ වැසි ඇතුළුව, 2016 මැද භාගයේදී ඇති වූ බරපතල කාලගුණික තත්වයන් හේතුවෙන් රටෙහි ප්‍රදේශ කිහිපයකම ගංවතුර, සුළි සුළං සහ නායයෑම් සිදුවිය. 2016 මැයි මාසයේදී මෝසම් වර්ෂාව සමග ඇති වූ බිහිසුනු ගංවතුරෙන් පවුල් දහස් ගණනකට තම

1 කතරගම නිවාඩු නිකේතන පහසුකම්

2 ගංවතුර උවදුරට මුහුණ දුන් අයහට ගු.ගු.සේ. විසින් ජල බෝතල් පරිත්‍යාග කිරීම

3 ගුවන් පථයේ හැලජන් ලාම්පු වෙනුවට *LED* සවිකිරීම

4 ගරු ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා ඉදිරයේ 2 වන පියවරෙහි 2 වන අදියර සඳහා JICA ආයතනය සමග ණය ගිවිසුම අත්සන් කිරීම

නිවෙස් අතහැර යාමට සිදු විය. පරිත්‍යාගශීලී රටවල් ගණනාවක් ක්ෂණික ආධාර ශ්‍රී ලංකාවට එවන ලදී. ගු.ගු.සේ. කාර්යමණ්ඩලය ගුවන් තොටුපල අනෙකුත් උනන්දු පාර්ශවයන් සමග එක්ව සහනාධාර ගුවන් යානාවලින් ඉක්මනින් ඉවත් කර ගැනීමේ අභියෝගයට මුහුණ දුන් අතර ඉතා ඉක්මනින් බෙදාහැරීම සඳහා එම ආධාර අදාල නියෝජිතයින්ට භාරදීම සිදු කරන ලදී.

මෙයට අමතරව අනුවේදනීය ගු.ගු.සේ. සේවකයින් ඔවුන්ට හැකි සියළු මාර්ග වලින් ගංවතුරින් අනාථ වූ ජනතවට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

## 4. ධෛර්යසම්පන්නබව *(Energetic)* - "ධෛර්යසම්පන්න" බව තුලින් වර්ධන මාවතට පිවිසීම

"ආසියානු කලාපයේ වඩාත්ම කාර්යක්ෂම මෙන්ම මිත්‍රශීලී ප්‍රධාන ගුවන් කේන්ද්‍රස්ථානය" බවට පත්වීමේ ගු.ගු.සේ. හි පරම අභිලාෂය අත්පත් කරගැනීමට, පැහැදිලිවම "සැඟවුනු දැක්මට" වඩා "ජීවමාන හවුල් දැක්ම" මගින් එය නිර්මාණය කිරීමට, ශක්තිමත් කායික සහ මානසික තුලනයක් පවත්වා ගනිමින් ගු.ගු.සේ. කාර්යමණ්ඩලය සැමට පොදුවේ ගණන් ගත හැකි සාමුහික මලල ක්‍රීඩකයින් බවට පත්වීම අවශ්‍ය වේ. සාමුහික සන්දර්භයේදී ධෛර්යය, ස්වයං අභිප්‍රේරණය සහ ක්‍රියාත්මක කළ නොහැකි සහ අභියෝගාත්මක කණ්ඩායම් වැඩ හරහා ගලා එයි. 2016 වර්ෂය පුරාම ගු.ගු.සේ. අත්‍යන්තයෙන්ම ධෛර්ය සම්පන්න විය.

2016 වර්ෂය තුලදී පිටත්ව යාමේ මංතීරුව පිළිසකර කිරීම ආරම්භ කොට මුළු වියදම රු. මිලියන 39 ක්



3



4

සමගින් භෞතික ප්‍රගමනය 30% ක් සම්පූර්ණ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 190 ක් වූ අතර සම්පූර්ණ වූ පසු මෙය පර්යන්ත ගොඩනැගිල්ලේ වැඩිවන මගී ඉල්ලුම සැපයීම සඳහා වූ ප්‍රධාන දියුණු කිරීමක් වේ. මෙයට අමතරව රේගුව සඳහා නව කාර්යාල ප්‍රදේශයක් ඇතුළුව ගුවන් මගීන් වෙන් කිරීම සඳහා වීදුරු යොදා කොටස් කිරීම මගින් පිටත්ව යාමේ පරීක්ෂණ ප්‍රදේශය ව්‍යාප්ත කිරීම රු. මිලියන 21 ක් වූ මුළු පිරිවැයකින් යුක්තව අවසන් කරන ලදී. 2016 දී ආරම්භ කළ පිටත්ව යාමේ පර්යන්තයේ විවේකාගාරය ඉදිකිරීම රු. මිලියන 65 ක මුළු පිරිවැයකින් අවසන් කළ අතර 2017 ජනවාරි 10 දින විවෘත කරන ලදී. ප්‍රධාන ව්‍යාපෘති වලින් එකක් වූ බ.ජා.ගු. හි මගී පර්යන්ත ගොඩනැගිල්ලේ නව ආගමන ශාලාවක් සහ ඉලෙක්ට්‍රොනික වෙළඳ සැලක් ඉදි කිරීම සඳහා රු. මිලියන 374 ක ඇස්තමේන්තු පිරිවැයක් සහිත ව්‍යාපෘතිය 2016 අගභාගයේදී පිරිනැමූ අතර ඉදිකිරීම් කටයුතු 2017 ජනවාරියේදී ආරම්භ කරන ලදී.

විශේෂයෙන් දැඩි අවධානයක් සහ ප්‍රතිකාරක ක්‍රියා අවශ්‍ය වඩා සංකීර්ණ ප්‍රදේශ පහසුවෙන් සහ හොඳින් අධීක්ෂණය කිරීමට හැකිවන අයුරින් රාජකාරී කළමනාකරුගේ කාර්යාලය සඳහා මුළු කැමරා 292 කට බාහිරව ව්‍යුහාත්මක දියුණු කිරීමක් ලෙස CCTV කැමරා පහසුකම් සපයන ලදී.

ධාවන පථයේ ආලෝක පද්ධතිය වැඩිදියුණු කිරීම

2016 වර්ෂයේදී මඩකලපුව ගුවන් තොටුපලේ සූර්ය බලශක්තියෙන් ක්‍රියාත්මක වන LED ධාවන පථ ආලෝක පද්ධතියක් සවිකරන ලදී. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 300 කට වැඩි වූ රැහැන් සම්බන්ධ සහිත සාම්ප්‍රදායික හැලජන් සූත්‍රිකා පහන්වලට සාපේක්ෂව මෙම ව්‍යාපෘතියේ වටිනාකම රු. මිලියන 30 ක් විය. එමනිසා මෙම ව්‍යාපෘතියේ සියලුම දෙයින් ගු.ගු.සේ. සමාගමට පිරිවැය මෙන්ම විදුලිය ඉතිරියෙන් ඉහළ ඵලදායිතා ආධාරක ගෙන එන ලදී.

හානිවීම් සහ අකුණු වැදීම් අඩු පද්ධතියක් බැවින් මෙමගින් මෙහෙයුම් කාර්යක්ෂමතාවයද වැඩි කරන ලදී. ගු.ගු.සේ. සමාගම සමාන සූර්ය බලශක්ති LED ධාවන පථ ආලෝක පද්ධතියක් අනෙකුත් අභ්‍යන්තර ගුවන්තොටුපල වලටද යෙදවීමට මූලික පියවර ගෙන ඇත.

තවදුරටත් කැනඩා මිත්‍රත්ව මාවතේ සවිකොට තිබූ විදුලි පහන් 300 ගණනක් LED මගින් ප්‍රසම්පාදනය කළ අතර පැරණි සහ අකාර්යක්ෂම මායිම් ආලෝක පහන් සියල්ලම වාගේ ඉවත් කරන ලදී.

350 KVA UPS / ජෙනරේටර් සංයෝජනයක් හඳුන්වා දීම තුලින් ධාවන පථයේ බලශක්තිය සැපයීමේ පද්ධතිය CAT II දක්වා උසස් කරන ලද අතර ගුවන් තොටුපල දෘශ්‍ය යාත්‍රාකිරීම් ආධාරකවලට බාධා පැමිණවීම ශූන්‍යයට ගෙන එන ලදී. එමනිසා ලංකා විදුලි බල මණ්ඩලයේ සීමා හේතුවෙන් ළඟා වීමට හෝ ගොඩ බෑමට බාධා නොවන අතර ගුවන් යානාවලට දැන් සීමා ඉක්මවා යාමකින් තොරව ළඟා වීමට සහ ගොඩ බෑමට හැකිය.

ADS - B භූමි ස්ථාන පිහිටුවීම

රු. මිලියන 220 ක මුළු පිරිවැයක් සහිත මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ කොළඹ ගුවන් තොරතුරු කලාපයේ (FIR) ආරක්ෂාව වැඩි දියුණු කිරීමයි. 2017 දී උපකරණ පරීක්ෂා කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකි කරමින් 2016 වර්ෂය තුල බිම සූදානම් කිරීම සහ සවිකිරීම කර ගෙන යන ලදී.

ම.රා.ජා.ගු. හි කාර්යමණ්ඩල නිල නිවාස

ම.රා.ජා.ගු. හි දවසේ පැය 24 පුරාම සහ සතියේ දින 7ම මෙහෙයුම් කටයුතු සඳහා වෙහෙස වන සේවකයින් හට පහසුකම් සැපයීමට 2016 දී මෙම ව්‍යාපෘතිය රු. මිලියන 63 ක මුළු පිරිවැයකින් සම්පූර්ණ කරන ලදී.

යෝජිත සුවිසල් ව්‍යාපෘති

ගු.ගු.සේ. සේවකයින් 2016 වසරේදී ඉතාමත් කැපවීමෙන් සහ ධෛර්ය සම්පන්නව රාජකාරී කටයුතු වල නියැලීමේ ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් ගුවන් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ඉහළ වේගයකින් ඉදිරියට ගෙන යාමට හැකි වී ඇත.

බ.ජා.ගු. හි දෙවන පියවරෙහි දෙවන අදියර

ඉදිරි වසර 5 සඳහා සැලසුම් කළ යෝධ ව්‍යාපෘති අතුරින්

එකක් වනුයේ වසරකට තවත් මගීන් මිලියන 9 ක් එකතු කිරීමේ අරමුණින් බ.ජා.ගු. හි දෙවන පර්යන්තය (T2) ඉදිකිරීමට යෝජිත ධාරිතා ව්‍යාප්තියයි. මෙය මූලික ප්‍රමුඛතාවය වූ අතර ව්‍යාපෘති කටයුතු බාධාවකින් තොරව ආරම්භ කිරීමට අදාල ව්‍යුහාත්මක පරිසරය 2016 වර්ෂය පුරාම සූදානම් කරන ලදී. මෙම ව්‍යාපෘතිය ජපාන අන්තර්ජාතික සාමුහික නියෝජිතායතනයේ (JICA) ODA ණය මගින් මූල්‍යනය කළ අතර ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමුවරට ඉහතින් සඳහන් කළ මූලික සැලසුම් ක්‍රියාත්මක කරනු පිණිස ණය ගිවිසුම (SL- P 104) JICA සහ ගුගුසේ අතර 2012 මාර්තු 28 දින ජපන් යෙන් මිලියන 28,969 කට අත්සන් තබන ලදී. දළ සැලැස්ම වෙනස් වීම සමග පිරිවැය වෙනස් වූ නිසා දෙවන සහන ණය ගිවිසුම (SL- P 114) ජපන් යෙන් මිලියන 45,428 කට ගු.ගු.සේ. සහ JICA අතර 2016 මාර්තු 24 දින අත්සන් කරන ලදී.

මෙම දෙමහල් පර්යන්ත ගොඩනැගිල්ල (T2) ආසන්න වශයෙන් වර්ග මීටර් 1,80,000 ක භූමි ප්‍රදේශයකින් යුක්ත වේ. මෙහි පැමිණීම සහ පිටත්ව යාම සඳහා සිරස් ලෙස වෙන්වූ පර්යන්ත ගොඩනැගිල්ලෙහි ගුවන් මගී මණ්ඩප දෙකකින් සමන්විත වේ. ඒවා ගුවන් මගී මණ්ඩප 2 සහ 3 ලෙස නම් කොට ඇත. පරිසර හිතකාමී ආරම්භකයන් සමග බාධකවලින් තොර ප්‍රවේශයක් සඳහා මෙය සැලසුම් කර ඇත. නව දුරස්ථ ගුවන් යානා අංගනය ගුවන් යානා 23 ක් නැවැත්වීමේ පහසුකම් සහිත, බිමෙහි ආධාරක උපකරණ (GSE) සහිත පාරවල් සහ ගුවන් පථයට උප පිවිසුම් මාර්ග තුනකින් සමන්විත වන අතර නව පර්යන්ත ගොඩනැගිල්ල අමතර පරීක්ෂණ කවුන්ටර් 96 කින්, ගමන්මලු සඳහා හිමිකම් පාන පථ 8 කින්, ගමන් භාණ්ඩ ගෙනයන පථ 7 කින් සහ ගුවන් යානයට ගොඩවන මගී පාලම් 28 ක් සමග ගුවන් මගීන් සඳහාවූ සම්බන්ධිත දොරටු 16 කින් සහ බස් දොරටු 6 කින් යුක්ත වේ. මෙම විෂය පථයට ඝණ අපද්‍රව්‍ය දහනාගාරය, ජල පවිත්‍රාගාරය සහ මළ අපද්‍රව්‍ය පිරිපහදු පිරියත ආදියේ ධාරිතාව වැඩි දියුණු කිරීමද ඇතුලත් වේ.

ජපන් නවීන තාක්ෂණය සහ ශිල්පී ක්‍රම සමග පරිසර හිතකාමී ගුවන් තොටුපල පිළිබඳ සංකල්පය මත පදනම්ව මෙම ව්‍යාපෘතිය සංවර්ධනය කරනු ලබයි. මෙම සංකල්පයට භූමි අලංකරණ කටයුතු සඳහා වැසි ජලය එකතු කිරීම, වැසිකිලි පවිත්‍ර කිරීම සඳහා මළ අපද්‍රව්‍ය පිරිපහදු පිරියත මගින් ජලය ප්‍රතිචක්‍රීය කිරීම, විද්‍යුත් ධාරා නිපදවන බල උත්පාදනය, සූර්ය බලශක්තිය එකතුකිරීම, LED ආලෝකකරණය සහ බලශක්ති කාර්යක්ෂම වීදුරු සවිකිරීම ආදිය ඇතුලත් වෙයි.



ශ්‍රී ලංකාව වෙත ජාත්‍යන්තර දොරටු විවෘත කිරීමේ තත්වයට පත්වන මෙම විශේෂිත පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ජපාන නවීන තාක්ෂණය භාවිතා කිරීමට නියමිතය. ජපානය සහ ශ්‍රී ලංකාව අතර තාක්ෂණික හුවමාරුව සහ ආර්ථික සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා JICA ණය, ආර්ථික සහයෝගිතාවය සඳහාවූ විශේෂ කොන්දේසි මත වර්ෂයකට 0.2% ක පොලියක් සහ වසර 10 ක සහන කාලයක් ඇතුලත් වසර 40 ක නැවත ගෙවීමේ කාලයක් සහිතව සපයනු ලබයි. නව මගී පර්යන්ත ගොඩනැගිල්ල 2020 වසරේදී විවෘත කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන බ.ජා.ගු. හි අතීත කාලගුණික දත්ත සමාලෝචනය මත පදනම්ව ධාවන පථයෙහි මතු පිට ඇතිරීමේ කටයුතු සඳහා වඩාත්ම උචිත වියලි කාලගුණික රටාවන් සැලකිල්ලට ලක් කරන ලදී. මතුපිට ඇතිරීමේ වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුව බද්ධ ව්‍යාපාරක් වූ චීන ජාතික ගුවන් තාක්ෂණ ජාත්‍යන්තර කණ්ඩායම (CATIC) සහ ෂැන්හයි නිව් ඊරා එයාර්පෝට් ඩිසයින් ආයතනයට 2016 සැප්තැම්බර් 02 දින පිරිනමන ලදී. මෙම බද්ධ ව්‍යාපාර සමාගම චීන සිවිල් ගුවන් සේවා අධිකාරිය යටතේ කීර්තියට පත් ආයතනයකි. කොන්ත්‍රාත්තුව වූයේ ධාවන පථය මතුපිට ඇතිරීම සහ "සැලසුම් කොට ගොඩ නැගීමේ" පදනම මත ආශ්‍රිත වැඩ නිම කිරීමයි. සම්පූර්ණ ව්‍යාපෘතිය වෙනුවෙන් වූ පිරිවැය බදු සහ තීරු ගාස්තු හැර එ. ජ. ඩොලර් මිලියන 48 ක් විය.

බ.ජා.ගු. හි ධාවන පථය මත
ඇතිරීම සහ ආශ්‍රිත
වැඩ



බ.ජා.ගු. ධාවන පථය, ගුවන් තොටුපල ධාවන පථ භූමිය ආලෝක කිරීම සමග අනුකූල වන නිසා වෙනස් කරන ලද CODE F දක්වා උසස් කරන ලදී. බ.ජා.ගු. පිවිසුම් මාර්ග පද්ධතිය ICAO අනුව CAT II දක්වා උසස් කරන ලදී. සියළුම නව සවිකිරීම් බලශක්තිය අතින් කාර්යක්ෂම LED ආලෝක පද්ධතිය වේ. ධාවන පථයේ මතුපිට චලන මෙහෙයුම් පද්ධතිය සහ කුලීරථ මාර්ග පද්ධතිය, නව ගුවන් ක්ෂේත්‍ර ආලෝක පාලන සහ අධීක්ෂණ පද්ධතිය යන සියළුම ධාවන පථ සලකුණු ACI නව එකතු කිරීම්වලට අනුව වේ. එසේම ධාවන පද්ධතියේ ධාරිතාව ඊළඟ වසර 20 ක වර්ධනයට ගැලපෙන පරිදි වැඩි දියුණු කරනු ලැබේ.

තවදුරටත්, A 380 ගුවන් යානා ගොඩබැස්වීමට පහසු වන පරිදි ධාවන පථයේ පලල මීටර් 15 කින් (දෙපසින් මීටර් 7.5 බැගින්) පුළුල් කර ඇත.

1986 දී කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය අදියර 1 යටතේ ධාවන පථය ඉදිකොට ක්‍රියාත්මක කරන විට ධාවන පථයේ සැලසුම් සහ අධීක්ෂණ උපදේශකයින් වූයේ නෙදර්ලන්ත ගුවන් තොටුපල උපදේශකයන්ය (NACO).

2017 වර්ෂය මුලදී, දිවා කාලයේ අඩු ප්‍රවාහන පරිමාවක් මෙන්ම මගී අපහසුතා අවම කිරීමට ධාවන පථය මෙහෙයුම් කටයුතු සඳහා පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා වසා තබන ලදී.

## 5. උද්‍යෝගීබව (Enthusiastic) - "උද්‍යෝගීබව" තුලින් වර්ධන මාවතට පිවිසීම

පර්යේෂණ වලින් හෙලිවන පරිදි අභිප්‍රේරණය වූ සේවකයින් කඩිසර සේවකයින් වෙයි. එසේම සමහර සංවිධාන උපායශීලීව "පැයකට සිනාසීම්" ප්‍රමාණය ගණනය කිරීමට යොමු වී ඇත. කෙනෙකුට බැහැර කළ නොහැකි බිම් මට්ටමේ යථාර්තයන් තිබේ. එක්කෝ කෙනෙකු ඔහු හෝ ඇය ආශා කරන වැඩ සොයා ගත යුතුය. එසේ නොවේ නම් ඔහු හෝ ඇය කිරීමට ඇති වැඩ වලට ආදරය කළයුතුය. මෙය කොන්දේසි විරහිතව වැඩ සඳහා වූ ධනාත්මක ප්‍රවේශය වේ. තියඩෝර් රූස්වෙල්ට් කියූ පරිදි "ඔබ කොහේ සිටියත් ඔබට තිබෙන දේ සමග ඔබට හැකි දේ කරන්න."

2016 වර්ෂය තුලදී ගු.ගු.සේ. කාර්යමණ්ඩලය ඔවුන්ගේ නිල රාජකාරි, නව උත්පාදන, අභ්‍යන්තර වැඩි දියුණු කිරීම්, ක්‍රීඩා කටයුතු සහ තවත් බොහෝ දේ පිළිබඳව අධික ලෙස උද්‍යෝගිමත් විය. ගු.ගු.සේ. හි ක්‍රීඩා, සුභසාධන සහ විනෝද කටයුතු සමාජය (**SWRC**) විසින් බ.ජා.ගු., රත්මලාන සහ ම.රා.ජා.ගු. හි සියළුම අංශවල උද්‍යෝගිමත් ක්‍රීඩකයින් සහභාගි කර ගනිමින් 2016 ජූලි මස දී අති උත්කෘෂ්ඨවත් ක්‍රිකට් සැණකෙළියක් සංවිධානය කරන ලදී. ගු.ගු.සේ. බර ඉසිලීමේ කණ්ඩායම ජාතික බර ඉසිලීමේ ක්‍රීඩාවලට සහභාගි වූ අතර රන් පදක්කම් ඇතුළුව පදක්කම් කිහිපයක් දිනා ගන්නා ලදී. හොකී කණ්ඩායම 2016 දී පවත්වන ලද වෙළඳ සේවා හොකී තරඟාවලියේ අනුශූරතාවය දිනා ගන්නා ලදී. 2016 දී පැවැත්වූ 33 වන වෙළඳ සේවා මලල ක්‍රීඩා තරඟාවලියේදී අප ක්‍රීඩකයින්ගේ අති මහත් සහභාගිත්වය සහ කැප වීම හේතුවෙන් බොහෝ ආයතන අතරින් 3 වන ස්ථානයට පත්වීමට ගු.ගු.සේ. ට හැකිවිය.

2016 වර්ෂයේදී ගු.ගු.සේ. ආරක්ෂක සේවා කාර්යමණ්ඩලය විසින් වැදගත් අනාවරණය කරගැනීම් සිදුකර තිබේ. මගින් සම්බන්ධව වූ සිදුවීම් 1042 ක් අතුරෙන් සිදුවීම් 41ක් අනාවරණය කර ගැනීමට හැකි වූ අතර එම භාණ්ඩ අනෙකුත් සම්බන්ධිත ගුවන් තොටුපලවලදී සොයා නොගත්, තහනම් කළ හෝ සීමා කළ අයිතම් වේ.

## 6. අපේක්ෂාව (Envision) - "අපේක්ෂාව" තුලින් වර්ධන මාවතට පිවිසීම

"සිහින දකින්න, ක්‍රියාත්මක වන්න, අසාර්ථක වන්න, ජයග්‍රහණය කරන්න" මෙවැනි පැරණි කියමනක් තිබේ. සෑමදෙයක්ම අපේක්ෂාවකින් යුතුව ආරම්භ වෙයි. වෝල්ට් ඩිස්නි කියූ පරිදි "ඔබට එය පිළිබඳ සිහින දැකිය හැකි නම් ඔබට එය ඉටු කිරීමට පුළුවන". දැනට ඇති ප්‍රමුඛතම අවශ්‍යතාවය වන්නේ දැක්ම මත පදනම් වූ සීඝ්‍ර වර්ධනයක් කරා ගුවන් සේවාවන් පුළුල් කිරීමයි.

ගු.ගු.සේ. කළමනාකාරිත්වය අත්‍යන්තයෙන්ම අනාගතය දකින අතර එමනිසාම අනාගතයේදී යථාර්තයන් බවට පත් කළයුතු පහත සඳහන් "සිහින ව්‍යාපෘති" හඳුනාගෙන ඇත. ව්‍යාපෘති සියල්ලෙහිම වාගේ අනාගතයේදී ස්ථාපිත ඉලක්ක සාක්ෂාත් කරගනු පිණිස දැනටමත් මූලික කටයුතු ආරම්භ කර තිබේ.

| ව්‍යාපෘතිය | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මිලියන) |
|---|---|
| බ.ජා.ගු. මගීන් පැමිණීමේ පර්යන්ත ගොඩනැගිල්ලේ නව ආගමන ශාලාවක් සහ ඉලෙක්ට්‍රොනික වෙළඳසංකීර්ණයක් ඉදි කිරීම | 374 |
| බ.ජා.ගු. පිටත්ව යාමේ පර්යන්ත ගොඩනැගිල්ලේ මහජන පිවිසුම් ශාලාව සහ උද්‍යානයේ සාප්පු පුළුල් කිරීම | 255 |
| විගමන ප්‍රදේශය - පිටත්වයාම යලි ස්ථාපිත කිරීම | 400 |
| අත්තිඩිය උච්ච සංඛ්‍යාත (HF) සම්ප්‍රේෂණ ස්ථානයේ ගගන නාවික HF සම්ප්‍රේෂණ සමග ඇන්ටෙනා සැපයීම, සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීම | 320 |
| බ.ජා.ගු. හි පරීක්ෂා කිරීමේ ප්‍රදේශය පුළුල් කිරීම | 1,000 |
| බ.ජා.ගු. හි ගුවන් ප්‍රවාහන කළමනාකාරිත්ව (ATM) පද්ධතිය සැපයීම, සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීම | 320 |
| ගගන නාවික තොරතුරු කළමනාකාරිත්ව (AIM) පද්ධතිය සැපයීම, සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීම | 260 |
| බ.ජා.ගු. සහ රත්මලාන සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම | 420 |
| බ.ජා.ගු. හි නව ගගන නාවික සේවා ගොඩනැගිල්ල | 200 |
| බ.ජා.ගු. හි ගුවන් ගමන් පාලක කුළුණේ මැදිරිය පුළුල් කිරීම | 120 |
| ගගන ජංගම මධ්‍යස්ථානය (උච්ච සංඛ්‍යාත සන්නිවේදනය) නවීකරණය කිරීම | 100 |

බ.ජා.ගු. හි යෝජිත ගුවන් තොටුපල හෝටල්

බ.ජා.ගු. හි තරු 4 ගුවන් තොටුපල හෝටල් දෙකක් සඳහා ටෙන්ඩර් කැඳවා ඇති අතර ඒ සඳහා ගුවන් තොටුපල ආසන්නයේ හෙක්ටෙයාර් 2.5 ක වාණිජ භූමිප්‍රදේශයක් වෙන්කර ඇත. ව්‍යාපෘතිය බ.ජා.ගු. හි ගුවන් තොටුපල යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම ඉලක්ක කොට ඇති අතර ගුවන් තොටුපල තුලම ගුවන් මගීන් සහ ගුවන් සේවා කාර්යය මණ්ඩලය සඳහා අත්‍යාවශ්‍ය සුවපහසුව සහ සුඛෝපභෝගීත්වය සැපයීමත් එමගින් ගු.ගු.සේ වෙත වැඩි ආදායමක් උපයා ගැනීමත් මෙහි අරමුණු වේ.

## 7. වැඩිදියුණු කිරීම "Enhance" - "වැඩිදියුණු කිරීම" තුලින් වර්ධන මාවතට පිවිසීම

ප්‍රකට පර්වර්තනීය නායකයකු වූ මහත්මා ගාන්ධි වරක් " ඔබ ලෝකය දැකීමට කැමති ආකාරයට වෙනස්වන්න". යයි ප්‍රකාශ කරන ලදී. ඇත්තෙන්ම ලෝකය බහුල ලෙස ප්‍රචණ්ඩ සහ සදාචාර විරෝධී උද්ඝෝෂණවලින් ගහන නිසා අද පවතින කැළඹිලි සහිත ව්‍යාපාරික විරුද්ධාභාසය තුල "වෙනස" අත්‍යාවශ්‍ය වේ. එමනිසා වැඩපල තුල "ඩයිනෝසරයින්ට වඩා ඩොල්පින් වීම" සඳහා ගු.ගු.සේ. කාර්යමණ්ඩලයට වෙනස්වීමේ දිශාවට දැනුම සහ කුසලතාවයන් වැඩිදියුණු කිරීම අවශ්‍යය. ඉගෙනීම ඉලක්ක සපුරා ගැනීම දෙසට වූ අභියෝගාත්මක වැඩවල කොටසක් බවට පත් වී ඇත. අප තියුණු දැනුමකින් මුවහත් වීම තරඟයට මුහුණ දීමේ පරමාර්ථය වේ. සොක්‍රටීස් කියූ පරිදි අපි "උපතේ සිට මරණය" දක්වා ඉගෙන ගනිමු. ගු.ගු.සේ. කළමනාකාරිත්වය 2016 වර්ෂය තුලදී භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට උනන්දු වූවා පමණක් නොව සේවකයින්ගේ බුද්ධිමය දැනුම සහ කුසලතාවය වැඩිදියුණු කිරීම කෙරෙහිද දැඩි උනන්දුවක් දැක්විය.

ගු.ගු.සේ. තම උපායමාර්ගික වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය කාර්යමණ්ඩලයේ බුද්ධිමය හැකියාවන් නිරතුරුව වැඩිදියුණු කිරීම තුලින් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. එසේම ආකර්ෂනය, තෝරාගැනීම, අභිප්‍රේරණය, සංවර්ධනය සහ සංවිධානයට හොඳම මානව සම්පත් රඳවා ගැනීම තුලින් ගු.ගු.සේ. මානව සම්පත් සංචිතය වැඩි දුරටත් දියුණු කරන ලදී.මානව සම්පත් කළමනාකරණය (**HRM**) සමාලෝචනයේදී සාකච්ඡා කළ ආකාරයට පවත්නා නිපුණතා සැපයුම් මෙන්ම දේශීය සහ විදේශීය පුහුණු කිරීම් මගින් මානව ප්‍රාග්ධන සංවර්ධනය මත ආයෝජනය කිරීම මගින් ගු.ගු.සේ. අඛණ්ඩව කාර්යමණ්ඩලයේ දැනුම හා කුසලතාවයන් වැඩිදියුණු කරමින් සිටී.

## 8. යෙදවීම "Engage" - "යෙදවීම" තුලින් වර්ධන මාවතට පිවිසීම

ව්‍යාපාර චක්‍රය තුල සේවකයින් යෙදවීම දැනටමත් කැළඹිලි සහිත වචනයක් බවට පත්වී ඇත. එය H3 ප්‍රශස්ථ සංයෝජනය එනම් වැඩෙහි යෙදීමේ දී සේවකයාගේ හිස, අත් සහ හදවත සම්බන්ධවීමේ හරය නිරූපණය කරයි. එමගින් සේවක චරිත ස්වභාවය කාර්යසාධනය සහ මානසික දෘෂ්ඨිය පෙන්නුම් කරයි. කෙටියෙන් කියතොත් එය ආවේගශීලීත්වය (හැඟීම), ප්‍රජානනය (සිතීම) සහ චර්යාව (ක්‍රියාකිරීම) යන සේවකයකුගේ මානයන් නිරූපණය කරයි. වැඩි වැඩියෙන් යෙදවීම මගින් වැඩි වැඩියෙන් උත්කෘෂ්ඨ බවට පත්වීමේ අවස්ථා ඇතිවේ.

ගු.ගු.සේ. කාර්යමණ්ඩලය විසින් හැසිරවූ පහත සඳහන් අවස්ථා වැදගත් කාර්යයන්හි නිරත වීමේදී ඔවුන් දක්ෂ වන්නේ කොපමණ ප්‍රමාණයකටද යන්නට සාක්ෂි සපයයි.

අ) 2016 වර්ෂය තුලදී ඉතා වැදගත් පුද්ගල (VIP) සංචලන 12,331 ක් සහ රාජ්‍ය නායකයින් ඇතුළු අතිශය වැදගත් පුද්ගල (VVIP) සංචලන 50 ක් හසුරුවන ලදී.

ආ) ආසියා-ශාන්තිකර කලාපීය සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ (DGCA) 53 වන සම්මේලනය

ඇ) ලෝක සෞඛ්‍ය සංවිධානයේ 69 වන කලාපීය කමිටු රැස්වීම

සේවක නිරතවීම අභිවර්ධනය කිරීම

මානව සම්පත් සමාලෝචනයේදී පැහැදිලි කළ නවක සේවකයින් සඳහා වූ ගු.ගු.සේ. ආරම්භක සහ අනුස්ථාපන පුහුණු වැඩසටහන, ජ්‍යෙෂ්ඨ සේවකයින්ගේ නිරත වීම රැස්කර තැබීම සඳහාවූ "අපේක්ෂිත වෙනස සඳහා මූලික වී පෙලගැසෙන්න " වැඩසටහන සේවක යෙදවීම්වලට උදාහරණ කිහිපයක් වේ.

මගී ගුවන් යානා 12 කට නැවත ඉන්ධන සැපයීම සඳහා ගිනි ආවරණ සපයා ඇති අතර ඉන්ධන ගලා යාම් වැලැක්වීම් 10 ක නිරත වී ඇත. තවදුරටත් ගු.ගු.සේ. ගිනි ආරක්ෂකයින් ගුවන් යානා හදිසි අවස්ථාවන් 15 කට ප්‍රතිචාරය දක්වා ඇති අතර මගීන් 302 කට ගිලන් රථ සේවා පහසුකම් සපයා ඇත.

රත්මලාන ගුවන් තොටුපලට අනුබද්ධිත ගිනි ආරක්ෂකයින්, 2016 මාර්තු 07 වන දින මොරටුව සොයිසා පුර නිවාස යෝජනා ක්‍රමයේ නිවසක ඇතිවූ ගින්නක් නිවීමට මැදිහත් වූ අතර වර්ෂය තුලදී මගීන් 12 ක් සඳහා ගිලන් රථ සේවා සපයන ලදී.

මත්තල ගුවන් තොටුපලට අනුබද්ධිත ගිනි ආරක්ෂකයින්, මගී ගුවන් යානා 22 කට නැවත ඉන්ධන සැපයීම සඳහා ගිනි ආවරණ සැපයූ අතර එක් මගියෙකු සඳහා ගිලන් රථ සේවාව ලබා දී ඇත.

## 9. ගවේෂණය කිරීම "Explore" "ගවේෂණය කිරීම" තුලින් වර්ධන මාවතට පිවිසීම

අත්‍යාවශ්‍යයෙන්ම මෙය නිර්මාණාත්මක බව, සීමාවෙන් එපිටට සිතීම පිළිබඳවයි. අපගේ ප්‍රවීන ලේඛක කුමාරතුංග මුනිදාස බොහෝ කලකට පෙර කියූවක් මෙමගින් අපට සිහිගන්වයි. "නවෝත්පාදන නොමැති ජාතියක් සාර්ථක නොවේ. නමුත් හිඟා කෑමට නොහැකි නිසා විලාප නගමින් වැතිර සිටී. නවෝත්පාදනය ගෝලීය තරඟකාරිත්වය ජය ගැනීම සඳහා බොහෝ සංවිධානවලට මාවත විවෘත කර

ඇත. සැම්සුන්ග් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී කියූ පරිදි "නවෝත්පාදන දවසේ පැය 24 සහ සතියේ දින 7 තුලම සිදුවිය යුතුය.

සමාලෝචිත වර්ෂය තුලදී ගු.ගු.සේ. කාර්යමණ්ඩලය තම ගුවන් තොටුපල මෙහෙයුම් "විශිෂ්ඨ වටිනාකම් ප්‍රස්තුතයක්" (UVP) ජනිත කළ හැකි ආකාරයට ඉටු කිරීමේ හැකියාවන් පිළිබඳව සෑම අංශයක් හරහාම ගවේෂණය කරන ලදී. පහත සඳහන් අභ්‍යන්තර සංවර්ධනයන් මේ සඳහා ස්ථිර සාක්ෂි සපයන උදාහරණ කිහිපයකි.

අ.) විවේකාගාර කළමනාකරණ පද්ධතිය

ගු.ගු.සේ. කාර්යමණ්ඩලයට පිළිගැනීමේ කවුන්ටරයේ සිට, ගුවන් මගීන්ගේ අසුන්පත්හි තොරතුරු සුපිරික්සීම තුලින් තම කාර්යයන් වඩා කාර්යක්ෂමව ඉටු කිරීමට හැකිවීම. විවේකාගාර මෙහෙයුම් කළමනාකරණයට මෙන්ම අවශ්‍ය කළමනාකරණ තොරතුරු ලබා ගැනීමට ද එහි මහත් ප්‍රායෝගික බවක් ඇත.

ආ.) අයවැය කළමනාකරණ පද්ධතිය

ගු.ගු.සේ. හි ප්‍රාග්ධන සහ මෙහෙයුම් අයවැය සැකසීම, විභජනය කිරීම සහ අධීක්ෂණය කිරීම පහසු කරවයි.

ඇ.) ඝන අපද්‍රව්‍ය දහනාගාරය කළමනාකරණ පද්ධතිය

ඝන අපද්‍රව්‍ය දහනය කිරීම සඳහා අයකරන ගාස්තු ගණනය කිරීම.

ඈ.) පසු විපරම් පද්ධතිය (සනීපාරක්ෂක පහසුකම්)

වැසිකිළි, ආරක්ෂක ස්ථාන සහ මගී පහසුකම් සැලසීමේ කවුන්ටර් යන ස්ථානවල ඇති QR cords ස්කෑන් කිරීමෙන් මගීන් හට තම ප්‍රතිචාරය ඉදිරිපත් කළ හැකිය. මෙමගින් පරීක්ෂකවරුන් හට අධීක්ෂණය කිරීමටත් සංඛ්‍යාලේඛන වාර්තා උත්පාදනය කර ගැනීමටත් ඉඩ ලබා දෙයි.

ඉ.) කාර්යමණ්ඩල පැමිණීමේ වාර්ථා පද්ධතිය

කළමනාකරුවන් හට අධීක්ෂණයට සහ පාලනයට අවශ්‍ය පැමිණීමේ වාර්තා ජනිත කර ගත හැකිය.

ඊ.) ගුවන් තොටුපල අමුත්තන් තෘප්තිමත් වීම පිළිබඳ සමීක්ෂණ පද්ධතිය (AGSS) AGSS Mobile Application (Android) මගින් බ.ජා.ගු. හිදී මගීන්ගේ පසු විපරම් ලබා ගනී.

මෙමගින් මගීන් හට තම ප්‍රතිචාරය ඉදිරිපත් කළ හැකි වන පරිදි ප්‍රශ්න ප්‍රදර්ශනය කරන අතර ඒවා මගීන්ගේ පහසුකම්, සුවපහසුව සහ ආරක්ෂාව දියුණු කිරීම සම්බන්ධ තීරණ ගැනීම සඳහා භාවිතා කරයි.

උ.) බස් රථ නැවැත්වීමේ පද්ධතිය

බස් රථ නැවතුමට ඇතුල් වීමට අවසර පත් නිකුත් කිරීමට සහ අවශ්‍ය සංඛ්‍යා ලේඛන වාර්තා සැපයීම.

ඌ.) මල්මාලා දැමීම/පිළිගැනීමේ පද්ධතිය

පැමිණීමේ කුලී රථ කවුන්ටරයේ සිට මල්මාලා දැමීම සහ කැටුව ඒම සඳහා අවසරපත් නිකුත්කිරීමට සහ අවශ්‍ය වාර්තා උත්පාදනය කිරීමට හැකි කරයි.

1 එක්සත් ජාතීන්ගේ මහලේකම් බන් කි මූන් මහතා බ.ජා.ගු. හිදී පිළිගැනීම

2 සනීපාරක්ෂක පහසුකම් පසු විපරම් යෙදවුම්

3 සංක්‍රමණ ප්‍රදේශ තුල අළුතෙන් විවෘත කළ තේ වෙළඳ සැල

4 ජලය පිළියම් කිරීමේ පිරියත - අපජලය ප්‍රතිචක්‍රීය පහසුකම්

1



2



ඔ.) අමතකව දමා යන ගමන් මළු පද්ධතිය සහ බන්ධිත භාණ්ඩ පද්ධතිය

මගීන්ගේ ගමන් භාණ්ඩ හැසිරවීමේ ක්‍රියාවලිය පහසු කරවයි. මෙහෙයුම්කරුට වඩා කාර්යක්ෂමව ගමන් මළු එකතුකිරීමට සහ නිකුත් කිරීමට හැකි අතර වාර්තා උත්පාදනයටද ඉඩ සලසයි.

ඖ.) සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

සේවකයින්ගේ සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය හැසිරවීම සඳහා සැලසුම්කර ඇත. මෙම යෙදවීමෙහි ප්‍රධාන ලක්ෂණ වන්නේ සේවක ලියාපදිංචිය, අභ්‍යන්තර සහ බාහිර හිමිකම් පෑම්, හදිසි අසනීප හිමිකම් පෑම්, යොජනාක්‍රමය කළමනාකරණය, ආරෝග්‍යශාලා ලිපි සහ වාර්තාකරණයයි.

ච.) ගුවන් ගමන් තොරතුරු ප්‍රදර්ශනය කිරීමේ කළමනාකරණ පද්ධතිය (FIDS)

මගීන්ගේ සහ අනෙකුත් උනන්දු පාර්ශවයන්ගේ පහසුව සඳහා කොළඹ ගුවන් තොටුපලේ ජංගම ගුවන් තොරතුරු ප්‍රදර්ශනය කිරීම සහ පාලනය කිරීම.

නව ආදායම් අවස්ථා ගවේෂණය කිරීම

පිටත්ව යාම/සංක්‍රමණ ප්‍රදේශ තුල නව සාප්පු සහ ආපනශාලා

විශේෂයෙන් ඉන්දියාව සහ චීනය වැනි රටවල වේගයෙන් වැඩිවන ධනවත් මධ්‍යම පාන්තික මගීන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ලක් කරමින් පිටත්ව යන වෘත්තික මගීන්ට ආහාර සහ අනෙකුත් අවශ්‍යතා සැපයීම සඳහා පිටත්ව යාමේ සහ සංක්‍රමණ ප්‍රදේශය තුල නව සාප්පු සහ ආපනශාලා හඳුන්වා දී ඇත.

පැවරුම් පසුතල වෙනස්කම්

පිටත්වයාමේ සංක්‍රමණ ප්‍රදේශය තුල ඇති සාප්පු දැන් සමාන පැවරුම් අනුව එක පොකුරකට ගෙන නව පාරිසරික පසුතලයක් යටතේ අළුත් පරිසරයක් නිර්මාණය කර ඇති අතර මෙමගින් මගීන්ට පහසුකම් මෙන්ම දැඩි ආකර්ෂණයක්ද ඇති කරයි.

නව ආරම්භයන්

සේවා ප්‍රනාම 2016

ගු.ගු.සේ. ඉතිහාසයේ ප්‍රථම වරට, 2016 වර්ෂය තුල විශ්‍රාම ලැබූ සේවකයින් විසින් සිදුකළ කැපකිරීම ඇගයීම සඳහා වැඩසටහනක් සංවිධානය කරන ලදී. මේ පිළිබඳ විස්තර මානව සම්පත් කළමනාකරණය යටතේ සාකච්ඡා කර ඇත.

## 10. බලගැන්වීම *(Empower)*

"බලගැන්වීම" තුලින් වර්ධන මාවතට පිවිසීම

ලාඕ ට්සු දිගු කලකට පෙර පැවසූ පරිදි "බලවත් නායකයින්, නායකයන් බිහිකිරීමේ සමත්හු වෙති."වැනි පරිවර්තනයක් කළ හැකි වන්නේ බලගැන්වීමක් තුලින් පමණි. එය වගවන අතරතුර කර ගෙන යාම සඳහා අන්‍යයන්ට කාර්යයන් බෙදා හැරීම සහ පැවරීම හා සම්බන්ධ වෙයි. අනෙක් අතට එය සංවර්ධනය හා සම්බන්ධ වෙයි. "බලගැන්වීම" අර්ථයෙන් ගත්කළ ගු.ගු.සේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය යටතේ සිත් ගන්නා සුළු වේගයකින් නොගිණිය හැකි දියුණුවක් වාර්තා කර ඇත.

රාජ්‍ය සංස්ථාපිත අපේක්ෂාව (SCI)

බලගැන්වීම පිළිබඳ කරළියේ තීරණාත්මක සන්ධිස්ථානයක් වනුයේ 2017 සිට 2019 කාලච්ඡේදය සඳහා ශ්‍රී ලංකා රජය සහ ගු.ගු.සේ. අතර යෝජිත සංස්ථාපිත අපේක්ෂාව පිළිබඳ ප්‍රකාශනයයි. ගු.ගු.සේ. පාලක මණ්ඩලයේ සහ කළමනාකාරිත්වයේ ජයග්‍රහණ පහසු කිරීමට ප්‍රමාණවත් සහ සාධාරණ කළමනාකාරිත්ව සහ මෙහෙයුම් ස්වාධීනත්වයක අවශ්‍යතාවය හඳුනාගැනීමේ අරමුණ ඇතිව මේ සඳහා මූලික කටයුතු 2016 දී ආරම්භ කොට ක්‍රියාත්මක කරන ලදී. මෙම බල ගැන්වීමේ යාන්ත්‍රණය පොදු සම්පත් පිළිබඳ කළමනාකාරිත්වයේ විනිවිදභාවය සහ ප්‍රතිඵල පිළිබඳව වගවීම වැඩිදියුණු කරයි.

පසුව 2017 මාර්තු 15 වන දින මුදල් අමාත්‍යාංශයේ



3



4



1



2

ලේකම්, ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් සහ ගු.ගු.සේ. සභාපති ඉහත සඳහන් ත්‍රෛපාර්ශවීය ගිවිසුම අත්සන් කරන ලදී.

## 11. දරා සිටීම *(Endure)* - "දරා සිටීම" තුලින් වර්ධන මාවතට පිවිසීම

මෙය පවත්වා ගෙන යාම පිළිබඳව වේ. ව්‍යාපාර අසාර්ථකත්වයන් අතර තීරණාත්මක සාධකයක් බවට තිරසාර පැවැත්ම පත් වී ඇත. විශ්වය හරහා පවතින අවුල් සහගත කාලගුණික රටා, පරිසර හිතකාමී ක්‍රියාකාරකම් වඩවඩා අවශ්‍යය යන්න පිළිබඳව බරපතල මතක් කිරීමක් වේ. කුමක් වුවත් ලාභය සහ මිනිසුන් පමණක් නොව සමස්ථ පරිසරය පිළිබඳව තැකීමක් කළ යුතුය. මේ තත්වය අනුව ගු.ගු.සේ. 2016 වර්ෂය තුලදී ආයතනික සමාජ වගකීමේ ගම්‍ය බලය සහ තිරසාර බව අඛණ්ඩව පවත්වා ගෙන ගොස් ඇත.

ආයතනික සමාජ වගකීම (CSR)

ප්‍රජා සංවර්ධනයේ වටිනාකම අවබෝධ කරගනිමින්, ගු.ගු.සේ. සමාගම 2016 මැයි මාසය තුලදී නායයාම් සහ ගංවතුරවලින් විපතට පත් මහජනයා වෙත පානීය ජලය සහ වියලි ආහාර ලබා දීම. බෝපිටිය පමුණුගම මහා විද්‍යාලයේ සිසුන් 574 කට පාසල් උපකරණ සහ අරනායක නායයෑම්වලින් විපතට පත් පවුල් 62 කට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සැපයීම මගින් තම ආයතනික සමාජ වගකීම ඉටු කිරීමට සම්බන්ධ විය.

පරිසර හිතකාමී වායුගෝලය සහ හරිත ගුවන් සංකල්පය.

වැසිකිලි සේදීමට සහ භූමි අලංකරණ කටයුතු සඳහා සැපයීමට බජාගුහි ජල පිළියම් පිරියත මගින් අපජලය ප්‍රතිචක්‍රීය කිරීමේ පහසුකම යෝජනා කරන ලදී. මෙම යෝජිත පද්ධතිය සැලසුම් කරනු ලැබුවේ හිඟ ප්‍රදේශවල ජලය ඉතිරි කර ගැනීමටත් දූෂ්‍යවීම වලක්වන අතර සංවේදී පාරිසරික පද්ධතියෙන් ජලය ඉවතට හැරවීම අඩුකිරීමටත්ය.

නව මෝටර් රථ නැවතුමෙහි සහ VIP ප්‍රදේශය තුල මළ අපද්‍රව්‍ය උතුරා යාම වැලැක්වීම සඳහා පොලව යට ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන මලාපවහන වලවල් කිහිපයක් යෝජනා කර ඇත.

වායු සමීකරණ පද්ධතියේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට මෙන්ම හරිත ගුවන් සංකල්පය ගොඩනැගිලි තුල අනුයුක්ත කිරීමට මගී පර්යන්ත ගොඩනැගිල්ලේ සහ අනෙකුත් ගොඩනැගිලි කිහිපයක මධ්‍යම වායු සමීකරණ පද්ධතිය වර්ධනය කිරීමට යෝජනා කර ඇත.

ම.රා.ජා.ගු. හි CSR ව්‍යාපෘති

ඔරුකෙන්ගල රජ මහා විහාරයට ම.රා.ජා.ගු. සිට ඇත්තේ සැතපුම් කිහිපයක් පමණි. ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල ආසන්නයේ පිහිටි මෙම පන්සල අතිශයින්ම ග්‍රාමීය මෙන්ම නටබුන් වූවකි. අඩු පහසුකම් යටතේ සහ බොහෝ දුෂ්කරතා මධ්‍යයේ එය මත්තල අඩු වරප්‍රසාද ලත් ගැමියන් හට ජීවිත ආලෝකය ලබා ගැනීමට සහය වෙයි. අවට ජනයාගේ ජීවිත ආලෝකමත් කිරීමට උර දෙමින් පන්සල යම් ප්‍රමිතියකට සංවර්ධනය කිරීම ගු.ගු.සේ. ආයතනික සමාජ වගකීම වැඩසටහන් වලින් ප්‍රධාන එකක් විය. පහත සඳහන් දෑ සාර්ථකව නිම කරන ලදී.

- පැවතුනු බුදු මැදුර තීන්ත ආලේප කොට උසස් තත්වයට පත් කරන ලදී.
- සතර මහා දේවාලය සහ ස්ථූපය ගොඩනැගීමට ආරම්භ කරන ලදී.
  - පන්සලට ප්‍රවේශ මාර්ගය වීදි ලාම්පු සහිතව අළුත්වැඩියා කොට ප්‍රතිසංස්කරණය කරන ලදී.
  - විදුලි පද්ධතිය, විදුලි පංකා සහ බිත්ති කපරාරුව සහිතව ධර්මශාලාව සම්පූර්ණ කිරීම.

2016 මාර්තු 17 දින තවත් CSR වැඩසටහනක් වූ ලේ දන් දීමේ වැඩසටහනක් මරාජාගු හි ක්‍රියාත්මක කළ අතර ඒ පිළිබඳ විස්තර මානව සම්පත් කළමනාකරණය යටතේ ඇතුලත් කොට ඇත.



3

1 2016 මාර්තු 18 දින ම.රා.ජා.ගු. 3 වන සංවත්සරය වෙනුවෙන් ලේ දන් දීමේ ව්‍යාපාරයක් පැවැත්වීම

2 ගු.ගු.සේ. බ.ජා.ගු. හිදී ප්‍රවාහන ආරක්ෂණ පරිපාලන (*TSA*) පරීක්ෂණයට අනුගත වීම

3 ජීව පැමිණීමේ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම

## 12. ග්‍රහණය කරගැනීම *(Embrace)* "ග්‍රහණය කර ගැනීම" තුලින් වර්ධන මාවතට පිවිසීම

වේගයෙන් වෙනස් වන සහ මනාව සම්බන්ධිත ලෝකය තුල ගු.ගු.සේ. ට 'හොඳම' පරිචයන් අභිබවා 'ඊළඟ' පරිචයන් ග්‍රහණය කර ගැනීම අවශ්‍ය වේ. විශේෂයෙන්ම ගුණය, මිත්‍රශීලී බව, සාමූහික පාලනය, කාර්යක්ෂමතාවය, ආරක්ෂාව සහ සමාජ වගකීම සංස්ථාපිත වටිනාකම් ලෙස සලකන රාජ්‍ය ආයතනයක් ලෙස කියන දේ කරන කළමනාකරණ විලාසිතාවක් පිළිබිඹු කරනු පිණිස ග්‍රහණය කර ගැනීම අතිශය වැදගත් වේ.

ගු.ගු.සේ. සමාගම TSA පිරික්සීම සමග අනුකූල වෙයි

එක්සත් ජනපද ආණ්ඩුව ගුවන් යානයක ගෙන යන සෑම භාණ්ඩයක්ම පිරික්සීමට ප්‍රවාහන ආරක්ෂණ පරිපාලනය (TSA) නම් වූ නීතියක් සම්මත කරන ලදී. TSA සහතික ලත් භාණ්ඩ පිරික්සුම් වැඩසටහන මගින් ප්‍රමාදවීම් සහ භාණ්ඩ හානි සිදුකරමින් ගුවන් තොටුපලේදී කොටස් පිරික්සනවාට වඩා ව්‍යාපාරික නැව් භාණ්ඩ කල් තබා පිරික්සීමට හැකියාව ඇති කරයි. ව්‍යාපාරයන්ට තම නැව් භාණ්ඩ තමන් විසින්ම ගුවන් මගින් සහතික කර ගැනීම හෝ TSA පිරික්සුම් පහසුකම් භාවිතා කිරීම මගින් ගුවන් තොටුපලේදී කොටසෙන් කොටස පිරික්සීම වලක්වා ගැනීම හැකිවේ.

ගු.ගු.සේ. ගුවන් ආරක්ෂක පිරිස් 995 දෙනෙක් ICAO පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කොට තම සුදුසුකම් ගු.ගු.සේ. හි සිවිල් ගුවන් සේවා පුහුණු ආයතනයෙන් ලබා ගන්නා ලදී. 2016 දෙසැම්බරයේදී ගුවන් සේවා ආරක්ෂක පුහුණු වන්නන් 50 දෙනෙක් බඳවා ගත් අතර සාර්ථක පුහුණුවක් සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන්ව සේවාස්ථ පුහුණුව සඳහා යොමු කරනු ලැබේ.

2016 නොවැම්බරයේදී නව දියුණු CCTV පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරක්ෂණ පද්ධතියට හඳුන්වා දුන් ඉතා වැදගත් ආවේක්ෂණ උපකරණයක් විය.

2016 දී ගුවන් ආරක්ෂණ පුහුණු ක්‍රියාවලිය ( AVSEC ) වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන වැඩපිළිවෙලක් සකස් කරන ලදී. මෙහිදී AVSEC මෙහෙවර අත්පත් කරගැනීමට අදාල රීති, චර්යා සමග සියළු තීරණාත්මක ගැටළුද හඳුනාගන්නා ලදී. ගු.ගු.සේ. ආරක්ෂක කාර්යමණ්ඩලයේ දැනුම, කුසලතාවය සහ දක්ෂතා සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- මුර සංචාරක නායකයින් සහ ආරක්ෂක නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන.
- උපදේශකයින් සඳහා පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීම සඳහා වූ පුහුණු සැසිය.
- සියළුම AVSEC පිරිස් සඳහා පුපුරණ ද්‍රව්‍ය සහ ආයුධ හඳුනාගැනීමේ වැඩමුළුව.
- මගීන් සහ ගමන්මලු පිරික්සීම පිළිබඳව AVSEC කාර්යමණ්ඩලය සඳහා ප්‍රායෝගික පුහුණුව.
- AVSEC පිරිස් සඳහා අන්තරායකර භාණ්ඩ නියාමනය පිළිබඳ පුහුණුව.
- AVSEC පිරිස් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා .
- AVSEC පිරිස් සඳහා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැටසටහන.
- AVSEC පිරිස් සඳහා ඵලදායි සහ යහපත් වටාපිටාවක් වෙනුවෙන් ඵලදායි සහ සඵලවත් ලෙස රැස්වීම් පැවැත්වීම පිළිබඳ පුහුණුව.
- AVSEC උපදේශකයින් සඳහා සැලසුම් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන.
- AVSEC පිරිස් සඳහා ගුවන් ආරක්ෂක කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන.
- කළමනාකරණ සහායකයින් සඳහා ධනාත්මක ආකල්ප ගොඩනැගීම මගින් ගුණාත්මක වැඩ නිමැවුම්.
- AVSEC පිරිස් සඳහා ගනුදෙනුකරුවන් රැක බලා ගැනීම සැමගේ කාර්යයක් වැඩ සටහන.

අපගේම කාර්යමණ්ඩලයට අමතරව ගුවන් ආරක්ෂාවට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ අනෙකුත් ආයතනවල ප්‍රයෝජනය සඳහා බොහෝ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- ශ්‍රී ලංකන් කේටරින් කාර්මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන.
- තීරු බදු රහිත සාප්පු කාර්යමණ්ඩලය සඳහා

දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන.

- ගු.ගු.සේ. නවක කාර්යමණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන.

ඉහත සඳහන් පුහුණු පාඨමාලාවලට අමතරව පහතින් දැක්වෙනුයේ දැනුම වැඩිදියුණු කිරීම පිළිබඳව අප ලැබූ ජයග්‍රහණ කිහිපයක් වේ.

- ආරක්ෂක මාෂල් තිදෙනෙක් හා නියෝජ්‍ය ආරක්ෂක මාෂල් පස් දෙනෙක් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් පවත්වනු ලැබූ AVSEC කළමනාකරණ සහතික පත්‍ර විභාගය සම්පූර්ණ කරන ලදී.
- 75 ක් වූ AVSEC පිරිස් පරීක්ෂකවරුන් ලෙස සහතික ලබා ගන්නා ලදී.
- AVSEC 525 දෙනෙක් පරීක්ෂකවරුන් ලෙස CAASL මගින් යලි සහතික ලබා ගන්නා ලදී.

ජීව පැමිණීමේ තොරතුරු වාර්තා පද්ධතිය

ගු.ගු.සේ. පූර්වයෙහි සේවක පැමිණීම් වාර්තා කිරීමට පූර්ණ ලියකියවිලි මත පදනම් වූ ක්‍රමයක් අනුගමනය කළ අතර 2016 වර්ෂයේදී ස්වයංක්‍රීය ජීව පැමිණීමේ තොරතුරු වාර්තා කිරීමේ පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මෙය ව්‍යවසාය සම්පත් සැලසුම් හා අනුකූල වන්නක් ද වේ. නව පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය සමිති, සේවක සංවිධාන, අංශ ප්‍රධානීන් සහ අනෙකුත් සියළු කාර්යමණ්ඩල වලින් ලැබුනු සහයෝගය කළමනාකාරීත්වය පැසසුමට ලක් කරයි. මෙම වෙනස මගින් තවදුරටත් සේවකයින්ගේ ඵලදායිතාවය සහ සඵලත්වය වර්ධනය කිරීමට ගු.ගු.සේ. බලාපොරොත්තු වෙයි.

## 13. සුපෝෂණය *(Enrich)* - "සුපෝෂණය" තුලින් වර්ධන මාවතට පිවිසීම

මෙය ජීවිතයේ භෞතික, මානසික, චිත්තවේගී, සමාජයීය සහ අධ්‍යාත්මික පැතිකඩ හා සම්බන්ධ වන පුළුල් යෙදුමකි. අපට ඉහත සඳහන් සියළු පෙරමුණු තුලනය වන ආකාරයට සුපෝෂණය කිරීම අවශ්‍ය වේ. 'ජීවිතය සුපෝෂණය කිරීමේදී' පළපුරුදු සහ අනාවරණය කර ගැනීම් ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. සමාලෝචිත වර්ෂය තුලදී ගු.ගු.සේ. සමාගම තම ශේෂ පත්‍රයේ 'භෞතික තොග ය' වැඩි කරගැනීමට වඩා 'මානව ප්‍රාග්ධන තොගය' වැඩි කිරීම සඳහා තම කාර්යමණ්ඩලය සුපෝෂණය කිරීමට කටයුතු කරන ලදී.

විදේශීය පුහුණුව

සංවිධානයක මූලික ප්‍රමුඛත්වය වනුයේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමයි. මානව ප්‍රාග්ධනයේ වටිනාකම එහි සේවකයින්ගේ කාර්ය පිරිවිතර නිපුණතා සහ තාක්ෂණික නිපුණතා මත රඳා පවතියි. මානව ප්‍රාග්ධන සංවර්ධනයේ වැදගත්කම සැලකිල්ලට ලක් කරමින් ගු.ගු.සේ. පුහුණු අවශ්‍යතා විශ්ලේෂණ ක්‍රියාවලිය මගින් විධිමත් පුහුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ක්‍රියාපටිපාටියක් පවත්වා ගෙන ගොස් ඇත.

මානව සම්පත් සමාලෝචනයේදී සවිස්තරව සාකච්ඡා කළ පරිදි සමාගම පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය මත පදනම්ව ස්ථාවර දේශීය සහ විදේශිය පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සැලසුම් කරන ලදී.

කාර්යසාධන කළමනාකරණය

'අංශක 180 ඇගයීම් පද්ධතිය' ලෙසින් ජනප්‍රිය වූ නව කාර්යසාධන කළමනාකරණ පද්ධතිය ගුගුසේ විසින් විධායක නොවන ශ්‍රේණි සඳහා දියත් කළ අතර මානව සම්පත් කළමනාකරණ සමාලෝචනයේදී සවිස්තරාත්මකව සාකච්ඡා කළපරිදි වර්ෂය තුල එය ඉතා සාර්ථකව ක්‍රියාත්මක විය.

## 14. පූර්ණ ඒකාත්මික බව *(Engross)* "පූර්ණ ඒකාත්මික බව" තුලින් වර්ධන මාවතට පිවිසීම

සම්පූර්ණ සහභාගිත්වය ඇතිව සමස්ථ ලෙසම සම්බන්ධ වීම මෙයින් අදහස් කරයි. ඔබට සාකල්‍යවාදී වීමට අවශ්‍ය සහ තත්වයෙහි පිරුණු බව ග්‍රහණය කර ගැනීමට කැමති ප්‍රමාණයට මෙය යෙදවීම යන්නෙන් වෙනස් වෙයි. අවුල් ලෙස සම්පූර්ණ කළ දුබල සහ හොඳින් සැලසුම් නොකළ ප්‍රවේශයන් සම්පූර්ණයෙන් ප්‍රති විරුද්ධ වෙයි. පූර්ණ ඒකාත්මික බව 'විශිෂ්ඨ' බවේ මාවත වෙයි.



1



2

"ආසියානු කලාපයේ වඩාත්ම කාර්යක්ෂම සහ හිතකාමී ප්‍රමුඛතම ගුවන් සේවා කේන්ද්‍රස්ථානය" වීමේ "හවුල් දැක්ම" පිළිබඳ අභිලාෂය අත්පත් කරගැනීම සඳහා ඔවුන් නිර්මාණාත්මක නම් ගු.ගු.සේ. හි සියළුම අංශයන්ට වාගේ පූර්ණ ඒකාත්මික බව පැහැදිලි ලෙසම වැදගත් වෙයි. කෙසේ වුවද ඉහළ ප්‍රමිතියක ගම්‍යතාවක් පවත්වා ගැනීම සඳහා විශේෂයෙන්ම ආරක්ෂක සහ ගිනි සහ මුදවා ගැනීමේ කාර්යමණ්ඩලයට දෛනික පරිචයක් ලෙස පූර්ණ ඒකාත්මික බව ප්‍රමුඛ පරිචයක් වේ.

අ) බ.ජා.ගු., ම.රා.ජා.ගු. සහ රත්මලාන තුල ගිනි සහ මුදවා ගැනීම් සේවා වලදී ICAO ප්‍රමිතීන් සහ නිර්දේශිත පරිචයන් වර්ෂය පුරාම පවත්වා ගෙන යන ලදී.

ආ) 2016 නොවැම්බර් 24 දින අභ්‍යන්තර සහ බාහිර නියෝජිතායතන සමග බ.ජා.ගු. හි දී මහා පරිමාණයේ හදිසි අභ්‍යාස සාර්ථකව මෙහෙයවන ලදී.

බ.ජා.ගු. හි සිංහල සහ හින්දු අළුත් අවුරුදු උත්සව

අභ්‍යවකාශය තුල සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට ගමන් කරන විට ගු.ගු.සේ. කාර්යමණ්ඩලයේ පූර්ණ සහභාගිත්වය ඇතිව නව අවුරුද්ද සැමරීම ආරම්භ කරන ලදී. මෙය වඩාත් වර්ණවත් කිරීම සඳහා විදේශීය මගීන් පවා ශ්‍රී ලංකා සත්කාරය භුක්ති විඳීම පිණිස අපගේ සේවකයින් සමග එක්වන ලදී.

1 මගීන් සමග එක්ව බ.ජා.ගු. හිදී නව අවුරුදු සැමරුම

2 බ.ජා.ගු. හි හදිසි අභ්‍යාස (Emergency Exercise)

3 හිමාලයා ගුවන් සේවය

4 *KLM* ගුවන් සේවයේ බ.ජා.ගු. දක්වා පළමු ගුවන් ගමන

මහා පරිමාණ හදිසි අභ්‍යාස

බ.ජා.ගු. හි එකම හදිසි වෛද්‍ය සේවා සපයන්නා ලෙස වෛද්‍ය ඒකකය නිරන්තරයෙන් හදිසි අභ්‍යාස පැවැත්වීම අත්‍යාවශ්‍ය වෙයි. වෛද්‍ය ඒකකය ඇතුළුව සියළු උනන්දු පාර්ශවයන්ගේ සූදානම්බව පරීක්ෂා කිරීම සඳහා 2016 නොවැම්බර් 24 දින මහා පරිමාණ හදිසි අභ්‍යාසයක් මෙහෙයවන ලදී.

වෛද්‍ය ඒකකයට අනතුරට පත් වූවන් එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සහ ජීවතුන් අතර සිටින්නන් භාර ගැනීමේ මධ්‍යස්ථානයක් සූදානම් කිරීමේ වගකීම පැවරින. මේවා හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා මුදවා ගන්නන් විසින් අනතුරට පත් වූවන් ගෙන එනු ලබන සහ විශේෂ ප්‍රතිකාර සඳහා ආරෝග්‍යශාලා වෙත මාරු කර යවනු ලබන ප්‍රධාන ස්ථාන වේ. ගු.ගු.සේ. වෛද්‍ය ඒකකයට සම්බන්ධ කාර්යමණ්ඩලය සහ වෛද්‍ය නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම වැදගත් මධ්‍යස්ථාන දෙක හසුරුවන ලදී.

වෛද්‍ය ඒකකයේ කාර්යමණ්ඩලයට අමතරව සම්බන්ධිත රජයේ ආරෝග්‍යශාලා සුපරීක්ෂාකාරී වූ අතර අනුබද්ධිත රජයේ රෝහල්වල නිලධාරීන්ද අභ්‍යාසයට සහභාගී වූහ. බ.ජා.ගු. හදිසි සේවා සැලසුම පරිදි සහභාගිත්වය, ප්‍රතිචාර



4

3


දැක්වීමේ කාලය සහ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOP) වලට අනුකූල වීම අනුව ප්‍රබල සාර්ථකත්වයකින් යුතුව අභ්‍යාසය පවත්වන ලදී.

නව ගුවන් සේවා සමග "පූර්ණ ඒකාත්මික බව" තුලින් වර්ධන මාවතට පිවිසීම

හිමාලයා ගුවන් සේවය

2016 අප්‍රේල් 12 වෙනි දින හිමාලයා ගුවන් සේවය තම ප්‍රථම වාණිජ ගුවන් ගමන කත්මන්ඩු සිට කොළඹ දක්වා පියාසර කරන ලදී. ගුවන් ගමන තුලින් ශ්‍රී ලංකාව සහ නේපාලය අතර සංචාරක කර්මාන්තය දියුණු කිරීමට මෙන්ම දෙරට ජනයා මුණ ගැස්වීම තුලින් සුහදත්වය දියුණු කිරීමද අදහස් කරන ලදී. කත්මන්ඩු සිට කොළඹ දක්වා වූ මෙම නව ගුවන් ගමන ශ්‍රී ලංකාවට එන නේපාල සංචාරකයින් මෙන්ම නේපාලය හරහා ශ්‍රී ලංකාවට එන සංචාරකයින් වැඩි කර ගැනීමට ඉමහත් ධෛර්යයක් වනු ඇත.

KLM Royal Dutch ගුවන් සේවය

අවුරුදු 20 කට පසු 2016 නොවැම්බර් 01 වන දින **KLM Royal** Dutch ගුවන් සේවය ඇම්ස්ටර්ඩෑම් සිට කොළඹ දක්වා සෘජු ගුවන් සේවා ආරම්භ කරන ලදී. යුධ තත්වයන් වැඩිවීම නිසා 1997 දී KLM (එකල අබුඩාබි හරහා සේවය කළ) තම සේවා ශ්‍රී ලංකා අගනුවරට සැපයීම නතර කරන ලදී. KLM හි නව බෝයිං 787 ඩ්‍රීම් ලයිනර් ගුවන් යානය බ.ජා.ගු. සිට ඇම්ස්ටර්ඩෑම්හි ෂිපෝල් ගුවන් තොටුපල දක්වා මගීන් 294 දෙනෙකු KLM ගෝලීය ජාලයට සම්බන්ධ කරමින් ක්‍රියාත්මක වෙයි.

මහා මාලදිවයින් ගුවන් සේවා (MEGA Maldives Airlines)

මහා මාලදිවයින් ගුවන් සේවය 2016 නොවැම්බර් 03 වන දින මාලේ සහ බ.ජා.ගු. අතර නව ගුවන් සේවා ආරම්භ කරන ලදී. සති අන්තවල මාලදිවයින් සහ ශ්‍රී ලංකාව අතර ගුවන් ගමන් නිසි වේලාවට සිදු කෙරෙන අතර මෙම කාර්යබහුල දිනවල දැරිය හැකි සහන ගාස්තු ලබා දෙනු ඇත.

යුක්‍රේන් ජාත්‍යන්තර ගුවන් සේවය (UIA)

යුක්‍රේනයේ ජාතික ප්‍රවාහකයා වන යුක්‍රේන් ජාත්‍යන්තර ගුවන් සේවය බෝයිං 767 -300 ER නවතම යානය භාවිතා කරමින් කිව් සිට බ.ජා.ගු. දක්වා ගුවන් ගමන් ආරම්භ කරන ලදී. ආරම්භක ගුවන් ගමන 2016 නොවැම්බර් 05 වන දින ක්‍රියාත්මක කරන ලදී. යුරෝපයේ සිට ශ්‍රී ලංකාව දක්වාත් නැවත යුරෝපයටත් සෘජු ප්‍රවේශය ලබා දෙන ප්‍රවාහකයින් අතුරෙන් UIA එකක් වෙයි. යුක්‍රේනයේ සහ නැගෙනහිර යුරෝපයේ සිට සංචාරකයින් ගණන සුවිශේෂී ලෙස වැඩිවීමත් සමග මෙම ගමනාන්තයන් අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වෙයි.

ටර්කිෂ් ගුවන් සේවා

2016 නොවැම්බර් 09 වන දින බ.ජා.ගු. වෙත පැමිණි භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානය සමග තම ගෝලීය ගුවන් ගමන් සිතියමට කොළඹින් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව එකතු කිරීම ටර්කිෂ් ගුවන් සේවය මගින් සමරන ලදී.

## 15. නිදහස්වීම *(Emancipate)* - "නිදහස්වීම" තුලින් වර්ධන මාවතට පිවිසීම

මෙය සියල්ලෙහි විචක්ෂණ දෘෂ්ටිය වේ. එය සංස්ථාමය වටිනාකම් පුහුණු කිරීම හා සම්බන්ධ වෙයි. එය හුදෙක් කෙටිකාලීන වාසි අත්පත් කරගැනීම පමණක් නොව වඩා ගැඹුරු, පැතිරුණු ස්ථාවර මූලධර්ම වෙයි. ආචාර ධර්ම නිශ්චිත ක්‍රමයකට නිර්වචනය කල නොහැකිය. සාමාන්‍ය අර්ථයෙන් ගත් කළ, ආචාර ධර්ම යනු හරි කුමක්ද හෝ වැරදි කුමක් ද යන්න සමග ආයතනික චර්යාවන් පාලනය කරනු ලබන සදාචාරාත්මක මූලධර්ම සංග්‍රහයක් වේ. "අන්‍යයන්ගෙන් ඔබට ලැබියහැකි දෙය, ඔබ අන්‍යයන්ට ලබා දෙන්න" ආචාර ධර්ම පිළිබඳ ස්වර්ණමය රීතිය එසේ පවසයි.

ගු.ගු.සේ. සමාගම මගීන්, අමුත්තන්, කාර්යමණ්ඩලය, ගුවන් සේවක පිරිස, ගුවන් යානා සහ ගගන යාත්‍රාංගණය තුල ඇති සියළු පහසුකම් ආරක්ෂා කළයුතු වඩාත් වැදගත් සම්පත් ලෙස සලකයි. AVSEC කාර්යමණ්ඩලය සහ ආරක්ෂණ පිරික්සුම් උපකරණ වෙත නිසි කාර්යක්ෂම ආරක්ෂාව ගුගුසේ සහතික කරයි. හොඳින් පුහුණු කළ AVSEC කාර්යමණ්ඩලය, ක්‍රියාපටිපාටීන් සහ තාක්ෂණය හරහා ගුවන් ආරක්ෂාවෙහි අපේක්ෂිත ICAO ප්‍රමිතීන් සාක්ෂාත් කරගැනීමටත් පවත්වාගෙන යාමටත් ගු.ගු.සේ. නිරතුරුව බලාපොරොත්තු වෙයි.

මධ්‍ය වර්ගයේ තීරු බදු රහිත සාප්පු

ගු.ගු.සේ. සමාගම වඩාත් ආචාරශීලී වෙමින් සහ එසේම රජයේ ප්‍රසම්පාදන මග පෙන්වීම් අනුගමනය කරමින් මෑත ඉතිහාසයේ පළමුවරට මධ්‍ය වර්ගයේ තීරු බදු රහිත සාප්පු පවත්වාගෙන යාම සඳහා ජාත්‍යන්තර මිල ගණන් කැඳවන ලදී. බ.ජා.ගු. හි ඉහළ ආදායම් ජනනය කෙරෙන වාණිජ කටයුතු ප්‍රධාන ඝනයේ තීරුබදු වලින් නිදහස් එකක් බැවින්, පිටත්වයාමේ සංක්‍රමණ ප්‍රදේශය තුල විශාල සාප්පු අවකාශයක් වර්ෂය තුලදී වෙන් කරන ලදී.

ආයතනික වටිනාකම් පිළිබඳ ආරක්ෂණ මිනුම්

දවසේ පැය 24 සහ සතියේ දින 7 පුරාම පදනම යටතේ ක්‍රියාත්මක වීමේදී ගු.ගු.සේ. එහි මෙහෙයුම් සහ මූල්‍යමය කාර්යසාධනයට තර්ජනයක් විය හැකි බොහෝ අවදානම්වලට මුහුණ දෙයි. සෑම ඉහළට නැගීමකදී මෙන්ම ගොඩ බැස්සවීමකදී, සෑම ඉන්ධන නැවත පිරවීමකදී, සෑම එන්ජින් සූදානම් කිරීමකදී, ගුවන් යානා හැසිරවීමේ ප්‍රදේශය තුල වාහනයක් හෝ පුද්ගලයෙක් පිළිබඳ සෑම අවස්ථාවකදීම අවදානමක් ඇති වෙයි. මෙය ගුවන් සේවා ක්ෂේත්‍රයේ ස්වභාවයයි. එය ස්වභාවය වුවත් වැරදි සහ උල්ලංගනය වීම් නැවත නැවත සිදු වුවහොත් සමාවක් තිබිය නොහැකිය. එමනිසා "පුද්ගලයින් හෝ දේපල හානි පිළිබඳ අවදානම, ව්‍යසන හඳුනාගැනීමේ සහ

අවදානම් කළමනාකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියක් හරහා බලාපොරොත්තු වන මට්ටමට" වඩා අවම මට්ටමකින් පවත්වා ගෙන යාමට කළහැකි සෑම දෙයක්ම කළයුතුය. බ.ජා.ගු. හි ආරක්ෂණ කළමනාකරණ පද්ධතියේ අරමුණ එය වේ.

බ.ජා.ගු. හි අනතුරු / සිදුවීම් අනුපාතය සීහුම් පරාසය තුල වෙයි. මගීන් සහ ගුවන් යානා සංචලනයන් වැඩිවීමකදී පවා ප්‍රධාන ආරක්ෂිත ගැටළු නොතිබුනි. මෙම ජයග්‍රහණය සියළු මෙහෙයුම් අඛණ්ඩව අධීක්ෂණයේ, ක්‍රියාපටිපාටීන්ට අනුකූල වීමේ, නිරන්තර පරීක්ෂාවේ, නිසි කලට නිවැරදි කිරීමේ හෝ වැලැක්වීමේ පියවර ගැනීමේ සහ නිරතුරුව දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් වේ. බ.ජා.ගු. හි උසස් ආරක්ෂිත කාර්යසාධන ප්‍රමිතීන් ගුවන් සේවා මෙහෙයුම්කරුවන් සහ අනෙකුත් උනන්දු පාර්ශවයන්ගේ විශ්වාසය ඇතිව ගොඩ නැගූවකි. දඬුවම්කාරී නොවන ආරක්ෂණය වාර්තා කිරීමේ සංස්කෘතියක් සභාපතිතුමා විසින් අනුමත කිරීම සහ ඉහළ කළමනාකාරිත්වයේ කැපවීම ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය පිළිබඳව සේවක විශ්වාසය ගොඩනැංවීමට ප්‍රධාන හේතුවක් වෙයි. දඬුවම් කිරීමේ නොව වැලැක්වීමේ ධනාත්මක ආකල්පයකින් සෑම ආරක්ෂිත ගැටළුවකටම ආමන්ත්‍රණය කරන පහත සඳහන් ආරක්ෂණ දර්ශනය සභාපතිතුමා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අවබෝධ කරගනිමින් සහ ගරු කරමින් සිටී.

- අනතුරු සහ බරපතල සිදුවීම් සහමුලින්ම නැති කිරීම කළ නොහැකිය.
- මනාව පුහුණු කරනු ලැබූ වැලැක්වීමේ ප්‍රයත්න නොසලකා අසාර්ථකවීම් සිදුවිය හැකිය.
- අවදානමෙන් සහ වැරදිවලින් තොර මානව ප්‍රයත්න හෝ මානව විධික්‍රම තිබිය නොහැකිය.
- නෛසර්ගික වූ ආරක්ෂණ පද්ධතියක පාලනය කළ අවදානම් සහ වැරදි පිළිගත හැකිය.

අභ්‍යන්තර විගණන/ පරීක්ෂා/ සමීක්ෂණ වලට වැඩිමනත් ලෙස උසස් ආරක්ෂණ කාර්යසාධන ප්‍රමිතීන්වල අඛණ්ඩ භාවය සහතික කරගනු පිණිස CAASL ස්වාධීන විගණන/ පරීක්ෂා/ සමීක්ෂණ පවත්වාගෙන යයි.

ගු.ගු.සේ. ආරක්ෂණ කළමනාකරණ පද්ධතියෙහි සඵලවත් ක්‍රියාත්මක වීම ආරක්ෂණ කළමනාකරණ ඒකකය විසින් අධීක්ෂණය කරන අතර සියළු ගුවන් තොටුපලවල නියාමන කළමනාකරණ අවශ්‍යතා සමග නිරතුරු අනුකූලත්වය සහතික කරයි. ආරක්ෂණ කළමනාකරණ ඒකකය, ගුවන් තොටුපලවල් තුල මෙහෙයුම් අංශයන්හි ආරක්ෂණ කාර්යසාධනය පිළිබඳව සමීප අධීක්ෂණයක් ක්‍රියාත්මක කරන අතර මෙම අංශ තුල නිරන්තර විගණන මෙහෙයවනු ලබයි.

## 16. විශිෂ්ඨත්වය *(Excel)* - "විශිෂ්ඨත්වය" තුලින් වර්ධන මාවතට පිවිසීම

විශිෂ්ඨත්වය යනු ඉතාමත් හොඳින් කටයුතු කිරීමයි. සාම්ප්‍රදායික විශ්වාසය වූයේ මධ්‍යම හෝ කෙටිකාලයේදී සංවිධානයකට විශිෂ්ඨ වීමට නොහැකි බවයි. නමුත් සංඛ්‍යාංක ආවේණික (Digital Natives) අවුල්කාරී තාක්ෂණ (Disruptive Technologies) මගින් ධාවක airbnb(https://www.airbnb.com) සහ uber (http://www.uber.com) වැනි ව්‍යාපාර මොඩලයන් මෙම සිද්ධාන්තය පරාජය කරන ලදී. ගු.ගු.සේ. වැනි රාජ්‍ය ආයතනයන්ට සංගත ආකාරයකට අසාමාන්‍ය ජයග්‍රහණ හරහා 'විශිෂ්ඨ' වීමට හැකිය. මේ සඳහා සේවකයින් ඔවුන් කරන සියල්ලේදී විශිෂ්ඨත්වය පිළිබිඹු කිරීම සහ ශක්තිමත් කිරීම කළයුතුය.

"විශිෂ්ඨත්වය, පුහුණුව සහ පරිචයනය මගින් දිනිය යුතු කලාවකි. අපි නිවැරදි ලෙස කටයුතු නොකරමු, මක්නිසාද අපට ආවේනික ගුණය හෝ විශිෂ්ඨත්වය ඇති බැවිනි. නමුත් අපට තරමක් හෝ ඒවා ඇත්තේ අපි නිවැරදිව කටයුතු කරන බැවිනි. අපි කරන දෙය නැවත නැවත කරන්නෝ වෙමු. විශිෂ්ඨත්වය, ඒ අනුව ක්‍රියාවක් නොව පුරුද්දකි. ඇරිස්ටෝටල් බොහෝ කලකට පෙර එසේ පවසා ඇත. මෙය අදට මෙන්ම හෙටටත් බෙහෙවින් අදාල වේ.

- පැහැදිලිවම 2016 වර්ෂය තුලදී. ගු.ගු.සේ. එහි මූල්‍යමය සහ මෙහෙයුම් ජයග්‍රහණ තුලින් විශිෂ්ඨත්වයට පත්විය.

7% ක වර්ධනය සමග පියාසර සංචලන 35,118 ක්




- 11% ක වර්ධනයක් සමග මගීන් 9,466,248 ක්

බ.ජා.ගු. හි මගී සංචලනය



- 10% ක වර්ධනයක් සමග ගුවන්යානා සංචලන 61,637 ක්

බ.ජා.ගු. හි වාණිජ ගුවන්යානා සංචලනය




- 14% ක වර්ධනයක් සමග ගුවන් භාණ්ඩ මෙ.ටො. 248,347 ක්

බ.ජා.ගු හි ගුවන් භාණ්ඩ සංචලනය




2016 වර්ෂය තුලදී ගු.ගු.සේ. දිනූ සම්මාන

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් තොටුපලවල් පාලනය කරන සහ සංවර්ධනය කරන ව්‍යවස්ථාපිත බලය සහිත රජය සතු ආයතනයක් වූ ගු.ගු.සේ. සමාගම, අඛණ්ඩව දෙවන වර්ෂය සඳහා "ආසියාවේ හොඳම සේවායෝජකයා 2016" සම්මානය දිනා ගනිමින් 2016 වර්ෂයේදී විශිෂ්ඨ බවට පත්විය. ගු.ගු.සේ සමාගම ශ්‍රී ලංකාවේ වඩාම කැමති සේවායෝජකයින් අතුරින් එකක් ලෙස වැදගත් කමක් උසුලයි. ආසියාවේ හොඳම සේවායෝජකයා සම්මානය ආසියාව පුරා සේවා ස්ථානවල ඉහළම කාර්යසාධනය ප්‍රදර්ශනය කරන සංවිධාන හඳුනාගනී. සේවායෝජක සන්නාමය ගොඩනැගීමේදී විශිෂ්ඨත්වය අත්පත් කරගත් ගු.ගු.සේ. සමාගම ආසියාව පුරා රටවල් 40 අතුරින් සම්මානයට පාත්‍ර වූ අතර මානව සම්පත් පරිචයන්, ප්‍රතිපත්තීන් සහ උපායමාර්ග හරහා දෘශ්‍යමාන විශිෂ්ඨ හඳුනාගැනීමක් ලැබුනි.

ආසියා හොඳම සේවායෝජක සන්නාම සම්මාන උළෙල 7 වන වරට 2016 අගෝස්තු 04 වන දින සිංගප්පූරුවේදී පැවැත්වූ අතර සේවා යෝජක සන්නාම පිළිබඳ ආයතනය, ලෝක මානව සම්පත් සම්මේලනය සහ ආරම්භක කර්මාන්ත කණ්ඩායම් සමග CHRO Asia උපායමාර්ගික හවුල්කරුවන් ලෙස පිළිගනු ලැබූ අතර ආසියානු ව්‍යාපාරික සංධානය විසින් අනුමත කරන ලදී.

- වෘත්තීමය සහභාගීත්වය සහ නවෝත්පාදන සංස්කෘතියක් බිහිකළ,
- සංවිධාන සෞඛ්‍යය මැනීම මගින් මානව සම්පත් ප්‍රතිපත්තිය අඛණ්ඩව වර්ධනය කිරීම සහ දැක්ම ජයග්‍රහණය කිරීමට උදව්වන වටිනාකම් අවධාරණය කිරීම මත විශ්වාසය තැබූ,
- සමාජ සේවායෝජකයෙක් වන සහ අනාගත නායකයින් සංවර්ධනය කරන,

හොඳම සේවා යෝජකයින් පිළිබඳව ප්‍රවේශමෙන් පර්යේෂණ කිරීමෙන් අනතුරුව සම්මානය පිරිනමන ලදී.

ලෝක මානව සම්පත් සම්මේලනයේ ආචාර්ය ආර්.එල්. භාතියා ගේ ආරාධනය මත සිංගප්පූරුවේ පෑන් පැසිපික් මරීනා චතුරශ්‍රයේදී පවත්වන ලද උත්කර්ෂවත් උත්සවයකදී ගු.ගු.සේ. උප සභාපති සමාගම වෙනුවෙන් සම්මානය පිළි ගන්නා ලදී.

හොඳම නිපුණතා ආකර්ෂණය කිරීමෙන්, සංවර්ධනය කිරීමෙන් සහ රඳවා ගැනීමෙන් සේවා විශිෂ්ඨත්වය ජයග්‍රහණය කළ හැකි බව ගු.ගු.සේ. විශ්වාස කරයි. තෘප්තිමත් සහ පූර්ණ සහභාගීත්වයෙන් යුක්ත වූ වැඩ බලකායක් පවත්වා ගැනීමට ගු.ගු.සේ. පුහුණු කිරීම් සහ සංවර්ධන ආරම්භකයන් මත ආයෝජනය කර ඇති අතර අසමාන දිරිදීමනා සහ ප්‍රතිලාභ පැකේජයන් හඳුන්වා දී ඇත.

සෑම පැත්තකින්ම ගුගුසේ ආචාර සම්පන්න සේවා යෝජකයෙක් වන අතර ජාතික ආර්ථික වර්ධනයේ උත්ප්‍රේරකයෙක්ද වෙයි. කාරුණික සේවා යෝජකයෙක් වන අතරම සමාගමේ විශිෂ්ඨත්වය පිළිබඳ සලකුණු වාර්තා සඳහා ගු.ගු.සේ. ලැබූ හොඳම සේවායෝජක සන්නාමය පිළිබඳ සම්මානය දීප්තිමත් හඳුනාගැනීමක් වේ.

7th Edition

# ASIA BEST EMPLOYER BRAND AWARDS 2016

Proudly Awarded to

## Airport & Aviation Services (Sri Lanka) Ltd.

(Sri Lanka)

Airport and Aviation Services (Sri Lanka) Limited (AASL)is mandated by the government of Sri Lanka to develop, operate and manage all the International and domestic airports in Sri Lanka. Established in 1983, the Company is responsible for providing Air Traffic and air navigation services, aviation security , fire fighting and rescue services and airport passenger services. AASL believes that one key element to achieve service excellence is to attract the best talent , develop and retain them. To maintain a contended workforce for many productive years, AASL has invested on training and development initiatives and introduced unparalleled incentive and benefit packages. Workforce of AASL represents the courage, progressive thinking and hospitality that is inherent to Sri Lankan nation.

4th August, 2016 | Pan Pacific, Marina Square, Singapore

Dr. R. L. Bhatia
Founder, World CSR Day & World Sustainability

Hosted by: World HRD Congress; Employer Branding Awards

Endorsed by

Media Partner: Oxford Business Group




## 10 % ක වර්ධනයක් සමග

# ගුවන් යානා සංචලන 61,637 ක්




ගුවන් යානා සමග අපි අපේ අහස
වඩ වඩා අලංකරණය කරමින්
සිටිමු

# මූල්‍ය
# සමාලෝචනය

"අප උනන්දු පාර්ශවයන්ගේ ධනය උපරිම කරමින් අපගේ මූල්‍ය තත්වය ශක්තිමත් කළ, අප සමාගම් ඉතිහාසයේ ඉහළම මගීන් සහ ගුවන් යානා සංචලන ප්‍රමාණයක් වාර්තා කරමින්, 2016 මූල්‍ය වර්ෂයේදී අපි ද්විසංඛ්‍යාංක වර්ධනයක් අත්පත් කර ගත්තෙමු."

## මූල්‍ය කාර්යසාධන සමාලෝචනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ගු.ගු.සේ. සමාගම පසුගිය වර්ෂයට සාපේක්ෂව 17% ක් වූ ද්විසංඛ්‍යාංක සුවිශේෂී වර්ධනයක් සමග මුළු ආදායම රු. බිලියන 18.3 ක් වාර්තා කර ඇත. මෙය මූලික වශයෙන් මගී ප්‍රවාහන, ගුවන් යානා සංචලන සහ ගුවන් භාණ්ඩ පරිමාවේ අඛණ්ඩ වර්ධනය මත පදනම් විය. සමාලෝචිත වර්ෂය තුල මගී ප්‍රවාහනයේ සමස්ථ වර්ධනය මිලියන 9.5 ක් වන අතර එය 11% ක වැඩිවීමකි. ඒ අතරම ගුවන් යානා සංචලන පසු ගිය වසරේ 56,156 සිට 61,637 දක්වා 10% කින් වැඩිවී ඇති අතර ගුවන් භාණ්ඩ පරිමාව පසුගිය වසරේ මෙ.ටො. 218,402 සිට මෙ.ටො. 248,347 දක්වා 14% කින් වැඩිවී ඇත.

සමාගමෙහි මෙහෙයුම් වියදම් 2015 වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී 5% කින් එනම් රු. බිලියන 10.7 කින් වැඩිවී ඇත. 2015 සමග සසඳන කළ වර්ෂය තුලදී ඩොලරයට එරෙහිව ලංකා රුපියලෙහි අවප්‍රමාණය අඩු අනුපාතයක් වීම හේතුවෙන් ණය පොලී සම්බන්ධ මූල්‍ය පිරිවැය සහ විනිමය පාඩුව 37% කින් අඩුවිය. 2015 රු. බිලියන 1 සමග සසඳන කළ රු. බිලියන 1.9 ක් වූ මූල්‍ය ආදායම 81% ක වර්ධනයක් වාර්තා කර ඇත.

2016 වර්ෂයේදී සමාගම ම.රා.ජා.ගු. මෙහෙයුම් පාඩුව වූ රු. බිලියන 2.3 අවශෝෂණය කිරීමෙන් පසු රු. බිලියන 6.9 ක බදු පෙර ලාභයක් වාර්තා කරන ලදී. 2015 දී වාර්තා කළ රු. බිලියන 2.4 ට වඩා 191% කින් බදු පෙර ලාභය වැඩිවිය. 2015 වර්ෂයේ බදු ප්‍රතිපාදනය වූ රු. බිලියන 1.6 සමග සසඳන විට ම.රා.ජා.ගු. වත්කම් මත වූ විලම්බිත බදු ප්‍රතිවර්තය හේතුවෙන් බදු සඳහා වෙන් කිරීම රු. මිලියන 11 ක ධන සංඛ්‍යාවක් වීම නිසා බදු පසු ලාභයද රු. බිලියන 6.9 ක් විය. 2016 වර්ෂයේ බදු පසු ලාභය 2015 දී වාර්තා කළ රු. බිලියන 0.8 ට වඩා 747% ක් වැඩිය.

කාර්යසාධනය 2012 - 2016




## ආදායම

2015 දී වාර්තා වූ රු. බිලියන 15.7 සිට රු. බිලියන 18.3 දක්වා 17% කින් ආදායම වර්ධනය වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් ගගන නාවික ආදායම රු. බිලියන 3.7 සිට රු. බිලියන 4.4 දක්වා 17% කින් සහ ගගන නාවික නොවන ආදායම (කුලී, අනුග්‍රාහක ගාස්තු සහ ගුවන්යානයට නැගීමේ ගාස්තු ඇතුළුව) රු. බිලියන 12 සිට රු. බිලියන 14 දක්වා 19% කින් වර්ධනය වීම හේතු විය.

2016 ආදායම් සංයුතිය




## ගගන නාවික ආදායම

ගගන නාවික ආදායම ප්‍රධාන වශයෙන් ජනිත වනුයේ ගොඩබෑම, නැවැත්වීම, පියාසර කිරීම සහ ගුවන් පාලම් ආදායම් වලින් සමන්විත ගුවන් තොටුපල ගුවන් අංශයේ මෙහෙයුම් වලිනි. 2015 වසරෙහි 17% ක වර්ධනය සමග සැසඳීමේදී වර්ෂය තුල ගගන නාවික ආදායම මුළු ආදායමෙන් 24% ක් වේ. ගගන නාවික ආදායමෙහි ප්‍රධාන දායකය ගුවන් යානා ගොඩ බැස්සවීම සහ නැවතුම් ආදායම වන අතර එය 68% ක් ලෙස ගණනය වී ඇත. ගුවන් ගමන් සංචලන 56,156 සිට 61,637 දක්වා වර්ධනය වීම හේතුවෙන් ජාත්‍යන්තර ගුවන්යානා ගොඩබැස්සවීම සහ නැවතුම් ආදායමේ 19% ක අති විශාල වර්ධනයක් ඇති වූ අතර උපරිම එසවීමේ බර (MTOW) මෙ.ටො. මිලියන 4.3 සිට 4.7 දක්වා පිළිවෙලින් 9.4% සිට 10% කින් වර්ධනය වී ඇත. තවදුරටත් පියාසර ආදායම ගගන නාවික ආදායමෙන් 24% ක් වූ අතර 2015 වර්ෂයේ 32,694 ක් වූ කොළඹ ගුවන් තොරතුරු කලාපය (FIR) තුල පියාසර සංචලන 2016 වර්ෂයේදී 35,118 ක් වාර්තා කරමින් 7% ක වැඩිවීමෙන් දැක්වූ ඉහළ ප්‍රවනතාව හේතුවෙන් රු. බිලියන 0.9 ඉක්මවමින් රු. බිලියන 1 දක්වා පැමිණ ඇත. ගුවන් පාලම් ආදායම රු. මිලියන 324 සිට ප්‍රවර්තන වර්ෂයේදී රු. මිලියන 362 දක්වා වැඩිවී ඇති අතර 12% ක වර්ධනයක් වාර්තා කර ඇත.

ගගන නාවික ආදායමේ සංයුතිය - 2016




ගගන නාවික ආදායමේ සංයුතිය - 2015



## ගගන නාවික නොවන ආදායම

ගගන නාවික නොවන ආදායම ගුවන්යානයට නැගීමේ ගාස්තු, කුලී, අනුග්‍රාහක ගාස්තු, විවේකාගාර ආදායම් ආදියෙන් සමන්විත වේ. 2015 වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 3.9 සිට රු. බිලියන 4.7 දක්වා 19% කින් ගුවන්යානයට නැගීමේ ආදායම වැඩිවීම හේතුවෙන් ගගන නාවික නොවන ආදායම ශක්තිමත් ලෙස වර්ධනය වී ඇත. එ.ජ. ඩොලරයට සාපේක්ෂව දේශීය මුදලේ අවප්‍රමාණය නිසා පිටත්ව යන මගීන්ගෙන් අය කළ රු 130 ක ගුවන්යානයට නැගීමේ ගාස්තුව රු 140 දක්වා වැඩිවීමෙන් වූ ඩොලර් පරිවර්තනයේ වෙනස ප්‍රධාන වශයෙන් මෙයට හේතු විය. අමුත්තන් සහ වෙළඳ සැල් හිමියන් ආකර්ෂණය කිරීම වෙනුවෙන් කළ නව සේවා සහ නැවුම් පිරිනැමීම් අනුග්‍රාහක ගාස්තු ආදායමේ වැඩිවීමට හේතු විය. තීරු බදු රහිත ප්‍රධාන කාණ්ඩ 80% කට වඩා නියෝජනය වීම අනුග්‍රාහක ගාස්තු ආදායම රු. බිලියන 3.5 සිට රු. බිලියන 4.1 දක්වා 18% කින් වර්ධනය වීමට හේතු විය. පූර්ව වර්ෂය සමග සංසන්දනය කරන විට කුලී ආදායම රු. බිලියන 3 ඉක්මවමින් 21% වර්ධනයක් පෙන්නුම් කර ඇත. භූමි ප්‍රදේශ මත කලින් අය කළ ස්ථාවර අනුපාතය වෙනස් කරමින් තරඟකාරී මිල කැඳවීම් මතින් පාවෙන අනුපාත හඳුන්වා දීම නිසා අති විශාල වැඩිවීමක් සිදු වී ඇත.

ගගන නාවික නොවනආදායම - 2016




ගගන නාවික නොවනආදායම - 2015




ආදායමේ සහ මගී සංචලනයේ සමාන වර්ධනය හේතුවෙන් පසු ගිය වසර 5 පුරාම මගියෙකු සඳහා වූ මුළු ආදායම ඉහළ යාම් ප්‍රවනතාවක් පෙන්නුම් කරයි.

මගියෙකුට මුළු ආදායම




එසේම, ගු.ගු.සේ. විසින් මූල්‍ය වර්ෂය පුරාම ස්ථාවර හිතකර මට්ටමේ අපේක්ෂිත කාර්යසාධනයක් අත්කර ගැනින. මෙය පසුගිය වසරේ රු 469 ක් වූ මගියෙකුට අනුග්‍රාහක ගාස්තු ආදායම රු 527 ක් දක්වා 12% ක වර්ධන ප්‍රතිශතයක් පෙන්නුම් කිරීමෙන් තවදුරටත් පැහැදිලි කළ හැක. මෙම ආකර්ෂණීය වර්ධනය අත්කරගෙන ඇත්තේ ශක්තිමත් මගී ගලනය, මගීන්ගේ වැඩිපුර වියදම් කිරීම සහ නිශ්චිත උපාය මාර්ග තුලින් පාරිභෝගික සබඳතා වැඩිදියුණු කර ගැනීමෙනි.

## මූල්‍ය ආදායම

2015 මූල්‍ය වර්ෂයේ දී වාර්තා වූ රු. බිලියන 1 සිට රු. බිලියන 1.9 ට ළඟා වෙමින් මූල්‍ය ආදායම 81% කින් වැඩිවී ඇත. මෙයට හේතු වී ඇත්තේ රාජ්‍ය සුරැකුම් මත පොලී අනුපාත වැඩිවීම මෙන්ම සමාලෝචිත වර්ෂය තුල ගු.ගු.සේ. අනුගමනය කළ විචක්ෂණශීලී ආයෝජන උපායමාර්ග වේ. ඒ අනුව ගු.ගු.සේ. හැකි අවස්ථා හඳුනාගත් අතර ණයකර, රාජ්‍ය සුරැකුම් සහ ස්ථාවර තැන්පතු ආදී විවිධ දිගුකාලීන සහ කෙටිකාලීන මූල්‍ය මෙවලම්හි ආයෝජනය කරන ලදී.

මූල්‍ය ආදායමේ සංයුතිය - 2016




මූල්‍ය ආදායමේ සංයුතිය - 2015



## මෙහෙයුම් වියදම්

2015 දී රු. බිලියන 10.1 සිට වසර තුලදී මෙහෙයුම් පරිමාවේ වැඩිවීමට සාපේක්ෂව 5% ක ආන්තික වැඩිවීමක් සමගින් මෙහෙයුම් වියදම් පාලනය කර ගැනීමට සමාගමට හැකි විය. මෙහෙයුම් වියදම් වලින් 56% ක දායකත්වයක් වූ කාර්යමණ්ඩල පිරිවැය 6% ක ඉහළ නැඹුරුවක් වාර්තා කර ඇත. ශ්‍රම බලකායේ කුසලතා මට්ටම අඛණ්ඩව වර්ධනය කරන අතරතුර වෛද්‍යාධාර, ප්‍රවාහන සහ පාරිතෝෂික ප්‍රතිපාදන වැනි සේවක ප්‍රතිලාභ වැඩි කිරීම මගින් කාර්යමණ්ඩල පිරිවැය 2015 රු. බිලියන 5.7 සිට 2016 රු. බිලියන 6 දක්වා වැඩි වී ඇත.

ක්ෂය කිරීම, පරිපාලන සහ ආයතන වියදම් මෙහෙයුම් වියදම්වලින් පිළිවෙලින් 25% සහ 16% ලෙස ගණනය වී ඇත. පරිපාලන සහ ආයතන වියදම් කලින් වර්ෂයේ රු. බිලියන 1.6 සිට රු. බිලියන 1.7 දක්වා 8% කින් වැඩිවී ඇත. ඒකක පරිභෝජනය වැඩිවීම හේතුවෙන් කලින් වර්ෂයට සාපේකෂව රු. මිලියන 103 කින් එනම් 11% කින් විදුලිය වියදම් වැඩි වී ඇත. සනීපාරක්ෂක සහ පවිත්‍රතා කටයුතු වෙනුවෙන් වූ වියදම් රු. මිලියන 26 ක් ලෙස සලකුණු වී ඇති අතර එය කලින් වසරට වඩා 20% ක වැඩිවීමකි. ශ්‍රී.ගු.සේ. විසින් තම මගීන්ට සහ ගුවන් සේවා මෙහෙයුම්කරුවන් හට ප්‍රසන්න සහ පවිත්‍ර අත්දැකීමක් ලබා දීමට ගත් උත්සාහය නිසා ගාස්තු සංශෝධනය වීම මෙයට හේතු විය.

සියළුම ගුවන්තොටුපළ භාවිතාකරන්නන් හට ආරක්ෂාකාරී සහ සුරක්ෂිත අඛන්ඩ සේවයක් සපයනු පිණිස සමාගම විශාල වශයෙන් සන්නිවේදන උපකරණ, ගගන නාවික උපකරණ, ගගන යාත්‍රාංගනය සහ ධාවන පථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැඩි ආයෝජනයක් කළ බැවින් අළුත් වැඩියා සහ නඩත්තු වියදම් රු. මිලියන 249 සිට රු. මිලියන 301 දක්වා 21% කින් වැඩිවී ඇත.




## ශුද්ධ මූල්‍ය පිරිවැය

ගුවන් තොටුපල සංවර්ධනය සඳහා ලබාගත් දිගුකාලීන විදේශීය ණය මගින් මූල්‍ය පිරිවැය ඇතිවන අතර රු. බිලියන 4.2 සිට සමාලෝචිත වර්ෂය තුල රු. බිලියන 2.7 දක්වා 37% ක පහත වැටීමක් මේ අනුව සිදු වී ඇත. මෙයට හේතු වී ඇත්තේ ණය ශේෂ අඩුවීම සහ 2016 වර්ෂයේ ණය පරිවර්තනය මත රු. බිලියන 3.5 සිට රු. බිලියන 2 දක්වා විනිමය පාඩුව පහත වැටීමයි. තවදුරටත් 76% කින් ශුද්ධ මූල්‍ය පිරිවැය අඩුවීම ඉහතින් සඳහන් කළ ආකාරයට මූල්‍ය ආදායම 81% කින් වැඩිවීමට හේතු වී ඇත.

## EBITDA/බදු පසු ලාභය

කලින් වර්ෂයට සාපේක්ෂව 26% ක වැඩිවීමක් වූ රු. බිලියන 10 ක පොලී, බදු, ක්ෂයකිරීම් සහ ක්‍රමක්ෂයට පෙර ඉපයුම් (EBITDA) වාර්තා කරමින් සමාගම 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් ප්‍රදර්ශනය කර ඇත. ශ්‍රී.ගු.සේ. සමාගම රු. බිලියන 6.9 ක විශ්මය ජනක බදු පසු ලාභයක් සනිටුහන් කරමින් එහි ඉතිහාසයේ විශේෂිත වර්ෂයක් ලෙස සලකුණු කර ඇත. වාර්තා කරන වර්ෂයේ රු. මිලියන 11 ක ආදායම් බදු වල ප්‍රතිවර්තනය කලින් වර්ෂයේ ආදායම් බදු වියදම වූ රු. බිලියන 1.6 සමග සැසඳීමේදී 101% ක පහත වැටීමක් පිළිබිඹු කළ අතර එමගින් බදු පසු ලාභය හිතකර ප්‍රතිශතයක් දක්වා ගෙනැවිත් ඇත.

## විනිමය අනුපාත

2016 මූල්‍ය වර්ෂය පුරාම එ. ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල මහත් අස්ථාවර තත්වයකින් පැවතුනු අතර 2016 මූල්‍ය වර්ෂයේ පළමු කාර්තුවේ දී ජපාන යෙන්වලට සාපේක්ෂව සැලකියයුතු ලෙස අගය අඩු වී පසුව අගය වැඩිවිය. කෙසේවුවද කලින් වසර හා සසඳන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 7% ක ක්ෂය වීමක් වාර්තා කර ඇත. ජපන් යෙන්වලට සාපේක්ෂව රුපියලෙහි වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය 20% කින් වැඩිවී ඇත.

සමස්ථයක් ලෙස ගත් කළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල 4% කින් 2016 අවසානයේ (ගැනුම් මිල) රු. 148.35 ට ක්ෂය වී ඇත. වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතයද (ගැනුම් මිල) 2015 රු. 134.83 සිට 2016 රු. 144.83 දක්වා අගය අඩු වී ඇත.

ලංකා රුපියල් ස්ථාවර තැන්පතු සමග සන්සන්දනය කරන විට එ.ජ. ඩොලර් ස්ථාවර තැන්පතු මත පොලී අනුපාතය වැඩි නිසා ශ්‍රී.ගු.සේ. සමාගම එ.ජ. ඩොලර් ස්ථාවර තැන්පතු ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 17.2 සිට 27.7 දක්වා 61% ක වැඩි කරන ලදී. මෙමගින් විනිමය අනුපාත අවදානම අඩුකර ගැනීමට හැකි විය.




## මුළු වත්කම්

2015 වර්ෂයේ රු. බිලියන 65 ට සාපේක්ෂව 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු වත්කම් රු. බිලියන 71 ක් වූ අතර 9% ක වැඩිවීමක් වාර්තා කරන ලදී. වර්ෂය තුල පරිණත වූ රු. බිලියන 2 ක ණයකර සමග සසඳන විට නැවත ආයෝජනය රු. බිලියන 1.6 ක්වීම හේතුවෙන් දිගුකාලීන ආයෝජනයන්හි 13% ක පහත වැටීමක් වාර්තා කරන ලදී.

සතුටුදායක වර්ධනයට හේතු වුයේ කෙටිකාලීන ආයෝජන රු. බිලියන 6.6 කින් සහ මුදල් හා මුදල් සමාන දෑ රු. මිලියන 577කින් වර්ධනය වීමයි. මුළු ජංගම නොවන වත්කම් අගය රු. බිලියන 44.07 සිට රු. බිලියන 43.4 දක්වා පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. පසු ගිය වර්ෂයට සාපේක්ෂව එය 1.38% ක අඩුවීමකි. මෙයට ප්‍රධාන හේතුව වුයේ ණයකර ආයෝජනය රු. මිලියන 400 කින් අඩු වීමයි. ඉහතින් සඳහන් කළ ආකාරයට කෙටිකාලීන රජයේ සුරැකුම් සහ මුදල් හා මුදල් සමාන දෑවල ආයෝජනය කිරීම හේතුවෙන් 2015 රු. බිලියන 21 සිට 2016 රු. බිලියන 28 දක්වා ජංගම වත්කම්වල 30% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

මුළු වත්කම්




## ආයෝජන

සමාගම ණයකර, එ.ජ. ඩොලර් ස්ථාවර තැන්පතු, ශ්‍රී ලංකා රුපියල් ස්ථාවර තැන්පතු සහ යලි මිල දී ගැනීමේ ගිවිසුම් වල තම ආයෝජනයන්හි අඛණ්ඩ වර්ධනයක් වාර්තා කර ඇත. 2016 දෙසැම්බර් 31 දිනට මුළු ආයෝජනය රු. බිලියන 21.5 ක් වූ අතර 2015 දී වාර්තා කළ රු. බිලියන 14.9 ට සාපේක්ෂව එය 44% ක වර්ධනයකි. කලින් වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 7.3 හා සසඳන විට රු. බිලියන 10.6 ක මෙහෙයුම් මුදල් ප්‍රවාහයන්ගේ වැඩිවීම මෙයට හේතු විය. ආයෝජනයන්ගේ ධාරණ අගය පහතින් පෙන්වා ඇත.

ආයෝජන




## කාරක ප්‍රාග්ධනය

කාරක ප්‍රාග්ධනයෙන් ව්‍යාපාරයෙහි සාමාන්‍ය මෙහෙයුම් කටයුතු වලදී භාවිතා කරන කෙටිකාලීන ප්‍රාග්ධනය පිළිබිඹු වෙයි. එය කෙටිකාලීන මූල්‍ය ශක්තිය මනින මිනුමකි. එමනිසා මෙය ජංගම වත්කම්වලින් ජංගම වගකීම් පියවන්නේ කෙසේද යන්න නියෝජනය කරයි.

සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය කලින් වර්ෂයට වඩා 55% ක වර්ධනයක් නියෝජනය කරමින් රු. බිලියන 17 ක් වේ. මුළු වත්කම් යටතේ විස්තර කළ පරිදි කෙටි කාලීන ආයෝජනයන්හි වැඩිවීම කාරක ප්‍රාග්ධනය කෙරෙහිද බලපෑමක් ඇති කර තිබේ.

ගු.ගු.සේ. සමාගමෙහි පසුගිය වර්ෂ පහ සඳහා කාරක ප්‍රාග්ධනය පහතින් විග්‍රහ කර ඇත.

කාරක ප්‍රාග්ධනය




ජංගම අනුපාතය කෙටිකාලීන වගකීම් කෙටි කාලීන වත්කම් වලින් පියවීමට සමාගමට ඇති හැකියාව පෙන්වන ද්‍රවශීලතාවය ගනනය කරන මිනුමක් වේ. මෙමගින් සමාග මේ මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ හැඟීමක් ලබා දෙයි. හරයාත්මකව ගත් කළ ගු.ගු.සේ. සමාගම 2013 වර්ෂයේ සිට සමාගමේ මෙහෙයුම් සඳහා වැඩි ද්‍රවශීලතාවයක් ඇති බව පෙන්වමින් ජංගම අනුපාතයේ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ජංගම අනුපාතය




## ප්‍රාග්ධන ව්‍යුහය සහ ණය

මෙය රු. මිලියන 20 ක කොටස් ප්‍රාග්ධනයෙන්, රු. බිලියන 1 ක සංචිතවලින් සහ රු. බිලියන 15.4 රඳවාගත් ඉපයුම් වලින් සමන්විත වෙයි. සංස්ථාගත කිරීමේ දී ගුවන් තොටුපළ අධිකාරියෙන් ගු.ගු.සේ. වෙත පවරනු ලැබූ වත්කම් සහ දේපල, පිරියත සහ උපකරණවලට අකුණු සහ හානි වෙනුවෙන් කළ ප්‍රතිපාදන වලින් රු. බිලියන 1 ක සංචිත සමන්විත වේ. 2015 වසරේ රු. බිලියන 10 සිට රු. බිලියන 15 දක්වා වැඩිවී ඇති රඳවා ගත් ඉපයුම් 54% ක වර්ධනයක් වාර්තා කර ඇත.

2015 වසරට වඩා 0.1% සුළු අඩුවීමක් සහිතව ශේෂ පත්‍ර දිනට මුළු ණය රු. බිලියන 38 ක් වේ. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ වසර පුරාම තිබූ දේශීය මුදලට සාපේක්ෂව එ.ජ. ඩොලරයේ අස්ථාවර බවයි. ණය ස්කන්ධ අනුපාතය කොටස් හිමියන්ගේ ස්කන්ධයට එරෙහිව මූල්‍ය තෝලනය සහ මිනුම් මතු කර පෙන්වයි. පැහැදිලි ලෙසම

ශ්‍රී.ශ්‍රී.සේ. හි සියළු ණය මහා භාණ්ඩාගාරය හරහා ලබා ගෙන ඇති අතර රන් සහතික මත සුරැකුම් කර තිබේ.




## මුදල් ප්‍රවාහය

බදු පෙර ලාභයේ 191% ක හිතකර චලනය නිසා, කලින් වර්ෂයේ රු. බිලියන 8 සමග සසඳන විට 2016 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් රු. බිලියන 12 ක් බවට පත් වී ඇත.

2016 තුලදී, කලින් වර්ෂයේ ලැබුනු රු. මිලියන 66 ට සාපේක්ෂව, ආයෝජන ක්‍රියාකාරකම්හි භාවිත ශුද්ධ මුදල් ප්‍රමාණය රු. මිලියන 128 ක් විය. සමාගම දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීමට සහ ඵලදායිතා වර්ධන ආයෝජනයන්හි රු. බිලියන 2.4 ක් ආයෝජනය කර ඇත. ණයකර වල ශුද්ධ ආයෝජන රු. මිලියන 400 කින් අඩු වූ අතර පොලී ආදායම පසු ගිය වසරට සාපේක්ෂව රු. මිලියන 827 කින් වැඩිවී ඇත.

මූල්‍ය ක්‍රියාකාරකම්හි භාවිතා කළ ශුද්ධ මුදල්, ණය ආපසු ගෙවීම සහ ලාභාංශ ගෙවීම වැඩි වූ නිසා පිළිවෙලින් 68% සහ 202% වශයෙන් වේගයෙන් ඉහළ ගොස් ඇත.

සමස්ථයක් ලෙස පසුගිය වසරට වඩා 46% ක වර්ධනයක් වාර්තා කරමින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුදල් සහ මුදල් සමාන දෑ වල වටිනාකම රු. බිලියන 23ක් විය.

## අගය එකතුකිරීම

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ මුළු එකතුකළ වටිනාකම රු බිලියන 18.3 ක් වූ අතර එය 2015 වර්ෂයේ රු. බිලියන 15 හා සසඳන විට 21% ක වැඩිවීමකි. මෙයට හේතු වූයේ සමාලෝචිත වර්ෂයේ වියදමේ 5% ක වර්ධනය හා සාපේක්ෂව ආදායම් 17% කින් වර්ධනය වීමයි.

පහත දැක්වෙන අගය එකතු කිරීමේ ප්‍රකාශනයෙන් මුළු වටිනාකම නිර්මාණය වූයේ කෙසේද සහ සේවකයින්, ශ්‍රී ලංකා රජය, අඩමාන ණය සඳහා වෙන්කිරීම සහ ස්කන්ධ ප්‍රාග්ධනය අතර එය බෙදා හරින ලද්දේ කෙසේද යන්න පෙන්නුම් කරයි. එසේම ක්ෂය සහ සංචිත ආකාරයෙන් මෙහෙයුම් සඳහා යලි ආයෝජනය කිරීමට රඳවා ගෙන ඇති වටිනාකම් කොටසද පෙන්නුම් කරයි.

## වටිනාකම් එකතු කිරීමේ ප්‍රකාශනය

| | 2016 | 2015 |
|---|---|---|
| | **රු.000** | රු.000 |
| ආදායම | **18,027,257** | 15,218,760 |
| වෙනත් ආදායම් | **315,543** | 479,508 |
| මූල්‍ය ආදායම් | **1,894,215** | 1,046,516 |
| ආයුගණන උපකල්පන වෙනස්වීම් මත පැනනැගි ලාභ | **4,026** | 124,515 |
| | **20,241,041** | 16,869,299 |
| පරිපාලන, ආයතන සහ අලෙවි වියදම් | **(1,978,447)** | (1,808,049) |
| **එකතු කළ අගය** | **18,262,594** | 15,061,250 |

| | | | % | | % |
|---|---|---|---|---|---|
| **එකතු කළ අගය බෙදාහැරීම** | | | | | |
| සේවකයින් හට | සේවක වැටුප් සහ ප්‍රතිලාභ | **6,012,540** | 33% | 5,657,999 | 37% |
| රජයට | බදු | **211,572** | 1% | 115,659 | 1% |
| කොටස් හිමියන්ට | ලාභාංශ | **1,500,000** | 8% | 497,000 | 3% |
| ණය ප්‍රාග්ධනය සැපයුවන්ට | පොලී | **705,413** | 4% | 717,067 | 5% |
| ව්‍යාපාරය තුල රඳවා ගැනීම් | ක්ෂය සහ ක්‍රමක්ෂය | **2,664,687** | 15% | 2,658,306 | 18% |
| ව්‍යාපාරය තුල රඳවා ගැනීම් | සංචිත | **7,168,382** | 39% | 5,415,219 | 36% |
| | | **18,262,594** | 100% | 15,061,250 | 100% |

එකතුකළ අගය බෙදීයාම 2016




එකතුකළ අගය බෙදීයාම 2015






"අපගේ උසස්ම සම්පත අපගේ මගීන්ය.
එමනිසා අප සෑම විටම ඔවුන්ගේ සුව පහසුව
සහ රුචිකත්වය වැඩි දියුණු කිරීමට කැප වී
සිටිමු."



මගීන්

# 9,466,248

11% ක වර්ධනයක්

# මානව සම්පත්
# කළමනාකරණය

“විශිෂ්ඨත්වයේ සංස්කෘතියක්
ඇතිකිරීම උදෙසා අප මහත්
පරිශ්‍රමයෙන් එක්ව කටයුතු කරන
බැවින්, අපි නිරතුරුව අපගේ මිනිසුන්
සඳහා ආයෝජනය කරමු”.

දක්ෂ සහ කැප වූ සේවකයින් අප ආයතනයේ වර්ධනය සහ සාර්ථකත්වය උදෙසා පදනම සපයන ප්‍රමුඛ වත්කමක් ලෙසට ගු.ගු.සේ. සමාගම විශ්වාස කරයි. ඒ අනුව ගු.ගු.සේ.සමාගමෙහි මානව සම්පත් උපායමාර්ග සැලසුම් කර ඇත්තේ ආකර්ෂණය, තෝරාගැනීම, අභිප්‍රේරණය, සංවර්ධනය සහ ආයතනයේ සාර්ථකත්වයට දායක වියහැකි විශිෂ්ඨ නිපුනතාවයන් රඳවාගැනීම ඉලක්ක කොට ගෙනය.

## හොඳම නිපුනතා අත්පත් කරගැනීම

ගු.ගු.සේ. සමාගම අප රටෙහි රාජ්‍ය අංශයේ සේවකයින් අතර වඩාත්ම කැමති ආයතනය වන අතර සුදුසු අපේක්ෂකයින් විශාල ගණනක් අතරින් හොඳම නිපුනතාවය ආකර්ෂණය කර ගැනීමට මෙම කීර්තිය ඉවහල් වේ. හොඳම නිපුනතාවය අත්පත් කරගැනීමේදී විශේෂයෙන් තාක්ෂණික, වෘත්තීයමය, මෙහෙයුම් සහ කළමනාකරණ අංශ සඳහා සේවක පිරිස් බඳවා ගැනීමේදී, අපි දැඩි තෝරා ගැනීමේ ක්‍රියාවලියක් අනුගමනය කරමු. 2016 වර්ෂය තුලදී පුරප්පාඩු පිරවීම සඳහා 13 දෙනෙක් අභ්‍යන්තරිකව තෝරා ගනු ලැබූ අතර නව බඳවා ගැනීම් 48 ක් ගු.ගු.සේ. පවුලට එකතු වන ලදී. කාර්යමණ්ඩල සාමාජිකයින් 165 ක් ඔවුන්ගේ දක්ෂතා සහ කාර්යසාධනය මත වර්ෂය තුලදී උසස් කරන ලදී.

| වර්ගය | දිනට සේවක සංඛ්‍යාව 31/12/2016 | දිනට සේවක සංඛ්‍යාව 31/12/2015 |
|---|---|---|
| විධායක | 257 | 259 |
| අධීක්ෂකවරු/තාක්ෂණ නිලධාරී | 300 | 296 |
| ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි | 682 | 690 |
| පුහුණු සහ අර්ධ පුහුණු සේවකයින් | 1,983 | 2,022 |
| සුළු සහ නුපුහුණු සේවක-යින් | 588 | 602 |
| අනියම් සහ පුහුණුවන්නන් | - | 3 |
| **එකතුව** | **3,810** | **3,872** |

## අපගේ නිපුනතා ශක්තිමත් කිරීම

ගුවන් සේවා කර්මාන්තයට සුවිසල් සේවයක් සපයන රටෙහි එකම ගුවන් තොටුපල සහ ගගන නාවික සේවා සපයන්නා ලෙස ගු.ගු.සේ. සමාගම, ජාත්‍යන්තර ප්‍රමිතීන් පූරණය කරමින් පවරන ලද සේවා සැපයීම සඳහා දක්ෂ සහ පුහුණු කාර්යමණ්ඩලයක් තමන් සතු බව තහවුරු කිරීමට හැකි විය යුතුය. මෙම සන්දර්භය තුල මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම නිරතුරුව ගු.ගු.සේ. හි ප්‍රමුඛතම කාර්යය වේ. මානව සම්පත් සංවර්ධනයේ වැදගත්කම සැලකිල්ලට ලක් කරමින් ගු.ගු.සේ. සමාගම, සෑම වර්ෂයකම අවසාන කාර්තුවේදී ක්‍රමවත් පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය මත පදනම්ව වාර්ෂිකව තම පුහුණු කිරීම් පුරෝකථනය පිළියෙල කරයි.

2016 වර්ෂය තුලදී ගු.ගු.සේ. සමාගම විවිධ ශික්ෂණයන්ට අයත් කාර්යමණ්ඩල සාමාජිකයින් 131 දෙනෙකුට විදේශ පුහුණු අවස්ථා සපයන ලදී. ඔවුන් රටවල් 23 ක පැවැත්වූ පුහුණු වැඩ සටහන් 72 කට සහභාගි වූ අතර අගනා දැනුම සහ අනාවරණයන් ආයතනයට ලබා දෙන ලදී. සියළුම කාර්යමණ්ඩල සාමාජිකයින් සමාගම විසින් සපයන ලද දේශිය සහ ආයතනික පුහුණු වැඩසටහන් වලට සහභාගී වූහ. වර්ෂය තුලදී සේවකයකු හට පැය 11.7 ක සාමාන්‍ය පුහුණුවක් ලබා දෙමින් 2016 වර්ෂයට පුරෝකථනය කළ ප්‍රධාන පුහුණු අරමුණු සාක්ෂාත් කර ගැනීමට ගු.ගු.සේ. සමාගමට හැකි වී ඇත.

1 ගු.ගු.සේ. නිලධාරීන් ACI සම්මන්ත්‍රණයේ - පැනමා

2 ගිනි නිවන නිලධාරීන් සඳහා මූලය පටිපාටිය පිළිබඳ පුහුණුව


1


2




1




2

## 2016/12/31 දිනට සේවක වයස් විශ්ලේෂණය

3810 ක්වූ මුළු සේවක සංඛ්‍යාව වයස් කාණ්ඩ 4 කට වර්ගීකරණය කර ඇත.




## කාර්යසාධනය කළමනාකරණය කිරීම

වර්ෂය තුලදී විධායක නොවන ශ්‍රේණි සඳහා නව කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. සාර්ථකත්වය සඳහා විශාල වශයෙන් දායක වූ කළමනාකාරීත්වයේ සහය ඇතිව සේවක සංවිධාන සහ වෘත්තීය සමිති සමග නිරතුරුව සංවාදශීලී වෙමින් කාර්යමණ්ඩලය දැනුවත් කරන ලදී. “අංශක 180 ඇගයීම් පද්ධතිය” ලෙස ජනප්‍රිය වූ ක්‍රමය මගින් ඇගයීම් සම්මුඛ පරීක්ෂණ වලදී කළමනාකාරීත්වය සමග එක් එක් අයට වෙන්වූ සංවාද හරහා හවුල් වීමට සේවකයින් හට හැකි වූ අතර එක් එක් අංශයේ අරමුණු අත්පත් කර ගැනීම සඳහා තනි ඉලක්ක ස්ථාපිත කිරීමට හැකි විය. විධායක සහ කළමනාකරණ ශ්‍රේණි සඳහා දියත් කළ කාර්යසාධන කළමනාකරණ පද්ධතිය ඒ සඳහා වැඩිදුර සංවර්ධනයන් කිරීමට ගු.ගු.සේ. ධෛර්යමත් කරමින් වර්ෂය තුල ක්‍රමයෙන් ස්ථාපිත වෙන ලදී.

## සේවක පාරිතෝෂික ප්‍රතිලාභ

සේවක ප්‍රතිලාභ සඳහා වූ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි, 2014 වර්ෂයේ සිට පාරිතෝෂික ගණනය කිරීම ස්වාධීන ආයුගණක වෘත්තිකයකු මගින් සිදුකළ ආයුගණක ඇගයීම මත පදනම් වී ඇත.

ආයුගණක ඇගයීම මත පදනම් වූ 2016/12/31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදනය රු. බිලියන 2.6 ක් විය. රැකියාවෙන් ඉවත්ව යන අවස්ථාවේදීම හෝ විශ්‍රාම යාමේදී අවසන් ප්‍රතිලාභ ලබා ගැනීම සහතික කිරීම සඳහා පාරිතෝෂික වගකීමට ගැලපෙන සේ දිගුකාලීන ණයකර වල ආයෝජනයක් ගු.ගු.සේ. විසින් නිර්මාණය කර ඇත. ගණනය කිරීමට භාවිතා කළ උපකල්පන මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 22 හි දක්වා ඇත.

## සේවක නිරතවීම් දිරිගැන්වීම

සේවක නිරතවීම් නිර්මාණයේදී ගු.ගු.සේ. ගනු ලබන විවිධ ආරම්භක පියවරයන් අතුරෙන් පළමුවැන්න වන්නේ අනුස්ථාපන සහ අභිප්‍රේරණ පුහුණු වැඩසටහනයි. මෙය ගුවන් තොටුපලට අනුගත කිරීමේ සංචාරයක් ඇතුළුව සාමාන්‍යයෙන් දින තුනක වැඩ සටහනකි. මෙම වැඩ සටහන නවක සේවකයන් හට ආයතනයේ හදගැස්ම දනවන පිළිගැනීමේ වැඩසටහනක් වේ.

ජ්‍යෙෂ්ඨ සේවකයින් ගේ නිරතවීම ඒකරාශී කර තැබීමට ගු.ගු.සේ. අදියර දෙකකින් සමන්විත “අප බලාපොරොත්තු වන වෙනස ඔබ වන්න” වැඩසටහන ආරම්භ කර ඇත. පළමුවන පන්ති කාමර දේශනයේදී සේවකයින් වර්තමාන ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතීන් සහ අනාගත සංවර්ධනයන් පිළිබඳව දැනුම ලබා ගනී. මෙහි දෙවන අදියර ගුවන් තොටුපල මෙහෙයුම් පිළිබඳව ප්‍රමාණවත් උපදෙස් ලබා දෙන ගුවන් තොටුපල ආවරණය වන පරිදි දිනක සංචාරයකි. මෙය ඉදිරි වර්ෂය තුලදී වැඩි සේවක පිරිසකට ව්‍යාප්ත කළ හැකි ඉහළ ප්‍රතිචාරයක් ලැබූ වැඩසටහනකි.

ඉතිහාසයේ පළමුවරට ගු.ගු.සේ. සමාගම දීර්ඝකාලීන ආදර්ශවත් සේවයකින් පසු විශ්‍රාම යන සේවකයින් 62



3


4

1 ගුවන් තොටුපල අනුගත කිරීමේ සංචාරයේ පළමු කණ්ඩායම

2 "සේවා ප්‍රනාම" 2016 වැඩසටහනට සහභාගි වූ විශ්‍රාමික සේවකයෝ

3 උප සභාපතිතුමා සිංගප්පූරුවේ පවත්වන ලද උත්සවයකදී පිරිනැමූ "ආසියානු හොඳම සේව්‍ය සන්නාමය" වෙනුවෙන් වූ 2016 සම්මානය" පිළිගනිමින්

4 ගු.ගු.සේ. සභාපතිතුමා විසින් ගං වතුරෙන් හානියට පත් සිසුන් හට පාසැල් පොත් පරිත්‍යාග කිරීම

දෙනෙකුට ගරු කිරීම සඳහා "සේවා ප්‍රනාම 2016" යන තේමාව යටතේ සේවා ඇගයීමේ වැඩසටහනක් දියත් කරන ලදී. ගු.ගු.සේ. සභාපති රැස්වීම ආමන්ත්‍රණය කළ අතර විශ්‍රාම යන සේවකයින්ගේ නොසැලෙන දායකත්වය වෙනුවෙන් සමාගමේ කෘතඥතාවය පිරිනමන ලදී.

## සේවක සුභසාධනය පිළිබඳ සැලකිලිමත් වීම

2016 වර්ෂය ගු.ගු.සේ. විසින් තම සේවකයින් රැක බලාගත් ස්වභාවය පෙන්වූ කැපී පෙනෙන උදාහරණ වලින් පිරුණු තවත් වසරක් විය. ගු.ගු.සේ. හිදී සේවකයින් රැක බලා ගැනීමේ වැඩසටහන් බොහෝ ගණනක් වසර ගණනාවක් තුල පවත්වා ඇත. ඒවා සෞඛ්‍ය පහසුකම් පිළිබඳ යෝජනාක්‍රමය, කාර්යමණ්ඩල ප්‍රවාහනය, කාර්යමණ්ඩල ණය යෝජනා ක්‍රමය, නිවාඩු නිකේතන පහසුකම්, කාර්යමණ්ඩල නිවාස සහ දායකත්ව මරණාධාර යෝජනා ක්‍රමය යන පරාසයන් තුල විය. සියළුම පද්ධතීන් වර්ෂය තුල භාවිතා කරන්නන්හට හිතකර සහ කාර්යක්ෂම ආකාරයට අවම කාලයක් තුල සකස්කොට ඇත. සේවකයින්ගේ භාවිතය සඳහා සහනදායි මිලකට කතරගම වන්දනා නිකේතනය විවෘත කිරීම තවත් එබඳු උදාහරණයකි.

පවුලේ සාමාජිකයින්, විශේෂයෙන් අප කාර්යමණ්ඩලයේ දරුවන් පිළිබඳව දක්වනු ලබන සැලකිල්ල සේවක නිරතවීම්වලට බලපෑම් ඇති කරවන වැදගත් අංගයකි. එමනිසා 2016 දී පළමුවරට අපොස සා/පෙ සහ උ/පෙ විභාග සඳහා පෙනී සිටින දරුවන් උදෙසා "විභාග පීඩනය අවම කර ගැනීම" පිළිබඳ වැඩ සටහනක් පවත්වන ලදී.

2016 වර්ෂයේදී සිදුවූ ගංවතුර සහ නායයෑම් වැනි ස්වාභාවික විපත්වලට මුහුණ පෑ අපගේ සෙවකයින් සඳහා අවශ්‍ය සහන සහ ආධාර ලබා දීමට කළමනාකාරිත්වය ක්ෂණික පියවර ගන්නා ලදී. සේවකයින් මෙන්ම වෘත්තීය සමිතිද හානියට පත් සේවකයින් සහ මහජනයා වෙනුවෙන් වතුර බෝතල්, වියලි ආහාර සහ අනෙකුත් මූලික අවශ්‍යතා එකතු කරමින් සහ බෙදා හරිමින් තම සහයෝගය ඔවුන් වෙත පල කරන ලදී. මෙම මානවවාදී අනුග්‍රහය ආසන්න පාසැල්වල සිසුන් 574 දෙනෙකු වෙත සහ අරණායක පවුල් 62 ක් වෙතද ලබා දෙන ලදී.

## සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පුහුණුව (CATC)

1984 දී ආරම්භ කළ සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය (CATC) ගුගුසේ හි පුහුණු කිරීමේ හස්තය වේ. වර්තමානයේ ගුවන් (Aviation) සහ ගුවන් නොවන වැඩසටහන් සපයමින් එය ICAO TRAINAIRPLUS පූර්ණ සමාජිකත්වය සුරක්ෂිත කර ගෙන ඇත.

2016 වර්ෂය වෙනුවෙන් CATC පවත්වන ලද මුළු පුහුණු පැය ගණන 46,596 කි. මින් 32,592 ක් සමාගමේ සේවකයින් සඳහා දෙනු ලැබූ පුහුණු පැය වන අතර ඉතිරිය වාණිජ පුහුණුව නියෝජනය කරයි. මෘදු කුසලතා සංවර්ධනය ඉලක්ක කොට ගෙන සේවකයින් 236 දෙනෙක් සඳහා වූ කෙටිකාලීන පුහුණු වැඩ සටහන් 11 ක් මෙහි ඇතුලත් වේ.

පවත්වන ලද පුහුණු කිරීම්වල විස්තර පහත සඳහන් පරිදි වේ.

| ක්ෂේත්‍රය | පුහුණු පැය ගණන |
|---|---|
| මෘදු කුසලතා සංවර්ධනය | 2,160 |
| නව බඳවා ගැනීම් පුහුණු කිරීම | 8,700 |
| වෘත්තීය සංවර්ධනය සඳහා වූ වැඩසටහන් | 21,246 |
| උපදේශාත්මක පුහුණුව | 354 |
| සංස්කරණ පාඨමාලා | 132 |
| බාහිර පාර්ශවයන් සඳහා පුහුණුව | 14,004 |
| **එකතුව** | **46,596** |

## කාර්මණ්ඩල උපදේශනය

ආයතනයේ සමස්ථ ඵලදායිතාවය වැඩිකිරීම ඉලක්ක කොටගෙන 2008 දී සමාගමෙහි උපදේශන ඒකකයක් ස්ථාපිත කල අතර සුදුසුකම් සහිත පළපුරුදු උපදේශකවරුන්ගේ සහභාගීත්වයෙන් එය තවමත් සාර්ථකව ක්‍රියාත්මක වෙයි. භාවාත්මක ස්ථායිතාවය, ගැටුම් නිරාකරණය, ආතතිය කළමනාකරණය, විපර්යාස කළමනාකරණය වැනි දෑ පිළිබඳව විශේෂයෙන් අවධාරණය කරන ලදී.

කාර්යය/කාර්යසාධනය ආශ්‍රිත ගැටළු සඳහා වෘත්තීය උපදේශනයක් ලබාදීමද උපදේශන සේවාවේ එක් අංගයකි. දුර්වල කාර්යසාධනයක් ඇති සේවකයින් ස්වකැමැත්තෙන් හෝ අධීක්ෂකවරුන්ගේ සෘජු මැදිහත්වීම මත යන දෙයාකාරයෙන්ම උපදේශකයින් වෙතට යොමුකරනු ලබයි.

## අනෙකුත් ක්‍රියාකාරකම්

2016 අළුත් අවුරුද්ද සියළුම ආගමික පූජ්‍ය තුමන්ලාගේ ආශීර්වාදයෙන් ශ්‍රී.ශ්‍රී.සේ. කාර්යමණ්ඩලය විසින් උත්සවාකාරයෙන් සමරන ලදී. බ.ජා.ශ්‍රී. හි අනෙකුත් නියෝජිත ආයතනවල නියෝජිතයින් මෙම අවස්ථාව නියෝජනය කරන ලදී.

ශ්‍රීශ්‍රීසේ බෞද්ධ සංගමය විසින් සංවිධානය කළ වෙසක් භක්ති ගී වැඩසටහන 2016 මැයි 25 දින බ.ජා.ශ්‍රී. පර්යන්ත ගොඩනැගිල්ලේදී පවත්වන ලදී. සභාපති, උප සභාපති, විධායක අධ්‍යක්ෂ සහ සියළු අංශ ප්‍රධානීන් මෙම අවස්ථාවට සහභාගි වූහ. 2016 ජුනි 18 දින කටුනායක 18 වන සැතපුම් කණුව අසල පිහිටි බෝධිරතනාරාම විහාරයේදී සහ 2016 නොවැම්බර් 26 දින කැළණිය රජ මහා විහාරයේදී ශ්‍රී.ශ්‍රී.සේ. බෞද්ධ සංගමය විසින් සීල ව්‍යාපාර වැඩසටහන් සංවිධානය කරන ලදී.

2016 දෙසැම්බර් 16 වෙනි දින බ.ජා.ශ්‍රී. හි පැරණි මහජන ප්‍රෙක්ෂක මණ්ඩප ප්‍රදේශයේදී සන්ධ්‍යා යාඥා, භක්ති ගීත සහ සංග්‍රහයන් සමග නත්තල් උත්සවය සමරන ලදී. මෙය සංවිධානය කරන ලද්දේ පවුලේ සාමාජිකයින් සමගින් ශ්‍රී.ශ්‍රී.සේ. හි ක්‍රිස්තියානි සංගමය විසිනි.

සෑම වර්ෂයකම තම පවුල් සමග මඩු දේවස්ථානයට යාමේ වරප්‍රසාදය ශ්‍රී.ශ්‍රී.සේ.හි සෑම සේවකයෙකුටම විවෘතයි. මඩු දේවස්ථානය කරා යන මෙම වාර්ෂික වන්දනා ගමන 2016 සැප්තැම්බර් 23 - 25 දක්වා ශ්‍රී.ශ්‍රී.සේ. හි ක්‍රිස්තියානි සංගමය විසින් සංවිධානය කරන ලදී. පවුල් සාමාජිකයින්ද ඇතුළුව 600 ක් පමණ මෙම අවස්ථාවට සහභාගි වන ලදී.

සුභසාධක සමාජය විසින් සංවිධානය කළ 2016 බක් මහ උළෙල රත්මලාන කොළඹ ගුවන් තොටුපලේදී 2016 අප්‍රේල් 30 දින උත්කර්ෂවත් ලෙස පවත්වන්නට යෙදුනි. මෙම අවස්ථාවට සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහභාගි වූ අතර පෞරාණික ජන ක්‍රීඩා සාඩම්බරයෙන් යුතුව ඉදිරිපත් කරන ලදී. මෙම බක්මහ


1


2

උළෙළේදී කණා මුට්ටිය බිඳීම, අලියාට ඇස් තැබීම, ජනගායනා තරඟ, කොට්ටා පොර, කඹ ඇදීමේ තරඟ වැනි සාම්ප්‍රදායික ක්‍රීඩා ඇතුළුව බොහෝ විනෝදාත්මක ක්‍රීඩා ඉසව් සංවිධානය කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ සේවකයන් හට විවේකීව ගත කිරීමට සහ ප්‍රීති වීමට අවස්ථාව සලසන අතරම ඔවුන් අතර අන්තර් සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමයි.

සමාගමේ වැටුප් ව්‍යුහය සහ පවත්නා බඳවා ගැනීම් සහ උසස්කිරීම් පටිපාටිය සමාලෝචනය කිරීම සහ පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රවල ගැටළු ආමන්ත්‍රණය කරමින් ඔවුන්ගේ යොජනා ඉදිරිපත් කිරීම පිණිස ස්වාධීන නියෝජිතයෙකු ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි (SLIDA) සේවය ලබා ගැනීමට ගු.ගු.සේ. අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබේ.

(අ) ගු.ගු.සේ. හි පවතින වැටුප් ව්‍යුහය පරීක්ෂා කිරීම සහ වෙළඳපල වැටුප් අනුපාත, ශ්‍රම සැපයුම සහ ශ්‍රම අවශ්‍යතා ආදියට අනුව වැටුප් ව්‍යුහයක සේවකයින් ස්ථානගත කිරීමේදී වැටුප් විෂමතා ඇත්නම් ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

(ආ) පවත්නා බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටිය පරීක්ෂා කිරීම සහ සේවකයින්ගේ වෘත්තීය දියුණුව සහ සංවිධානයේ ඵලදායිතාවය වර්ධනය කිරීම යන දෙඅංශයටම අදාල වෙනස්කම් ඇත්නම් ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

ගු.ගු.සේ. හි මුස්ලිම් සංගමය රාමසාන් උත්සවය වෙනුවෙන් 2016 ජූලි 14 දින උත්සවයක් සංවිධානය කරන ලදී. මෙම ආරම්භක උත්සවය සභාපති, උප සභාපති, විධායක අධ්‍යක්ෂ, අංශ ප්‍රධානීන්, සේවකයින්, ගුවන් සේවා සහ අනෙකුත් නියෝජිතායතනවල නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. මුස්ලිම් සංගමයේ සාමාජිකයින්ගේ එක්සත් බව දිරි ගැන්වීම සහ සාමූහික ප්‍රයත්නයන් ප්‍රවර්ධනය කිරීම පිණිස අනෙකුත් ආගමික සංවිධාන සමග එක්ව කටයුතු කිරීමට අපේක්ෂා කරයි.




1 ගු.ගු.සේ. බෞද්ධ සංගමය විසින් සංවිධානය කරන ලද වෙසක් භක්ති ගීත

2 ගු.ගු.සේ. ක්‍රිස්තියානි සංගමය විසින් සංවිධානය කළ නත්තල් බැති ගී වැඩසටහන

3 රත්මලාන ගුවන් තොටුපල සුභසාධක සංගමය සංවිධානය කළ බක්මහ උළෙල

# සාමූහික පාලනය

"ඉහළ කාර්යසාධනයක් අත්පත් කර ගැනීම පිළිබඳ අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන අංගයන් වන්නේ ව්‍යවස්ථාපිත රාමුවට අනුකූලවීම, සංයුක්ත පාලනයේ ඉහළ ප්‍රමිතීන්, විනිවිද භාවය සහ කැපවීම වේ".

ශ්‍රී.ගු.සේ. සමාගම ඉහළ ප්‍රමිතීන් ගෙන් සමන්විත සාමූහික පාලනයක් පවත්වා ගෙන යාමට කැප වී ඇත. තිරසාර ලෙස කොටස්හිමියන්ගේ වටිනාකම ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම පිළිබඳ ශක්තිමත් විශ්වාසය ශ්‍රී.ගු.සේ. හි සාමූහික පාලන මූලධර්ම මගින් පිළිබිඹු වෙයි. ස්ථාවර ප්‍රතිපත්ති පද්ධතියක්, පරිචයන් සහ අභ්‍යන්තර පාලනය මගින් පෝෂණය වූ තම පාලක මණ්ඩල සාමාජිකයින්ගේ සහ සේවකයින්ගේ වෘත්තීයභාවය, එක්සත්කම සහ කැපවීම දිගුකාලීන වටිනාකම සහ කොටස් හිමියන්ගේ ප්‍රතිලාභ ආරක්ෂා කිරීමට අපට හැකියාව ඇති කරවන ප්‍රධාන කරුණු බව ශ්‍රී.ගු.සේ. දැඩි ලෙස විශ්වාස කරයි.

## සමස්ථ විශ්ලේෂණය

අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම යටතේ තම කොටස්හිමි වටිනාකම ආරක්ෂා කිරීමට ඉහළ සාමූහික පාලන ප්‍රමිතීන් අත්පත් කරගැනීම සඳහා ශ්‍රී.ගු.සේ. සමාගම කැප වෙයි. සංයුක්ත වගවීම සහ තිරසාර පැවැත්ම වැඩි දියුණු කිරීමෙහි ලා පැහැදිලිව නිර්වචනය කළ සාමූහික පාලන ප්‍රතිපත්තීන් සහ පරිචයන් යොදා ගැනීමේ වැදගත් කම සමාගම හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ විශිෂ්ඨ පරිචයන් පිළිබඳ ව්‍යවස්ථාව සහ වාණිජමය රාජ්‍ය ව්‍යාපාර **'A'** කාණ්ඩය යටතේ මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ යහපාලනය සඳහා වූ මග පෙන්වීම් අනුව යමින් 2016 මුදල් වර්ෂය තුල සමාගමේ ක්‍රියාත්මක වූ සාමූහික පාලන ක්‍රියාවලීන් සහ ක්‍රියාකාරකම් මෙම වාර්තාවේ සාරාංශ කොට දක්වා ඇත.

මීට අමතරව ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලවීම සඳහා විනිවිද භාවය, අනාවරනය කිරීම්, අභ්‍යන්තර පාලන සහ ව්‍යාපාරික ස්ථානයේ ආචාර ධර්ම වර්ධනය කරවන ඵලදායි පාලන පද්ධතීන් සහ පරිචයන් ආයතන ගත කර තිබේ.

යහපත් සාමූහික පාලනයක් යනු අඛණ්ඩ අභ්‍යාසයක් මෙන්ම සියළුම උනන්දු පාර්ශවයන්ගේ සමස්ථ අභිරුචිය පිණිස සාමූහික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ක්‍රියාවෙහි යෙදවීමට කැපවීම බව ශ්‍රීගුසේ හඳුනාගෙන ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ වරුන්ගේ මූලික වගකීම වනුයේ සමාගමෙහි යහපත සඳහා මෙන්ම දිගුකාලීන වටිනාකම සහ කොටස්හිමි ප්‍රතිලාභ නිර්මාණය කිරීම සඳහා සාධාරණ යයි. ඔවුන් විශ්වාස කරන ආකාරයට තම විනිශ්චයන් ක්‍රියාවේ යෙදවීමයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමෙහි සමස්ථ කාර්යසාධන අරමුණු, මූල්‍ය සැලසුම් සහ වාර්ෂික අයවැය, ප්‍රධාන ආයෝජන සහ අරමුදල් යෝජනා, මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය කිරීම, අවදානම කළමනාකරණය සහ සාමූහික පාලන පරිචයන් පිළිබඳව වගකිව යුතු වේ.

තම වගකීම් කාර්යක්ෂමව ඉටුකිරීම සහතික කිරීමට සහ කළමනාකාරීත්වයේ ස්වාධීන අතපසුවීම් සඳහා පෙර සූදානමක් ඇතිකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටු ස්ථාපිත කර තිබේ. විගණන කමිටු මූලික වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂක වරුන්ගෙන් සෑදී ඇත.

## අපගේ ප්‍රවේශය සහ කැපවීම

ශ්‍රී.ගු.සේ. සමාගම සම්පූර්ණයෙන්ම රජය සතු වන අතර උපායමාර්ගික මෙහෙයවීම සහ සමාගමේ ප්‍රමාද දෝෂයන් පිළිබඳව එහි පාලක මණ්ඩලය රජයට වගකිව යුතු වේ. අපගේ උනන්දු පාර්ශවයන් සඳහා වටිනාකම උපරිම කිරීම පිළිබඳ අපගේ මූලික අරමුණ සාක්ෂාත් කිරීමේ ක්‍රියාවලියේදී ඵලදායි වගවීම සහ විනිවිදභාවය පිළිබඳ රාමුව තුල ව්‍යාපාරික තීරණ ගැනීම වෙනුවෙන් පාලක මණ්ඩලය වගකිව යුතු වේ.

වාණිජමය රාජ්‍ය ව්‍යාපාර 'A'කාණ්ඩය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය මගින් නිර්දේශිත සාමූහික පාලන නියාමන ආකෘතිය විසින් සමාගම මෙහෙයවනු ලබයි. මෙම පාලන ආකෘති රාමුව ප්‍රධාන මූලධර්ම 5 ක් මත රඳා පවතියි.

1. නායකත්වය සහ මගපෙන්වීම
2. විනිවිදභාවය සහ ඒකීයත්වය
3. ප්‍රධාන කොටස්හිමියා ලෙසට රජයට වගවීම
4. උනන්දු පාර්ශවයන්ගේ නෛතික අයිතීන් හඳුනාගැනීම
5. කාලීන සහ සමබර අනාවරණ මූලධර්මය

## මූලධර්ම 1. නායකත්වය සහ මගපෙන්වීම

සාංගමික ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන ව්‍යාපාර කළමනාකරණය සහ මූල්‍ය පාලනය යන ක්ෂේත්‍රවල දැනුමක් සහ පලපුරුද්දක් ඇති සාමාජිකයින්ගෙන් සැදුම්ලත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සමාගමේ ව්‍යාපාරික සහ මෙහෙයුම් කටයුතු පාලනය වේ. ආයතනයේ සාමූහික පාලන ප්‍රතිපත්ති මෙහෙයවන සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීමේ වගකීම ඇති සභාපතිවරයාව පත්කරනු ලබන්නේද ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසිනි. අධ්‍යක්ෂ මණ්ඩලය රජය සහ උනන්දු පාර්ශවයන් වෙනුවෙන් සමාගමේ භාරකාරත්වය පිළිබඳ ව්‍යවස්ථාපිත වගකීම ඉටුකරයි. ඔවුන්ගේ ප්‍රධාන කාර්යයන් වන්නෙ.

අ) ආයතනික දැක්ම සාක්ෂාත් කර ගැනීමට සමාගම මෙහෙයවීම.

ආ) සමාගම සමස්ථයක් ලෙස ගත් කළ එහි කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ කාර්යසාධනයන් අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 11 ගෙන් සමන්විත වන අතර එයින් 8 දෙනෙක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ තිදෙනෙක් විධායක අධ්‍යක්ෂවරුන්

වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙම සංයුතිය සිද්ධාන්තමය සහ දෘශ්‍යමාන යන දෙඅංශයෙන්ම කළමනාකාරිත්වයේ ස්වාධීනත්වය පිළිබිඹු කරයි. මෙය අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික, සේවානියුක්තිය හෝ ව්‍යාපාරය පිළිබඳ තනි සම්බන්ධතාවයයක් පමණක් නොව කළමනාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ථ ආකල්පයයි. පරමාදර්ශී ස්වාධීන විනිශ්චයක් සැපයීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ භූමිකාවෙහි ප්‍රධාන අංගය වේ.

සමාගමේ අභ්‍යන්තර සහ බාහිර තොරතුරු සම්බන්ධයෙන් ස්වාධීනව හෝ ඒකාබද්ධව ප්‍රවේශ වීමට සියළු අධ්‍යක්ෂවරුනට හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටීන් අනුගමනය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් නෛතිකමය අවශ්‍යතාවයන් සඳහා මගපෙන්වීම සමාගම් ලේකම් විසින් තහවුරු කරයි.

මෙයට අමතරව සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැන්වීම්, රැස්වීම් වාර්තා, මාණ්ඩලික පත්‍රිකා සහ අධ්‍යක්ෂ වරුන්හට තීරණ ගැනීමට පහසු කරවන ප්‍රමාණවත් තොරතුරු සමග අදාල අනෙකුත් ලියවිලි බෙදාහරිනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ගනු ලබන පසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලබන්නේද සමාගම් ලේකම් විසිනි.

සමාගමේ සියළුම අංශ ඒවා මත වැඩි අධීක්ෂණයක් සහ විධිමත් පාලනයක් ඇති වනු පිණිස විධායක අධ්‍යක්ෂවරුන් තිදෙනා අතර බෙදා හැර ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්හට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වෙතට ස්වාධීනව ප්‍රවේශ වීමේ හැකියාව තිබේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය සඳහා නියම වී ඇති කරුණුවල අන්තර්ගතය:

අ) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පණතෙහි විධිවිධාන වල දක්වා ඇති විෂයපථය ඇතුලත ගොඩනංවා ඇති විශේෂිත මෙහෙවර මත සමාගම සඳහා දැක්ම සහ මගපෙන්වීම සැපයීම සහ එය කොතෙක් දුරට රජයේ සහ අනෙකුත් උනන්දු පාර්ශවයන්ගේ අභිලාෂයන්ට සේවය කරන්නේද යන්න සොයා බැලීම.

ආ) නෛතික අවශ්‍යතාවයන් සම්පූර්ණ වන බව සහතික කිරීම සහ 2007 අංක 7 දරන සමාගම් පණතේ ප්‍රතිපාදනවලට සහ සාංග මික සංස්ථා පත්‍රයට අනුකූලව සමාගම කටයුතු කරන බව තහවුරු කිරීම.

ඇ) රජයට සහ අනෙකුත් ප්‍රධාන උනන්දු පාර්ශවයන්ට ප්‍රශස්ථ ඵල සහ ප්‍රතිලාභ අත්පත් කරගැනීමට හැකි වන පරිදි අවදානම් කළමනාකරණය ඇතුළුව විවිධ වර්ගයේ ප්‍රතිපත්ති සකස් කිරීම.

ඈ) රාජ්‍ය ප්‍රතිපත්තිමය අරමුණු කලින් කල සමාලෝචනය කිරීම සහ අනාගත වර්ධනය උදෙසා දිගුකාලීන ඉලක්ක සහ අරමුණු සැකසීමට උපායමාර්ගික මගපෙන්වීමක් ලබා දීම.

ඉ) වගකීම් බෙදා හැරීම මගින් ප්‍රමාණවත් වගවීම සහතික කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය කාර්යක්ෂම අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් අතර සුදුසු ලෙස අධිකාරී බලය බෙදාහැරීම හරහා ප්‍රශස්ථ මිශ්‍රණයකින් එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාගමේ සමස්ථ කළමනාකරණයට වගකිව යුතුය.

## මෙම වපසරිය තුල අධ්‍යක්ෂ මණ්ඩලයට නියම වී ඇති කරුණු:

අ) අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති එය සකස් කළ ලෙසම සහ ආයතනයේ සහ මහජනයාගේ පරම අභිලාෂයන් අනුව ක්‍රියාත්මක වන බව සහතික කිරීම.

ආ) සමාගම සිය මෙහෙයුම් වලදී නිසි මාර්ග යේ ගමන් කරන බව තහවුරු කරගනු පිණිස කළමනාකරණ තොරතුරු වාර්තා ආධාරයෙන් කළමනාකාරිත්ව කාර්යසාධනය ඇගයීම සහ අධීක්ෂණය කිරීම

ඇ) අභිමත අපේක්ෂාවන් සමග ප්‍රතිඵල නොගැලපේ නම් ඉලක්ක සපුරාලීම සහතික කරනුවස් අප්‍රමාදව ප්‍රතිකාරක ක්‍රියාමාර්ග ගැනීම.

ඈ) දක්ෂ පුද්ගලයින් කළමනාකරුවන් ලෙස පත් කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය අතර ප්‍රමාණවත් ලෙස අධිකාරී බලය බෙදා හැර ඇද්ද යන්න තහවුරු කිරීම.

ඉ) පොදු ව්‍යාපාර පිළිබඳ කමිටු COPE රැස්වීම් සහ පාර්ලිමේන්තු උපදේශක කමිටු PCC රැස්වීම්වලට සහභාගි වීම හෝ අවශ්‍ය අවස්ථාවලදී ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙතට ඒ සඳහා වූ අධිකාරී බලය පැවරීම.

## සාමූහික පාලනය දෘෂ්ටියෙන් විගණන සහ කළමනාකරන කමිටුවේ (AMC) කාර්යභාරය

1999 - 11 - 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක PF/PE 3 අනුව ස්ථාපිත කළ විගණන සහ කළමනාකරණ කමිටුව අධ්‍යක්‍ෂ මණ්ඩලයට සහය ලබා දෙයි. මෙම කමිටුව අධිකාරීමය විෂය පථය (TOR) නිර්වචනය කරන නිර්ණය විෂයයන්හි දක්වා ඇති නිශ්චිත වගකීම් සහිතව බලතල පැවරූ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මෙහි අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිගමනය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම, ඒකකයේ සියලු ක්‍රියාකාරකම් සඳහා වූ අභ්‍යන්තර පාලන ක්‍රම අධීක්ෂණය කිරීම සහ ඇගයීම, පිරිවැය කාර්යක්‍ෂමභාවය ඇති කිරීම සහ නාස්තිකාරී වියදම් නැති කිරීම සඳහා කාලීනව කාර්යසාධනය තක්සේරු කිරීම ඇතුලත් වෙයි.

අනෙකුත් කරුණු අතර බාහිර විගණකවරුන් සමග සම්බන්ධතා පැවැත්වීම, විගණකාධිපති සහ බාහිර විගණකයින් විසින් නිකුත් කරනු ලැබූ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් වාර්තා කිරීම, ව්‍යවස්ථාවන්, නීතිරීති හා චක්‍රලේඛ අනුව කටයුතු කරන බව නිශ්චය කිරීම, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කරන බව තහවුරු කරගනු පිණිස මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුව විසින් කරන ලද නිර්දේශ සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම වැනි වගකීම් ද වේ.

ශ්‍රී.ගු.සේ. හි විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ගෙන්, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරිවරයෙකුගෙන් සහ අභ්‍යන්තර විගණන සහ තත්ව සහතික අංශ ප්‍රධානිගෙන් සමන්විත වේ. අභ්‍යන්තර විගණන සහ තත්ව සහතික අංශ ප්‍රධානි කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනා වූ අනෝමාල් ද සොයිසා මහතා (AMC සභාපති), එස්.ආර්. ආටිගල මහතා සහ එන්.පී.එල්. ප්‍රනාන්දු මහතා සමාලෝචිත වර්ෂය තුල කමිටුවේ සේවය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විගණන සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම් සහ විමර්ශන වාර්තා ලබාගනී. අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන් කර ඇති කරුණු පිළිබඳව තීරණ ගැනීමේ බලයක් කමිටුවට නැති අවස්ථාවලදී ඔවුන්ගේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීම සඳහා ඉස්මතු කොට දක්වනු ලැබේ. මෙම කමිටුවේ සභාපති විසින් කමිටු රැස්වීම්වල ප්‍රතිඵලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබන අතර අදාල තීරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලට ඇතුලත් කරනු ලබයි.

2016 මූල්‍ය වර්ෂය තුල විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පවත්වා තිබේ.

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත සඳහන් මූලධර්ම 2 - විනිවිදභාවය, අවංකභාවය සහ අවදානම් කළමනාකරණය යටතේ පෙළ ගස්වා ඇත.

## මූලධර්ම 2. විනිවිදභාවය, අවංකභාවය සහ අවදානම් කළමනාකරණය

සාමූහික පාලනය, වගවීම සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම ඉල්ලා සිටින සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ අවංකභාවය ආරක්ෂාකිරීමට යොදා ගනු ලබන පවත්නා ආයතනික සංස්කෘතික යොදාගැනීම් විගණන සහ කළමනාකරණ කමිටුව මගින් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සිදුකෙරේ. මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මග පෙන්වීම් මත පාදක වූ සමාගමේ සමස්ථ මිලදී ගැනීම් ක්‍රියාවලිය භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීමේදී පූර්ණ විනිවිදභාවයක් පෙන්වයි.

## අභ්‍යන්තර විගණනය

විගණන සහ කළමනාකරණ කමිටුව ශ්‍රී.ගු.සේ. හි අභ්‍යන්තර විගණන සහ තත්ව සහතික අංශයේ සහය ලබයි. අභ්‍යන්තර විගණන සහ තත්ව පාලන අංශ ප්‍රධානි විගණන සහ කළමනාකරණ කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරන අතර සභාපතිට වාර්තා කරයි.

අභ්‍යන්තර විගණන සහ තත්ව පාලන අංශයේ ප්‍රධාන ඉලක්කය වනුයේ අභ්‍යන්තර පාලනයන්ගේ ප්‍රමාණවත්බව, ඒකීයත්වය සහ ඵලදායිබව අගයමින් පවත්නා සමස්ථ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව ස්වාධීන සමාලෝචනයක් කිරීම සහ ඒ අතරම ගුවන් තොටුපල සේවාවන්ට නියමිත තත්ව ප්‍රමිතීන් සතුටුදායක ලෙස සපුරාලන බවට සහතික වීම සහ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කරනු සඳහා සුදුසු නිර්දේශයන් කළමනාකාරිත්වය වෙතට ඉදිරිපත් කිරීමයි.

අභ්‍යන්තර විගණනයට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රධාන තීරණ ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වීම.
- ශ්‍රී.ගු.සේ. සමාගමේ එක් එක් අංශයේ විෂය පථයට ගැනෙන කළමනාකරණ තීරණ සහ ක්‍රියාකාරකම් පිළිබඳව අවදානම් තක්සේරුව අගයමින් විගණන සහ කළමනාකරණ කමිටුව වෙත සහ ශ්‍රීගුසේ සභාපති වෙත නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
- පද්ධති සහ පාලන සම්බන්ධයෙන් බාහිර විගණකයින් විසින් කරනු ලබන අවදානම් තක්සේරු කිරීම් නිරීක්ෂණය කිරීම.
- ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් සහ වාර්තාකිරීමේදී ඒවා හඳුනාගැනීම සම්බන්ධයෙන් තත්කාර්ය සහ කාලීන මූල්‍ය සමාලෝචනයෙහි යෙදීම.
- තෝරාගත් ගුවන්තොටුපල පහසුකම් සහ ගුවන් තොටුපල සේවා සම්බන්ධයෙන් තත්ව විගණන පැවැත්වීමට භාරගැනීම.
- රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මගපෙන්වීම් සමග ප්‍රසම්පාදන ක්‍රියාපිළිවෙත අනුකූලවන්නේද යන්න සමාලෝචනය කිරීම.

## මූලධර්ම 3. ප්‍රධාන උනන්දු පාර්ශවය ලෙස රජයට ගිණුම් කිරීමේ වගකීම

පූර්ණ හිමිකාරිත්වය රජය වෙත ඇති සමාගමක් ලෙස රජයට ගිණුම් කිරීමේ වගකීම ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය හරහා පහතින් දැක්වෙන යාන්ත්‍රණය භාවිතා කරමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## පාර්ලිමේන්තුව

2002 මැයි 24 දිනැති අංක PE/PF 21 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව මූල්‍ය වර්ෂය අවසානයේ සිට දින 150 ක් ඇතුලත සමාලෝචනය සඳහා සමාගමේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

## පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව (COPE)

සමාගම නිසි ඉලක්කයන් සපුරාලන ප්‍රමාණය සහ සිය සමාජයීය වගකීම් ඉටුකරන ප්‍රමාණය නිශ්චය කර ගැනීම උදෙසා සමාගමෙහි කාර්යසාධනය සමාලෝචනය කිරීමේ බලය පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවට පවරා ඇත. කෝප් කමිටුව මගින් කැඳවීම් කරනු ලැබූ විට සභාපති, අධ්‍යක්ෂවරු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ප්‍රධාන ගණකාධිකාරී නිලධාරියා ලෙස අමාත්‍යාංශයේ ලේකම් සමග එහි පෙනී සිට සමාගමේ කටයුතු පිළිබඳ විමසුම් සහ කරුණු වෙනුවෙන් ප්‍රතිචාර දැක්විය යුතුය. වර්ෂය තුලදී කෝප් කමිටුව විසින් එක් රැස්වීමක් සඳහා සමාගම කැඳවා ඇත.

## පාර්ලිමේන්තුමය ආංශික විමර්ශන කමිටුව

2015 දෙසැම්බර් 19 දින පාර්ලිමේන්තුවේ සම්මත කළ යෝජනාව අනුව ගු.ගු.සේ. සමාගම ප්‍රවාහන සහ සන්නිවේදනය පිළිබඳ ආංශික සොයාබැලීමේ කමිටුව යටතට පත් කරන ලදී. කමිටුවේ ප්‍රධාන අරමුණ වනුයේ සමස්ථ සැලසුමෙහි ප්‍රගතිය, කාර්යසාධනය සහ වෙනත් විශේෂිත කරුණු ඇගයීම සහ අධීක්ෂණය කිරීමයි. සමස්ථ ක්‍රියාවලියේ අරමුණු සහගත බව පවත්වා ගැනීම පිණිස ආංශික සොයා බැලීමේ කමිටුවෙහි සභාපතිත්වය විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු විසින් දරනු ලබයි. ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අධීක්ෂණය කරනු පිණිස කමිටුව විසින් දෙවරක් ගු.ගු.සේ. සමාගම කැඳවා තිබේ.

## මුදල් අමාත්‍යාශය / මහා භාණ්ඩාගාරය

රාජ්‍ය ව්‍යවසාය ඇතුලුව රාජ්‍ය අංශයේ මූල්‍ය විනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරය වගකිව යුතුවේ. කාර්යසාධනය අධීක්ෂණය කිරීමටත්, ව්‍යවස්ථා, නීති රීති සහ රෙගුලාසි ආදියට අනුකූලබව සහතික කර ගැනීම සඳහාත් වැදගත් කරුණු අමාත්‍යවරයාට වාර්තා කිරීම සඳහාත් භාණ්ඩාගාර නියෝජිතයකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුල මෙම කාර්ය භාරය භාණ්ඩාගාර නියෝජිත එස්. ආර්. ආටිගල මහතා විසින් ඉටු කරන ලදී. රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය කළමනාකරණය සහ පාලනය අධීක්ෂණය කිරීමේ වගකීම රැඳී පවතින්නේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙතය.

## ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් ප්‍රධාන ගණකාධිකාරී නිලධාරියා ලෙස සමාගමේ මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් රජයට වගකිවයුතු අතර මෙම වපසරිය යටතේ පහත සඳහන් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය සමග නිරන්තරයෙන් සමාලෝචනයට භාජනය කරයි.

1) සංයුක්ත සැලසුම සහ වාර්ෂික අයවැය
2) ප්‍රවර්තන වර්ෂයේ කරගෙනයනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘතීන්හි භෞතික සහ මූල්‍යමය කාර්යසාධනය
3) සමස්ථයක් ලෙස වර්ෂයේ කළමනාකරණ ලිපි සහ මූල්‍ය කාර්යසාධනය ඇතුළුව විගණන භාරදීම්
4) පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටු (COPE) රැස්වීම් වලදී හෝ වෙනත් එවැනි ව්‍යවස්ථාපිත ආයතනවල රැස්වීම්වලින් පැන නගින කරුණු

## මූලධර්ම 4. උනන්දු පාර්ශවයන්ගේ නෛතික අයිතීන් හඳුනාගැනීම

උනන්දු පාර්ශවකරුවන් වෙත ආයතනය හොඳින් සලකන විට සහ සමාජයීය වගකීම සහ නෛතික අනුකූලත්වය පිළිබඳ කීර්තිය වැඩිවන විට උනන්දු පාර්ශවකරුවන්ගේ වටිනාකම උසස්වේ. ඒ අනුව ගු.ගු.සේ. සමාගමේ කටයුතු සහ සේවකයින් පිළිබඳ උනන්දුවන රජය සහ අනෙකුත් සම්බන්ධිත ආයතන, ගුවන් තොටුපල භාවිතා කරන්නන් (ගුවන් සේවා, මගීන්, ගුවන් තොටුපල ඇතුලත ව්‍යාපාරික කටයුතු කරන ව්‍යාපාරික ප්‍රජාව), සැපයුම්කරුවන්, අනෙකුත් සේවා සපයන්නන් සහ සමස්ථයක් වූ ප්‍රජාව ඇතුළුව සියළුම නෛතික උනන්දු පාර්ශවකරුවන් වෙත ඇති නීත්‍යානුකූල සහ අනෙකුත් බැඳීම් සමාගම හඳුනා ගනියි. මෙම බැඳීම් උනන්දු පාර්ශවයන්ගේ දිගුකාලීන වටිනාකම උපරිම කිරීමට අවශ්‍ය පරම යුතුකම්හි කොටසක් ලෙස සමාගම දකියි.

සුදුසු ආයතනික පරිචයන් පිළිබඳව එහි කැපවීම එමගින් විද්‍යාමාන වේ. එය පහත සඳහන් ක්ෂේත්‍රවලින් සමන්විත වේ.

- නියාමන ආයතන කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකාරිත්වයේ සැලකිලිමත්භාවය.

- ගුවන් තොටුපල මෙහෙයුම් පිළිබඳ ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස රජයේ වගකීම සම්පූර්ණ කිරීම.

- ණයහිමියන්ට සහ මූල්‍ය ආයතනවලට ඇති බැඳීම් නිසි කලට ඉටුකිරීම.

- සාධාරණ වෙළඳාම කෙරෙහි ඇති බැඳීම නිරතුරුව ඉටුකිරීම සහ සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සමග කටයුතු කිරීමේදී සාධාරණ පදනමක් සහතික කිරීම.

- ප්‍රජාවට බලපාන ව්‍යාපාරික ආචාර ධර්ම පරිචයන් සහතික කිරීම.

- සියළුම මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් නීතියෙහි දක්වා ඇති පරිදි ක්‍රියාත්මක කිරීම සහ සුදුසු පරිදි උසස්ම පරිචයන් අනුගමනය කිරීම.

- ගුවන් තොටුපල භාවිතාකරන සියල්ලන්ටම නොවෙනස්ව සැලකීම.

- සේවකයින්හට සාධාරණව සහ සමාන ලෙස සැලකීම.

## මූලධර්ම 5. කාලීන සහ සමබර අනාවරණය

විචක්ෂණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය ගැඹුරෙන් යුතුව සහ පුළුල් ලෙස කාලීන, නිවැරදි තොරතුරු සැපයීම අපගේ අභ්‍යන්තරව මෙන්ම බාහිරව තොරතුරු හෙළිදරව් කිරීමේ මූලික හරයයි. මහා භාණ්ඩාගාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ඇතුළුව සියළු නීති සහ නියමයන් සමග අනුකූලතාවය සහතික කිරීම සඳහා සමාගම විසින් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ස්ථාපිත කර ඇත.

ව්‍යාපාරය, අවදානම් පැතිකඩ, මූල්‍ය තත්වය, මෙහෙයුම් කාර්යසාධනය සහ ආයතනයේ ප්‍රවනතා කොටස්කරුවන් හට අවබෝධ කරගැනීමට උපකාරී වනු පිණිස ගු.ගු.සේ. සමාගම එලදායි සහ අව්‍යාජ සන්නිවේදනයක් කොටස්කරුවන් සමග පවත්වා ගෙනයනු ලැබේ. පරිචයක් ලෙස හෝ ඉල්ලීම් අනුව කාලීන මෙන්ම තත්කාර්ය වාර්තා සහ විශ්ලේෂණය කළ තොරතුරු බොහෝ ප්‍රමාණයක් සපයනු ලැබේ. ආයතනික මෙහෙයුම් සහ මූල්‍ය කාර්යසාධනය සම්බන්ධ සත්‍ය තත්වය පිළිබඳ සේවකයින් යාවත්කාලීන කර ඇත. සේවකයින් හට තොරතුරු බෙදාහැරීම උසස් කිරීමේ අරමුණින් සමාගමේ අන්තර්ජාල සේවා ක්‍රියාත්මක වෙයි. අප මෙහෙයුම් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජාව හට බලපාන සහ අපගේ ව්‍යාපාරයට බලපෑමක් ඇති කරන නීති සහ නියමයන්හි සංවර්ධනයන්, නියෝග සහ සංශෝධන සිදුවුවහොත් ගු.ගු.සේ. සමාගම ඒ පිළිබඳ පොදු ප්‍රතිපත්තිමය සංවාදයකට දායකත්වය සපයයි.

### සමාගමේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටීන් අනුගමනය කිරීම සහ නිරතුරුව සමාලෝචනය කිරීම සහතික කරමින් සමාගමේ ලේකම් ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි.

රැස්වීම්වලදී එලදායි තීරණ ගනු පිණිස සියළුම අදාල තොරතුරු, විස්තර සහ ලියවිලි අධ්‍යක්ෂ වරුන් හට සපයා ඇති බවට සමාගමේ ලේකම් සහතික කරයි. සමාගමේ ලේකම් මූලික වශයෙන් අදාල ව්‍යවස්ථාපිත නව රෙගුලාසි සමග අනුකූල වන බව තහවුරු කිරීමට වගකිව යුතු වන අතර පාලන කටයුතු සඳහා කළමනාකාරීත්වය සහ නියාමන අධිකාරීන් අතර සම්බන්ධකයක් ද වේ.

# අවදානම්
# කළමනාකරණය

“ඔබ අවදානමට මුහුණ නොපාන්නේ නම්, ඔබට සියල්ල අවදානමක් වේ. එමනිසා විශාලතම අවදානම වන්නේ අසාර්ථකත්වය සනිටුහන් කරන එකම උපක්‍රමය වන අවදානම නොසැලකීමයි. ඒ අනුව අපි ශ්‍රී.ශ්‍රී.සේ. හි කරන සියළු කටයුතු වලදී අවදානමට විවෘත වෙමු. අවදානම් කළමනාකරණය කරළියට පැමිණ ඇත්තේ එබැවිනි”

## අවදානම් කළමනාකරණය කෙටියෙන්

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) අවදානම් කළමනාකරණය පහත දැක්වෙන පරිදි නිර්වචනය කරයි.

"සංවිධානයේ පැවැත්මට හානි කරන, පසුව සිදුවන අවදානම හඳුනාගැනීම, විශ්ලේෂණය කිරීම සහ නැතිකර දැමීම (පිළිගත හැකි හෝ දැරිය හැකි මට්ටමකට අවම කිරීම)". (ICAO ලියවිලි 9859).

මෑත කාලීන සහ නවීන සංවර්ධනයක් ලෙස ගුවන් සේවා අංශය පිළිබඳ සන්දර්භයේදී "අවදානම" යන වචනය වෙනුවට "ව්‍යසනය" ලෙස හඳුන්වන අතර සමාන වචන ලෙස සලකයි. අවදානම් කළමනාකරණය 1990 ගණන්වල විශාල වශයෙන් මතු වූ බව පැහැදිලි වුවත් "අවදානම් කළමනාකරණය" යන යෙදුම 1990 ගණන්වලට බොහෝ කලකට පෙර භාවිතා කොට ඇත.

## ගුවන් සේවා නියාමන සන්දර්භයේදී අවදානම් කළමනාකරණයේ වැදගත්කම

චිකාගෝ සම්මුතියේ සුවිශේෂී ප්‍රතිපාදන කිහිපයක්, ගුවන් යානා මෙහෙයවන්නන් සහ ගුවන් සේවා සපයන්නන් මගින් වන ආරක්ෂක කළමනාකරණයට සම්බන්ධ සුගංගත කිරීම සහ දීර්ඝ කිරීම වෙතට ඉලක්ක කොට ඇති මෙම වෙනස්කම් මෙහෙයුම්කරුවන් හෝ සේවා සපයන්නන් විසින් ක්‍රියාත්මක කොට පවත්වා ගැනීම සඳහා ආරක්ෂක කළමනාකරණ පද්ධතියක් (SMS ) හඳුන්වා දෙයි.

"ආරක්ෂක අවදානම් කළමනාකරණය (SRM) - SMS ඇතුලත විධිමත් ක්‍රියාවලියක් - පද්ධතිය විස්තර කිරීම, ව්‍යසන හඳුනාගැනීම, අවදානම තක්සේරු කිරීම, අවදානම විශ්ලේෂණය කිරීම සහ අවදානම පාලනය කිරීම ආදියෙන් සමන්විත වෙයි. SRM ක්‍රියාවලිය භාණ්ඩ හෝ සේවා සැපයීමට භාවිතා කළ ක්‍රියාවලිය තුලට කා වද්දවා ඇත. එය වෙනස් වූ හෝ විශේෂ වූ ක්‍රියාවලියක් නොවේ". (FAA AC 120-92, ගුවන් මෙහෙයුම්කරුවන් සඳහා SMS හඳුන්වා දීම).

## අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) විශේෂ ප්‍රතිපාදන

ICAO ප්‍රතිපාදන සමග සංගතව, යුරෝපීය රෙගුලාසි 1035/2011 - ගුවන් නාවික සේවා පිළිබඳ පොදු අවශ්‍යතාවයන් සහ EUROCONTROL ESARR 3, අවදානම් තක්සේරුව සහ අවම කිරීම ආරක්ෂක කළමනාකරණ පද්ධතියේ ආරක්ෂාව අත්පත් කර ගැනීමේ බල ප්‍රදේශයක අත්‍යාවශ්‍ය අංගයක් ලෙස හඳුනා ගනියි. ඒ අනුව අවදානම් කළමනාකරණය අත්‍යාවශ්‍ය අංග තුනකින් සමන්විත වෙයි.

1. අනතුර හඳුනාගැනීම - අනතුරක් සිදුවීමට යොමු කරවිය හැකි නොපැතූ හෝ අහිතකර සිදුවීම් හඳුනාගැනීම සහ මෙම සිදුවීම් සිදුවිය හැකි සහ එමගින් හානි සිදුවිය හැකි යාන්ත්‍රණය විශ්ලේෂණය කිරීම. අනතුර හඳුනාගැනීම සඳහා ප්‍රතික්‍රියා මෙන්ම පූර්ව පාලන ක්‍රියා යන දෙකටම අදාල විධික්‍රම සහ ශිල්පීය ක්‍රම භාවිතා කළයුතුය.

2. අවදානම තක්සේරු කිරීම - හඳුනාගත් අනතුරු ඒවායේ හානිකර ප්‍රතිඵලයන්හි තීරණාත්මක බව අනුව තක්සේරු කිරීම සහ ඒවායේ අවදානම දැරීමේ හැකියාව අනුව ශ්‍රේණි ගත කිරීම සිදුකරයි. පළපුරුදු පුද්ගලයින් විසින් හෝ වඩා විධිමත් ශිල්පීය ක්‍රම භාවියෙන් සහ විශ්ලේෂක විශේෂඥයින් හරහා මේවා නිරන්තරයෙන් තක්සේරු කරනු ලබයි. ප්‍රතිඵලයන්හි දැඩි බව සහ අනතුරු සිදුවීමේ සංඛ්‍යාතය තීරණය කරනු ලබයි. අවදානම පිළිගත හැකියයි සලකන්නේ නම් මැදිහත් වීමකින් තොරව මෙහෙයුම් අඛණ්ඩව සිදුකරයි. එය පිළිගත නොහැකි නම් අවදානම අවම කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරයි.

3. අවදානම අවම කිරීම - අවදානම පිළිගත නොහැකි යයි සලකනු ලබන්නේ නම් එම අවදානමට එරෙහිව ආරක්ෂිත පියවරවල් ශක්තිමත් කිරීම සහ වැඩිකිරීම හෝ ආර්ථික වශයෙන් සාධ්‍ය නම් එම අවදානම වැලැක්වීම හෝ ඉවත් කිරීම සිදුකරයි.

පහත දැක්වෙන ප්‍රවාහ සටහනෙන් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පෙන්නුම් කරයි.




අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය (මූලාශ්‍රය - ICAO ලේඛන 9859 - ආරක්ෂාව සහ අවදානම් කළමනාකරණ අත්පොත)

## ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා ) සමාගමේ අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය

ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස සමාගම බ.ජා.ගු., ම.රා.ජා.ගු. සහ රත්මලාන යන ගුවන් තොටුපලවල් තුන පාලනය කරන අතර රටෙහි ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීමද සිදුකරයි. ගු.ගු.සේ. හි ව්‍යාපාරික කටයුතු සංවිධානයේ මෙහෙයුම් සහ මූල්‍ය කාර්යසාධනයට තර්ජනය කිරීම්වලින් පමණක් නොව රටෙහි ප්‍රතිරූපය පිළිබඳ විවිධ අවදානම් පරාසයකින් වට කොට ඇත. එමනිසා ගු.ගු.සේ. හි අවදානම් කළමනාකරණය සංයුක්ත පාලන රාමුවෙහි ප්‍රධාන අංගයන්ගෙන් එකක් වෙයි. එසේම පාලක සභාව ගු.ගු.සේ. හි අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සහ අවදානම් කළමනාකරණයේ ඵලදායි බව පිළිබඳව වගකිව යුතු වේ. සංයුක්ත මට්ටමේදී, ගු.ගු.සේ. හි දිගු කාලීන අරමුණු අත්පත් කරගැනීමට බාධාකරනු ලබන අවදානම සංයුක්ත සැලසුම් සන්දර්භය තුල විශ්ලේෂණය කරනු ලබයි. ගු.ගු.සේ. හි කෙටි සහ මධ්‍ය කාලීන අරමුණු හා බැඳුනු අවදානම හඳුනා ගැනීම අවශ්‍ය වන අතර වාර්ෂිකව ඒ පිළිබඳව කටයුතු කළයුතුවේ.

## ගු.ගු.සේ. තුල සංවර්ධනය වෙමින් පවතින අවදානම් කළමනාකරණ රාමුව

ගු.ගු.සේ. හි අභ්‍යන්තර පාලනයන් සැලසුම් කර ඇත්තේ අවදානම නැති කර දැමීමට වඩා එය පාලනය කිරීම සහ අවම කිරීම සඳහාය. අවදානම තක්සේරුව සහ කළමනාකරණය ගු.ගු.සේ. හි සෑම මට්ටමකදීම විශේෂයෙන් ම පාලක මණ්ඩල සීමාවේදී, විගණන සහ කළමනාකරණ කමිටුවේ දී සහ ජ්‍යෙෂ්ඨ සහ මධ්‍ය කළමනාකරණ මට්ටමේදී තීරණාත්මක කේන්ද්‍රය බවට පත් වී ඇත. අපගේ ප්‍රමාණාත්මක අවදානම් පැතිකඩ සියළුම මෙහෙයුම් සහ සහය ශ්‍රිතයන් ආවරණය කරමින් පහළ සිට ඉහළට විශ්ලේෂණාත්මක ප්‍රවේශය හරහා තක්සේරු කරනු ලබයි. ගුවන් තොටුපල මෙහෙයුම් වලට බලපාන අප්‍රමාණ අවදානම් හැකියාවන් තුල අවදානම සමාලෝචනය කිරීම සඳහා පූර්ණ අවදානම් හඳුනාගැනීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට සහ ගුවන් තොටුපලවල මෙහෙයුම්හි තිරසර බව කෙරෙහි තීරණාත්මක මෙහෙයුම් ක්ෂේත්‍රවලට අදාල ව්‍යාපාරික අවිච්ඡින්න කළමනාකරණ ක්‍රියාවලිය (BCP) පිළිබඳව සියළු මෙහෙයුම් දෙපාර්තමේන්තුවලට උපදෙස් දී ඇත.




ගු.ගු.සේ. හි අනාගත සංකලිත සහ බහු ස්තර අවදානම් සහ ව්‍යාපාරික අවිච්ඡින්න කළමනාකරණ සැලසුමෙහි ප්‍රධාන අංගවලට හඳුනාගත් අවදානම් ඔස්සේ යමින් ලේඛන ගත කිරීම සඳහා මෙහෙයුම් අවදානම් ලේඛනයක් ස්ථාපිත කිරීම, වලක්වාගත හැකි සහ ප්‍රතිචාරි පටිපාටින් අඛණ්ඩව යාවත්කාලීන කිරීම සහ සංවර්ධනය සහ සඵලදායි බව සහතික කරගනුවස් ක්‍රියාකාරි සැලසුම් සහ පටිපාටින් පරීක්ෂා කිරීම සහ අභ්‍යාස කිරීම ඇතුලත් වේ.

ගු.ගු.සේ. හි ඵලදායි අවදානම් කළමනාකරණයක් සහ පාලන පද්ධතියක් ඇති බව සහතික කිරීමේ සමස්ථ වගකීම පාලක මණ්ඩලය විසින් දරනු ලබයි. මෙම වගකීම සම්පූර්ණ කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුව සහය වෙයි.

අපගේ අවදානම්, සමාගමට වන විභව බලපෑම් සහ අවදානම් පාලන සහ අවම කිරීමේ උපායමාර්ගයන් පහතින් විස්තර කර ඇත.

## මෙහෙයුම් අවදානම

### 01 අවදානම හඳුනා ගැනීම - ආරක්ෂාව, සුරක්ෂිත බව සහ සෞඛ්‍යය අවදානම

**ආරක්ෂාව**

ගු.ගු.සේ. හි මෙහෙයුම් සම්බන්ධයෙන් ගත් කළ ආරක්ෂාව මූලික වෙයි. ගුවන් තොටුපල පහසුකම් පවත්වා ගැනීම සහ මෙහෙයවීම, අඩු කල හැකි, අවම කළ හැකි සහ සම්පූර්ණයෙන් ඉවත් කළ නොහැකි වුවත් මාරු කළ හැකි අවදානම් හඳුනාගැනීම හා සම්බන්ධ වෙයි. කාලෝචිතව අවම කෙරෙන වෘත්තීය සෞඛ්‍යයට සහ ආරක්ෂාවට අදාල සිදුවීම් හඳුනාගැනීම ගු.ගු.සේ. හි තිරසාර පැවැත්මේ ප්‍රධාන අංගයන්ගෙන් එකක් වේ.

උදාහරණයක් ලෙස කුරුල්ලන් හැපීම නිසා සිදුවන අනතුරු සහ සිදුවීම්වල ප්‍රතිඵලය මාරාන්තික තුවාල සහ ගුවන් යානාවලට සිදුවන හානි විය හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් සේවා පියාසර කිරීමෙන් වැලකී සිටිය හැකිය.

**ආරක්ෂාව**

ගුවන් තොටුපල ආරක්ෂාව, ගුවන් මගී ප්‍රමාණය වැඩිවීමෙන් සහ සිවිල් ගුවන් සේවාවට වන බලපෑම් වැඩිවීමේ ස්වභාවය මගින් අභියෝගයන්ට මුහුණ දීම නිරන්තරයෙන් සිදු කරයි. ගුවන් ආරක්ෂාව සමග සම්බන්ධිත අවදානම එනම් ISIS, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය, අන්තරායකාරී දියර සහ ඝන ද්‍රව්‍ය, නිරෝධායනය නොකළ සතුන් සහ පැලෑටි, නොහික්මුණු මගීන්, මගීන්ට, ගුවන් යානාවලට සහ අනෙකුත් ගුවන් සේවා වත්කම්වලට එරෙහි ද්වේශ සහගත ක්‍රියා සහ මායිමෙහි ආරක්ෂාවට තර්ජන, තහනම් භාණ්ඩ සහ ගනුදෙනුකරුවන්ට තැරැව්කාරකම් කිරීම වැනි ගෝලීය ත්‍රස්තවාදය කලාපය හරහා වැඩිවන ප්‍රවනතාවයක පවතී.

**සෞඛ්‍යය**

සමාලෝචිත වර්ෂය තුල ගු.ගු.සේ. සමාගම සෞඛ්‍යය අවදානම සම්බන්ධ කිසිදු බරපතල අභියෝගයකට මුහුණ දී නොමැත. කෙසේ වුවද ජාත්‍යන්තර ගුවන් තොටුපල සේවා සපයන්නෙක් ලෙස ගු.ගු.සේ. සමාගම එහි සෞඛ්‍යය අවදානම සඳහා වූ අවදානම් පාලන සහ අධීක්ෂණ යාන්ත්‍රණය පවත්වා ගැනීම සහ උත්ශ්‍රේණි කිරීම අඛණ්ඩව සිදුකරයි.

### අවදානම ඇගයීම (ගු.ගු.සේ. මත විභව බලපෑම)

ගෝලීය වශයෙන් මෙන්ම ආසියා පැසිපික් කලාපීය වශයෙන් මෙම ප්‍රධාන අවදානම් විචල්‍යයන් වර්ග තුනම වැඩි වන ප්‍රවනතාවයක පවතී. කිසියම් අවදානම අවම කිරීමක් හෝ අධීක්ෂණ ශිල්පීය ක්‍රම යොදා ගැනීමට පෙර ගු.ගු.සේ. මත වන විභව බලපෑම "ඉහළ" එකක් ලෙස වර්ග කළ හැකිය.

### අවදානම පාලනය සහ අවම කිරීම

සියළුම මට්ටම් වලදී, ආරක්ෂක උපද්‍රව සහ සිදුවීම් වාර්තාකරණය ධෛර්යමත් කිරීමත් අධීක්ෂණය කිරීමත් සිදු කරනු ලබයි. පෙර වර්ෂවල ලෙසටම, ගුවන් තොටුපලේදී ගුවන් කාර්ය මණ්ඩල, ගුවන් යානා සහ මගීන් තුවාල වීමේ අනුපාතය මගින් මනිනු ලබන ආරක්ෂිත තත්වය ගු.ගු.සේ. සමාගමේ ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලෙස පවතී. ගු.ගු.සේ. සමාගම ගුවන් ක්ෂේත්‍රයේ, ගුවන් අංගනයේ, දොරටුවල සහ නඩත්තු ප්‍රදේශවල ගු.ගු.සේ. මෙහෙයුම්වල සියළු කොටස් ආවරණය වන විවිධ ප්‍රමිත මෙහෙයුම් පටිපාටීන් නිරන්තරයෙන් සමාලෝචනය කරයි. ගු.ගු.සේ. සමාග මට ගැලපෙන පරිදි ආරක්ෂක කළමනාකරණය පිළිබඳ ප්‍රධාන කේන්ද්‍රය වන්නේ දැනටමත් මුහුණ දී ඇති අවදානම හඳුනා ගැනීම පමණක් නොව විශේෂයෙන් ගුවන් ක්ෂේත්‍රයේ විවිධ අවදානම් සඳහා යොමු කරවන විභව තත්වයන් හඳුනාගැනීමයි. උදාහරණයක් ලෙස කුරුළු ජනගහණයේ ප්‍රවනතාව අනතුරු සහ සිදුවීම් (කුරුල්ලන් ගැටීම හේතුවෙන්) සඳහා වන ප්‍රමුඛ සාධකයක් ලෙස හඳුනාගෙන ඇත.

මෙම අවදානම වැලැක්වීම පිණිස ගුවන් තොටේදී මූලික වශයෙන් කුරුළු ගහණය තක්සේරු කිරීම සහ කළමනාකරණය වැනි මිනුම් ගනු ලබයි. ඊට අමතරව ආරක්ෂක අංශය යටතේ වූ කුරුළු උවදුරු පාලන ඒකකය, බ.ජා.ගු. සහ ම.රා.ජා.ගු. වල කරගෙන ගිය ඔවුන්ගේ කාලීන අධ්‍යයනවලදී කොළඹ විශ්ව විද්‍යාලයේ සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත ක්ෂේත්‍ර පක්ෂි අධ්‍යයන කණ්ඩායම විසින් නියම කොට ඇති නිර්දේශ ක්‍රියාත්මක කරයි.

ගු.ගු.සේ. සමාගම අවශ්‍ය අවස්ථාවලදී සමාලෝචනය කරන සහ යාවත්කාලීන කරන ආරක්ෂිතබව කළමනාකරණය කිරීමේ සැලසුමක් සූත්‍ර ගත කර ඇත. නාමිකව ගත් කළ ආගමන විගමන දෙපාර්තමේන්තුව, ගුවන් හමුදාව සහ පොලීසිය යන ගු.ගු.සේ. හි ගුවන් තොටුපල ආරක්ෂක පිරිස් මෙම සිදුවීම් අවම මට්ටමක පවත්වා ගැනීම සඳහා බ.ජා.ගු. වල අභ්‍යන්තර අධීක්ෂණ සම්පත් සමග සහයෝගීව කටයුතු කරයි.

| | |
|---|---|
| | **අවදානම පාලනය සහ අවම කිරීම**<br><br>වැඩිදියුණු කළ සොයාගැනීම් සහ කාර්යක්ෂම උපකරණ හා පහසුකම් ස්ථානගතව ඇති අතර ඉහළම ආරක්ෂිත ප්‍රමිතීන් පවත්වා ගෙන යාම තහවුරු කරනු පිණිස ඒවා අඛණ්ඩව යොදවා තිබේ.<br><br>ඇතිවිය හැකි සෞඛ්‍යය අවදානමට ආමන්ත්‍රණය කිරීම සඳහා ගු.ගු.සේ. සමාගම ප්‍රධාන පොදු සෞඛ්‍ය ගැටළු වෙනුවෙන් වූ ක්ෂණික ප්‍රතිචාර සැලසුමක් අඛණ්ඩව පවත්වා ගෙන යයි. තවද තම වෛද්‍ය නිලධාරි කණ්ඩායම සමග එක්ව වෛද්‍ය ඒකකය විසින් මහා පරිමාණයේ වාර්ෂික හදිසි තත්ව අභ්‍යාස පවත්වා ගෙන යයි. එසේම ගු.ගු.සේ. සමාගම ගුවන් ගමන් මගින් ඇතිවන සංක්‍රමණීය රෝග පැතිරීම වැලැක්වීම සඳහා වූ සහයෝගිතා සංවිධානය (CAPSCA) සමග අවශ්‍යතාවක් පැන නැගුනු විට ඒකාබද්ධ වෙයි.<br><br>මෙම අවදානම්වලට කටයුතු කිරීම සඳහා ගු.ගු.සේ. සමාගමට පලපුරුදුකම් ඇති සහ ක්ෂේත්‍රයේ උගත් වෘත්තිකයින් ප්‍රධානත්වය දරණ, නම් වශයෙන් ගත් කළ, ආරක්ෂාව, සුරක්ෂිතබව සහ වෛද්‍ය අංශය යන විශිෂ්ඨ අංශ තුනක් තිබේ. |
| 02 | **අවදානම හඳුනාගැනීම - ජාතික ප්‍රවාහකයා (ශ්‍රී ලංකන් ගුවන් සේවය) මත අධික ලෙස රඳාපැවැත්ම.**<br><br>බ.ජා.ගු. හි මගී පරිමාවෙන් 50% ක් සමගින් ගු.ගු.සේ. හි විශාලතම ගනුදෙනුකරුවා වන්නේ ශ්‍රී ලංකන් ගුවන් සේවයයි.<br><br>**අවදානම ඇගයීම (ගු.ගු.සේ. මත විභව බලපෑම)**<br><br>වෙළඳපල සහ ගනුදෙනුකරුවන්ගේ පදනම යන්න අනුව ගු.ගු.සේ. සමාගම ඉහළ මට්ටමේ ව්‍යුහාත්මක අවදානමකට විවෘත වෙමින් පවතී. ගු.ගු.සේ. මත විභව බලපෑම "ඉහළ" එකක් ලෙස වර්ග කළ හැකිය.<br><br>**අවදානම පාලනය සහ අවම කිරීම**<br><br>ගු.ගු.සේ. සමාගම, ගුවන් තොටුපල මෙහෙයුම් කරුවෙක් සහ ජාතික වාහකයෙක් යන දෙආකාරය පිළිබඳ ව්‍යාපාරික සැලසුම් එකවිට ක්‍රියාත්මක කිරීමේ නිරන්තර උත්සාහයක නිරතව සිටියි. රටෙහි ගුවන් සේවා ප්‍රධාන සැලසුම නිදහස් අහසෙහි සම තත්වය සමගින් ජාතික වාහකයාගේ අයිතිය සුරකීමේ උපායමාර්ගයන්ගෙන් සමන්විත වෙයි. |
| 03 | **අවදානම හඳුනාගැනීම - ම.රා.ජා.ගු., දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල සඳහා වෙළඳපල සංවර්ධනය කිරීමේ අවදානම**<br><br>මරාජාගු හි ස්ථිර සේවා දායක පදනමක්, මගී පදනමක් හෝ ගුවන් භාණ්ඩ පදනමක් වැනි සාධක නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත සමප්‍රතිභේදන වර්ෂය සහ පිළිගෙවුම් කාලය දීර්ඝ වියහැකිය.<br><br>**අවදානම ඇගයීම (ගුගුසේ මත විභව බලපෑම)**<br><br>ම.රා.ජා.ගු. වර්තමානයේ ගු.ගු.සේ. සමාගමේ මුදල් ප්‍රවාහ මත රඳා පවතින බැවින් ම.රා.ජා.ගු. හි සමප්‍රතිභේදනය අත්කර ගැනීමේ යම් පමාවක් ගු.ගු.සේ. සමාගමේ මුදල් ප්‍රවාහයට මෙන්ම ලාභදායිත්වයට අහිතකර බලපෑමක් ඇති කරනු ඇත.<br><br>තවද පවත්නා තත්වය මත රඳාපවතිමින් මෙය "අධි අවදානමක්" ලෙස වර්ගීකරණය කළහැකිය.<br><br>**අවදානම පාලනය සහ අවම කිරීම**<br><br>ම.රා.ජා.ගු. සඳහා වෙළඳපල හැකියාවන් හඳුනාගැනීම සහ පුළුල් කිරීම කෙරෙහි සියළු වෙළඳපල ප්‍රයත්න කේන්ද්‍රගත වී ඇත. සිදුවිය හැකි සිදුවීම් විශ්ලේෂණය කිරීම, ප්‍රවාහන පුරෝකථන, මාර්ග පුරෝකථන සහ පෝෂක ප්‍රදේශ විශ්ලේෂණය කාලීනව කරගෙන යනු ලබයි.<br><br>සංචාරක කර්මාන්තය සහ ගුවන් සේවා සමූහය සමග සාමුහිකවත් අදාල බලධාරීන් සමග සාමුහිකවත් අලෙවිකරණ අංශය ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල නිරතවී ඇත.<br><br>ම.රා.ජා.ගු. හි වාණිජමය මෙහෙයුම් සඳහා ආයෝජනයට කැමැත්ත ප්‍රකාශ කිරීම් (EOI)කැඳවා තිබේ. |

## 04 අවදානම හඳුනාගැනීම - නෛතික, නියාමන සහ කීර්තිමත් භාවය පිළිබඳ අවදානම

නීති උල්ලංඝනය කිරීම සහ අනුකූල නොවීම

නීතිය උල්ලංඝනය කිරීම, නියාමන අවශ්‍යතාවලට අනුකූල නොවීම, පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල නොවීම සහ ගිවිසුම් කඩ කිරීම, "හිතාමතා නොවුනත්" කීර්තියට හානි වීම, ව්‍යාපාරයට හෝ මෙහෙයුම් කටයුතුවලට බාධා පැමිණීම, බලය පෙන්වීමේ ක්‍රියාවන් සහ නඩු කටයුතු ඇසුරු කොට ඇතිවන මුදල්මය අලාභ ඇතුළුව ගුගුසේ මත ඇතිවන බලපෑම් මගින් නෛතික ප්‍රතිඵල ඇති කරනු ලබයි.

කීර්තිය පිළිබඳ අවදානම යටතේ උනන්දු පාර්ශවයන්ගේ ප්‍රත්‍යක්ෂයන් සහ දුර්මතයන් මගින් කීර්තිය විනාශ කරනු ලබයි. එසේම අවසානයේදී ගනුදෙනුකරුවන් අතෘප්තිමත් වන ආකාරයේ අහිතකර ප්‍රචාරයක්, සමාගමෙහි වෙළඳනාමයෙහි පහත වැටීමක්, තරඟකාරී වාසි අහිමිවීම සහ තිරසාර ව්‍යාපාරික කළමනාකරණයට අහිතකර බලපෑම් වැනි දෑ ජනිත කරනු ලබයි.

### අවදානම ඇගයීම (ගු.ගු.සේ. මත වියහැකි බලපෑම)

සමහර නෛතික අවදානම් තනිව පවතින අතර, ඒවායින් බොහොමයක් මෙහෙයුම්, මූල්‍යමය, කීර්තිය, දේශපාලනික, බදු සහ නියාමන අවදානම් සමග කා වැදී ඇත. එමනිසා සිදුවිය හැකි නරකම තත්වයේදී ගු.ගු.සේ. මත වියහැකි බලපෑම "ඉහළ" එකක් ලෙස ශ්‍රේණි ගත කළහැකිය. වර්තමානයේදී එය "පහළ" මට්ටමේ පවතී.

කෙසේවුවද ගුගුසේ හි අපි නෛතික සහ නියාමන අවදානම්වල ඵලදායි කළමනාකරණය ව්‍යාපාරයෙහි, මෙහෙයුම්හි සහ ගු.ගු.සේ. හි සංවර්ධනය පිළිබඳව අනවශ්‍ය සහ අවිචාරශීලී අවදානම් දැරීම වැලැක්වීමට කළමනාකාරීත්වයට උදව්වන බව අවබෝධ කර ගෙන සිටිමු.

### අවදානම පාලනය සහ අවම කිරීම

ගුගුසේ සමාගම රජයේ ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාපිත වෙනස්කම් අධීක්ෂණය කරනු පිණිස පූර්වක්‍රියාකාරී මෙන්ම දුරදක්නා ප්‍රවේශයක් ගෙන ඇත. තවද ගුගුසේ සමාගමට අදාල වන අවදානම් වියහැක. ප්‍රදේශ හඳුනාගැනීම සඳහා තීරණ, නියමයන්, නියාමන ක්‍රියාවන් සහ පැමිණිලි සමාලෝචනය කරනු ලබයි. ගු.ගු.සේ. හි පිළිගත් අවදානම් මට්ටම තුල නෛතිකව ක්‍රියාත්මක වීමට කළමනාකාරීත්වයට මග පෙන්වනු පිණිස කාලීනව වෙනස්කම් ආමන්ත්‍රණය කිරීම සඳහා වූ ප්‍රතිපත්තීන, ක්‍රියාපටිපාටීන් සහ සුදුසු ක්‍රියාකාරී පියවරයන් සංවර්ධනය කරනු ලබයි. මෙම වෙනස්කම්වලට ගැලපීම සඳහා කළමනාකාරීත්වයට අඛණ්ඩව අධ්‍යාපනය සපයනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා ප්‍රමාණවත් මිනුම් පවත්වාගෙන යනු ලබන අතර බලාත්මක කරනු සඳහා නිරතුරුව සමාලෝචනය කරනු ලබයි. ගු.ගු.සේ. සමාගම නිරන්තරව අධීක්ෂණයෙහි යෙදෙන අතර නෛතික සහ නියාමන අවදානම් අපහසුවකින් තොරව ඉදිරියට යාම කළමනාකරණය කරයි. සෘජු සහ වක්‍ර නෛතික සහ නියාමන අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා වූ අවම කිරීමේ ප්‍රායෝගික ශිල්පීයක්‍රම සමහරක් පහතින් දැක්වේ.

පර්යන්ත ගොඩනැගිල්ල සහ යාබද ප්‍රදේශ ඇතුලත සිදුවන අනතුරු ආවරණය කිරීම සඳහා ගුවන් තොටුපල මෙහෙයුම්කරුවන්ගේ වගකීම් රක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී තිබේ.

ගුවන් සේවා මෙහෙයුම් කරුවන්, තීරු බදු රහිත සාප්පු සහ අනෙකුත් පැවරුම් සඳහා වන ගිවිසුම්වල තම ගිවිසුම් ගත ප්‍රදේශවල සිදුවන මරණ/තුන්වන පාර්ශවයට වන අලාභ ආශ්‍රිත නෛතික අවදානම් ආවරණය වන පරිදි පොදු වගකීම් රක්ෂණ ප්‍රතිපත්තියක් ඇතුලත් කිරීම අනිවාර්ය කොට ඇත.

ගුවන් තොටුපල ඇතුලත ඇතිවන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට සම්බන්ධ අවදානම ආවරණය කිරීම සඳහා එවැනි ගිවිසුම්වලට ඇතුලත් වන අවස්ථාවේදී කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු "කොන්ත්‍රාත් කරුවන්ගේ සියළු අවදානම්" රක්ෂණ ප්‍රතිපත්තිය ද තවත් ආවරණයක් වේ.

නීතිමය හෝ බේරුම් කිරීමේ තත්වයකට යාමට පෙර මිත්‍රශීලී විසඳුමකට යාමේ හැකියාවන් සොයා බැලීමේ ප්‍රතිපාදන අපගේ සියළු ගිවිසුම්වල ඇතුලත් වේ. නෛතික අවදානමේ ඉහළ පිරිවැය අවම කිරීම ධෛර්යවත් කරනු පිණිස මෙම රීතිය හඳුන්වා දී ඇති ගු.ගු.සේ. හි සංස්ථාමය ප්‍රතිරූපය මත ගම්‍ය වියහැකි කීර්තිමය අවදානම කළමනාකරණය කිරීම සහ කල් තබා වැලැක්වීම සඳහා මහජන මතය සහ සමාජ ආර්ථික ගතිකත්වයන් සමීපව අධීක්ෂණය කරනු ලබයි. මේ අතරතුර ගු.ගු.සේ. සමාගමෙහි කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන සංවර්ධනයන් පිළිබඳ සම්මත දෘෂ්ටීන් අවබෝධ කරගැනීම වැඩි දියුණු කිරීමට ප්‍රධාන උනන්දු පාර්ශවයන් සමග අඛණ්ඩව සම්බන්ධ වෙයි. කීර්තිය පිළිබඳ අවදානම අවබෝධ කරගැනීම සහ ඒවා අවම කිරීම විශේෂිත අංශයකට සීමා වනු වෙනුවට සියළුම අංශවල මූලික ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලබන අතර අහිතකර ප්‍රචාරයන් හැසිරවීම සඳහා මාධ්‍ය සමග සම්බන්ධතා පැවැත්වීමට අලෙවිකරණ අංශය යටතේ විශේෂිත ඛණ්ඩයක් පිහිටුවා ඇත.

| 05 | **අවදානම හඳුනා ගැනීම - තොරතුරු තාක්ෂණය ආශ්‍රිත අවදානම** |
|---|---|
| | පහත දැක්වෙන හේතූන් අනුව අද තොරතුරු තාක්ෂණය ආශ්‍රිත අවදානම අවම කිරීමේ ශිල්පීය ක්‍රම වඩාත් වැදගත් තත්වයට පත්වී ඇත.<br><br>සමාජ මාධ්‍ය භාවිතය<br><br>සමාජ මාධ්‍ය තාක්ෂණ භාවිතය නව ක්ෂේත්‍රයකට පුළුල් වී ඇති උදාහරණවලට පරිශීලක සමාජ, ව්‍යාපාරික සහයෝගිතාවන් සහ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය ඇතුලත් වේ. වියහැකි අවදානම වනුයේ රහස්‍ය දත්තවලට අවසර නොමැතිව ප්‍රවේශ වීම සහ ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීමයි.<br><br>උපාංග වල වේගවත් ව්‍යාප්තිය<br><br>උපාංග සහ ක්‍රියාකාරීත්වය බොහෝ ගණනක වේගවත් ව්‍යාප්තිය (උදාහරණ - මිලියන 15 කට වැඩි iPads වර්තමාන සංසරණයේ පවතී (15+ million iPads in current circulation). M-Commerce මගින් ගු.ගු.සේ. හි තීරණාත්මක දත්ත නැතිකිරීම/නිදහස් කිරීම, ආරක්ෂිත ගැටළු සහ සංවර්ධන අභියෝග යොදා ගැනීම වැනි නව අවදානම් හඳුන්වා දී ඇත.<br><br>සයිබර් තර්ජන ප්‍රවනතා ව්‍යාප්ත වීම<br><br>අනවසර දත්ත ලබා ගැනීම ප්‍රධාන ප්‍රවනතාවයක් වූයේ 2016 දී නම්, 2017 වනුයේ අනවසර දත්ත ලබා ගන්නන්ගේ නවෝත්පාදන වර්ෂය බව SurfWatch Labs හි ප්‍රධාන ආරක්ෂක උපායක්‍රමික ඇඩම් මේයර් පවසා ඇත. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ පද්ධතිවල ඵලදායිබව සහ ආරක්ෂාව ගු.ගු.සේ. මෙහෙයුම්වල විශ්වසනීයත්වය සහ ආරක්ෂාව සහතික කිරීමේදී තීරණාත්මක වෙයි. අපගේ රහස්‍ය, සංවේදී සහ ආරක්ෂාව සම්බන්ධ තොරතුරුවලට මෙන්ම පවත්නා පරිඝණක බාධක යාන්ත්‍රණයට අනවසර ප්‍රවේශකයින්ගෙන් සහ වයිරස් මගින් ඇතිවන අවදානමට අමතරව ඇතිවන තීරණාත්මක තොරතුරු තාක්ෂණ අවදානම්වලින් සමහරක් නම් අකුණු නිසා IP PABX ජාලය අකර්මන්‍ය වීම, යෙදුම් අකර්මන්‍ය වීම/දුරකථන උපකරණ අකර්මන්‍ය වීම, සමකාර්ය ප්‍රවේශ අකර්මන්‍ය වීම, EDGE පද්ධතිය ( විද්‍යුත් තැපෑල, වෙබ්, DNS, Sam ඇතුළුව) වැනි දෘඩාංග පද්ධතීන් අකර්මන්‍ය වීම, BMS, PA, ගුවන් ක්ෂේත්‍ර සංඥ පාලනය, VDGS, ගිනි ආරක්ෂක පද්ධතීන්, හෝරා පද්ධතීන්, FID පද්ධතීන් වැනි ප්‍රධාන වශයෙන් අකුණු හේතුවෙන් ජාලයෙන් සහ විදුලි රැහැන් මගින් අකර්මන්‍ය වීම වේ.<br><br>උපායමාර්ගික තොරතුරු පද්ධතියක් නොමැති වීම (SISs)<br><br>අද ප්‍රාදේශීය ගුවන් තොටුපලවල්, ගුවන් සේවා ප්‍රතිපාදන මගින් ඔවුන් ජනිත කරගත් වැදගත් දත්තයන් භාවිතා කරමින් පක්ෂීන් ගණනය කිරීමේ ශිල්පීය ක්‍රම, තොරතුරු පද්ධති උපායමාර්ග සහ අන්තර්ජාල ක්‍රියාවන් වැඩියෙන් භාවිතය පිළිබඳව පර්යේෂණ කිරීමට සැලසුම් කරයි. ඔවුන්ගේ ඉලක්කය වන්නේ ගණිය දත්තයන් තොරතුරු බවට පත් කිරීමත් පසුව ඒවා දැනුම බවට පත් කිරීමත් අවසාන වශයෙන් "රීතිමය විශ්ලේෂණයක්" හරහා "තරඟකාරී වාසි" අත්කරගැනීම පිණිස එම දත්ත මගින් නැණවත් බවක් ඇති කිරීමය.<br><br>කෙසේවුවද තවමත් ගු.ගු.සේ. "ඓතිහාසික දත්ත" මත පදනම් වූ "ගණිය තොරතුරු පද්ධතියක්" මත රඳා පවතින අතර ගු.ගු.සේ. හි ක්‍රියාත්මක වන තනි තොරතුරු තාක්ෂණ පද්ධතියක් පවා නොමැත.<br><br>ගුගුසේ හි අවසාන අභිලාෂය වන "ආසියානු කලාපයේ වඩා කාර්යක්ෂම සහ මිත්‍රශීලී ප්‍රධාන ගුවන් සේවා කේන්ද්‍රය බවට පත්වීමේ" වුවමනාව අත්පත් කර ගැනීමට නම් ඉදිරි වසරවලදී මෙය ප්‍රධාන සීමාව හෝ අවදානම වනු ඇති. මක්නිසාද යත් තරඟකාරී වාසි නොමැතිව ගු.ගු.සේ. ට වී දක්වා යා නොහැක. එසේම තරඟකාරී වාසි ලබා ගැනීමට නම් ගු.ගු.සේ. උපායමාර්ගික තොරතුරු පද්ධතීන් භාවිතා කරමින් දත්ත බුද්ධිය බවට පරිවර්තනය කළයුතුය. |
| | **අවදානම ඇගයීම (ගු.ගු.සේ. මත වන විභව බලපෑම)** |
| | අවසානයේදී තොරතුරු තාක්ෂණය ආශ්‍රිත අවදානම මෙහෙයුම් අවුල් කිරීමට, මගීන් අතෘප්තිකර කරවීමට සහ තරඟකාරී වාසි අහිමි කිරීමට හේතු වේ. අවදානම අවම කිරීමේ ශිල්පක්‍රම යොදා ගැනීමට පෙර ගුගුසේ මත වන විභව බලපෑම "ඉහළ" එකක් ලෙස ශ්‍රේණි ගත කළහැකිය.<br><br>කෙසේවුවද අද දක්වා අවදානම අවම කිරීමේ උපකරණවල සංවර්ධන තත්වයක් ඇති වී තිබෙන බැවින් හීනවන අවදානම "පහළ" හෝ "මධ්‍යස්ථ" එකක් ලෙස වර්ගීකරණය කළහැකිය. |

## අවදානම පාලනය සහ අවම කිරීම

වර්තමානයේදී තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය කෙටුම්පත් කොට අංශ ප්‍රධානීන්, විධායක අධ්‍යක්ෂ, උප සභාපති සහ සභාපති විසින් අනුමත කර ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය සඳහා ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ.

අන්තර්ජාල ප්‍රවේශය සහ බලෙන් ඇතුළුවීම, රහස් පරීක්ෂාව වෙත කේන්ද්‍රගත වූ විශ්වාසය තහවුරු කරන උසස් පාලන පද්ධතීන්  ස්ථාපිත කර ඇති අතර ඊට අමතරව පද්ධතියට අනවසර දත්ත ලබා ගන්නන් සහ නෛතික නොවන මැදිහත් වීම් වැලැක්වීම සඳහා ආරක්ෂාවන් හඳුන්වා දී ඇත.

තොරතුරු තාක්ෂණ සේවාවලට බාධාවීමක් සහ පද්ධති ආපතිකතාවේ අකර්මන්‍ය වීමක් ගුවන් තොටුපල මෙහෙයුම් අවුල් කරනු ඇත. මෙහෙයුම් අවුල් කිරීමේ අවදානම අවම කිරීම සඳහා එම අවදානමට ආමන්ත්‍රණය කිරීමට ආරක්ෂාකාරී නඩත්තුව, පරීක්ෂාකාරී අධීක්ෂණයන් සහ වැරදි මත පැතිරීම වැලැක්වීමේ මිනුම් ක්‍රියාත්මක කර ඇත. වැලැක්වීමේ සහ පරීක්ෂාකාරීවීමේ මිනුම් හරහා අන්තර්ජාල ප්‍රවේශයන් සීමා කිරීම, අනවසර ඇතුල්වන්නන් සොයා ගැනීමේ පද්ධතීන් ස්ථාපිත කිරීම සහ අවදානම සහ හානි පිළිබඳව කළමනාකාරිත්වයට සුපරීක්ෂාකාරී වීමට ආරක්ෂක අධීක්ෂණ උපකරණ භාවිතා කිරීම ඇතුළුව ආරක්ෂාව පිළිබඳව වන තර්ජන අවම කර ඇත.

අඛණ්ඩ අවදානම තක්සේරුකිරීම සහ කළමනාකරණය සහතික කරනු පිණිස තොරතුරු තාක්ෂණය පාලනය කිරීමේ රාමුව සහ තොරතුරු තාක්ෂණ අවදානම කළමනාකරණය කිරීමේ රාමුව ස්ථාපිත කොට ඇත. තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතීන් සංයුක්ත උපායමාර්ග සමග බැඳී පවතීද යන්න තහවුරු කර ගැනීම සඳහා වාර්ෂික සමාලෝචන පවත්වා ගෙන යයි. යල් පැන යන තොරතුරු තාක්ෂණ තත්වයන් කාලීනව සමාලෝචනය කරනු ලබයි. මතුවන තොරතුරු තාක්ෂණ අවදානම් අධීක්ෂණය කරනු ලබන අතර අවදානම් පිළිබඳ දැනුවත් කිරීම වැඩිදියුණු කිරීම සඳහා පූර්වක්‍රියාකාරී මිනුම් ස්ථාපිත කර ඇත. ගු.ගු.සේ. හි ක්‍රියාත්මක වන, අවදානම අවම කිරීමේ සුවිශේෂී ශිල්පීයක්‍රම සමහරක් පහතින් දැක්වේ.

ප්‍රකාශ/අතිරික්ත තන්තු ජාල එලදායි ලෙස මෙහෙයවීම, මාර්ගගත UPS සහ ආරක්ෂකයින්, එකිනෙකට ප්‍රතිසම්පාදනය කිරීමේ සහතිකය මත පදනම් වූ මිලදී ගැනුම්, අමතර උපකරණ තොග පවත්වා ගැනීම, පරිඝණක සහ විශේෂයෙන් සේවා කාමර සහ දුරකථන හුවමාරුවට අළුතෙන් ඇතුළුවන්නන් සඳහා ක්ෂණික ආරක්ෂණ යෙදුම්.

තවදුරටත් පද්ධති අකර්මන්‍යවීම් වැලැක්වීමට සහ අඩු කිරීමට පූර්ව අධීක්ෂණ මෙන්ම පශ්චාත් අධීක්ෂණ යාන්ත්‍රණ සහ ආරක්ෂණ පද්ධතීන් ස්ථාපිත කොට තිබේ මධ්‍යම දෝෂ අධීක්ෂණ පද්ධතිය වර්තමාන තත්වයන් පෙන්නුම් කරන, දෝෂ ප්‍රස්තාරිකව සොයා ගනු ලබන සහ අනාගත බිඳ වැටීම් පිළිබඳව අනතුරු හඟවන එවැනි පූර්ව අධීක්ෂණ පද්ධතියක් වේ.

පාඩු හෝ  හානි අවම කරන අතරතුර දෝෂ ක්ෂණිකව සොයා ගැනීම සහතික කරනු පිණිස ගිනි ආරක්ෂණ පද්ධතීන් සහ ආපතිකතා සැලසුම් ස්ථාපිත කොට ඇත.

ගුවන් තොටුපලේදී ජාල අතත්‍යකරණය, සේවා අතත්‍යකරණය සහ ඒකාබද්ධ සහ ගබඩාමය අතත්‍යකරණය වැනි උසස් තාක්ෂණික සහයක් ලැබෙන දත්ත මධ්‍යස්ථාන. ගු.ගු.සේ. සමාගම මූලික දත්ත මධ්‍යස්ථානයේ සහ EDGE දත්ත මධ්‍යස්ථානයේ පවතින සේවා සංචිතය අතත්‍යකරණය මගින් තොරතුරු තාක්ෂණ පද්ධතියේ යන්ත්‍ර අක්‍රිය කාලය අවම කළ හැකි අඛණ්ඩ ව්‍යාපාර සේවාවක් වර්තමානයේ ඉටු කරයි. එසේම ලැයිස්තු ගත කළ තාක්ෂණික සහයන් පවත්වා ගෙන යන නිසා සමස්ථ දෘඩාංග අකර්මන්‍ය වීමකදී අවම දත්ත හානියක් සහිතව ප්‍රතිසංස්කරණය කිරීමට ඒවා භාවිතා කළ හැකි වෙයි.

ගු.ගු.සේ. සමාගම කටුනායක - බ.ජා.ගු. හි ස්ථාපිත කර ඇති ආපදා සුව කිරීමේ මධ්‍යස්ථානය මගින් තොරතුරු තාක්ෂණ පද්ධතියේ යන්ත්‍ර අක්‍රිය කාලය අවම කළ හැකි අඛණ්ඩ ව්‍යාපාර සේවාවක් වර්තමානයේ ඉටු කරයි. වර්තමාන ආපදා සුව කිරීමේ මධ්‍යස්ථාන වැඩබිමෙහි ගෘහ නිර්මාණ ශිල්පයේ නිදහස් බව මගින් එය අනාගතයේදී ම.රා.ජා.ගු. හි යලි ස්ථාපනය කිරීමේ නම්‍යතාවයක් සපයයි.

## 06 අවදානම හඳුනා ගැනීම - ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) නොමැති කම

විශ්වාසදායි යාවත්කාලීන කළමනාකරණ තොරතුරු ප්‍රතිපාදනයට සහය වන ව්‍යවසාය සම්පත් සැලසුම් විසඳුමක් නොමැතිකම.

වර්තමානයේ මෙය දැනටමත් සාකච්ඡා කළ අනෙකුත් සියළු වර්ගයේ අවදානම් හරහා සෘණාත්මක ප්‍රතිඵල ගෙන එන "තොරතුරු වර්ගයේ" අවදානමක් බවට පරිනාමය වෙමින් තිබේ. මක් නිසාද යත් කුඩා පරිමාණ සංවිධාන වල පවා ඔවුන්ගේ මූල්‍ය සහ සැපයුම්වලදී තම කර්මාන්ත ඇතුලත තරගකාරී වාසි ජනිත කරමින් විශ්වාසදායි කළමනාකරණ තොරතුරු ලබා ගැනීමට හැකි විස්තීර්ණ ව්‍යාපාර සම්පත් සැලසුම් භාවිතා කරන බැවිනි.

### අවදානම ඇගයීම (ගු.ගු.සේ. මත විභව බලපෑම)

වර්තමානයේ අවදානම "ඉහළ" එකක් ලෙස වර්ගීකරණය කළ හැකිය.

### අවදානම පාලනය සහ අවම කිරීම

මෙම විශේෂී අවදානම අඩු කිරීම සඳහා ගු.ගු.සේ. විසින් කලින් ගනු ලැබූ අවදානම අවම කිරීමේ ප්‍රවේශයන් අසාර්ථක වියි එමනිසා ඒකක මෙහෙයවීමක් ලෙස පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. වර්තමානයේ මූල්‍ය සැපයුම් දාම කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ අංශ සහයෝගීව මූල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ අංශයේ ක්‍රියාකාරකම් ආවරණය වන සංකලිත පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කර ගෙන යයි. සියළු ඒකක යෙදවූ පසු හොඳින් සංවර්ධනය වූ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ගු.ගු.සේ. හි ලබාගත හැකි වන පරිදි ප්‍රසම්පාදනය සැලසුම් කර ඇත.

## 07 අවදානම හඳුනාගැනීම - ගුවන්යානා සිදුවීම්/අනතුරු ආශ්‍රිත අවදානම

බලාපොරොත්තු නොවන හේතු මත වියහැකි අවදානම් තිබිය හැකිය.

### අවදානම ඇගයීම

වර්තමානයේ කොළඹ ගුවන්යානා තොරතුරු කලාපයේ (FIR) අවදානම සාධකය අඩුය.

ඉහත දැක්වෙන අවදානම අවම කිරීම සඳහා නීතිරීති, අධ්‍යාපනය සහ පුහුණුව උදව් වෙයි. ආරක්ෂාව, පෞද්ගලික බලපත්‍ර, ගුවන්යානා මෙහෙයවීම, ගුවන්තොටවල්, ගුවන් ප්‍රවාහන සේවා, අනතුරු විමර්ශනය සහ පරිසරය ආශ්‍රිතව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් සහ නිර්දේශිත පරිචයන් නියාමන බලධාරීන් විසින් කරනු ලබන කාලීන ආවේක්ෂණ විගණන සමගින් පවත්වා ගෙන යනු ලබයි.

## 08 අවදානම හඳුනාගැනීම - වංචා, අභ්‍යන්තර පාලනය (IC), ක්‍රියාවලීන් සහ ක්‍රියාපටිපාටීන් බිඳවැටීම්

අභ්‍යන්තර පාලනය අවදානම කළමනාකරණය පහසු කරවන අතර ගුගුසේ හට අවදානම මට්ටම අවබෝධ කර ගැනීමට සහය වෙයි. අභ්‍යන්තර පාලනය මිනිසා විසින් මෙහෙයවනු ලබන්නක් බැවින් වංචා සහ අභ්‍යන්තර පාලනයේ බිඳවැටීම් තිබිය හැකිය.

### අවදානම ඇගයීම

ඉහළ අවදානමක් ඇත්නම්, එය මෙහෙයුම් අවුල් කිරීම, ලාභ අහිමිවීම සහ සම්පත් නාස්තිය කරා මෙහෙයවයි. කෙසේ වුවද ඓතිහාසික අත්දැකීම් සලකා බැලීමේදී ගු.ගු.සේ. මත වියහැකි බලපෑම "පහළ" එකක් ලෙස ශ්‍රේණි ගත කළහැකිය.

### ආවදානම පාලනය සහ අවම කිරීම

ප්‍රමිතකරණය කළ මූල්‍ය ක්‍රියාපටිපාටීන් සහ ISO පද්ධති විගණන (අනුකූලතා විගණන) වැනි දැඩි අභ්‍යන්තර පාලන පද්ධතීන් ක්‍රියාත්මක වෙයි. අභ්‍යන්තර විගණන සහ ගුණාත්වය සහතික කිරීමේ අංශ මගින් කරනු ලබන කාලීන සමාලෝචන සහ ඵලදායි අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කිරීම සංවිධානය තුල අභ්‍යන්තර පාලන කණ්ඩායම් මගින් කරගෙන යනු ලබන නිරන්තර කළමනාකරණ විගණන මගින් ඌණපූරණය කරනු ලබයි.

**09** **අවදානම හඳුනාගැනීම - ශ්‍රී.ගු.සේ. වත්කම්වලට පාඩු හෝ හානි වීම**

මෙය ස්වාභාවික ආපදා, ව්‍යසන හෝ මගීන්, කාර්යමණ්ඩලය, වෘත්තීය සංගම් වැනි අනුබද්ධිත පාර්ශවයන් මගින් සිදුවන ද්වේශ සහගත ක්‍රියාවන් නිසා වියහැකිය.

**අවදානම ඇගයීම**

පිරිවැය වැඩිවීම සහ ලාභය අඩුවීම ගුගුසේ හි මූල්‍ය තත්වයන් කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි. කෙසේ වුවද, ඓතිහාසික අත්දැකීම් අනුව මෙම වර්ගයේ අවදානමෙහි බලපෑම "පහළ" හෝ "මධ්‍යස්ථ" එකක් වෙයි.

**අවදානම පාලනය කිරීම සහ අවම කිරීම - ශ්‍රී.ගු.සේ. වත්කම්වලට පාඩු හෝ හානි වීම**

සුදුසු ආරක්ෂිත සහ ගිනි ආකරක්ෂිත මිනුම්වලට අමතරව, නිරන්තර පදනමෙන් ක්ෂණික සැලසුම් පුහුණු කරනු ලබයි. රක්ෂණ ආවරණයක් මගින් අවදානම අවම කිරීම නියෝගාත්මක පරිචයක් වේ.

**10** **අවදානම හඳුනාගැනීම - ප්‍රසම්පාදනයේදී/සැපයුම් දාම ක්‍රියාවලියේදී ටෙන්ඩර් මණ්ඩල ක්‍රියාපටිපාටීන් සමග ඇතිවියහැකි විවිධ අවදානම්**

**අවදානම ඇගයීම**

ජාතික ප්‍රසම්පාදන මගපෙන්වීම් අනුව කල් ගතවන ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීම හේතුවෙන් සාධාරණ මිල ගණන්වලට හොඳ තත්වයේ භාණ්ඩ සහ සේවා මිලදී ගැනීමේ අවස්ථාව නොමැති වන අතර ටෙන්ඩරය සම්පූර්ණ කිරීමේ කාල රාමුවද දීර්ඝ එකක් වේ. ඒ අනුව ලංසුකරුවන් සැපයුම් කිරීමටද කැමති නොවේ. මෙය ගුගුසේ සමාගමේ ව්‍යාපාරික කටයුතුවලට බලපාන අවදානමකි.කෙසේවුවද මෙම අවදානම සාමාන්‍ය ආකාරයෙන් මිනිය නොහැකි අතර ගු.ගු.සේ. ක්‍රියාත්මක කරන ව්‍යවස්ථාපිත රාමුව හේතුවෙන්ද මෙය පැන නැගිය හැකියි එමනිසා මෙය "පහළ" හෝ " මධ්‍යස්ථ බලපෑමක්" ලෙස වර්ග කළ හැකිය.

**අවදානම පාලනය සහ අවම කිරීම**

ගු.ගු.සේ. සමග ව්‍යාපාර කටයුතු කිරීමට පෙළඹෙන සැපයුම් කරුවන්ගේ ධාරිතාව, පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු විසින් මිල කියුම් විස්තර විකල්ප මාර්ග ඔස්සේ පරීක්ෂා කරමින් මෙන්ම වෙළඳපල පර්යේෂණ හරහා ලබා ගනු ලැබූ ස්වාධීන විස්තර සත්‍යාපනය කිරීමෙන් සෝදිසි පරීක්ෂාවක් හරහා අගයනු ලබයි. අඛණ්ඩ සැපයුම සහතික කර ගැනීම සඳහා අපි ඔවුන්ගේ පද්ධතීන්, ක්‍රියාවලීන්, මූලාශ්‍රයන් සහ පරිසරය වෙතට හෝ වෙතින් වන බලපෑම පරීක්ෂා කරන්නෙමු. අපි සැපයුම්කරුවන්ගේ නිසි වෙලාවට බෙදාහැරීම, අනුකූලතාවය, තිරසර පැවැත්ම සහ මූල්‍යමය විශ්වාසභාවය වැනි කරුණුවලට සමාන වැදගත් කමක් දෙන්නෙමු. ටෙන්ඩර් ලියවිලිවල අපගේ අපේක්ෂාවන් පැහැදිලිව ඇතුලත් කර ඇති අතර දැඩි විනිවිද භාවයක් ප්‍රවර්ධනය කරනු පිණිස වූ වගන්ති සහ කොන්දේසි ඇතුලත් කරමු.

බාහිරින් ලබා ගැනීම, නිරන්තර සැපයුම් සහ නිසි කලට බෙදාහැරීම් සහ විකුණු පසු සේවය සමග බැඳෙන අවදානම පාලනයේ ප්‍රධාන සූචකය කොන්ත්‍රාත් ගිවිසුම්ය.

විභව සැපයුම්කරුවන් සුදුසුකම් ලත් අය බවට පත්කිරීමත්, අපගේ ඇතුලට එන සහ පිටට යන සැපයුම් දාමයට සම්බන්ධ වීමට ගිවිසුම් ප්‍රදානය කිරීමත් සමග සැපයුම්කරුවන් විසින් ක්‍රියාත්මක නොවීමේ අවදානම කාර්ය බැඳුම්කරය සහ ලංසු බැඳුම්කරය හරහා හඳුන්වා දෙනු ලබන ප්‍රමිත කොන්දේසි මගින් අවම කරනු ලබයි.

**11** **අවදානම හඳුනාගැනීම - උපයෝගී සේවාවන්හි බාධාවීම්**

ජාත්‍යන්තර ගුවන් තොටුපලක් ලෙස ගු.ගු.සේ. සමාගම විවිධ උපයෝගී සේවාවන් ලබා ගන්නා අතර ඒවා ගු.ගු.සේ. මෙහෙයුම් සඳහා තීරණාත්මක වේ. මෙම සේවාවන්හි ඇතිවන බාධාවක් ගු.ගු.සේ. මෙහෙයුම්වලට සෘජුවම සහ අහිතකර ලෙස බලපායි.

**අවදානම ඇගයීම**

ප්‍රමානවත් අවම කිරීමේ මිනුම් දැනටමත් ක්‍රියාත්මක කර ඇති බැවින් සහ ස්ථාපිත කර ඇති බැවින් විභව බලපෑම "පහළ" එකක් වේ.

| | |
|---|---|
| | **අවදානම හඳුනාගැනීම - උපයෝගී සේවාවන්හි බාධාවීම්**<br><br>**අවදානම පාලනය සහ අවම කිරීම**<br><br>බ.ජා.ගු වෙතට අඛණ්ඩ ජල සැපයුමක් සහතික කරනු පිණිස ප්‍රධාන ජාතික ජල සැපයුම් පද්ධතිය මත රඳා පැවැත්ම අඩුකරනුවස් අමතර ගැඹුරු ළිං මගින් භූගත ජලය ලබාගැනීමේ පද්ධතියක් වර්ධනය කිරීම් විදුලිය අකර්මන්‍ය වීමකදී අතිරේක ආධාරකයක් ලෙස අදාල ධාරිතාවයෙන් යුත් ප්‍රමාණවත් ජෙනරේටර් සංඛ්‍යාවක් යොදවා තිබේ. |
| 12 | **අවදානම හඳුනාගැනීම - සේවක පිරිවැටුම/බුද්ධි ගලනය පිළිබඳ අවදානම**<br><br>පවත්නා ප්‍රවාහන ඉල්ලුම සපුරාලීම සඳහා මධ්‍යම ප්‍රමාණාය් සිට දිගුකාලය දක්වා පවතින ප්‍රධාන අංගයන්ගෙන් එකක් ලෙස බ.ජා.ගු. ව්‍යාප්ත කිරීමේ සැලසුම වෙන්ව සලකුණු කර තිබේ. ගුවන් තොටුපල සංවර්ධන කටයුතු සඳහා සහයවීමට පුහුණු ශ්‍රම බලකායෙහි අප්‍රමාණවත් සැපයුමක් වර්ධනයට අහිතකර ලෙස බලපායි. ගු.ගු.සේ. සමාගමේ ආසන්න සංවර්ධන ව්‍යාපෘතිවල තොරතුරු අනුව ගුවන් තොටුපල මෙහෙයුම්වලදී පලපුරුද්ද සහ දැනුම විශේෂයෙන් වැදගත් වේ.<br><br>**අවදානම ඇගයීම**<br><br>ඉහළ සේවක පිරිවැටුම් අනුපාතයන් බොහෝ ආකාරවලින් ගු.ගු.සේ. වෙත සෘණාත්මක බලපෑම් ඇතිකරයි. නව සේවකයින් කුලියට ගැනීමේ සහ පුහුණු කිරීමේ නිරන්තර අවශ්‍යතාවය සමග පහසුවෙන්ම ගු.ගු.සේ. හි දැක්මෙන් සහ මෙහෙවරෙන් වෙනත් මගකට යොමු විය හැකිය. සේවකයින් රඳවා ගනිමින්, පාදක රේඛාවට ධනාත්මකව බලපාන ඉහළ හැකියාවකින් යුක්ත ශ්‍රම බලකායක් සැපයීමට ගු.ගු.සේ. සමාගමට හැකිය. ප්‍රමාණවත් පුහුණුව සපයමින්, හොඳින් ඉටුකළ කාර්යයන් සඳහා සේවකයින්ට ත්‍යාග ප්‍රදානය කරමින් සහ සමාගමේ සංස්කෘතිය සහ විශ්වාසවන්ත භාවය ඇතිකරමින් ගු.ගු.සේ. හට පහළ සේවක පිරිවැටුම් අනුපාතයක් පවත්වා ගත හැකිය. සේවක පිරිවැටුම ගු.ගු.සේ. හි ආදායමට සහ ලාභදායිතාවට සෘජුව බලපායි. මෙයට දායක වන අංගයන්වලට කුලී වියදම්, ශ්‍රමය පුහුණු කිරීම, විකුණුම් සහ ඵලදායිතාවය නොමැතිවීම ඇතුලත් වේ. පැහැදිලි ලෙසම අංශය, සේවකයාගේ තත්වය සහ වේතන මත ආදායමට බලපෑම ඉතා ඉහළ එකක් වියහැකිය.<br><br>කෙසේ වුවද, වර්තමානයේ ගු.ගු.සේ. හි සෙවක පිරිවැටුම් අනුපාතය 4% ට වඩා අඩුවන අතර අවදානමේ බලපෑම මධ්‍යස්ථ ලෙස දැකිය හැකිය.<br><br>**අවදානම පාලනය සහ අවම කිරීම**<br><br>වෘත්තීය කාඩරයේ පංගුව රඳවා තබා ගැනීම සඳහා ගුගුසේ සමාගමෙහි වේතන ව්‍යුහය වෘත්තීයමය, අධ්‍යාපනික සහ තාක්ෂණික සුදුසුකම් සඳහා විශේෂ දීමනා සපයයි. වැටුප් රහිත පදනම් සහ බැඳුම්කර ගිවිසුම් සංයෝග කරමින් විදේශ රැකියා සහ අවස්ථා අනාවරණය කිරීම් ප්‍රදානය කරයි.<br><br>ගු.ගු.සේ. හි අනාගත මිනිස්බල අවශ්‍යතා සඳහා හොඳින් සූදානම් වනු පිණිස අභ්‍යන්තර පුහුණු වැඩසටහන්වලට අමතරව මිනිසුන් සංවර්ධන සහ සන්තතික සැලසුම් රාමුවක් සකස් කොට ඇත. |
| 13 | **අවදානම හඳුනාගැනීම - ගගන නාවික ආදායම ප්‍රශස්ථකරණය නොවීම**<br><br>(අ.) පවත්නා සහ කෙදින හෝ වෙනස් වන තාක්ෂණ හෝ ක්‍රියාපටිපාටීන්ට සමානව කොළඹ ගුවන් යානා තොරතුරු කලාපය තුල කළමනාකරණය කිරීමේ සහ මෙහෙයවීමේ අවදානම කලාපීය සහ ගෝලීය වශයෙන් අදාල වේ.<br><br>අප්‍රමාණවත්බවේ අවදානමක් කොළඹ තොරතුරු කලාපයේ (වර්ග කිලෝ මීටර් 1,717,148.2 ක ප්‍රමාණය) සීමා අහිමි වීමේ හැකියාවකට මග පාදයි. ප්‍රතිඵලය වන්නේ ගුගුසේ සමාගම වෙත පියාසර ආදායම අහිමි වීමයි.<br><br>උදාහරණයක් ලෙස පිළිගත් ප්‍රමිතීන්ට පහළින් ගුගුසේ ආරක්ෂක මට්ටම පවත්වා ගෙන යන්නේ නම්, ෂක්ධ ගුවන් අවකාශයෙන් කොටසක් යාබද රටවලට පැවරීමට තීරණය කරනු ඇත.<br><br>(ආ.) අනුපාත වෙනස්වීම සඳහා ඉහළ ඉල්ලුම් නම්‍යතාවක් පැවතීමේ අවදානම (අධි මිල සංවේදිතාව) |

| 13 | **අවදානම හඳුනාගැනීම - ගගන නාවික ආදායම ප්‍රශස්ථකරණය නොවීම** |
|---|---|

ගුවන් සේවා සඳහා සමහර අයකිරීමේ අනුපාත අවුරුදු ගණනාවකදී සංශෝධනය කොට හෝ වැඩිකොට නොමැති වුවත් කොළඹ ගුවන් කලාපය මගහරිමින් විකල්ප මාර්ග හෝ කෙටි මං සෙවීමට පෙළඹවීමක් බැවින්, අනුපාතයන්හි සුළු වැඩි කිරීමකදී පවා ගුවන් සේවා පැත්තෙන් බැලූ කළ ආදායම අහිමිවීමේ අවදානමකට ගු.ගු.සේ. සමාගම මුහුණ දෙයි.

උදාහරණ - පියාසර ගාස්තුවල වැඩි කිරීමක්, කොළඹ ගුවන් තොරතුරු කලාපයෙන් මාරුවන හොංකොං සිට ජොහැන්නස්බර්ග් දක්වා වූ L 894 සහ L 774 ගුවන් යානාවලට කොළඹ ගුවන් තොරතුරු කලාපය මගහරිමින් විනාඩි විස්සකට අඩු කලකදී වෙනත් මාර්ගයක් තෝරා ගැනීමට මං සලසනු ඇත.

(ඈ.) පහත දැක්වෙන දෑ අනෙකුත් වියහැකි අවදානම් සාධක ලෙස සැලකිය යුතුය.

1) කලාපයට සමානව ගුවන් යානා කළමනාකරණ පද්ධතියක (ATM) නව සංවර්ධනයක් නොමැතිවීම.
2) ICAO මගපෙන්වීම් වලට අනුකූල නොවීම.

**අවදානම ඇගයීම**

කෙසේවුවද, වර්තමානයේ ගු.ගු.සේ. සමාගම, යථාවත් කළ ගුවන් නාවික සේවාවක් සැපයීම සඳහා සහ කොළඹ ගුවන් තොරතුරු කලාපයේ ආරක්ෂාව සඳහා පූර්ව සූදානම වෙනුවෙන් උපකරණ, ක්‍රියාපටිපාටීන් සහ මානව සම්පත් අඛණ්ඩව වර්ධනය කරනු පිණිස ඉමහත් සේ උනන්දු වෙයි. ඒ අනුව අවදානම බලපෑම පහළ එකක් ලෙස පෙනේ.

**අවදානම පාලනය සහ අවම කිරීම**

උසස් තාක්ෂණය සහ ක්‍රියාපිළිවෙත් මෙන්ම මානව සම්පත් පිළිබඳ විශේෂඥතාවයන් වැනි ප්‍රමාණවත් අවදානම් වැලැක්වීමේ යාන්ත්‍රණ මෙවලම් ස්ථාපිත කොට ඇති අතර දැනුම් ප්‍රවාහය අඛණ්ඩව යාවත්කාලීන කරනු ලැබේ.

ගුවන් සැතපුම් ප්‍රමාණය අඩුකිරීම සඳහා සෘජු ගුවන් මාර්ග සහ කාර්යසාධනය පදනම් කරගත් නාවුක තරණය හඳුන්වා දීම මගින් ගුවන් සේවා කොළඹ ගුවන් තොරතුරු කලාපය මගහැර යාමේ අවදානම අවම කළ හැකි වේ.

ගාස්තු වෙනස් කිරීමට ඉහළ ඉල්ලුම් නම්‍යතාවක් ඇති සංවේදී මාර්ගයන්හි ගාස්තු අවදානම අවම කරමින් පවත්වා ගෙන යාමේ පාලන උපක්‍රමයක් ලෙස වැඩි නොකරනු ඇත.

ගු.ගු.සේ. සමාගම පිළිගත හැකි ප්‍රමිත මට්ටමකට ඔළු පද්ධතියෙහි ගැටළු නිවැරදි කිරීම කළමනාකරණය කර ඇත.

(අ) අනාගත ඔළු අවශ්‍යතා වලට අනුකූල වීමට යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
(ආ) අඛණ්ඩ පුහුණු සහ සංවර්ධන සැලසුමකට අනුකූලවීම
(ඇ) ක්‍රියාපටිපාටීන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ යාවත්කාලීන කිරීම
(ඈ) අනෙකුත් රටවල් සමග විශ්ව ආරක්ෂක දෝෂ විගණන වැඩසටහනෙහි (USOAP) වඩා හොඳ ශ්‍රේණි ගත කිරීමක් සලකුණු කිරීම
(ඉ) අවශ්‍ය පරිදි යාබද රටවල් සමග ගිවිසුම් ලිපි (බඩ්) සංශෝධනය කිරීම
(ඊ) බඳවා ගැනීමේ සහ පුහුණු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම
(උ) ICAO SARPS සඳහා වූ නවතම සංශෝධන ATC උපදෙස් මගින් ATCs අතර බෙදා හැරීම පිටපත් ඇගයීම කරනු ලබන අතර නිවැරදි කිරීමේ පියවර ගනු ලැබේ
(ඌ) ඇගයීම සහ නිවැරදි කිරීමේ මිනුම් සඳහා ඩ්‍යජ පිටපත් නියැදි ලෙස ලබා ගනී

## 14 අවදානම හඳුනාගැනීම - කොළඹ පරීක්ෂා කිරීමේ සහ මුදවා ගැනීමේ කලාපය තුල පරීක්ෂා කිරීමේ සහ මුදවා ගැනීමේ හැකියාවන් (SRR)/ FIR

ගුවන් නාවික යථාදර්ශය අනුව අදාල පරීක්ෂා කිරීමේ සහ මුදවාගැනීමේ කලාපය තුල වන ගුවන් සිදුවීමකදී අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) වාර්ෂික සම්මේලනයේ එකඟතාවයන්ට බැඳීමක් ලෙස අදාල රජය පරීක්ෂා කිරීම, ස්ථාන ගත කිරීම, අනතුරට පත්වූවන්ට සහය දැක්වීම, අනතුරට පත්වූවන් මුදවා ගැනීම සඳහා වගකිවයුතු වේ. මෙම වගකීම දැරීමට නොහැකිවීම ප්‍රඥප්තියට අත්සන් කළ රටක් ලෙස ෂක්ඩ සමග වූ එම ගිවිසුම බරපතල ලෙස උල්ලංගනය කිරීමකි.

වර්තමාන විකසනයේදී එවැනි දෑ සිදුවියහැකි බව දුරස්ථ වුවත් ඒවා සිදුවන්නේ නම්, එය සුළුවෙන් තැකිය නොහැකි මහා විපත්තිදායක තත්වයක් වේ.

සටහන:

විශේෂයෙන් සුනාමි, භූමිකම්පා, යුද්ධ ආදී ව්‍යසනාත්මක අවස්ථාවලදී මෙම හැකියාවන් ප්‍රධාන භූමිකාවක් නිරූපනය කරන අතර රජය සැමවිටම මෙම සිදුවීම් වලට මුහුණ දීමට සූදානම්ව සිටිය යුතුය.

ICAO සහ IATA වැනි අදාල නියෝජිතායතන මගින් අනාරක්ෂිත ගුවන් අවකාශයක් ලෙස ප්‍රකාශ කිරීම හේතුවෙන් කොළඹ පරීක්ෂා කිරීමේ සහ මුදවා ගැනීමේ කලාපය (SRR) / ගුවන් යානා තොරතුරු කලාපය (FIR) ට ආධාර කිරීමෙන් ගුවන් යානා වැලකී සිටීම ප්‍රධාන අවදානම වේ මේ සමග වන ප්‍රතිඵලය වනුයේ ගු.ගු.සේ. හි ආදායම අහිමිවීමයි.

තම වැසියන් හට බලපෑ හානියට පත් රජයන්ගේ තෘප්තිය වෙනුවෙන් වැදගත් ලෙස එම බැඳීම්වලට මුහුණ නුදුනහොත් රටට අවාසිදායක විය හැකි තානාපති මට්ටමේ අතුරු විපාක ඇතිවිය හැකිය.

### අවදානම ඇගයීම

ගු.ගු.සේ. සමාගම වර්තමානයේ කලාපයේ පූර්ව ක්‍රියාකාරී ANS සැපයුම්කරු නිසා, රත්මලාන පිහිටි මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (RCC) හරහා පරීක්ෂා කිරීමේ සහ මුදාගැනීමේ හැකියාවන් දැඩි ඕනෑකමකින් සම්බන්ධීකරණය කරයි. වියහැකි අවදානම් සාධකය පහළ එකක් වේ.

### අවදානම පාලනය සහ අවම කිරීම

එකම සේවා සපයන්නා ලෙස ගු.ගු.සේ. සමාගම ගගන නාවික මුදාගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) නම්කර ඇති අතර පහසුකම් සක්‍රීය කරනු පිණිස යටිතල පහසුකම් මෙන්ම මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක නිරත වෙයි.

පූර්වක්‍රියාකාරී අර්ථයෙන් ගුගුසේ සමාගම අපගේ අසල්වැසි රටවල් දෙකක් (ඕස්ට්‍රේලියාව සහ මාල දිවයින) සමග SAR වැඩ සැලසුමක් ස්ථාපිත කර ඇති අතර වර්තමානයේ ඉන්දියාව සහ ඉන්දුනිසියාව සමග එවැන්නක් පිහිටුවීම සඳහා සමීපව කටයුතු කර ගෙන යයි.

ඕස්ට්‍රේලියානු සාගර ආරක්ෂක අධිකාරිය අනුග්‍රාහකත්වය දක්වන ඉන්දියානු සාගරයේ SAR හැකියා හවුල් වැඩසටහනට වැදගත් ලෙස ශ්‍රී ලංකාව ඇතුලත් කර ගෙන ඇති අතර මෙම වැදගත් ව්‍යාපෘතිය හරහා SAR හැකියාව වැඩි දියුණු කිරීමට සමීපව කටයුතු කර ගෙන යයි.

එසේම ගු.ගු.සේ. සමාගම පූර්වක්‍රියාකාරි ලෙස ICAO හි ආසියා පැසිපික් පරීක්ෂා කිරීමේ සහ මුදා ගැනීමේ කාර්ය බලකායට ද සම්බන්ධ වෙයි.

## මූල්‍ය අවදානම

### 01 අවදානම හඳුනාගැනීම - ණය අවදානම/පැහැර හැරීමේ අවදානම

ණයගැතියෙක් අදාල ගෙවීම් කිරීමට අසමත් වීම මගින් ඕනෑම වර්ගයක ණයක් පැහැර හැරීමේ අවදානම මෙයින් හඳුන්වයි. අවදානම මූලික වශයෙන් ණය දෙන්නා හා සම්බන්ධ වන අතර පොලිය සමග මුල් මුදල අහිමිවීම, මුදල් ප්‍රවාහ අවුල්වීම සහ එකතු කිරීමේ පිරිවැය වැඩිවීම ඊට ඇතුලත් වේ.

#### අවදානම ඇගයීම

මෙම අවදානම ගුගුසේ හි මුදල් ප්‍රවාහය සමග සෘජු සම්බන්ධතාවයක් ඇති බැවින් "අධි අවදානම් සාධකයක්" ලෙස වර්ග කළ හැකිය.

#### අවදානම පාලනය සහ අවම කිරීම

ණය සීමාවක් සඳහා අවසර දීමට හෝ දික් කිරීමට පෙර ගු.ගු.සේ. සමාගම පැහැර හැරීම ආවරණය කිරීමට ප්‍රමාණවත් වන පරිදි කලින් තීරණය කළ සීමාවන් මත පදනම්ව තම ණයගැතියන් බොහොමයකගෙන් බැංකු සහතික ලබා ගනී.

ගු.ගු.සේ. සමාගම තවදුරටත්, ණයගැතියෙක් අයකර ගත හැකි තත්වයෙන් ඉවතට යාමේ අවදානමක් පවතින්නේ නම් සේවා සැපයීම හෝ ගුවන් තොටුපල වාණිජ අවකාශ පිළිබඳ ගිවිසුම් අවසන් කිරීම සඳහා වූ නීති ප්‍රතිපාදනද ස්ථාපිත කර තිබේ. බ.ජා.ගු. හි පැවරුම් මගින් උපයනු ලබන පිරිවැටුම සඳහා නියම කළ අවම පරාමිතීන් සමග කාර්යසාධන ගිවිසුම්වලට ඇතුලත් වී ඇත. ඈවර කිරීමේ අලාභ, දඩමුදල් සහ කාලය සහ පියවීමේ ක්‍රියාපටිපාටීන් ද ආවරණය වන බැංකු සහතික ගිවිසුම්වලට ඇතුලත් කොට ඇත.

ගෙවීම් පැහැර හැරීම නිසා පැනනගින ද්‍රවශීල අවදානම, රජයේ සුරැකුම් මගින් පිරිනමන ණය දීමේ අනුපාතයන්ට වැඩි පැහැර හැරීමේ පොලී අනුපාත අයකිරීම මගින් අවම කරනු ලබයි.

### 02 අවදානම හඳුනාගැනීම - විදේශ විනිමය අවදානම

එක් මුදල් වර්ගයකට වැඩියෙන් ගනු දෙනු කිරීමේදී විවෘත වීම හෝ නෛසර්ගික අස්ථාවර බව මගින් ස්ථාවර සමාන අගයක් ඇති නොකරයි.

මෙය ගු.ගු.සේ. සමාගමේ පාලනයෙන් බොහෝ දුරස්ව පවතින අවදානම් වර්ගයකිලංකා රුපියල විදේශ මුදල් ඉදිරියේ ක්ෂයවන ප්‍රමාණය වැඩි වන්නේ නම් මෙම අවදානම වැඩි වේ. උදාහරණයක් ලෙස 2015 වර්ෂයේදී ගු.ගු.සේ. හි ලාභදායිතාවයට රු. බිලියන 3.5 ක විනිමය අලාභය අහිතකර ලෙස බලපාන ලදී.

බලපෑමෙහි වැදගත් බව තේරුම් ගනු පිණිස ලංකා රුපියලට එරෙහිව ඇ. එ. ජනපද ඩොලරයේ පරිවර්තන අනුපාතය පහතින් දක්වා ඇත.

2010 සිට 2016 වසර දක්වා ලංකා රුපියල්/ඇ.එ.ජ. ඩොලර් විනිමය අනුපාතය 110.95 සිට 149.80 දක්වා 35% කින් වැඩිවී ඇත.

#### අවදානම ඇගයීම

විදේශ මුදල් ගනුදෙනු මූලික වාර්තා කරන මුදලට පරිවර්තනය කිරීම මත ලාභදායිත්වයට සහ ද්‍රවශීලතාවයට අහිතකර ලෙස බලපායි.

කෙසේ වුවද මෙම අවදානම ගු.ගු.සේ. පාලනයෙන් එහා ගිය එකක් වන අතර ශ්‍රී ලංකා මහා බැංකුවේ මුදල් සහ මූල්‍ය ස්ථායිකරණ ප්‍රතිපත්ති මගින් අධීක්ෂණය කරනු ලබයි.තවදුරටත් මෙය අහිතකර මෙන්ම හිතකර මූල්‍ය ප්‍රතිඵල ජනිත කරමින් උච්ඡාවචනය වේ.

#### අවදානම පාලනය සහ අවම කිරීම

ගැලපුම් ශිල්පක්‍රමය හරහා අභ්‍යන්තර සීමා ඇති කිරීම (හැකි හැම විටම විදේශීය මුදලින් වත්කම් සහ වගකීම් සමාන කිරීම)

**03**

**අවදානම හඳුනාගැනීම - පොලී අනුපාත අවදානම (කෙටිකාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ආයෝජන මත)**

**අවදානම ඇගයීම**

ආයෝජිත මුදල් ප්‍රවාහයන්හි ආවස්ථික පිරිවැය සහ ආයෝජන මත අඩුවන ඵලදාව බදු පෙර ලාභය (PBT) අඩු කිරීමට දායක වේ.

බලපෑමෙහි විභව අවදානම "පහළ" හෝ "මධ්‍යස්ථ" එකක් ලෙස ශ්‍රේණි ගත කළ හැකිය.

**අවදානම පාලනය සහ අවම කිරීම**

පොලී අනුපාත අවදානම අඩුකිරීමට සහ ඵලදාව වැඩි දියුණු කිරීමට ගුගුසේ සමාගම පහත දැක්වෙන යාන්ත්‍රණය යොදා ගෙන ඇත.

ඉහළ අනුපාතයකට දිගු කාලීන ණයකර වල ආයෝජනය කිරීම.

දෛනික එක් දින භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම.

දෛනික, විශේෂිත දින ගණනක, මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වශයෙන් විවිධ පරිණත කාලසීමාවන් යටතේ ආයෝජනය කිරීම.

භාණ්ඩාගාර බිල්පත්, ලංකා ස්ථාවර තැන්පතු□ එක්සත් ජනපද ඩොලර් ස්ථාවර තැන්පතු ආදී වශයෙන් විවිධ නිමැවුම් වල ආයෝජනය කිරීම.

දෛනික පොලී ඉපයුම් අරමුදල් කළමනාකරණ ගිණුමක් පවත්වා ගෙන යාම සහ විශේෂයෙන් ආයෝජනය නොකරන අතිරික්ත මුදල් එයට මාරු කිරීම.

| 04 | **අවදානම හඳුනාගැනීම - ඉහළ මට්ටමක තෝලන අනුපාතය** |
|---|---|
| | කර්මාන්තයේ අනෙකුත් අය සමග සමානුයෝගීව ගුගුසේ සමාගම ප්‍රාග්ධනය තෝලන අනුපාතය පදනම මත අධීක්ෂණය කරයි. වර්තමානයේ ගුගුසේ හි තෝලන අනුපාතය 48% ක් වේ. |
| | **අවදානම ඇගයීම** |
| | ණය පූර්ණ වශයෙන්ම රන් සහතික යටතේ බ.ජා.ගු. සහ ම.රා.ජා.ගු. සංවර්ධන කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමතිය ඇතිව ගනු ලැබූ ණයවලින් සමන්විත වන නිසා ගු.ගු.සේ. මත වියහැකි බලපෑම "පහළ" එකක් ලෙස ශ්‍රේණිගත කළ හැකිය. කෙසේවුවද ඉහළ පොලී පිරිවැය ලාභදායිතාවය මත සෘණාත්මක බලපෑමක් ඇති කරයි. |
| | **අවදානම පාලනය සහ අවම කිරීම** |
| | රජයේ රන් සහතික යටතේ ආවරණය වන බැවින් ණය හා බැඳුනු අවදානමක් නොමැත. |




හාණ්ඩ මෙ.ටොන්

# 248,347 ක්

සමග 14% ක වර්ධනයක්



“බර හා ප්‍රමාණය සැබැවින්ම
වැදගත් වන ස්ථානය...”

## මූල්‍ය වාර්තා

# සහ දින දර්ශනය

**මූල්‍ය වාර්තා**


| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 87 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 95 |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | 96 |
| ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය | 97 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 98 |
| මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 99 |
| විගණකාධිපති වාර්තාව සඳහා පැහැදිලි කිරීමේ සටහන් | 128 |


**මූල්‍ය දින දර්ශනය**

2015 සඳහා අවසන් ලාභාංශ **2016 ජූලි 26** දින ගෙවන ලදී

2016 සහ 2017 අතුරු ලාභාංශ **2016 ඔක්තෝබර් 21** දින ගෙවන ලදී

2016 සඳහා වාර්ෂික වාර්තා සහ ගිණුම් **2017 ජූනි 09** දින අත්සන් කරන ලදී

34 වන වාර්ෂික මහා සභා රැස්වීම **2017 ජූනි 30** දින පැවැත්වීමට නියමිතය

# ස්වාධීන
# විගණකවරුන්ගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

**1.1** 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මාගේ අදහස් දැක්වීම් සහ වාර්ෂික වාර්තාව සමග ප්‍රසිද්ධ කිරීමට සුදුසු යැයි හැඟෙන නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් විස්තර කෙරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් ඇතිවන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින්, 2016 දෙසැම්බර් 31 දිනට එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 අනෙකුත් නීති හා නියාමන අවශ්‍යතා මත වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා වන පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මගේ මතය තුල:

විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ කරුණු මා විසින් ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණ වලින් පිළිබිඹු වන පරිදි, සමාගම විසින් විධිමත් ලෙස ගිණුම් වාර්තා තබා තිබුණි.

සමාගමේ මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන මත අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) ශ්‍රීලංගිප්‍ර 16 - දේපළ, පිරියත හා උපකරණ: මෙම ප්‍රමිතියේ 51 වන වගන්තිය ප්‍රකාරව ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කිරීමකින් තොරව රු. මිලියන 16,061 ක් වටිනා සම්පූර්ණයෙන් ක්ෂය වූ ජංගම නොවන වගකීම් සමාගම විසින් භාවිතා කරනු ලැබේ.

(ආ) ශ්‍රීලංගිප්‍ර 36 - වත්කම් හානිකරණය - ආරම්භයේ සිට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි මෙහෙයුම් පහළ වැටෙමින් තිබූ අතර දැනට මගී ගුවන් සේවා එක් ජාත්‍යන්තර ගුවන් සේවාවකට සීමා වී ඇත. කෙසේ වුවත්, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළට අයත් රු. මිලියන 25,123 ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් හානිකරණ තක්සේරුවක් සමාලෝචිත වර්ෂය තුලදී සිදු කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

එකතුව රු. මිලියන 1,027 ක් වූ ලැබිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ එකකට වැඩි කාලයක් හිඟහිට පැවතුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | මුදල<br>රු මිලියන | උපරිම ණය කාලය |
|---|---|---|
| ගොඩබෑසීම්, නවතා තැබීම් සහ ඉහළින් පියසර කිරීමේ ගාස්තු | 693 | දින 59 |
| ගුවන්මගී පාලම් ගාස්තු | 134 | දින 30 |
| කුලී | 200 | 03 days |
| **එකතුව** | **1,027** | |

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 6 වගන්තිය | නව සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කිරීමෙන් පසුව පොදු ලියකියවිලිවල සමාගමෙහි නමට "(ප්‍රයිවෙට්) ලිමිටඩ්" හෝ කෙටිකර "(පීවීටී) ලිමිටඩ්" යනුවෙන් එකතු කර සමාග මෙහි නම ප්‍රසිද්ධ කළ යුතුය. එහෙත් තවමත් සමාගමේ නම භාවිතයේදී "(ප්‍රයිවෙට්)/(පීවීටී)" ලෙස එකතු කර නොතිබුණි. |
| ආ) 2010 අංක 14 දරන සිවිල් ඒවියේෂන් පනතේ 14 වගන්තිය සහ 2015 වර්ෂයේ ශ්‍රී ලංකා සිවිල් ඒවියේෂන් අධිකාරියෙන් නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තාව | ගුවන් තොටුපළ කලාප ස්ථාපනය හෝ සංවර්ධනය සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කර හෝ ශ්‍රී ලංකා සිවිල් ඒවියේෂන් අධිකාරියෙන් අනුමැතිය ලබා ගැනීම 2017 මාර්තු 31 දක්වා සිදුකර නොතිබුණි. |
| ඇ) ජාත්‍යන්තර සිවිල් ඒවියේෂන් සංවිධානයේ (ICAO) ප්‍රමිතීන් හා 2015 වර්ෂයේ ශ්‍රී ලංකා සිවිල් ඒවියේෂන් අධිකාරියෙන් නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තාව | ආරක්ෂක සේවයට ප්‍රධානියෙක් ස්ථිරව පත්කර නොතිබුණි.<br><br>සිවිල් ඒවියේෂන් අධිකාරියෙන් උපදෙස් ලබා දී තිබියදීත් ජාතික සිවිල් ඒවියේෂන් ආරක්ෂක වැඩසටහනට අනුව විශේෂඥ ආරක්ෂක වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| ඈ) නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ අංක පීඊ/සීඕඑම්සී/33/02 හා 2006 අප්‍රේල් 28 දිනැති ලිපිය | රජයට අයත් ඉඩම් සහ ගොඩනැගිලි සහ අනෙකුත් නිශ්චල හා චංචල වත්කම් අගය කර ගිණුම් වලට ගෙන නොතිබුණි. |
| ඉ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 7.4.5 වගන්තිය | වත්කම් සත්‍යාපනය සිදු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල හා විශේෂ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කර නොතිබුණි. |
| (ii) 9.2 (ඈ) වගන්තිය | සමාගමේ සංවිධාන සටහන හා අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. |
| (iii) 9.3.1 (එ) වගන්තිය | මහා භාණ්ඩාගාරයේ එකඟත්වය සහිතව සමාගමේ බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටිය (SOR) අදාල අමාත්‍යාංශය විසින් අනුමත කර නොත්බුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් වලින් රු. මිලියන 6,909 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 2,378 වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 4,531 ක වැඩිවීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 2,808 කින් වැඩිවීම සහ මූල්‍ය වියදම් වල රු. මිලියන 1,570 ක අඩුවීම මෙම වැඩිවීමට හේතු වී තිබුණි.

### 3.2 අගය එකතු කිරීම

සමාගමේ අගය එකතු කිරීම 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණි. කෙසේ වුවද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 50 ක් හෙවත් රු. මිලියන 5,813 කින් සමාලෝචිත වර්ෂයේදී වැඩි වී තිබුණි.

### 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.3.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක් සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 2.65 | 2.09 | 1.68 | 1.29 | 1.78 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | 2.60 | 2.06 | 1.65 | 1.23 | 1.72 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 38 | 15 | 40 | 39 | 35 |
| කොටසක ඉපැයීම (Rs.) | 34,598 | 4,084 | 17,058 | 17,768 | 13,688 |
| ශුද්ධ වත්කම් වලට ප්‍රතිලාභය (%) | 42 | 7 | 32 | 48 | 65 |
| එක් මගියෙකුට ආදායම (Rs.) | 1,938 | 1,846 | 1,785 | 1,652 | 1,570 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) කෙටි කාලීන බැංකු තැන්පතු සහ ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම යටතේ වන භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනය පිළිවෙලින් සියයට 140 ක් හා සියයට 17කින් වැඩිවීම, ජංගම වත්කම් හා ක්ෂණික වත්කම් අනුපාතයන්ගේ වැඩිවීමට ප්‍රධාන හේතු වී තිබුණි.

ආ) ආදායමේ සියයට 18 ක වැඩිවීම හා මූල්‍ය වියදමේ සියයට 37 අඩුවීම සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 23 න් වැඩිවීමහේතු වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කොටසක ඉපැයීමද සියයට 745 න් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) සමාගමේ භෞතික කාර්ය සාධකය සමාගමේ සංයුක්ත සැලැස්මේ සඳහන් කාර්යසාධන දර්ශකය හා සසඳා පහත දැක්වේ.

| කාර්යසාධන දර්ශකය | සත්‍ය සාධනය | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
| ජාත්‍යන්තර ගුවන්යානා සංචලන සංඛ්‍යාව | 61,637 | 56,156 | 54,960 | 51,972 | 48,416 |
| ගුවන් මගීන් සංචලනයන් සංඛ්‍යාව | 9,466,248 | 8,505,740 | 7,780,724 | 7,330,421 | 7,079,920 |
| මගී සංක්‍රමණ සංඛ්‍යාව | 1,285,756 | 1,227,451 | 1,273,037 | 1,370,266 | 1,296,495 |
| මගී සංක්‍රමණ සංඛ්‍යාව මුළු මගී සංඛ්‍යාවේ අනුපාතය | 1:7.4 | 1:6.9 | 1:6.1 | 1:5.3 | 1:5.5 |
| නැව්බඩු සංචලනයන් (මෙට්‍රික් ටොන්) | 248,347 | 220,422 | 209,607 | 194,020 | 186,618 |
| එක් ගුවන් ගමනකට මුළු මෙහෙයුම් පිරිවැය (Rs.'000) | 216 | 256 | 171 | 177 | 164 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) සමාගම විසින් කාර්යසාධන දර්ශකයන් මත වාර්ෂික ඉලක්කයන් සකස් කර නොතිබුණි. එම නිසා සත්‍ය කාර්යසාධනය අපේක්ෂිත කාර්යසාධනය සමග සැසඳීමට විගණනයට නොහැකි විය.

(ii) මුළු අපේක්ෂිත මගී සංචලන සංඛ්‍යාව මිලියන 10 ක් ලෙසද මුළු මගීන් සංඛ්‍යාවට සංක්‍රමණය වන මගීන් සංඛ්‍යාව 1:7 ක් ලෙසද 2018 අපේක්ෂිත සාධනය සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකරගෙන තිබුණි. එබැවින්, සමාගමේ සංයුක්ත සැලැස්මේ ඉලක්කයන් අකාර්යක්ෂම ලෙස යොදා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) එජඩො මිලියන 190 ක විදේශ ණය මුදලක් යටතේ ඉදිකරන ලද මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ පිළිබඳ කාර්යසාධනය පහත දැක්වේ.

| කාර්යසාධන දර්ශකය | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| මුළු ගුවන් මගීන් සංඛ්‍යාව | 6,207 | 6,291 | 40,386 |
| ජාත්‍යන්තර ගුවන් යානා සංචලනයන් සංඛ්‍යාව | 1,317 | 1,044 | 2,890 |
| නැව් බඩු සංචලනයන් (මෙට්‍රික් ටොන්) | නැත | 19 | 221.9 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කාර්යසාධන දර්ශකයන් මත වාර්ෂික ඉලක්ක සකස් කර නොතිබුණි. එබැවින්, අපේක්ෂිත ඉලක්ක සමග සත්‍ය කාර්යසාධනය සැසඳීමට නොහැකි විය.

(ii) මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් බදු නිදහස් වෙළෙඳසැල් වල ගිවිසුම් අවලංගු වී තිබුණි.එබැවින්, සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම රු. මිලියන 18 න් පහළ බැස තිබුණි.

(iii) 2015 වර්ෂයේදී වී ගබඩා කිරීම හේතුවෙන් රු. මිලියන 891 ක් වටිනා ගුදම් ගොඩනැගිල්ලට සිදුවූ හානිය 2017 මාර්තු 17 දක්වා තක්සේරු කර නොතිබුණි.

(iv) මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ මූල්‍ය කාර්යසාධනයද පහත පරිදි පිරිහී තිබුණි.

| | රු. මිලියන | | |
|---|---|---|---|
| **විස්තරය** | **2016** | **2015** | **2014** |
| මුළු ආදායම | 49 | 71 | 136 |
| මුළු මෙහෙයුම් වියදම | 2,339 | 2,289 | 2,228 |
| මෙහෙයුම් අලාභය | 2,290 | 2,218 | 2,092 |
| මූල්‍ය වියදම් | 701 | 882 | 637 |

## 4.2 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) කෙටුම්පත් මූල්‍ය වාර්තා විගණනයට ඉදිරිපත් කළ පසු රු. මිලියන 227 ක් වටිනා ජර්නල් සටහන් 53 ක් යොදා තිබුණි. එබැවින්, ගිණුම්වල ඇති එවැනි අඩුපාඩු ව්‍යාප්තිය විගණනයේදී වැළැක්විය නොහැකි විය.

(ආ) ආයතනික සම්පත් සැලසුම් පද්ධතිය (ඈසෘඡ) ක්‍රියාත්මක කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව මාස 08 කින් නිමකිරීමට 2012 ජූනි 29 දින රු. මිලියන 248.6 කට පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණි. සමාගම අදාල කොන්ත්‍රාත්කරුට රු. මිලියන 27 ක් ගෙවා තිබූ අතර 2016 ඔක්තෝබර් 31 දක්වා අවස්ථා 4 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්තුව පිරිනමා වර්ෂ 4ක් ගතවී තිබුණද, 2016 ඔක්තෝබර් 31 දින වන විටත් කොන්ත්‍රාත්කරු අදාල කොන්ත්‍රාත්තුව නිම කර නොතිබුණි. එබැවින්, 2017 ජනවාරි 03 දින රු. මිලියන 24.86 ක්වූ කාර්යසාධන සුරැකුම නැවත ලබා ගෙන තිබුණි. කෙසේවුවද, කොන්ත්‍රාත්කරු එම කාර්යසාධන සුරැකුම නැවත අයකර ගැනීම උදෙසා නඩුවක් ගොනුකර තිබුණි. එසේවුවත්, සමාගම විසින් මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සංචාරක නිවාසයක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී රු. මිලියන 7 ක් වියදම් කර පෞද්ගලික පාර්ශවයකින් ඉඩමක් මිලදී ගෙන තිබුණි. ඉන්පසු මෙම ඉඩම රජයට අයත් ඉඩමක් බව කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැනුම් දී තිබුණි. එසේ වුවද, පෞද්ගලික පාර්ශවය වෙත ගෙවනු ලැබූ රු. මිලියන 7 නැවත අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. එසේම, මේ සම්බන්ධයෙන් එම පෞද්ගලික පාර්ශවයට විරුද්ධව නඩුවක් හෝ ගොනුකර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2011 වර්ෂයේ සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරියකු වෙනුවෙන් 2012 වර්ෂයේදී රු. මිලියන 2.5 ක වන්දි මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි.

## 4.4 මානව සම්පත් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) 1997 ඔක්තෝබර් 24 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක 124 දරන චක්‍රලේඛය ප්‍රකාරව පුරප්පාඩු වූ තනතුරක වැඩ බැලීමේ කාලය මාස 03 කට සීමා විය යුතු වේ. නමුත්, අංශ ප්‍රධානී තනතුරුවල වැඩ බැලීමේ කාර්යය සඳහා වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාලයක් නියෝජ්‍ය අංශ ප්‍රධානීන් 4 දෙනෙකු වැඩ බැලීම සඳහා පත්කර තිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.1,020,000 සිට රු. 1,577,000 ක් දක්වා එක් සේවකයෙකුට සේවක පිරිවැය වැඩිකර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) මානව සම්පත් කළමනාකරණය | සේවක සංඛ්‍යාව හා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කර නොතිබුණි. |
| (ආ) ගිණුම්කරණය | සමාගමේ සමස්ත විස්තරාත්මක ගිණුම්කරණ පද්ධතියක් නොතිබුණි. |
| (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල | ගිණුම්වල දිගු කාලීන හිඟ ශේෂයන් පැහැදිලි කර ගැනීමෙන් හෝ/සහ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. |
| (ඈ) වත්කම් කළමනාකරණය | භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි<br>වත්කම් කේත කිරීම සහ වත්කම ලේඛනය නිසිපරිදි යාවත්කාලීන කිරීම සිදු කර නොතිබුණි. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

2017 ජුනි 19 දින

# විගණනය කළ
# මූල්‍ය ප්‍රකාශන

# විස්තීර්ණ
# ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| | | **රු.** | රු. |
| **ආදායම්** | 5 | **18,027,257,179** | 15,218,760,071 |
| වෙනත් ආදායම් | 6 | **315,543,437** | 479,508,417 |
| | | **18,342,800,616** | 15,698,268,488 |
| පරිපාලන, ආයතනික සහ අලෙවිකරණ වියදම් | 7 | **(10,655,673,712)** | (10,124,353,778) |
| **මෙහෙයුම් ලාභය** | | **7,687,126,903** | 5,573,914,710 |
| මූල්‍ය ආදායම | 8 | **1,894,214,701** | 1,046,515,607 |
| මූල්‍ය පිරිවැය | 8 | **(2,672,747,250)** | (4,242,304,944) |
| මූල්‍ය (පිරිවැය)/ආදායම - ශුද්ධ | | **(778,532,549)** | (3,195,789,337) |
| **බදුවලට පෙර ලාභය** | | **6,908,594,354** | 2,378,125,373 |
| ආදායම් බදු වියදම | 9 | **11,149,716** | (1,561,269,802) |
| **වර්ෂයේ ලාභය** | | **6,919,744,070** | 816,855,571 |
| කොටසක මූලික ඉපැයුම | 10 | **34,598** | 4,084 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික ගණනයේදී උපකල්පන වෙනස්වීම් මත මතුවූ වාසි/(පාඩු) | 22 | **5,591,439** | 172,937,123 |
| ආයුගණක වාසි/(පාඩු) මත විලම්බිත බදු | 13 | **(1,565,603)** | (48,422,394) |
| **වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | | **4,025,836** | 124,514,729 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **6,923,769,906** | 941,370,300 |

පිටු අංක 95 සිට 127 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම බැඳුණු කොටසක් වේ.
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව පිටු අංක 87 සිට 93 දක්වා වේ.

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2016<br>රු. | 2015<br>රු |
|---|---|---|---|
| වත්කම්<br>ජංගම නොවන වත්කම් | | | |
| දේපල පිරියත සහ උපකරණ | 11 | **36,313,463,742** | 38,381,811,973 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | | **3,604,758,634** | 1,797,848,789 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | **12,830,190** | 17,427,437 |
| විලම්බිත බදු වත්කම් | 13 | **797,895,349** | 745,194,174 |
| ණයකර වල ආයෝජන | 14 | **2,650,000,000** | 3,050,000,000 |
| සමාගම් සේවක ණය | 16.1 | **92,448,969** | 87,102,228 |
| | | **43,471,396,885** | 44,079,384,601 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 15 | **473,538,561** | 349,373,378 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 16 | **3,453,666,250** | 4,548,446,775 |
| ලැබියයුතු ආදායම් බදු | 17 | **970,271,595** | 758,699,782 |
| භාණ්ඩාගාර බිල්/නැවත මිලදී ගැනීමේ ගිවිසුම් සහ කෙටිකාලීන බැංකු තැන්පතු | 18 | **21,520,929,076** | 14,939,671,494 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 18 | **1,187,019,995** | 609,972,967 |
| | | **27,605,425,476** | 21,206,164,395 |
| **මුළු වත්කම්** | | **71,076,822,361** | 65,285,548,996 |
| **ස්කන්ධය සහ වගකීම්**<br>**ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 19 | **20,000,200** | 20,000,200 |
| සංචිත | 20 | **1,019,226,769** | 1,008,226,769 |
| රඳවාගත් ඉපයුම් | | **15,396,983,807** | 9,984,213,901 |
| | | **16,436,210,776** | 11,012,440,870 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ණයගැනීම් | 21 | **35,068,548,732** | 35,135,336,416 |
| විශ්‍රාම පාරිතෝෂික බැඳීම් | 22 | **2,576,178,455** | 2,395,344,715 |
| විලම්බිත බදු වගකීම | 13 | **5,321,588,674** | 5,278,471,611 |
| විලම්බිත රජයේ ප්‍රදාන | 23 | **1,244,099,064** | 1,331,704,822 |
| | | **44,210,414,925** | 44,140,857,563 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 24 | **7,819,396,018** | 7,537,941,778 |
| ණය ගැනීම් | 21 | **2,610,800,642** | 2,594,308,784 |
| | | **10,430,196,660** | 10,132,250,562 |
| මුළු වගකීම් | | **54,640,611,585** | 54,273,108,126 |
| **ස්කන්ධය සහ වගකීම් වල මුළු එකතුව** | | **71,076,822,361** | 65,285,548,996 |

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ බවට මම සහතික කරමි.

..........................................

**මුදල් ප්‍රධානි**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා 2017 ජූනි 09 වන දින අනුමතිය දෙන ලදී.

.................................

**සභාපති**

.....................................

**විධායක අධ්‍යක්ෂ**

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2017 ජූනි 09 දින අත්සන් තබන ලදී.

පිටු 95 - 127 දක්වා පිටුවල එන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය කොටසක් වේ.

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 85 සිට 91 දක්වා පිටුවල ඇතුලත් වේ.

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | සටහන් | ප්‍රකාශිත ප්‍රාග්ධනය | වෙනත් සංචිත | රඳවාගත් ඉපයුම් | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 2015 ජනවාරි 1 දිනට ශේෂය | | 20,000,200 | 1,004,726,769 | 9,543,343,602 | 10,568,070,571 |
| වර්ෂයේ ලාභය | | - | - | 816,855,571 | 816,855,571 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම්වල ආයුගණක වාසි | | - | - | 172,937,123 | 172,937,123 |
| ආයුගණක වාසි මත විලම්බිත බදු | | - | - | (48,422,394) | (48,422,394) |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** (**බදු ගෙවීමෙන් පසු**) | | - | - | 124,514,729 | 124,514,729 |
| **මුළු විස්තීර්ණ ආදායම්** | | - | - | 941,370,300 | 941,370,300 |
| ගෙවූ ලාභාංශ | 26 | - | - | (497,000,000) | (497,000,000) |
| සංචිත ගිණුමට මාරුකිරීම් | | - | 3,500,000 | (3,500,000) | - |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 20,000,200 | 1,008,226,769 | 9,984,213,901 | 11,012,440,870 |
| **2016 ජනවාරි 1 දිනට ශේෂය** | | **20,000,200** | **1,008,226,769** | **9,984,213,901** | **11,012,440,870** |
| **වර්ෂයේ ලාභය** | | **-** | **-** | **6,919,744,070** | **6,919,744,070** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම්වල ආයුගණක වාසි | | **-** | **-** | **5,591,439** | **5,591,439** |
| ආයුගණක වාසි මත විලම්බිත බදු | | **-** | **-** | **(1,565,603)** | **(1,565,603)** |
| **වෙනත් විස්තීර්ණ ආදායම් -** (**බදු ගෙවීමෙන් පසු**) | | **-** | **-** | **4,025,836** | **4,025,836** |
| මුළු විස්තීර්ණ ආදායම් | | **-** | **-** | **6,923,769,906** | **6,923,769,906** |
| ගෙවූ ලාභාංශ | **26** | **-** | **-** | **(1,500,000,000)** | **(1,500,000,000)** |
| සංචිත ගිණුමට මාරුකිරීම් | | **-** | **11,000,000** | **(11,000,000)** | **-** |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **20,000,200** | **1,019,226,769** | **15,396,983,807** | **16,436,210,776** |

පිටු අංක 95 - 127 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය කොටසක් වේ.

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 87 සිට 93 දක්වා පිටුවල ඇතුලත් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහ** | | | |
| ආදායම් බදු වියදම්වලට පෙර ලාභය | | **6,908,594,354** | 2,378,125,373 |
| **ගැලපීම්** | | | |
| ක්ෂය කිරීම් | 11 | **2,652,137,717** | 2,647,777,594 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 12 | **12,549,232** | 10,527,658 |
| විනිමය (වාසි)/පාඩු | 21 | **1,777,079,530** | 3,189,855,520 |
| ආයෝජන ආදායම් | | **(1,874,898,049)** | (1,047,704,225) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ (ලාභය)/අලාභය | | **(1,363,891)** | (13,873,095) |
| ලියාහැරීම් | 11 | **-** | 6,365,790 |
| විලම්බිත රජයේ ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරීම | 23 | **(87,605,758)** | (104,961,427) |
| මූල්‍ය පිරිවැය | 8 | **705,413,235** | 717,067,024 |
| විශ්‍රාමික ප්‍රතිලාභ සැලැස්ම සඳහා වෙන් කිරීම | 22 | **404,904,826** | 387,961,248 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | **(10,496,811,196)** | 8,171,141,460 |
| තොග (වැඩිවීම) / අඩුවීම | | **(124,165,183)** | (84,122,733) |
| වෙළඳ හා වෙනත් ලැබියයුතුදෑ (වැඩිවීම) / අඩුවීම | | **(1,094,780,525)** | (742,600,168) |
| වෙළඳ සහ වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම/(අඩුවීම) | | **281,454,240** | 818,590,226 |
| මෙහෙයුම්වලින් උත්පාදිත මුදල් | | **11,748,880,779** | 8,163,008,785 |
| ප්‍රතිලාභ සැලැස්ම යටතේ ගෙවීම් | 22 | **(218,479,647)** | (75,630,644) |
| ගෙවූ පොලීය | 8 | **(705,413,235)** | (717,067,024) |
| ආදායම් බදු ගෙවීම් | 17 | **(211,571,814)** | (115,658,760) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **10,613,416,084** | 7,254,652,357 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ මුදල් ප්‍රවාහ | | | |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් | 11 | **(2,391,642,012)** | (616,999,225) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 12 | **(7,951,985)** | (17,500) |
| ණයකර ආයෝජන | 14 | **(1,600,000,000)** | (800,000,000) |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබූ මුදල් | | **2,306,572** | 13,873,077 |
| ණයකර නිදහස්කිරීම | | **2,000,000,000** | 300,000,000 |
| ලැබූ පොලීය | 8 | **1,874,898,049** | 1,047,704,225 |
| සේවක ණය ප්‍රදාන | | **(112,968,905)** | (104,016,595) |
| සේවක ණය ලැබීම් | | **107,622,164** | 93,488,348 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(127,736,117)** | (65,967,670) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලැබූ මුදල් ප්‍රවාහ** | | | |
| ගෙවූ ලාභාංශ | 26 | **(1,500,000,000)** | (497,000,000) |
| ණය ලැබීම් | 21 | **763,697,010** | 160,785,686 |
| ණය ගෙවීම් | 21 | **(2,591,072,366)** | (1,540,649,646) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(3,327,375,357)** | (1,876,863,961) |
| **මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම** | | **7,158,304,610** | 5,311,820,726 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමානදෑ** | 18 | **15,549,644,460** | 10,237,823,733 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | 18 | **22,707,949,070** | 15,549,644,460 |

පිටු අංක 95 සිට 127 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍යම කොටසක් වේ.
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 87 සිට 93 දක්වා පිටුවල ඇතුලත් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**1. ආයතනික තොරතුරු**

1.1 පොදු කරුණු

ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම ("සමාගම") ශ්‍රී ලංකාවේ නිත්‍ය වාසික සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇතග සමාගමේ ලියාපදිංචි කාර්යාලය කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පිහිටා ඇතග

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ජාත්‍යන්තර පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් තොටුපළ කළමනාකරණය, ශ්‍රී ලංකාව තුළට පැමිණෙන සහ ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) තුළින් පියාසර කරන ගුවන් යානා සඳහා ගගන නාවික සේවා සැපයීම සහ ගුවන් තොටුපළ භාවිතා කරන්නන්ට අවශ්‍ය වෙනත් පහසුකම් සැළසීම වර්ෂය තුළ දී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

1.3 ප්‍රසිද්ධ කිරීම සඳහා අනුමැතිය දුන් දිනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම සඳහා 2017 ජූනි 09 වන දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලබා දී තිබේ.

**2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහතින් දක්වා ඇත. විශේෂයෙන් සඳහන් කර නොමැති නම් මෙම ප්‍රතිපත්ති සියලුම වර්ෂවල අඛණ්ඩව යොදා ගෙන තිබේ.

2.1 පිළියෙළ කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs/LKAS) අනුව ඊට අනුකූලවන සේ පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇති අතර සමහර මූල්‍ය වත්කම් සහ වගකීම් වල සාධාරණ අගය සහ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය දැක්වෙන පරිදි අවශ්‍ය සංශෝධන කර තිබේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිතීන්ට SLFRS අනුකූලව වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. එසේම සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදා ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකාරීත්වය ඔවුන්ගේ විනිශ්චයන්ට අනුව කටයුතු කිරීමද අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් වූ උපකල්පන සහ ඇස්තමේන්තු ක්ෂේත්‍රයන් සටහන් අංක 4 යටතේ හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 7 දරන සමාගම් පණතට අනුකූලව සිදු කර ඇත.

2.1.1 ඒකාබද්ධ කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ ඒකාබද්ධ ස්වරූපය ඉදිරිපත් කරන අතර:

(අ) ප්‍රාග්ධන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන නියෝජනය කරන වැය ශීර්ෂ අරමුදල්; සහ

(ආ) රඳවා ගත් ආදායම් අරමුදල් ගිණුම් නීතිපතිගේ උපදේශයක් ලැබෙන තුරු 2011 වර්ෂය දක්වා වෙනමම පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

2005 අගෝස්තු 17 දිනැති කැබිනට් පත්‍රිකාවේ 3.5 ඡේදයට අනුව ගුවන් තොටුපළේ වත්කම් සහ වගකීම් සමාගමේ වත්කම් සහ වගකීම් සමඟ ඒකාබද්ධ කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීමක් ලෙස සමාගම ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට ඉදිරිපත් කළ ඉල්ලීමක් පදනම් කර ගනිමින් සිවිල් ගුවන් සේවා අධිකාරිය නීතිපතිගේ උපදේශය විමසා තිබේ.

කලින් පැවති ගුවන් තොටුපල අධිකාරිය විසින් දරන ලද වත්කම් වලින් කොටසක් 1983 දී සමාගමට මාරු කිරීමත් සමග අධිකාරිය විසුරුවා සමාගම පිහිටුවීම හේතුවෙන් ඉතිරි වත්කම් සහ වගකීම් වැය ශීර්ෂ සහ රඳවා ගත් ආදායම් අරමුදල් දෙකෙහි පැවතීම සහ ගණනය කිරීම නිසා කැබිනට් අනුමැතිය ඉහත සඳහන් පරිදි ලබා ගැනීමට අවශ්‍ය විය.

සමාගම එහි මූලික ක්‍රියාකාරකම්හි යෙදෙමින් මෙම අරමුදල් දෙකෙහිම වත්කම් භාවිතා කර ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමත් එසේම ණය සේවා බැඳීම් ගිණුම්ගත කිරීමත් අදාල වගකීම් වාර්තා කිරීමෙන් තොරව ඒ අනුව මූලික ගිණුම්කරණ සංකල්පවලින් ඉවත්ව යාම පදනම් කොට ගෙන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2013 ජූනි 28 දින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලවනසේ ඒකාබද්ධ කිරීම අනුමත කරන ලදී.

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන් දුරටත්

2.1.2 අනුකූලතා ප්‍රකාශනය

සමාගම් පණතේ විධිවිදාන සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS's) අනුව සමාග මේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ.

2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ("මූල්‍ය ප්‍රකාශන")ද එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සංසන්දනාත්මක තොරතුරුද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකසා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) මෙන්ම සමාගම් පණතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

මෙම ප්‍රමිතීන් www.casrilanka.com වෙබ් අඩවියේ ලැයිස්තු ගත කොට දක්වා ඇත.

2.1.3 සංසන්දනාත්මක තොරතුරු

වෙනත් ආකාරයකින් සඳහන් නොවුනේ නම් හැර සමාගම පසුගිය වර්ෂ වල උපයෝගි කර ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරීව අනුගමනය කර ඇත.

2.1.4 මිනුම්කරණ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එන පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතම් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය.

ආයෝජන දේපල - සාධාරණ අගය
කෙටිකාලීන ආයෝජන විකිණීමට ඇති මූල්‍ය උපකරණ ලෙස වර්ගීකරණය කර ඇති සාධාරණ අගය ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම් - නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගයට හඳුනානොගත් ආයුගණන වාසි එකතුකොට ඉන් හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ හඳුනානොගත් ආයුගණන පාඩු අඩුකොට වගකීම හඳුනාගෙන ඇත.

2.1.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල්

මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් වන්නාවූ අයිතමයන් සමාගම මෙහෙයවන ප්‍රාධාන ආර්ථික පරිසරයෙහි මුදල් (ක්‍රියාකාරී මුදල් ) පදනම් කරමින් මනිනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශන සමාගමේ ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමට භාවිත මුදල් එනම් ශ්‍රී ලංකා රුපියල් වලින් පිළියෙල කොට ඇත. සමාලෝචිත වර්ෂය තුල සමාගමේ ඉදිරිපත් කරන සහ ක්‍රියාකාරී මුදල්වල වෙනසක් සිදුවී නොමැත.

2.1.6 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති වත්කම් සහ වගකීම් ස්වභාවය අනුව වර්ගීකරණය කර ඇති අතර එහි සාපේක්ෂ ද්‍රවශීලතාවය සහ කල්පිරීමේ රටාව අනුව ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන්නාවූ උද්ධමන සාධකය වෙනුවෙන් ගැලපීම් කර නොමැත. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කොට ශුද්ධ ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත්තේ හඳුනාගත් ප්‍රමාණයකට නෛතිකව බලාත්මක කළ හිමිකමක් හිලව්වීම සහ ශුද්ධ පදනමක් මත පියවීමට කැමැත්තක් ඇති විට හෝ ගිණුම්කරණ ප්‍රමිත හෝ අර්ථ දැක්වීම් මගින් වත්කම උපලබ්ධි කොට පියවීමට අවසර ඇතිවිට සහ සමාග මේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මත විශේෂයෙන් හෙළිදරව්කොට ඇත්නම් පමණි.

2.1.7 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සමාන අයිතමයන්ගේ සෑම ප්‍රමාණාත්මක කාණ්ඩයක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇති අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරිත්වයේ ඇති අයිතම්, ප්‍රමාණාත්මක නොවුනත් "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" මත වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - LKAS 1 මගින් අවසර දී තිබේ නම් වෙනම ඉදිරිපත් කර ඇත.

2.1.8 විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වනසේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ වාර්තාකරන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් කළමනාකාරිත්වය විසින් සිදුකොට තිබේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් වියහැකිය. ඇස්තමේන්තු සහ යොදාගනු ලබන උපකල්පනයන් පවත්නා පදනමින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංස්කරණ අපේක්ෂිත ලෙස හඳුනාගනියි. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල උපකල්පන සහ අවිනිශ්චිතතා ඇස්තමේන්තුවල ප්‍රමාණාත්මක ගැලපුම් ඇති කිරීමේ සුවිශේෂී අවධානමක් ඇති තොරතුරු පහතින් දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2.1.9 අඛණ්ඩභාවය

කළමනාකාරිත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමේ තම හැකියාව තක්සේරු කර ඇති අතර අනාගත කාලයක් දක්වා ව්‍යාපාරය පවත්වා ගෙනයාමට සම්පත් තමන් සතුවීම පිළිබඳව සෑහීමට පත්වෙයි. එසේම අඛණ්ඩව පවත්වා ගෙනයාමේ සමාගම සතු හැකියාව පිළිබඳ විශේෂිත සැකයක් උපදවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා ඇති බවක් කළමනාකාරිත්වය නොදනී. එමනිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත නිරන්තරයෙන් පිළියෙල කරනු ලබයි.

2.1.10 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සාධාරණ අගය මත මනිනු ලැබූ මූල්‍ය උපකරණ සමාගම සතුව නොපවතී.

2.1.11 විලම්බිත බදු වත්කම්

බදු අලාභ සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ එවැනි බදු පියවීමට අලාභ භාවිත කිරීමට එරෙහිව අනාගත බදු කළ හැකි ශුද්ධ ලාභ ඇතිවිය හැකි බවට සම්භාවිතාවයක් ඇත. හඳුනාගත හැකි විලම්බිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට උපකල්පන යොදා ගනු ලබන්නේ අනාගත බදු සැලසුම් උපායමාර්ග සමග අනාගත බදු කළහැකි ලාභයේ කාලය සහ මට්ටම මත පදනම්වය.

2.1.12 ගිණුම්කරණ ප්‍රතිපත්තියේ සහ හෙළිදරව් කිරීම්වල වෙනස් වීම්

සමාගම යොදා ගනු ලැබූ නව ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථ දැක්වීම්.

නිකුත් කළ නමුත් තවමත් වාර්තා කරන දිනට ක්‍රියාත්මක නොවන නව ප්‍රමිතීන් සහ ප්‍රමිතීන්ට වූ සංශෝධන මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා නොගන්නා ලදී. ඒ අනුව මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කර නොගන්නා ලදී.

පහත දැක්වෙන නව ප්‍රමිතීන් සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සුවිශේෂී බලපෑමක් සිදු කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත SLFRS 9 - "මූල්‍ය මෙවලම්" - මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය මිනුම්කරණය සහ හඳුනාගැනීම යන කරුණු පිළිබඳ විස්තර කරයි. SLFRs 9 හි සම්පූර්ණ සංස්කරණය 2014 ජූලි මාසයේදී නිකුත් කරන ලදී. LKAS 39 - ප්‍රමිතියෙහි මූල්‍ය මෙවලම් වර්ගීකරණය සහ මිනුම් කිරීම පිළිබඳ මගපෙන්වීම්වලට මෙය ආදේශ කොට ඇත. SLFRs 9 මගින් සරල මිශ්‍ර මිනුම් ආකෘතියක් පවත්වාගෙන යන අතර ක්‍රමක්ෂය පිරිවැය, ලාභ හෝ පාඩු මත සාධාරණ අගය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් (OCI) මත සාධාරණ වටිනාකම ලෙස මූල්‍ය වත්කම් සඳහා මූලික වර්ගීකරණ තුනක් ස්ථාපිත කොට ඇත. ඒකකයේ ව්‍යාපාර ආකෘතිය සහ මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත වර්ගීකරණයේ පදනම රඳා පවතියි. ස්කන්ධ මෙවලම්හි ආයෝජන සාධාරණ අගය මත ලාභාලාභ මගින් මිනුම් කළ යුතු අතර ප්‍රතිවක්‍රීය නොවූ වෙනත් විස්තීර්ණ ආදායම්හි වෙනස්කම් ඉදිරිපත් කිරීම සඳහා ආරම්භයේදීම ප්‍රතිප්‍රාප්ත කර ගත නොහැකි විකල්පය ඇතුලත් කර ඇත. දැනට LKAS 39 හි භාවිතා කළ සිදු වූ අලාභ අපහායන ආකෘතිය වෙනුවට නව අපේක්ෂිත ණය පාඩු ආකෘතියක් ඇත. අනෙකුත් විස්තීර්ණ ආදායමෙහි ණය අවදානම් වෙනස්කම් හඳුනාග ැනීම හැර පාඩු හා ලාභ හරහා සාධාරණ අගයට වගකීම් නම් කිරීම තුල මූල්‍ය වගකීම් සඳහා වර්ගීකරණයේ සහ මිනුම්කරණයේ වෙනස්කම් නොමැත. SLFRS 9 ඇවුරුම් එලදායිත්වය සඳහා වූ අවශ්‍යතාවය තියුණු ඇවුරුම් එලදායිතා පරීක්ෂණයක් මගින් ලිහිල් කර ඇත. එමගින් "ඇවරුම් අනුපාතය" සඳහා භාවිතා කරන ඇවුරුෑ අයිතම් සහ ඇවුරුම් මෙවලම් අතර ආර්ථිකමක සම්බන්ධතාවයක් ඉල්ලා සිටින අතර මෙය අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේදී කළමනාකාරිත්වය සත්‍ය ලෙසම භාවිතා කරන්නක් හා සමාන වේ. සමකාලීන ලේඛන කටයුතු තවමත් අවශ්‍ය වන නමුත් එය LKAS 39 යටතේ දැනට පිළියෙල කරනවාට වඩා වෙනස් වේ. මෙම ප්‍රමිතිය 2018 ජනවාරි 01 දින හෝ ඊට පසුව ඇරඹෙන ගිණුම්කරණ කාලච්ඡේදයන් සඳහා ක්‍රියාත්මක වන අතර එයට කලින් යොදාග ැනීමටද අවසර ඇත. සමාගම SLFRS 9 හි සම්පූර්ණ බලපෑම තවමත් තක්සේරු කරමින් සිටියි.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිත IFRS 15- ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් තුලින්වූ ආදායම - ප්‍රමිතිය මගින් මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ ගනුදෙනුකරුවන් සමග ආයතනයේ කොන්ත්‍රාත් වලින් පැනනගින මුදල් ප්‍රවාහ සහ ආදායම්වල අවිනිශ්චිතතාවය පිළිබඳව ප්‍රයෝජනවත් තොරතුරු වාර්තා කිරීම සඳහා ආදායම් හඳුනාගැනීම සහ මූලධර්ම ස්ථාපිත කිරීම පිළිබඳව විග්‍රහ කරයි. භාණ්ඩයක් හෝ සේවයක් ගනුදෙනුකරුගේ පාලනයට ලබාගත් විට සහ එසේම භාණ්ඩයෙන් හෝ සේවයෙන් ප්‍රතිලාභ ලැබීමට යොමු කිරීමේ හැකියාව ඇති විට

ආදායම හඳුනා ගනියි. මෙම ප්‍රමිතිය LKAS 18 - ආදායම් - සහ LKAS 11 - ඉදිකිරීම් කොන්ත්‍රාත්තු - ප්‍රමිතීන්ට සහ අදාල අර්ථකථනයන්ට ආදේශකයක් වේ.

මෙම ප්‍රමිතිය 2018 ජනවාරි 01 දින හෝ ඉන්පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්ට අදාල වන අතර කල් ඇතිව යොදා ගැනීමටද අවසර තිබේ. සමාගම IFRS 15 හි බලපෑම තක්සේරු කරමින් සිටියි.

ශ්‍රී ලංකා වාර්තාකරන ප්‍රමිත SLFRS 16 මගින් ශේෂ පත්‍ර දිනට මූල්‍ය කල්බදු සහ  ශේෂ පත්‍ර දිනෙන් පසුවට එන මෙහෙයුම් කල්බදු අතර වෙනස දැක්වෙන  කල්බදු ගැනුම්කරු වෙනුවෙන් වූ ද්විත්ව ගිණුම්කරණ ආකෘතිය ඉවත් කරයි. ඒ වෙනුවට වර්තමාන මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමාන ශේෂ පත්‍ර දිනට වන තනි ගිණුම්කරණ ආකෘතියක් ඇත. SLFRS 16 2019 ජනවාරි 01 දින හෝ ඉන්පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන්ට බලාත්මක වේ.

සමාගම වෙත ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කළ හැකි යයි අපේක්ෂිත මෙතෙක් බලාත්මක නොවූ වෙනත් SLFRSs හෝ ෂත්‍යෘෂත අර්ථනිරූපන නොමැත.

## 2.2 විදේශීය මුදල් පරිවර්තනය

### අ) ව්‍යවහාර ඉදිරිපත් කරන මුදල්

මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් වන්නාවූ අයිතමයන් සමාගම මෙහෙයවන ප්‍රධාන ආර්ථික පරිසරයෙහි මුදල් (ව්‍යවහාර මුදල් ) පදනම් කරමින් මනිනු ලබයි. මූල්‍ය ප්‍රකාශන සමාගමේ ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමට භාවිතා කරන මුදල් එනම් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත.

### ආ) ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් ගනුදෙනු, එම ගනුදෙනු සිදු වූ අවස්ථාවේ හෝ අයිතමයන් ආගණනය සිදු වූ අවස්ථාවේ තිබූ විනිමය අනුපාත භාවිතා කරමින් ව්‍යවහාර මුදලට පරිවර්තනය කර නැවත මැනීමක් සිදු කර ඇත. එවැනි ගනුදෙනු පියවීමේ දී ඇතිවූ විදේශ විනිමය වාසි හෝ පාඩු සහ විදේශ මුදලින් නම් කළ මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ෂය අවසානයේ විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමෙන් ඇති වූ විදේශ විනිමය වාසි හෝ පාඩු, යෝග්‍යතා මුදල් ප්‍රවාහ ඇවුරුම් සහ යෝග්‍යතා ශුද්ධ ආයෝජන ඇවුරුම් ලෙස විලම්බනය වූ අනෙකුත් විස්තීර්ණ ආදායම් හැර, ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

ණය ගැනීම් සම්බන්ධ විදේශ විනිමය පාඩු හෝ වාසි සහ මුදල් හා මුදල් සමාන දෑ  විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ 'මූල්‍ය ආදායම් හෝ මූල්‍ය පිරිවැය' යටතේ ඉදිරිපත් කර ඇත. අනෙකුත් සියලු විදේශ විනිමය වාසි හෝ පාඩු ආදායම් ප්‍රකාශනයේ 'වෙනත් ශුද්ධ (පාඩු)/වාසි ' යටතේ දක්වා ඇත.

විකිණීම සඳහා යයි වර්ග කළ විදේශීය මුදල් වලින් හඳුන්වා ඇති මූල්‍ය සුරැකුම්වල සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සුරැකුම් ක්‍රමක්ෂය පිරිවැයෙහි වෙනස්වීම සහ සුරැකුම් ධාරන වටිනාකමෙහි වෙනස්වීම අතර පරිවර්තන වෙනසක් ලෙස විශ්ලේෂණය කර ඇත. ක්‍රමක්ෂය පිරිවැය වෙනස් වීමට අදාල පරිවර්තන වෙනස්කම් ආදායම් ප්‍රකාශනයේ හඳුන්වා දී ඇති අතර ධාරන අගයේ වූ වෙනත් වෙනස් වීම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුන්වා ඇත.

ලාභ හෝ පාඩු මතින් සාධාරණ අගයකට පවත්වා ගනු ලබන ස්කන්ධ වැනි මූල්‍යමය නොවන මූල්‍ය වත්කම් සහ වගකීම් මත පරිවර්තනීය වෙනස්කම් සාධාරණ අගයේ වාසි හෝ පාඩුවල කොටසක් ලෙස ලාභ හෝ පාඩු හඳුනාගෙන ඇත. විකිණීම සඳහා ඇති ස්කන්ධ වැනි මූල්‍යමය නොවූ මූල්‍ය වත්කම් වල සිදුවූ පරිවර්තන වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා තිබේ.

## 2.3 ප්‍රවර්තන  සහ විලම්බිත ආදායම් බදු

කාලපරිච්ඡේදය සඳහා බදු වියදම ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධ වල හඳුනා ගත් අයිතමයන්ට සම්බන්ධිත ප්‍රමාණයට හැර බදු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුන්වා දී ඇත. මේ තත්වය යටතේ බදු පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුව ස්කන්ධ යටතේ හඳුන්වා ඇත. වර්තමාන ආදායම් බදු වියදම පවත්නා බදු නීති හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය වන විට සම්පාදනය කළ නීති මත ගණනය කර ඇත.

කළමනාකාරීත්වය අදාල කර ගත යුතු බදු නීති සමග බදු වාර්තා කාලීනව ඇගයීමකට බඳුන් කරයි. ඒ අනුව බදු අධිකාරීන් වෙත ගෙවිය යුතු අපේක්ෂිත බදු පදනම් කරගෙන සුදුසු ලෙස ප්‍රතිපාදන සලස්වයි.

වත්කම් සහ වගකීම් වල බදු පදනමේ සහ මූල්‍ය වාර්තා වල ඒවායේ ධාරන වටිනාකමේ අතර ඇති තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත ආදායම් බදු හඳුනා ගෙන ඇත. කෙසේ වුවද කීර්තිනාමය හඳුනා ගැනීමේදී මතුවන්නක් නම් විලම්බිත බදු සඳහා වෙන් කිරීමක් නොමැතී ව්‍යාපාර සංයෝජනයක්

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

සිදු නොවන අවස්ථාවක දී හඳුනා ගන්නා ලද මූලික වත්කම් හා වගකීම් මත සහ ගණුදෙනු සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරන හෝ බදු ලාභයට බලපෑමක් ඇති නොකරන අවස්ථාවන්හි දී විලම්බිත ආදායම් බදු වගකීම ගණනය කර නැත. විලම්බිත ආදායම් බදු ගණනය කර ඇත්තේ වර්ෂය තුළ දී උපලබ්ධි වූ වත්කම් හෝ නිදහස් කරන ලද වගකීම් සඳහා අදාළ කර ගැනීමට බලාපොරොත්තු වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පනවන ලද හෝ පැනවීමට ඉදිරිපත් කර ඇති බදු අනුපාතයන් (සහ බදු නීතිය) භාවිතා කරමිනි.

විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනාගෙන ඇත්තේ තාවකාලික වෙනස්කම් උපයෝජනය කළ හැකි අනාගත බදු අයකළ හැකි ලාභ ප්‍රමාණය ඇත්නම් පමණි.

ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදු වගකීම් වලට එරෙහිව පියවීමට හැකි නීති බලාත්මකව ඇති විට සහ එය එකම බදු අධිකාරියට සම්බන්ධ වූ විට විලම්බිත බදු වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් වේ.

2.4 තොග

යල්පැන ගිය සහ සෙමින් සංචලනය වන තොග සඳහා ගැළපීම් කිරීමෙන් පසු, තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට ගණනය කර ඇත.

2003 දෙසැම්බර් 31 දිනට පෙර මිල දී ගත් ගිනි නිවීම් උපකරණ වල අමතර කොටස් සහ පරිභෝජන ද්‍රව්‍ය තක්සේරු කළ වටිනාකමට දක්වා ඇති අතර, ඉන් පසුව බරතැබූ සාමාන්‍ය මිල ක්‍රමයට අගය කර තිබේ.

ඉන්ධන ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට අගය කර ඇති අතර, අනිකුත් තොග වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දැරූ සියලු පිරිවැය බරතැබූ සාමාන්‍ය මිල ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කර තිබේ.

වසර 10 ක කාලයක් තුල සංචලනය නොවූ තොග සඳහා සමාගම ප්‍රතිපාදන සළසා ඇත.

2.5 වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ මූලිකව සාධාරණ අගයකට හඳුනා ගන්නා අතර පසුව ඵලදායි පොලී ක්‍රමය යටතේ හානිවීම් සඳහා ප්‍රතිපාදන අඩු කොට ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනුම් කර ඇත.

වෙනත් ලැබිය යුතු දෑ බොල් හා අඩමාණ ලැබිය යුතු දෑ වෙනුවෙන් ගැලපීම් කිරීමෙන් පසු පිරිවැයට ගිණුම් ගත කර ඇත.

2.6 මුදල් සහ මුදල් සමාන දෑ

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයක් ඇති ආයෝජන, අගය වෙනස්වීමේ අවම අවදානමකට ලක් විය හැකි සහ මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දෑ මුදල් හා මුදල් සමාන දෑ ලෙස නිර්වචනය කෙරේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා මුදල් හා මුදල් සමාන දෑ වල අඩංගු වන්නේ බැංකු අයිරාව අඩුකළ ශුද්ධ බැංකු ශේෂ, බැංකු තැන්පතු සහ අතැති මුදල්ය. කෙටි කාලීන ආයෝජන, එනම් අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජන ද මුදල් හා මුදල් සමාන දෑ ලෙස සළකා ඇත.

2.7 දේපල, පිරියත හා උපකරණ

සියලු දේපල, පිරියත සහ උපකරණ මූලික වශයෙන් පිරිවැයට දක්වා ඇති අතර ක්ෂය අඩු කර ඓතිහාසික පිරිවැයට පෙන්වා ඇත. වත්කම් සෘජුව අත්පත් කර ගැනීමේ පිරිවැය සහ අයිතමයන් ගලවා ඉවත්කිරීම සඳහාවූ පිරිවැය සහ ඒවා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැය කරන ලද පිරිවැය මෙන්ම එම අයිතමය අත්පත් කර ගැනීමේදී හෝ අදාල කාලය තුල තොග වශයෙන් හැර එය භාවිතා කිරීම වෙනුවෙන් දැරූ යම් දෙයක් ඇත්නම් එයද ඓතිහාසික පිරිවැය තුල ඇතුලත් වේ.

ස්වඉදිකළ වත්කම් වල පිරිවැය සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ පොදු කාර්ය වියදම් වල සුදුසු සමානුපාතිකයකින් සමන්විත වේ.

වත්කමේ ධාරන අගයෙහි හෝ වෙනම වත්කමක් ලෙස සුදුසු බව හඳුනාගත් පසුව එකතු වූ පිරිවැය ඇතුලත් කොට ඇත්තේ එම අයිතමය මගින් සමාගමට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හැකියාවක් ඇති සහ එහි පිරිවැය විශ්වාසයෙන් යුතුව මැනිය හැකි විට පමණි. ප්‍රතිසම්පාදනය කළ කොටසේ ධාරන අගය වෙනම හඳුනා නොගනී. සියලුම අලුත්වැඩියා සහ නඩත්තු වියදම් එය දැරූ මූල්‍ය වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට අය කරයි.

දීර්ඝකාලීන ප්‍රාග්ධන ව්‍යාපෘති පිරිවැය අදාල ව්‍යාපෘතිය සම්පූර්ණ කර වත්කම ප්‍රයෝජනයට ගත හැකි තත්වයට පත්වන තුරු නොනිම් ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස ඉදිරියට ගෙන යයි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන් දුරටත්

දේපලල පිරියත සහ උපකරණ එම වත්කම් වල ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළ තැන් සිට ඉවත්කරන තුරු එම වත්කම අක්‍රීයව පැවතුනත් ක්ෂය කිරීම පටන් ගනියිග දේපලල පිරියත සහ උපකරණ වල සෑම කොටසකම පිරිවැය මුලු වියදමට අනුව ගත්කළ වැදගත් වේ නම් වෙනම කොටසක් ලෙස ක්ෂය කරය. ඉඩම් ක්ෂය කරනු නොලබයි. අනෙකුත් වත්කම් සඳහා ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමයට අනුව සිදු කරන අතර ඒවායේ පිරිවැය ප්‍රයෝජනවත් ජීවිත කාලයෙන් පසු සුන්බුන් වටිනාකම දක්වා බෙදී යන ආකාරයට ගණනය කරයි.

වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය පහත සඳහන් අයුරු ඇස්තමේන්තු කරයි:

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 50 දක්වා |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | වසර 4 සිට 20 දක්වා |
| මෝටර් වාහන | වසර 4 සිට 15 දක්වා |
| ලීබඩු, සවිකිරීම් සහ කාර්යාල උපකරණ | වසර 8 දක්වා |
| සන්නිවේදන හා ගුවන් සංතරණ උපකරණ | වසර 5 සිට 10 දක්වා |
| අනෙකුත් උපකරණ | වසර 8 දක්වා |
| ගුවන් තොටුපල යටිතල පහසුකම් | වසර 8 සිට 50 දක්වා |

වත්කමක ධාරන අගය එහි ආවරණය කර ගත හැකි ඇස්තමේන්තුගත අගයට වැඩි නම් ක්ෂණිකව එහි ධාරණ අගය ආවරණිත අගයට ලියා හරිනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂණ ක්‍රියාත්මක කරන විට හඳුනාගැනීමේ නිර්ණායකයන් සෑහීමට පත්විය හැකි නම් පිරියත සහ උපකරණ ප්‍රතිසම්පාදනයක් ලෙස සලකා ධාරණ අගයෙහි ඇතුලත් කර ඇත.

දේපළ, පිරියත සහ උපකරණ විකිණීමක් මඟින් ඉවත් කළ අවස්ථාවේ දී හෝ ඒවා භාවිතයෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති අවස්ථාවන්හි දී ඒවා පොත් පත් වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ පොත් වලින් ඉවත් කිරීමේ දී ඇති වන ලාභය හෝ අලාභය (වත්කමේ ධාරන අගය සහ ශුද්ධ විකුණුම් වටිනාකම අතර වෙනස) වත්කම් ඉවත් කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ගළපනු ලැබේ. සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම, වත්කම් වල සුන්බුන් අගය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනය කරන අතර යෝග්‍ය වන අවස්ථාවක දී ඊට ගැළපුම් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම සිදු කරයි.

අලෙවි කිරීමේ ලාභ හෝ පාඩු වත්කමේ ධාරන වටිනාකම සහ ලැබූ මුදල සැසඳීමෙන් තීරණය කරනු ලබන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් හෝ පාඩු ලෙස සඳහන් වේ.

දේපල, පිරියත සහ උපකරණ අපහායනය

දේපල, පිරියත උපකරණ වල ධාරන අගය සිදු වීම් හෝ තත්ත්වයේ වෙනස්කම් හේතුකොට ගෙන ආවරණය කර ගත නොහැකි විට දේපල, පිරියත සහ උපකරණ වල ධාරන අගය අපහායනය වීම නැවත විමර්ශනය කරනු ලැබේ. ධාරන අගය ඇස්තමේන්තුගත ආවරණ අගය ඉක්මවා වැඩි වන බවට ඇඟවීමක් පවතින විට වත්කම ආවරණ අගයට ලියා හරිනු ලැබේ. අපහායනය වීමෙන් පාඩු එම වත්කමේ පූර්ව ප්‍රත්‍යාගණන අතිරික්තයන්ට ගලපා නැත්නම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුල හඳුනාගනු ලැබේ.

2.8 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස වර්ග කර ඇත.

2.9 වෙළඳ ගෙවිය යුතු දෑ

වෙළඳ ගෙවිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සැපයුම් කරුවන්ගෙන් ලබා ගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට වූ බැඳීමයි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ වෙනත් ගෙවියයුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනෙන් වසරක් තුල හෝ ඉල්ලූ විටක ගෙවීමට නියමිතව ඇති දේවල් වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතමයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනෙන් වසරකට වැඩි කලකදී ගෙවීමට නියමිත දේවල් වේ.

වෙළඳ ගෙවියුතු දෑ මූලික වශයෙන් ගනුදෙනු මිල අනුව හඳුනා ගන්නා අතර පසුව සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය වියදමට මනිනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2.10 ණය ගැනීම්

ණය ගැනීම් මූලිකව ශුද්ධ ගනුදෙනු පිරිවැය හැර සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇත. ණය ගැනීම් ක්‍රමක්ෂය පිරිවැය මත සඳහන් කර ඇත. ලබන මුදල් (ශුද්ධ ගනුදෙනු පිරිවැයෙහි) සහ නිදහස් කිරීමේ වටිනාකමෙහි වෙනසක් වේ නම් එය සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ණය ලබා ගත් කාලච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුල හඳුනාගෙන ඇත.

ණය පහසුකම් ලබා ගැනීම සඳහා ගෙවන ලද ගාස්තු එය සිදු විය හැකි නම් හෝ සියලු පහසුකම ලබා ගැනීමේ ප්‍රමාණයට ණය සම්බන්ධ ගනුදෙනු පිරිවැය ලෙසට හඳුනාගෙන ඇත. මෙහිදී සියලුම ලබා ගැනීම් අවසන් වන තුරු ගාස්තු විලම්භනය කරනු ලැබේ. සියලු පහසුකම් ලබා ගැනීම පිළිබඳ සාක්ෂි නොමැති විට එම පහසුකම අයත් කාලපරිච්ඡේදයේ කලින් ගෙවීමක් ලෙස ගාස්තු ප්‍රාග්ධනිත කරනු ලබන අතර පහසුකම සම්බන්ධ කාලච්ඡේදයට ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.11 ණය පිරිවැය

අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් කිරීමට තරමක් විශාල කාලයක් ගතවන සහ අත්පත් කරගැනීම්, ඉදිකිරීම් සහ නිෂ්පාදනය කිරීම් සඳහා සෘජු වශයෙන් අවශ්‍ය පොදු සහ විශේෂිත ණය ගැනීම් පිරිවැය එම අපේක්ෂිත භාවිතයට සූදානම් වන තුරු වත්කම්හි පිරිවැයටම එකතු කරයි.

කෙටි කාලීන ආයෝජන මත ඉපයූ ආදායම් වෙනුවෙන් වූ වියදම් ප්‍රාග්ධනිත කල හැකි ණය පිරිවැයෙන් අඩු කොට දක්වයි. අනෙකුත් සියලුම ණය පිරිවැය ඒවා සිදු වූ කාලපරිච්ඡේදයේදී ලාභය හෝ පාඩුව ලෙස හඳුනා ගනියි.

2.12 ප්‍රතිපාදන

සමාගම විසින් ප්‍රතිපාදන ගිණුම් ගත කර ඇත්තේ වර්ථමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් ඇති විට පමණක් අතර ආර්ථික වාසි අඩංගු පසුගිය සිදුවීමක් නිසා සම්පත් පිටතට ගලායාමක් තුලින්, බැඳීම් නිදහස් කිරීමට අවශ්‍ය වන අතර විශ්වාසනීය ලෙස බැඳීම් වල වටිනාකම ඇස්තමේන්තු කළ හැක. මුදලෙහි කාලීන වටිනාකමෙහි බලපෑම ප්‍රමාණාත්මක නම්, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළඳපල තත්වය සහ සුදුසු පරිදි වත්කමට විශේෂ වූ අවදානම පිළිබිඹු වන පූර්ව බදු අනුපාතයකට වට්ටම් කර ඒ සඳහා ප්‍රතිපාදනය තීරණය කර ඇත. වට්ටම් කිරීම භාවිතා කෙරෙන අවස්ථාවල කාලයත් සමග ප්‍රතිපාදනයේ වැඩි වීම පොලී වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

2.13 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු වෙනම ඒකකයකට සමාගම ගෙවන ස්ථාවර දායකත්වයක් යටතේ වූ විශ්‍රාමික සැලසුමකි. සේවකයින්ගේ පෙර සහ වර්තමාන සේවයට අදාලව සියලුම සේවකයින්ට ප්‍රතිලාභ ගෙවීමට ආයතනය සතුව ප්‍රමාණවත් අරමුදල් නැත්නම් අමතර දායක මුදල් ගෙවීමට නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් සමාගමට නොමැත.නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායකත්ව සැලැස්මක් නොවන විශ්‍රාමික සැලසුමකි.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් සේවකයෙකු විශ්‍රාම යාමේදී ලබන විශ්‍රාමික ප්‍රතිලාභ ප්‍රමාණය නිර්වචනය කර ඇති අතර වයස, සේවා කාලය සහ වන්දි යන සාධකවල එකක් හෝ කීපයක් මත රඳා පවතී.

නිශ්චිත විශ්‍රාමික ප්‍රතිලාභ සැලසුම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති වගකීම, වාර්තා කරන කාලච්ඡේදය අවසානයට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන අගයෙන් සැලසුම් කල වත්කම්වල සාධාරණ වටිනාකම අඩුකල ප්‍රමාණයයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ආයුගණක මගින් වාර්ෂිකව ගණනය කරයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාම වට්ටම් කර තීරණය කරන අතර උසස් තත්ත්වයේ ආයතනික බැඳුම්කර සඳහා වන පොලී අනුපාත භාවිතා කරන අතර ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් හඳුන්වනු ලබන ලෙසම අදාල විශ්‍රාම බැඳීමේ කොන්දේසි වලට ආසන්න වශයෙන් කල් පිරීම සඳහා කොන්දේසි අඩංගු වේ. මෙම බැඳුම්කර සඳහා හොඳ වෙළඳපලක් නොමැති රටවල රාජ්‍ය බැඳුම්කර වල වෙළඳපල අනුපාතය භාවිතා කරයි.

වර්ෂයේ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම සඳහා සමාගම ස්වාධීන ආයුගණක තක්සේරු සේවාවක් ලබා ගෙන ඇත.

පළපුරුද්දෙන් සිදුකරන ගැලපීම්වලින් සහ ආයුග ණන උපකල්පනයන්ගෙන් වන ආයුගණන වාසි

හෝ පාඩු ඒවා පැනනැගුනු විට කාලච්ඡේදයේ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අයකිරීම හෝ ස්කන්ධයට බැරකිරීම හෝ කරනු ලැබේ.

ආ) නිශ්චිත දායකත්ව සැලැසුම්

ශ්‍රී ලංකාව තුල සමාගමෙහි සියලුම සේවකයින් සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ සාමාජිකයෝ වන අතර අදාල සේවකයින්ගේ මූලික හෝ ඒකාබද්ධ වැටුපෙන් පිළිවෙලින් 12% හා 3% ක් එම අරමුදල්වලට සමාගම විසින් බැර කරනු ලැබේ.

2.14 ප්‍රදානයන් හා සහනාධාරයන්

වත්කම් වලට සම්බන්ධ මූල්‍ය ප්‍රදාන පිරිවැයට හඳුනාගන්නා අතර වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල මූල්‍ය තත්ව ප්‍රකාශනයේ විලම්බනය කොට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලබයි.

2.15 මූල්‍ය නොවන වත්කම් අපහායනය

අවිනිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාලයක් ඇති වත්කම් (උදාහරණයක් ලෙස කීර්තිනාමය හෝ පාවිච්චි කිරීමට සූදානමක් නැති අස්පෘශ්‍ය වත්කම්) ක්‍රමක්ෂය කිරීමට යටත් නොවන අතර වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කරයි. ක්‍රමක්ෂය සඳහා යටත් වන වත්කම් ඒවායේ ධාරන අගය නැවත ලබා ගත නොහැකි යයි වෙනස්කම් මගින් හෝ සිදුවීම් මගින් හඟවන විට සමාලෝචනය කරනු ලැබේ.

වත්කමෙහි ධාරන අගය එහි නැවත ලබා ගත හැකි අගය ඉක්මවන ප්‍රමාණයට අපහායන පාඩුව හඳුනා ගනියි. වත්කමේ සාධාරණ අගයෙන් එය විකිණීමේදී හෝ පාවිච්චි කිරීමේ දී දැරූ පිරිවැය අඩු කළ අගය සහ පරිශීලනය කරන වටිනාකම අතර ඉහල වටිනාකමට නැවත ලබා ගත හැකි අගය තීරණය කරයි. අපහායනය තක්සේරු කිරීමේ අරමුණ සඳහා වත්කම් අනුව පහළ මට්ටමේ සිට වර්ගීකරණය කරනු ලබන අතර ඒ සඳහා මුදල් ප්‍රවාහ (මුදල් ජනිත ඒකක) හඳුනා ගත හැක. කීර්තිනාමය හැර මූල්‍ය නොවන වත්කම් අපහායනය වීමක් ඇත්නම් සෑම වාර්තා කරන දිනයක් වෙනුවෙන්ම අවශ්‍ය ගැලපුම් සඳහා සමාලෝචනය කරනු ලැබේ.

2.16 මූල්‍ය වත්කම්

2.16.1 වර්ගීකරණය

සමාගම එහි මූල්‍ය වත්කම් පහත ප්‍රභේද වලට වර්ගීකරණය කර ඇත. ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගය මත, ණය සහ ලැබියයුතුදෑ, විකිණීම සඳහා ඇති සහ කල් පිරෙන තෙක් රඳවා ගත් වශයෙන් වර්ගීකරණය කරයි. මූල්‍ය වත්කම් අත්පත් කර ගත් අරමුණ මත වර්ගීකරණය රඳා පවතියි. කළමනාකාරිත්වය එහි මූල්‍ය වත්කම් වර්ගකිරීම මූලික හඳුනාගැනීමේ සිට තීරණය කරන අතර සෑම වාර්තාකරන දිනයකදීම එය නැවත අගය කරනු ලැබේ.

අ) ලාභ හෝ අලාභ මත සාධාරණ අගයක් යටතේ මූල්‍ය වත්කම්

මේ යටතේ මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබන්නේ කළමනාකාරිත්වය ප්‍රධාන වශයෙන්ම කෙටිකාලයක් තුල විකිණීමේ අරමුණින් ඒවා අතපත් කරගන්නේ නම්ය. මාස 12 ක කාලයක් ඇතුලත පියවීමට බලාපොරොත්තු වේ නම් මෙම වර්ගයේ වත්කම් ජංගම වත්කම් යටතේ වර්ගකරනු ලබයි. එසේ නොමැති නම් ඒවා ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කරයි. ඇවුරුමක් ලෙස නම් කර ඇත්නම් හැර ව්‍යුත්පන්න සාධාරණ අගය මත මූල්‍ය වත්කම් ලෙස ලාභ හෝ අලාභ හරහා වර්ගීකරණ කර ඇත.

ආ) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබි යුතු දෑ යනු ක්‍රියාකාරී වෙළඳ පල තුල ප්‍රකාශිත නොවූ ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීමක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරන දිනෙන් කල් පිරීමට මාස 12 කට වැඩි කාලයක් ගන්නා වත්කම් හැර මෙම වත්කම් ජංගම වත්කම් යටතේ දක්වයි. කල් පිරීමට මාස 12 කට වැඩි කාලයක් ගන්නා වත්කම් ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කරයි. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ "වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදල් සමාන දෑ" යන වර්ග දෙකෙන් සමන්විත වේ.

ඇ) කල්පිරෙන තෙක් තබා ගන්නා ආයෝජන

කල්පිරෙන තෙක් තබා ගන්නා ආයෝජන යනු ස්ථිර හෝ තීරණය කළ ගෙවීම් සහ ආයතනය සතු ස්ථාවර කල්පිරීම් එනම් කල්පිරෙන තෙක් තබා ගැනීමේ ධනාත්මක චේතනාව සහ හැකියාව ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

ඈ) විකිණීම සඳහා තිබෙන

විකිණීම සඳහා තිබෙන මූල්‍ය වත්කම් ව්‍යුත්පන්න නොවූ ඒවා වන අතර මෙම ප්‍රභේදය යටතේ දැක්වෙන හෝ වෙනත් වර්ග යටතේ වර්ගීකරණය නොවන වත්කම් වේ. මූල්‍ය තත්ව ප්‍රකාශන දිනෙන් මාස 12 ක කාලයක් තුල ඒවා ඉවත් කිරීමට කළමනාකරණය තීරණය කරන්නේ නම් හැර මෙම වත්කම් ජංගම නොවන වත්කම් යටතේ දක්වයි.

2.16.2 හඳුනා ගැනීම සහ මැනීම

මූල්‍ය වත්කම් නිතර මිලදී ගැනීම සහ විකිණීම සමාගමේ ගනු දෙනු සිදුවන දිනට-වත්කම් විකිණීමට හෝ මිලදී ගැනීමට බැඳෙන දිනය ලෙස හඳුනා ගනියි. ආයෝජන මූලික වශයෙන් සාධාරණ අගය මත ධාරනය නොවූ සියලු මූල්‍ය වත්කම් සඳහා වූ ගනු දෙනු පිරිවැය එකතු කර හඳුනා ගනියි. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් දරන මූල්‍ය වත්කම් සාධාරණ අගයකට හඳුනාගන්නා අතර ගනුදෙනු පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන ඇත. මූල්‍ය වත්කම් හඳුනා නොගන්නේ ආයෝජන කල් ඉකුත් වී හෝ පවරා ඇතිවිට සහ සමාගමේ සියලු අවදානම් හිමිකාරිත්වයට පවරා ඇත්නම් පමණි. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගය මත ඇතිවන මූල්‍ය වත්කම් පසුව සාධාරණ අගය අනුව ධාරණය වේ. ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට අගය කරයි.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට වර්ග කරන මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ වෙනස් වීම් නිසා ඇති වන වාසි හෝ පාඩු ඒවා පැන නගින කාලයට අදාල විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ශුද්ධ ලාභ/(පාඩු) යන ශීර්ෂය යටතේ ඉදිරිපත් කරයි.

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය අනුව අගය කර ඇති මූල්‍ය වත්කම් වලින් ලැබෙන ලාභාංශ ආදායම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් වල කොටසක් ලෙස හඳුනා ගනු ලබන්නේ ආයතනයේ ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට පමණි.

විකිණීම සඳහා ඇති සේ වර්ග කළ මූල්‍ය සහ මූල්‍ය නොවන සුරැකුම්වල සාධාරණ අගයෙහි වෙනස් කම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනියි. විකිණීම සඳහා ඇති සේ වර්ග කළ සුරැකුම්පත් විකිණීම හෝ අපහායනය කලවිට සමුච්චිත සාධාරණ වටිනාකමට ගැලපුම් ස්කන්ධ යටතේ හඳුනා ගන්නා අතර එය 'ආයෝජන සුරැකුම්පත් වල ලාභ හෝ පාඩු' ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් වේ.

විකිණීම මත ඇති සුරැකුම් වල පොලිය සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් වල කොටසක් ලෙස දැක්වේ. විකිණීම සඳහා ඇති ස්කන්ධ උපකරණ මත ලාභාංශ සමාගමට එය ලැබීමේ අයිතිය තහවුරු වූ විට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් වල කොටසක් ලෙස හඳුනා ගනියි.

2.17 මූල්‍ය උපකරණ හිලව්කිරීම

හඳුනාගත් ප්‍රමාණය හිලව් කිරීමට නෛතික බලපෑමක් ඇති ශුද්ධ පදනම මත හෝ වත්කම් උපලබ්දි කර වගකීම ඒ සමගම පියවන අවස්ථා වේදී මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ. නෛතිකව බලපෑමක් ඇති කිරීමේ අයිතිය අනාගත සිදුවීම් මත අසම්භාව්‍යයක් නොවියයුතු අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සමාගමේ හෝ විරුද්ධ පාර්ශවයන්ගේ පැහැර හැරීම, බුන්වත්වීම හෝ බංකොලොත් වීම යන අවස්ථාවන්හි බලාත්මක වියයුතුය.

2.18 මූල්‍ය වත්කම් අපහායනය

අ) ක්‍රමක්ෂය පිරිවැයට ධාරණ අගයක් ඇති වත්කම්

සමාගම මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහය අපහායනය වීම පිළිබඳව යටත් නොවූ සාක්ෂි තිබේදැයි යන්න සෑම වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසානයේදීම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහය අපහායනය වී ඇත් නම් සහ අපහායන අලාභයක් ඇති විය හැක්කේ වත්කමක් මූලිකව හඳුනා ගත් පසුව මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහය විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කිරීමට හැකියාව තිබියදී ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහය මත බලපෑම් ඇති කරයි.

අපහායනය වීමේ සාක්ෂි ලෙස ණය ගැතියන් හෝ ණයගැති සමූහයෙහි සැලකිය යුතු මූල්‍ය අපහසුතා ලෙස මුහුන දෙන, පොලි හෝ ප්‍රාග්ධන මුදල ගෙවීම පැහැර හැරීම හෝ අපහසුතා, බුන්වත් වීමේ සම්භාවිතාව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යුහගතකරණය සහ නිරීක්ෂණය කළ දත්ත මගින් හිඟ මුදල්වල වෙනස්වීම් හෝ පැහැරහැරීම් සමග සම්බන්ධයක් ඇති ආර්ථික තත්ත්වයන් තුලින් ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ වල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරයි.

ණය සහ ලැබිය යුතු දෑ වල අලාභය වත්කමේ ධාරන අගය සහ මූල්‍ය වත්කම් වල සඵල පොලී අනුපාත මත වට්ටම් කළ අනාගත මුදල් ප්‍රවාහ වල වර්තමාන අගය (තවමත් දැරීමට සිදු නොවූ අනාගත ණය අලාභ හැර) අතර වෙනස ලෙස මනිනු ලබයි. වත්කමේ ධාරන අගය අඩුකරන අතර අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනියි. ණය හෝ කල්පිරීම දක්වා තබාගන්නා ආයෝජන සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ඇත්නම් අපහායන අලාභය මැනීම සඳහා යොදා ගැනෙන වර්ථමාන සඵල පොලී අනුපාතිකය වට්ටම් කර ගිවිසුම යටතේ තීරණය කරනු ලැබේ.

උපයෝගීතාවයක් ලෙස නිරීක්ෂිත වෙළඳ පල මිල භාවිතයෙන් මූල්‍ය උපකරණ වල සාධාරණ අගය පදනම් කර ගෙන සමාගම අපහායනය මනිනු ලබයි.

පසුව එන කාල පරිච්ඡේදයේදී අපහායන අලාභයෙහි ප්‍රමාණය අඩුවීමක් සිදුවන විට හා අපහායනය හඳුනාගැනීමෙන් පසු ණයගැතියන්ගේ ණය ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම කලින් හඳුනාගත් අපහායන අලාභ ආපසු හැරවීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුල හඳුනා ගනු ලබයි.

ආ) විකිණීමට ඇති සේ වර්ගීකරණය කළ වත්කම්

සමාගම සෑම වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසානයේදීම මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි අපහායනය වීමක් සිදු වී තිබේද යන්න තක්සේරු කරයි. ණය සුරැකුම් සම්බන්ධයෙන් සමාගම ඉහත (අ) කොටසේ දැක්වූ ක්‍රමෝපායන් අනුගමනය කරයි. විකිණීමට ඇති ගණයට වර්ග කළ ස්කන්ධ ආයෝජන සම්බන්ධයෙන් සුරැකුමෙහි සාධාරණ වටිනාකම සුවිශේෂී ලෙස හෝ දිගුකාලීන පහත වැටීමක් ලෙස එහි පිරිවැයට පහලින් තිබීම එම වත්කමේ අපහායනය වීමේ ලක්ෂණයක් වේ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් එවැනි සාක්ෂි වෙතොත් සමුච්චිත අලාභය (අත්පත් කර ගැනීමේ පිරිවැය සහ වර්තමාන සාධාරණ අගය අතර වෙනස ලාභාලාභ ලෙස කලින් හඳුනාගත් මූල්‍ය වත්කම් මත අලාභ අඩුවීමක් වෙතොත් එය ස්කන්ධ උපකරණ සඳහා වූ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගන්නා අතර ප්‍රතිවර්තනය විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුලින් සිදු නොකෙරේ. පසු කාල පරිච්ඡේදයේදී විකිණීම සඳහා පවත්නා වර්ගය යටතේ නම් කළ ණය උපකරණ වල සාධාරණ අගයෙහි ආපසු වැඩිවීමක් වූයේ නම් සහ එම වැඩිවීම ලාභය හෝ අලාභය තුල ඇති අපහායන අලාභය හඳුනා ගැනීමෙන් පසුව ඇති වූවක් නම් එම අපහායන අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට යලි ගලපනු ලැබේ.

2.19 මූල්‍ය වගකීම්

සමාගමේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු ණය සහ අනෙකුත් ණය ගැනීම් සහ අහිතකර ව්‍යවහාර මුදල් ගිවිසුම් ආදිය ඇතුලත් වේ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට දක්වන මූල්‍ය වගකීම් හැර අනෙකුත් සියලු මූල්‍ය වගකීම් ආරම්භයේ දී ඒවායේ සාධාරණ වටිනාකමින් හඳුනාගන්නා අතර පසුව වට්ටම් කිරීමේ ප්‍රතිඵලය නොවැදගත් නම් සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. ඒ අනුව ඒවා පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.20 ආදායම් හඳුනා ගැනීම

ආදායම් හඳුනා ගැනීම කරනුයේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදු වේ නම් සහ ආදායම් හා ඒ ආශ්‍රිතව ඇතිවන හෝ ඇතිවිය හැකි වියදම් විශ්වාසයෙන් යුතුව මැනිය හැකි නම් පමණි. ආදායම ලැබූ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය හෝ වෙළඳ වට්ටම් හෝ විකුණුම් බදු වල ලැබිය යුතු ශුද්ධ අගය මත මනිනු ලැබේ. ආදායම හඳුනා ගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් විශේෂිත නිර්ණායකයන් භාවිතා කරයි.

අ) සේවා සැපයීම

සේවා සැපයීමෙන් ලැබුණු ආදායම එම සේවාව සැපයූ හෝ ක්‍රියාත්මක කළ ගිණුම් කාල පරිච්ඡේදය තුලදී හඳුනාගනියි.

ආ) පොලිය

අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් නොමැති නම් පොලිය උපචිත ආකාරයෙන් හඳුනා ගනියි.

ඇ) කුලී ආදායම්

කුලී ආදායම කුලී ගිවිසුමේ විස්තර කොට ඇති පරිදි උපචිත පදනම මත හඳුනා ගනී.

ඈ) නියෝජිත ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු

අදාල ගිවිසුමේ හරයට අනුකූලව නියෝජිත ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු උපචිත පදනම මත හඳුනා ගනියි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

ඉ) ජාත්‍යන්තර/අභ්‍යන්තර ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම්

ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම, අවම ගාස්තු සහ ගුවන් තොටුපලේ අංගනයෙහි නැවතුම් කාලයට යටත්ව ගුවන් ගත කිරීමේ උපරිම ස්කන්ධය (MTOW) මත පදනම් වන අතර උපචිත පදනම මත හඳුනාගනියි.

ඊ) පියාසර ආදායම්

පියාසර ආදායම් ගුවන් ගත කිරීමේ උපරිම ස්කන්ධය මත පදනම්ව ගණනය කරන අතර උපචිත පදනම මත හඳුනාගනියි.

උ) ගුවන් මගී පාලම් ආදායම්

ගුවන් මගී පාලම් ආදායම් ගුවන් පාලම පාවිච්චි කරන කාලය සහ ගුවන් යානා වර්ගය මත පදනම්ව ගණනය කරනු ලබන අතර ආදායම උපචිත පදනම මත හඳුනාගනියි.

ඌ) ගුවන් යානයට නැගීමේ බදු

ගුවන්යානයට නැගීමේ බදු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මූල්‍ය පණතට අනුව එකතු කරනු ලබන අතර ශ්‍රී ලංකා රු. 140/- කට සමාන වන පරිදි ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 9.75 ක් ගු.ගු.සේ. සමාගමට ප්‍රේෂණය කරයි. ආදායම මුදල් පදනම මත හඳුනාගනියි.

එ) ඇතුල් වීමේ අවසර පත් ගාස්තු, වාහන නැවතුම් ගාස්තු සහ පේජින් පුවරු

ආදායම් මුදල් පදනම මත එකතු කරන අතර එම පදනම මත හඳුනාගනියි.

ඒ) වෙනත්

මගී ආලින්ද ආදායම් ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනම මත හඳුනාගනියි.

ඝණ අපද්‍රව්‍ය භෂ්මක ආදායම් උපචිත පදනම මත හඳුනා ගනියි.

අනෙකුත් ආදායම් මුලාශ්‍ර ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනමෙන් හඳුනාගනියි.

3. මූල්‍ය අවදානම් කළමනාකරණය

3.1 මූල්‍ය අවදානම් සාධක

සමාගමේ ක්‍රියාකාරකම් විවිධ මූල්‍ය අවදානම් වලට විවෘතව පවතී. එනම් වෙළඳපල අවදානම (විදේශ මුදල් අවදානම, මුදල් ප්‍රවාහ සහ සාධාරණ අගයේ පොලී අනුපාත අවදානම ඇතුලුව), ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම වේ.

අ) වෙළඳපල අවදානම

(i) විදේශ විනිමය අවදානම

සමාගම විනිමය අනුපාතයන්හි උච්චාවචනයන්ට සංවේදී වන අතර ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර්, යුරෝ සහ ජපාන යෙන් වලට අනුව ශ්‍රී ලංකා රුපියලේ උච්චාවචනයන්ට විවෘතව පවතී. සමාගමේ ක්‍රියාකාරී මුදල් වන්නේ ශ්‍රී ලංකා රුපියල් වන අතර බොහෝ ගනුදෙනු සිදුකරනු ලබන්නේ රුපියල් වලින් වන අතර අනෙකුත් මුදල් ණය ගෙවීම් සඳහා භාවිතා වන විදේශ මුදල් ලෙස සැලකේ. සමහර වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මෙන්ම වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑද විදේශ මුදලින් පෙන්නුම් කරයි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරෙන බැවින් පරිවර්තන අවදානම සහ ගනුදෙනු අවදානම යන දෙකෙන්ම විදේශ විනිමය උච්චාවචනයන්ගේ බලපෑමට හසු වෙයි. විදේශ මුදල් වල විනිමය අනුපාත වෙනස්කම් සමාගමේ ලාභ හෝ අලාභ කෙරේ බලපායි. උදාහරණයක් ලෙස එක්සත් ජනපද ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල දුර්වල වීම එනම් මහා භාණ්ඩාගාරය විදේශ මුදලින් ලබා ගෙන ඇති ණය ගෙවීමට යාමේදී සමාගමේ ලාභදායිතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.

ඇ.එ. ඩොලර්, යුරෝ සහ ජපාන යෙන් වලට එරෙහිව අනෙකුත් සියළු විචල්‍යයන් නොවෙනස්ව තිබියදී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකයෙහි වියහැකි සාධාරණ වෙනස්කම්වලට සමාගමේ සංවේදීතාවය පහත දැක්වෙන වගුවෙන් පෙන්වයි. සමාගමේ මූල්‍ය උපකරණ සමාගමේ ඉදිරිපත් කරන සහ ලිඛිත මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලින් නම් කළ පසු ඇ.එ. ඩොලර් සහ ජපාන යෙන් ප්‍රධාන මුදල් වෙයි. ස්කන්ධය මත ඇ.එ. ඩොලර්, යුරෝ සහ ජපාන යෙන් විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම් වල බලපෑම පහත දැක්වෙන වගුවෙහි සඳහන් වේ.

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන් දුරටත්

ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇ.එ. ඩොලර් විනිමය අනුපාතයේ සංවේදිතාව

| | 2016<br>**ලාභයේ වැඩිවීම/අඩුවීම (ශ්‍රී.ල.රුපියල්)** | 2015<br>ලාභයේ වැඩිවීම/අඩුවීම (ශ්‍රී.ල.රුපියල්) |
|---|---|---|
| ඇ.එ. ඩොලර් වලින් 10% ක වැඩිවීම/අඩුවීම (2016 - 10%) | **(90,680,460)** | (235,302,690) |
| ඇ.එ. ඩොලර් වලින් 15% ක වැඩිවීම/අඩුවීම (2016 - 15%) | **(136,020,690)** | (352,954,035) |
| ඇ.එ. ඩොලර් වලින් 20% ක වැඩිවීම/අඩුවීම (2016 - 20%) | **(181,360,920)** | (470,605,381) |

ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව යුරෝ විනිමය අනුපාතයේ සංවේදිතාව

| | 2016<br>**ලාභයේ වැඩිවීම/අඩුවීම (ශ්‍රී.ල.රුපියල්)** | 2015<br>ලාභයේ වැඩිවීම/අඩුවීම (ශ්‍රී.ල.රුපියල්) |
|---|---|---|
| යුරෝ වලින් 10% ක වැඩිවීම/අඩුවීම (2016 - 10%) | **(972,499)** | 1,132,926 |
| යුරෝ වලින් 15% ක වැඩිවීම/අඩුවීම (2016 - 15%) | **(1,458,748)** | 1,699,389 |
| යුරෝ වලින් 20% ක වැඩිවීම/අඩුවීම (2016 - 20%) | **(1,944,997)** | 2,265,852 |

ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ජපාන යෙන් විනිමය අනුපාතයේ සංවේදිතාව

| | 2016<br>**ලාභයේ වැඩිවීම/අඩුවීම (ශ්‍රී.ල.රුපියල්)** | 2015<br>ලාභයේ වැඩිවීම/අඩුවීම (ශ්‍රී.ල.රුපියල්) |
|---|---|---|
| යෙන් වලින් 10% ක වැඩිවීම/අඩුවීම (2016 - 10%) | **(86,054,995)** | 82,549,936 |
| යෙන් වලින් 15% ක වැඩිවීම/අඩුවීම (2016 - 15%) | **(129,082,492)** | 123,824,903 |
| යෙන් වලින් 20% ක වැඩිවීම/අඩුවීම (2016 - 20%) | **(172,109,989)** | 165,099,871 |

(ii) මුදල් ප්‍රවාහය සහ සාධාරණ වටිනාකම් පොලී අනුපාත අවදානම

සමාගමේ පොලී අනුපාත අවදානම ඇ.එ. ඩොලර්, යුරෝ සහ ජපාන යෙන් නමින් ගනු ලැබූ දීර්ඝකාලීන ණය ගැනීම්වලින් පැන නගියි. එම ණය ගැනීම් ස්ථාවර අනුපාතයකට නිකුත් කරනු ලබන අතර එමගින් ණය ගැනීම් මත මුදල් ප්‍රවාහ පොලී අනුපාත අවදානම අවම කරයි. මෙය තවදුරටත් විචල්‍ය අනුපාත වලට මුදල් දැරීම තුලින් අවම කරයි. ස්ථාවර අනුපාතයන්ට නිකුත් කළ ණයගැනීම් සමාගමේ සාධාරණ වටිනාකම් පොලී අනුපාත අවදානම පෙන්නුම් කරයි.

සමාගම මෙම පොලී අනුපාතයන්ගේ සංචලන පසුගිය වසර හතරක් තිස්සේ සලකා බැලූ අතර පොලී අනුපාතයන්ගේ මෙම සංචලන ස්කන්ධය කෙරේ ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන බවට නිගමනය කර ඇත.

(අ) ණය අවදානම

ණය අවදානම මතුවන්නේ බාහිර පාර්ශවයන්ගේ වෙළඳ සහ අනෙකුත් ලැබියයුතු දෑ මගිනි. වැඩි දුර විස්තර සටහන් අංක 26 හි දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

(ආ) ද්‍රවශීලතා අවදානම

මුදල් ප්‍රවාහ පුරෝකථනය මුදල් අංශය විසින් ක්‍රියාත්මක කරයි. මෙහෙයුම් අවශ්‍යතා වලට සෑහෙන මුදල් ඇති බවට සහතික කිරීමට සමාගමේ ද්‍රවශීල අවශ්‍යතා පුරෝකථනය කිරීම මුදල් අංශය මගින් අධීක්ෂණය කරයි. එවැනි පුරෝකථන සමාගමේ ණය මූල්‍යයන සැලසුම්, ගිවිසුම් අනුකූලතා, අභ්‍යන්තර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන අනුපාත ඉලක්ක සහ අදාලවේ නම් බාහිර රෙගුලාසි සහ නෛතික අවශ්‍යතා සැලකිල්ලට ගනියි. උදාහරණයක් ලෙස මුදල් සීමා කිරීම්.

කාරක ප්‍රාග්ධන කළමනාකරන අවශ්‍යතා ඉක්මවා සමාගම අත ඇති අතිරික්ත මුදල් ද්‍රවශීලතා අවදානම අවම කර ගැනීමට රජයේ සුරැකුම් වල ආයෝජනය කරයි.

3.2 ප්‍රාග්ධන අවදානම කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී සමාගමේ අරමුණු වනුයේ කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දෙනු පිණිස ප්‍රතිලාභ සඳහා සමාගම අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම, සහ පරදුභාරකරුවන්ට ප්‍රතිලාභ ලබා දීම සහ ප්‍රාග්ධන පිරිවැය අඩු කිරීම සඳහා ප්‍රශස්ථ ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීම වේ. ප්‍රාග්ධන ව්‍යුහය ගැලපීම හෝ පවත්වා ගැනීම පිණිස සමාගම කොටස් හිමියන් වෙත ගෙවනු ලැබූ ලාභාංශ ගැලපීම, කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ගැලපීම, නව කොටස් නිකුත් කිරීම හෝ ණය අඩුකිරීම සඳහා වත්කම් විකිණීම කරනු ඇත. සමාගම ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට පෙර ලාභාංශ අනුපාතය පවත්වා ගැනීම පිණිස බුන්වත් බව තක්සේරු කරයි. කර්මාන්තයේ අනෙකුත් ආයතන සමග සමපාත වීමට සමාගම ණය තෝලන අනුපාතය පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුලු ණය මුලු ප්‍රාග්ධනයෙන් බෙදීමෙන් ගණනය කරයි. ණය ලෙස ගණනය කරනුයේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්වෙන “ජංගම සහ ජංගම නොවන” මුළු ණය ගැනීම් වේ. මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්වෙන පරිදි මුළු ප්‍රාග්ධනය ස්කන්ධය ලෙස ගණනය කරයි.

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන් දුරටත්

2016 දෙසැම්බර් 31 දිනට හා 2015 දෙසැම්බර් 31 දිනට ණය තෝලන අනුපාතය පහත සඳහන් පරිදි වේ:

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| මුළු ණය ගැනීම් (සටහන් 21) | **37,679,349,374** | 37,729,645,200 |
| අඩුකළා - මුදල් හා මුදල් සමාන දෑ (සටහන් 18) | **(22,707,949,070)** | (15,549,644,460) |
| **ශුද්ධ ණය** | **14,971,400,304** | 22,180,000,740 |
| මුළු ස්කන්ධ ප්‍රමාණය | **16,436,210,776** | 11,012,440,870 |
| **මුළු ප්‍රාග්ධනය** | **31,407,611,080** | 33,192,441,610 |
| **තෝලන අනුපාතය** | **48%** | 67% |

ඉහත සඳහන් ණය ගැනීම් සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරය හරහා බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සහ මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල සංවර්ධනය කිරීම සඳහා පවත්නා වෙළඳපල අනුපාත අනුව රන් පවුම් සහතික මත ලබාගත් ණය වලින් සමන්විත වේ. වට්ටම් කිරීමේ බලපෑම සැලකිය යුතු නොවන නිසා ණය ගැනීම් වල සාධාරණ අගය එහි ධාරන අගයට සමාන වේ.

4 තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

ඇස්තමේන්තු සහ විනිශ්චයන් නිරතුරුව ඇගයීමට ලක් කරන අතර ඒවා ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් සාධක පදනම් කරගන්නා අතර සාධාරණ යයි විශ්වාස කළ හැකි අනාගත සිදුවීම් වල අපේක්ෂාද ඇතුලත් වෙයි.

### තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

සමාගම අනාගතය සම්බන්ධ තක්සේරු කිරීම්වල සහ උපකල්පනයන්හි නිරත වෙයි. අර්ථ දැක්වීම අනුවම ඇස්තමේන්තුවල ප්‍රතිඵල කලාතුරකින් සත්‍ය ප්‍රතිඵල හා සමාන වේ. ඊළඟ මූල්‍ය වර්ෂය තුල වත්කම් සහ වගකීම්වල ධාරන අගයට ප්‍රමාණාත්මක ගැලපීම් නිසා වන සුවිශේෂී අවදානම් ඇති ඇස්තමේන්තු සහ උපකල්පනයන් පහතින් සාරාංශ කොට ඇත.

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි වර්තමාන අගය උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයුගණක පදනම මත තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේදී භාවිතා කරන උපකල්පන තුල වට්ටම් අනුපාතය ඇතුලත් වේ. මෙම උපකල්පනයන්ගේ ඕනෑම වෙනසක් නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ ධාරන අගයට බලපායි. සමාගම සෑම වර්ෂයකම අවසානයේ සුදුසු වට්ටම් අනුපාතය තීරණය කරයි. මෙය නිශ්චිත ප්‍රතිලාභ බැදීම් පියවීම සඳහා අනාගතයේදී අවශ්‍ය වන මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය තීරණය කරන පොලී අනුපාතය වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා වූ අනෙකුත් ප්‍රධාන උපකල්පනයන් වන වර්තමාන වෙළඳපල තත්ත්වයන් අඩ වශයෙන් පදනම් වේ. අතිරේක තොරතුරු 22 වන සටහනෙහි හෙළිදරව් කර ඇත.

(ආ) ප්‍රතිපාදන

සමාගම ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ වර්තමාන නීතිමය හෝ එලදායී බැඳියාවක් පැන නැගීමට හේතුවන අතීත සිදුවීම් සම්බන්ධයෙන් ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් සහ ස්ථිර ලෙසම බැඳීම් නිදහස් කිරීමක් කළ යුතු හා විශ්වාස කළ හැකි ආකාරයෙන් බැඳීම් වල වටිනාකම ඇස්තමේන්තු කළ හැකි අවස්ථාවන් සඳහාය. ප්‍රතිපාදන වාර්තා කිරීමේදී අවසාන වශයෙන් බැඳීම් නිශ්චය කිරීමේදී විනිශ්චයන් යොදාගැනීම අවශ්‍ය වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනකදීම ප්‍රතිපාදන සමාලෝචනය කිරීමත් සමාගමේ හොඳම වර්තමාන ඇස්තමේන්තු පිළිඹිබු වන ආකාරයට ඒවා ගැලපීමත් සිදුකර තිබේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| 5. ආදායම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ගගන නාවික | **4,378,530,773** | 3,737,262,112 |
| ගගන නාවික නොවන | **13,648,726,406** | 11,481,497,959 |
| | **18,027,257,179** | 15,218,760,071 |
